

www.sl-unlimited.com
Sumee
SL-UNLIMITED
E-Book
The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

www.slunlimited.com

අර්චනාගේ හිත නොසන්සුන්ව තිබිණි. ඇලියොන් කාරයේ හිඳ පසුවන හැම කඩසාප්පුවක් වීදියක් දිහාම ඇය බැලුවේ බියපත් දෑසෙනි.

මේ හිතුවක්කාරකමකි. එක්තරා විදිහකින් හොරකමකි. ආදරය විඳින්නට, ලබන්නට ගෙදරට බොරු කර හිතුවක්කාරවන්නට වීම පවකි. එය හිතට නොදැනුනා නොවේ. ආචර්නාගේ නෙත් තෙමිණ.

එහෙත්....

රවිශ්කගේ නෙත් ඒ කඩවසම් පිරුණු මුහුණ සිහිවෙන හැමවරකම හිත පෙලන බිය වියැකේ. ආදරයෙන් - ආශාවෙන් හිත වැසේ. බලාපොරොත්තු - ආදරයේ බලාපොරොත්තු මල් වැස්සක් වාගේ ජීවිතයට කඩා හැලේ. හිත මත්තේ ඔහු නමට ආදරය පිරී ඇතිවිට අර්චනාට මුළු ලෝකයම අමතක කළ හැකිය.

"නෙත්සිරි... ඔහොම්ම පාර අයිනට කරල නතර කරන්න..."



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අර්චනා කීවාය. ඔඩෙල් එක අයිනේ නතර කර ඇති රවිශ්කගේ හුරුබුහුටි රතු මාරුටි කාරය ඈ දුර තියා අඳුනාගත්තාය. නෙත්සිරි.... පවුලේ රියදුරා ඔහුත් එය හඳුනාග න්නට ඇත. ඇලියොන් රිය නතර විය. නිල් ඩෙනිමට රතු කළු කොටු කමිසයක් හැඳි අර්චනා බෑගය උරහිසේ ළා ගත්තාය.

www.sl-unlimited.com Sumee

"බේබි...."

නෙත්සිරි බයාදුව බැලුවේය.

"ඕන තැනක ඇවිදලා.... ඕන දෙයක් අරගෙන කාලබීලා හරියට එක වෙනකොට නෙත්සිරි මෙතෙන්ට එන්න..."

අර්චනා රියදුරාට නෝට්ටු කීපයක් දිගු කරමින් කීවාය.

"මේවා අහුවුනොත් මගෙ බෙල්ලත් ගහලයන වැඩ බේබි..."

මුදලට අත දිගු කරමින් නෙත්සිරි කීවේය.

"නෙත්සිරි බයවෙන්න එපා.... වැඩිම උනොත් අපේ ගෙදරින් එළියට දායි.... ඒත් මං නෙත්සිරිට රස්සාවක් හොයලා දෙනවා...."

අර්චනා හෙමිහිට කීවාය.

බෙල්ල ගහලා යන්නේ ඔහුගේවත් - තමන්ගේවත් නොවේ. අර අහිංසකයාගේය. මරුටි කාරයට හේත්තු වී ඉන්නා අහිංසකයාගේ. ඒ තිත්ත ඇත්ත අර්චනාගේ හිත ගිනි ලෑවේය.

"මගෙ රවී..."

ඉතිරි අඩි දෙක තුන දුවගොස් ඈ ඒ උස් සිරුරේ එතිණ.



SL-UNLIMITED E Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අච්කණ්ණාඩිය ගලවා අතට ගෙන රවිශ්ක හිනා පෑවේය. ඝන ඇහි බැමි යට හීන් නෙත් තවත් හීන්කොට හිනා පෑවේය.

"මගෙ චණ්ඩි කෙල්ල..."

රවිශ්ක කීවේ අර්චනාගේ හිසට අත තියාය. දෙදෙනා අතර වයස් පරතරය අවුරුදු හතරකට වඩා නැත. ඒත් රවිශ්කගේ අඩිහයක් උස ඒ උසට ගැලපෙන කඩවසම් දේහය ළඟ අර්චනා පෙනුණේ බෝනික්කියක සේය.

"යං...."

රවිශ්ක රිය දොර හැරියේය. අර්චනා එයට ගොඩවූයේ කොහේද යන්නේ නොඅසාය.

"අද මොකද්ද ගෙදෙට්ට කියාපු බොරුව?"

රිය පණගන්වා ගනිමින් අවිශ්ක ඇහුවේය.

"ෂොපින්..."

අර්චනා රවුම් ඇසක් වසා ඉගිකළාය.

"මං ගින්දරත් එක්ක සෙල්ලම් කරනවා අර්චි...."

රවිශ්ක කීවේය. ඒ මුණේ හිනා නැත. ඔහු කීවේ හැඟීම්බරවය.

"ඔයාගෙ ගෙදරින් කවදාවත් ඔයාව මට දෙන්නෑ... ප්‍රාදේශිය සභා මන්ත්‍රී පියල් මොරගොල්ලට චූටි දුව ගැන ගොඩක් ලොකු බලාපොරොත්තු ඇති... නිකම්ම රෙස්ටුරන්ට් එකක් අයිතිකාරයෙකුට දුව දීලා අත පිහගන්න එයා කැමති වෙන එකක් නෑ..."



The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඔහු හරිය. මේ ආදරය වරදක් නොවේ. වරද තමා ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෙනෙකුගේ දුවක් වීමය. තාත්තාගේ හිතේ අනාගත බලාපොරොත්තු මහ හුගක්ය. අර්චනා ඒවා නොදන්නවා නොවේ.

"තාත්ති යන්නේ දුර ගමනක්... ඒ ගමන ඉවර වෙන්නෙ පාර්ලිමන්ට් එකෙන්... එයාගෙ හීනෙ ඒක... එයා හිතන්නේ අපිත් එයාගේ ගමනට තුරුම්පු කියලා... අක්කි දුන්නේ පළාතේ ඉන්න ලොකුම කන්ස්ට්‍රක්ෂන් එක අයිතිකාරයගෙ පුතාට... මාධව අයියා හොඳ කෙනෙක් වුණ නිසා අක්කි වසනාවන්තයි... මට එහෙම බෑ රවී... තාත්ති තෝරාගෙන අත දික්කරලා පෙන්නන කෙනෙක් එක්ක කුඩුවක් හදන්න මට බෑ..."

අර්චනා කීවාය. ඒ දෑස් තිබුණේ රවීගේ මුහුණේ නොවේ. රියේ ඉදිරි වීදුරුවෙන් පෙනෙන දුර ඈතකය.

"අක්කිට වගේ හොඳ කෙනෙක්ව තාත්ති තෝරලා තිබුණොත් අපරාදෙනෙ..."

රවිශ්ක කීවේය. ඒ හිනාවක් හංගාගෙනය.

අර්චනා හැරී බැලුවාය. දිනක් දෙකක් වයස රැවුල් කොට විසිරි ඒ මුහුණ තුළ සැඟවී සිනහව ඇය ඇඳින්නාය.

"මොනා කරන්නද? ඔක්කොටම කළින් මේ දඩෝරියට මං වශී උනානෙ... නව් නෝ චාන්ස්... ! "

අර්චනා හිනැහී කීවාය. රවිශ්කගේ හැංගුණ හිනාව එළියට පැන්නේය. රිය විහාර මහා දේවී උද්‍යානයට ඇතුළු කෙරුණේ ඔය අතරේය.

"අර්චි..."



Scanned by CamScanner

ඇගේ අත අල්ලාගෙන ලොකු මල් පිරි ඇහැළ ගහක් යට ලී බංකුව බර කරමින් රවිශ්ක කීවේය.

"ම්..."

අර්චනා ඉදගත්තේ ඔහුගේ ඇකයට අතකුත් බරකරය. ඔහු එක්ක කොහේ හෝ දුර ඈතක යන්න හිත ආසා නොකළා නොවේ. ඒත් ගෙදරට රහසේ උනත් ඇවිදින්න අවසර තිබුණේ කොළඹ අවට විතරය. රවිශ්ක බොහෝ විට අර්චනාව රැගෙන ආවේ විහාරමහා දේවී උද්‍යානයටය.

"මං ගෑණියෙකුට කන්න දෙන්න බැරි මිනිහෙක් නෙමේ... ඒත් අර්චි... ඔය විඳින සැප මා ළඟ නැතිවෙයි..."

"ගෑණියෙක්ගෙ සැප තියෙන්නෙ ඒ ගෑණු කෙනාගෙ ආදරේ තියෙන තැන රවී..."

"මට බයයි... ඔයාගේ ගෙදරින් ඔයාව මට දෙන්නෑ අර්චි..."

"මාව විශ්වාස කරන්නකෝ... මං ඔයා එක්ක එනවා රවී... කවුරු කැමති උනත් අකමැති උනත්..."

ආදරය ළඟ අර්චනා ඒ තරම් මුරණ්ඩුව උන්නාය.

"අපි කරන්නෙ හරි දේමද?"

රවිශ්කගේ ඇඟිලි වල උණුසුම අර්චනාගේ අතට දැනිණ.

"ජීවිත කාලෙම ජීවත් වෙන්න යන කෙනා තෝරගන්න අයිතිය මට නැද්ද රවී..."



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අරචනාගේ හඬ බිඳිණ.

"අම්මා නැතුව මාව හදන්න තාත්ති ගොඩක් මහන්සි වෙන්න ඇති... ඒත් එයාට යුතුකමක් තියෙනවා මගෙ පැත්තෙනුත් හිතන්න... තාත්තාට විරුද්ධ වෙන එක පවක් නම් ඒ පව මට දරාගන්න වෙනවා රවී... මොනා කරන්නද? හැම කෙනෙක්ගෙම ආදර කතාවලට දෙමාපියන්ගෙ ආශිර්වාදය ලැබෙන්නෙ නැනෙ..."

අර්චනාගේ සුදු ඇස් ඇහැල කොළ අතරින් පෙනෙන ආකාසය දිහාවට යොමුව තිබිණ. හමාගිය සුළඟට කහමල් පොකුරු ලතාවට පැද්දිණ. ගිලිහෙන මල් පියල්ලක් දෙකක් පෙම්වතුන්ගේ ඇගට වැටිණි.

"ඔයාට මං නැතුවට කමක් නැද්ද රවී ?..."

අර්චනා උන් හිටි හැටියේ ඇහුවාය. ඒ කෙළින් මුහුණ බලාය. රවිශ්ක ගැස්සිණ. ඒ හීන් ඇස් තරමක් ලොකු විය. වෙව්ලන යටිතොල ඔහු උඩු තොළට හපා ගත්තේය.

"ඇගපණ තියෙන මුළු ආත්මෙම මැරිච්ච මිනිස්සු ඔයා දැකලා තියෙනවාද අර්චි...? ඔයාව නැතුව ගිය දවසක එක පාරක් මේකා දිහා බලල යන්න... මං ඊට පස්සෙ පණ තියෙන මළ කඳක් විතරයි..."

රවිශ්කගේ ඇස් බොඳ විය. අර්චනා ඒ දුටුවාය. ඇගේ හිත ඇවිලිණ. දනිමි. විශ්වාස කළෙමි. මේ අහස තරමට මේ පොළව තරමට විශ්වාස කළෙමි. මේ මතුපිටින් පෙනෙන දැවැන්ත පිරිමියා ඇතුලේ ඒ තරමට හිතන ආදරවන්තයෙකු උන්නේය. අර්චනා මේ ජීවිතය දෙන්න හදන්නේ ඒ සෙනෙහෙවන්තයා වෙනුවෙන් නොවේද?

"අම්මා තාත්තා නැති මාව හදාගත්තෙ නැන්දා...



Scanned by CamScanner

මුලින්ම මම දාගත්තේ පොඩි වඩේ කඩයක්... එතකොට වයස යන්තම් දාසය පහුවුනා විතරයි... ඕ ලෙවල් කරල හම්බකරන්න පටන්ගත්ත රවුම පොඩි වඩේ කඩේ ඉඳන් අද මං මේ රෙස්ටුරන්ට් එක තරම් දුරකට ආවා... කිසිදෙයක් මට නිකම් ලැබිච්චා නෑ අර්චි... රෙස්ටුරන්ට් එක, මේ පොඩි කා එක, හැමදේම මගෙ මහන්සියෙන් හම්බකරපුවා... මට ඉන්නෙ ඔයා විතරයි... ඔයාව අයිතිකර ගන්න මං තව ඕන දුකක් විඳින්න ලෑස්තියි..."

රවිශ්ක සෙමින් කියවාගෙන ගියේය. ඒ වචනයක් වචනයක් ගානේ තිබුණේ ආදරය නොවේද? ආදරය පමණක්ම නොවේද?

"අනේ රවී..."

අර්චනා රවීගේ උරහිසක හිස තැබුවාය.

"ඔයා නැති ජීවිතයක් මට ඕනේ නෑ රවී..."

අර්චනාගේ හදවත දුකකින් වැහිණ. ඒ දුකට යටින් ඔහු කෙරේ වන ආදරයද තිබිණ.

"අර්චනා..."

ඒ ගිගිරුම් හඬට පළමුව නැගිට්ටේ අර්චනාද? නොවේ නම් අවිශ්කද? දෙදෙනාම එකවර ලී බංකුවෙන් උඩ විසිවුණාද පැහැදිලි නොවේ.

"තා...ත්...ති..."

ලී බංකුව පස්සේ උන් තාත්තාගේ රුවත් ඒ පස්සේ උන් ගෝලයා තිලක්ගේ රුවත් අර්චනා දුටුවාය.

"උඹට මෙච්චර කියලත් මේකාව අත් අරින්න බැරි උනා



www.sl-unlimited.com
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

නේද?...."

පියල් මොරගොල්ල අර්චනාගේ කම්මුලට ගැසුවේය.

"ඌහ් !..."

www.sl-unlimited.com Sumee

අර්චනාට කෑගැහිණ.

රවිශ්ක මැදට පැන්නේ දෙවරක් නොහිතාය.

"තරහක් තියේනම් මට ගහන්න... අර්චනාට ගහන්න එපා..."

රවිශ්ක කීවේය. ඒ වෙන ඕන දෙයක් බලාගෙනය. පියල්ට පෙර ඉස්සර වුණේ තිලක්ය. ඔහු තල්ලුකළ පාරට රවිශ්ක විසි වී ඇහැල ගහේ හැපිණ.

"අනේ එයාට මුකුත් කරන්න එපා..."

අර්චනා කෑගෑවාය. විරයා වගේ ඉදිරියට ආවාට රවිශ්ක මිනිසුන් එකක් පොර බැඳ පුරුදු කෙනෙක් නොවේ. ඇඟපත තිලක්ට වඩා ලොකු බව හැබෑය. අවිශ්ක අතක් විසි කළොත් තිලක්ව විසිවෙන බවත් හැබෑය. ඒත් අවිශ්ක වාගේ හොඳින් හැදුණු තරුණයෙකුට තිලක් වගේ මැරයෙක් එක්ක හැරෙන්න බැරිය.

"අනේ තාත්ති... වරද මගේ.... රවීට මුකුත් කරන්න එපා..."

අර්චනා කෑගෑවාය. රවිශ්ක වහා නැගිට තිලක්ගේ මුහුණට මුහුණලා කෙළින් හිටගත්තේය.

"තිලක්..."



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

පියල් මොරගල්ල ගෝලයාව පස්සට කළේය. ඇවිලෙන්නට ගිය මහ ගින්න අළුයට හැංගිණ. උද්‍යානයේ උන් ගැහැණු පිරිමි බොහොමයකගේ ඇස් දූන් මෙතනය. ප්‍රසිද්ධියේ මඩ ගාගන්න පියල් කැමති නොවිණ. ඔහු අඩි දෙකක් රවිශ්කට කිට්ටුවිය.

"උඹ ගැන මං පස්සෙ බලා ගන්නං..."

ඒ මුහුණට ඇඟිල්ල ලෙලවා පියල් කීවේය.

"අනේ තාත්ති..."

ගින්න අළුයට හැංගුණ බව නොදත් අර්චනා පියල්ගේ අතක එල්ලිණ.

"යමං..."

පියල් අඩි දෙකතුනකින් වාහනය වෙත ගියේ අර්චනාව අතින් ඇදගෙනය.

"නැගපං..."

තාත්තා රියට තල්ලු කරද්දී අර්චනා ඇහැල ගහ දෙස බැලුවාය. රවිශ්ක ඇහැල ගහට අතකුත් තියා බරවී බලා උන්නේ අසරණවය. ඒ පිරිමි දෑස්මත වූ බිය - තමා සඳහටම නැතුව යාවී බිය අර්චනා හැඳින්නාය. තිලක් පණගන්වා ගත් රිය සැරදමා ඉගිලිණි.

"අදින් පස්සෙ උඹට මේ ගෙදරින් හෙලවෙන්න බෑ..."

පියල් කීවේ අර්චනාව කාමරයට දමාය.



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"ගෙයි හිරකරලා මාව නවත්තන්න බෑ තාත්ති... මං රවිශ්කට ආදරෙයි... බැන්දොත් බඳින්නේ එයාව විතරයි..."

අර්චනා නොබියව කීවාය. විරුද්ධකම් වැඩි වද්දී ආදරය එන්න එන්න හයිය වන බව ඇයට වැටහෙමින් තිබිණ.

www.sl-unlimited.com Sumeo

"මගේ දරුවෝ ඉන්න ඕන මට ඕන හැටියට අර්චනා... උන්ව හරියට හදන්න බැරි උනොත්... මං උන්ව මකනවා... අන්න ඒක දැනගනිං..."

පියල් මොරගොල්ල කීවේය. ඔහු නැවතුණේ ඔය ටික කියන්න විතරය. රිය ආවාටත් වඩා ඉක්මණින් ගේට්ටුවෙන් ඉගිලිණ.

දවස ගෙවිණ. රැය උදාවිය. හඳ තරු නැති අහස නිසොල්මන්ව උන්නේය. අර්චනා ජනේලයෙන් එළිය බැලුවාය. දොර තිබුණේ තාමත් පිටතින් අගුළු දමාය.

හීත හුළඟක් කාමරයට ගැලුවේය. රවිශ්කගේ උරහිස මත දැනුණු උණුහුම අර්චනාට සිහිවිය. ඈ පපුවට අතක් තියාගත්තාය.

"ඔයාට කොහොමද රවී..."

අර්චනාගේ හිත බියව තිබිණ. ඒ කාමරයකට හිර කර තිබූ තමාගැන නොවේ. එළියේ උන් අහිංසකයා ගැනය. තාත්තාගේ රිය හවස ගිය රවුම තවමත් ගෙදර ආවේ නැත. ඔහුගේ දේශපාලනය මැර බලයට කළ හැකි නොකළ හැකි දේ ගැන අර්චනා දැන උන්නේ අල්පයකි.

"අනේ රවී මට ඔයාට කතාකරන්නවත් විදියක් නෑ..."

අත් බෑගය... එය තාත්තා ළඟය. ජංගම දුරකතනය එතුළේය. සමහර විට රවිශ්ක එයට කතා කරන්න ඇත. මහා



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සුනාමියකට පෙර දැනෙන නිහඬතාවයක් විසල් නිවස තුළ අර්චනාට දැනිණ. අයිරාංගනීත් පහළය. ඈ තාත්තාට බයය. ගේ දොර බලාගත්තාට උයා පිහා දුන්නාට ගේ ඇතුලේ දේවලට අත දාන්නේ නැත. ඉතිං පිහිටක් ඉල්ලන්නේ කාගෙන්ද? අර්චනා තැවිණ. ඇඳට වැටුණේ වේදනාවෙනි. නින්ද ගියේ කීයටද? රය ගෙවුණේ කීයටද ඇය නොදත්තාය. බියකරු හීන අතරේ රය ඇහැරී තිබිණ.

www.sl-unlimited.com

"කරාස්...."

දොර හැරිණි. අයිරාංගනී බියපත් මුහුණින් දොරකඩින් එබිණ.

"අයිරාංගනී..."

රිදෙන හිසට අතකුත් තියාගෙන අර්චනා ඇඳෙන් බැස්සාය.

"ලොකු බේබි ඇවිත්..."

වන්දනා - අර්චනාගේ අක්කා පැමිණ ඇත.

"උදෙන්ම..."

අර්චනා පුදුම වූවාය. විවාහයෙන් පසුව වෙන්ව වසන ඈ දුන් නිවසට ආ ගියේ එහෙමත් වෙලාවකය.

"කට්ටියම පුංචි බේබි එනකං බලන් ඉන්නවා..."

අයිරාංගනී කීවේ අර්චනාගේ දෑස් මඟහැරය. අර්චනා පහළට බැස්සේ නිදිගැට කඩමිනි.

අක්කා වන්දනා හා මාධවන් අයියා සැටියේය. තාත්තා



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

උන්නේ ගෙයි මැද සාලේ එහාට මෙහාට යමිනි.

"අක්කි..."

අර්චනා කෙළින්ම ගියේ වන්දනා ළඟටය. වන්දනා බලහත්කාරයෙන් මුහුණට ගත් හිනාවට ඒ නෙත් මත වූ බිය වසා දමන්නට බැරි විය. අර්චනා සොයුරියගේ නෙත් මත නොකියා රැකි ලොකු කතාවක් දුටුවාය.

www.sl-unlimited.com

"මෙයා හදන්නේ අපේ මුළු පවුලෙම නම කැත කරන්න... මාධව පුතා... මට විතරක් නෙමේ මෙයා කරන දේවල් ඔයාගෙ නමටත් හොඳ නෑ... පුළුවන් නම් මේ හරකීට තේරුම් කරලා දෙන්න..."

පියල් කෑගැවේය. මාධවන් මෑදුව හිනාවිය. ඔහු මන්ත්‍රී මාමා තරමට දූෂණය වූ හදවතක් ඇත්තෙක් නොවේ.

"මොනාද නංගි මේ කරන විකාර?..."

වන්දනා කරදකාරී හඬකින් ඇසුවාය. අර්චනා සුසුමක් හෙලුවාය. ආදරය ගැන දන්නේ ආදරය කළවුන්ය. අක්කා මාධව අයියාට කීකරුය. ආදරේය. ඒත් ඒ ආදරයත් තමා හා රවිශ්ක අතරේ ඇති ආදරයත් දෙකකි. මෙය ලෙයට- ලේ ධාතුවට - ආත්මයට - හුස්මට බැඳුණු ආදරයකි. මේ කාටවත් ඒ ආදරය තේරුම් ගන්න බැරිය.

"තාත්ති මං ටික දවසකට මෙයාව එහෙ එක්ක යන්නං..."

වන්දනා කීවාය.

"මං කොහෙවත් යන්නෑ..."

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

අර්චනා සෘජුව කීවාය.

"ඔය කිව්වෙ... ඔය කිව්වෙ... කට ඇරියොත් මුරණ්ඩු කම බේරෙනවා... පොඩි එකී පොඩි එකී කිය කියා මුල ඉඳලම මං හුරතල් කරපුවායෙ ප්‍රතිඵල තමා ඔය..."

පියල් මොරගොල්ල කෑගැවේය. දෙමහල් නිවස තුළ ඒ හඬ දෝංකාර දිණ.

"ඇත්තටම මට ආදරේ නම් තාත්ති කැමති වෙන්න ඕන මං කැමති දේට... තාත්ති මට දෙන්න ඕන මං ආසදේ..."

අර්චනා - ඈ පියල්ගේ ගෙරවිල්ලට බිය නොවිණ. මේ හයිය දුන්නේ - මේ ශක්තිය දුන්නේ ආදරයම පමණි.

"පුංචි කාලේ දකින දකින කඩවල් වලින් සෙල්ලම් බඩු ඉල්ලනකොට අරන් දීපු කාලයක් තිබ්බා... උඹල දූන් ලොකුයි... උඹලට හොඳ මොනාද නරක මොනාද කියලා මේ තාත්තා දූන් හොඳට දන්නවා අර්චනා..."

පියල් කීවේය.

"පොඩි කාලේ දෙමාපියෝ තෝරන කොයි දේත් හොඳයි කියල බාර ගත්තේ අපේ නොතේරුම් කමට... අපේ ජීවිතේට ගැලපෙන්නෙ මොකද්ද නැත්තේ මොකද්ද කියලා දූන් මටත් හොඳට තේරෙනවා තාත්ති..."

"අර්චනා..."

පියල්ගේ දෑස් රතුවිය. ලොකුවිය. ඒ ඇස් කීවේ පෙරදා රැය නිදි නැතිව ගෙවුණු බවය.

"කටවහපං අර්චනා... මාත් එක්ක එකට එක කියවලා



www.sl-unlimited.com
SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community

මගෙන් ගුටිකන්න එපා..."

ඒ රතුව ගිය නෙත් ඇති රකුසු මුහුණින් පියල් කෑගැවේය.

"තාත්තිව කේන්ති නොකර ඉන්න නංගී..."

www.sumee
www.sl-unlimited.com

වන්දනා කරදරකාරී මුහුණින් කීවාය.

"මේ දෙන්නව මේ විදියට මේ ගෙදර තනියම දාලා යන්න බෑ සුදු... අපි නංගිව එක්ක යං... තාත්ති දවස් දෙක තුනකට අපි නංගිව එහෙ එක්ක යන්නං..."

වන්දනාටක් කියා මාධවන් පියල්ගෙන් අවසර පැතුවේය.

"මට මාධවන් පුතාගේ මූණට මුකුත් කියන්න බෑ... නැත්නම් මෙයාව කීයටවත් මේ ගෙදරින් එළියට යවන්නෑ..."

පියල් තරමක් මෙල්ල විය. ඒ මාධවන්ට ඇති සැලකිල්ල නිසාය.

"අපි යං නංගි..."

වන්දනා අර්චනාගේ අතක් අල්ලා ගත්තාය. අර්චනා ගහක් ගලක් වාගේ උන්නාය. යායුතුද නැතිද... ඈ තාම හිතා තිබුණේ නැත.

"මෝඩ වැඩ කරලා තාත්තිව අවුස්සන්න එපා... ඕවයින් අමාරුවෙ වැටෙන්නෙ ඔයා තෙමේ..."

වන්දනා ඒ ටික කීවේ කොඳුරාසේය. අර්චනා ගැස්සිණ. ඈ වහා අක්කාගේ මුහුණ බැලුවාය. සොයුරියගේ පියකරු



The Soul of Sri Lankan e-community
Scanned by CamScanner

මුහුණේ ඇස් මත කියා නොකියා ලොකු කතාවක් හැංගී තියෙනවා අර්චනා දුටුවාය.

ඇයට රවිශ්ක සිහිවිය. මේ කියන්නේ රවිශ්ක ගැන නොවේ ද?

www.slsumunlimited.com

අතට අහුවන ඇඳුම් කෑලි දෙකතුනක් බෑගයක ඔබාගෙන අර්චනා මාධවන්ගේ රියට නැගිණ.

"නංගි..."

මාධවන් කතා කළේ පියල්ගේ මන්දිරය ඉක්මවා නොපෙනෙන දුරකට ගිහින්ය.

"ඔයාට ආදරේ කරන්න එපා කියන්න අපට අයිතියක් නෑ... ඒත් කරන දෙයක් ඔයිට වඩා දුරදිග හිතල කරන්නෝන..."

මාධවන් කීවේය.

"රවිශ්ක නරක කෙනෙක් නෙමේ අයියා..."

අර්චනාගේ ඇස් කඳුළින් බොඳවිය.

"දන්නවා..."

මාධවන්ගේ ඒ වචනයේ ලොකු විශ්වාසයක් විය.

"නංගි හිතන්නේ ඔයා රවිශ්ක එක්ක එහෙයා එකක් තියෙනවා කියලා දැනගෙන අපිත් නොදන්නවා වගේ උන්නා කියලද?"

වන්දනා ඇහුවාය.

SL-UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"මං රවිශ්ක ගැන හොයලා බැලුවේ මීට මාස ගණනකට කළින්..."

මාධවන් කීවේය.

www.sl-unlimited.com Sumee

"අයියා..."

අර්චනාට අදහාගන්න අමාරුය.

"තමන්ගේ කියලා කිසිකෙනෙක් නැති උනාට රවිශ්ක දාහකින් හොයා ගන්න බැරි හොඳ කොල්ලෙක් ! අපි ඒක පිළිග න්නවා... ඒත් ප්‍රශ්නේ එක් නෙමේ නංගි... ඔයා ගැන තාත්ති ඊට වඩා ලොකු බලාපොරොත්තු තියා ගෙන ඉන්න එක... එයාගෙ දෙවනි බෑනා ගැන තාත්ති ලොකුවට හිතන් ඉන්න එක... රවිශ්කට ඒ අඩුව පුරවන්න අමාරුයි..."

මාධවන් කීවේය. අර්චනා නිහඬය. රවිශ්කට තිබූ තැන හිමි ඔහුටම පමණය.

"නංගි..."

වන්දනා පසු අසුනට බරවිය. අර්චනා උන්නේ පසු අසුනේය.

"කාගෙත් යහපත ගැන හිතලා ඔයා දැන් ඔය ඔක්කොම අමතක කරලා දාන්න..."

වන්දනා කීවේය.

"මං ජීවත් වෙන්නෙ නැතිවෙයි..."

අර්චනා කීවාය. ඒ සෙමිනි.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"ඔච්චර බොළඳ වෙන්නෙපා... ළමයෝ..."

වන්දනා කීවේ තරමක කෝපයකිනි.

"මං විතරක් නෙමේ අර අහිංසකයටත් ජීවතේ නැතිවෙයි..."

www.sl-unlimited.com Sumee

අර්චනා කීවාය. ඇය ඒ විශ්වාස කළාය. තමා නැතිව ඔහුට හොඳින් හුස්ම වැටෙන්නේ නැත.

"ඔයා දැනටමත් එක කරලා ඉවරයි නංගි..."

වන්දනාට කියවිණ.

"වන්දනා..."

මාධවන් කෑගැවේ නොකිය යුතු යමක් බිරියගේ කටින් පිටවුණාසේය.

"අක්කි !..."

අර්චනාට කටින් පිටකරගත හැකිවුණේ ඔච්චරය. ඇගේ උගුරකට වියළිණ. ඇස් ගල් ගැහිණ. වන්දනා තැවුණාය. හදිසි වී කටින් පිටවුණ වචන ආපහු ඇදගත නොහැක. මාධවන් පාර අයිනට කර රිය තිරිංග ගැහුවේය.

"මොනාද වෙලා තියෙන්නේ අක්කි...?"

අර්චනා ඇහුවාය. ඒ සෙමිනි. ඒත් ඒ මෘදු ස්වරය ඇතුලේ ලොකු අනතුරක් හැංගී තිබිණ.

"කලබල වෙන්න දෙයක් නෑ නංගි..."



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

මාධවන් සිද්ධිය හැකිතාක් සරල කරන්නට වචන හෙව්වේය.

"මොකද වෙලා තියෙන්නෙ ?"

අර්චනා ඇසුවාය. මුල පටන් සොයුරියගේ දෑස් ඇතුලේ හැංගී තිබූ ලොකු කතාව ඇයට තේරෙමින් තිබිණ.

www.slsumeeunlimited.com

"නංගි කලබලවෙන්න එපා..."

මාධවන් ආයිම කීවේය.

"මං ජීවත්වෙන්නෙ නැතිවෙයි අයියා... මට තවත් හංගන්න එපා..."

අර්චනා කීවේය. ඇගේ ඇස් තුළ ඒ තීරණය ඉතා පැහැදිලිව සටහන්ව තිබිණ.

"රවිශ්කට පොඩි කරදරයක්..."

මාධවන් කීවේ අහක බලාගෙනය.

"මගේ අහිංසකයාට මොකද..."

අර්චනාගේ හඬ බිඳිණ. අඹුසැමියන් මුහුණින් මුහුණ බලාගත්හ.

"කියන්න අයියා... මගෙ අහිංසකයට මොකද?"

අර්චනා ඇහුවාය.

"ඊයේ රෑ කවුරුහරි රෙස්ටූරන්ට් එකට ගහලා... ඇතුලේ ඉදල තියෙන්නෙ රවිශ්කයි කෝකියයි විතරයි..."

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

මාදවන් කීවේ එච්චරය. අර්චනා වෙව්ලා ගියාය. මාධවන්ගේ වචන ඊට වඩා ඉස්සරහට එන්නට ශක්තිමත් නොවිණ.

"නංගි..."

චන්දනා අර්චනාගේ අතක් මෘදුව අල්ලා ගත්තාය. සොයුරියගේ හිතේ ගින්දර ඒ දෑසින් ඇයට පෙනිණ.

www.sl-unlimited.com

"මට රවිශ්ක බලන්න ඕන..."

අර්චනා කීවාය.

"රවිශ්කට වැඩි අමාරුවක් නෑ නංගි... මේ වෙලාවේ අපි ටිකක් එයාගෙන් ඈත්වෙලා ඉන්න එක තමා හොඳ... රවිශ්කගෙ ජීවිතේට උනත්..."

මාධවන් කීවේය.

"මේ කතාව පස්සේ ඉන්නේ කවුද කියලා මං දන්නවා අයියා..."

අර්චනා කීවාය.

"මාව රවිශ්ක ගාවට අරං යන්න පින් සිද්ධ වෙයි..."

ඇගේ ඇස් වලින් කඳුළු කඩා හැළිණ.

"නංගි..."

සොයුරියගේ පියකරු මුහුණේ ඇදි මහා වේදනාව චන්දනාට පෙනිණ.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"ඉවසන්න පුරුදු වෙන්න ළමයෝ..."

ඈ කීවේ එය මේ මොහොතේ කළ හැකි යැයි විශ්වස කළ නිසා නොවේ.

"බැරිවෙයි අක්කා... ඒක කරන්න මගෙ හිත හයියනෑ... මට රවිශ්කව බලන්න ඕන..."

www.sl-unlimited.com Sumee

අර්චනා දැඩිව කීවාය. ඒ බොරු නොවේ. ඇගේ දෑසේ ඒ ඍජු බව තිබිණ. මේ සියුමැලි සුරූපී කෙල්ලට ඒ තරම් දැඩි බවක් කොහොම ලැබුණාද? චන්දනාටත් මාධවන්ටත් නොතේරිණ.

"අයියා..."

අර්චනා ලිහිලෙන් මාධවන්ගේ අතක් අල්ලා ගත්තාය.

"පින් සිද්ධ වෙයි මාව එකපාරක් රවිශ්ක ගාවට ගෙනියන්න අයියා... සත්තයි මම හැමදේම කලබල නොකර දරාගන්නං..."

අර්චනා පොරොන්දු විය.

මාධවන් අතින් නළල පොඩි කර ගත්තේය. ඊළඟට සැනින් රිය හරවා ගත්තේ තීරණයක් අරගෙනය.

■ ■ ■ ■ ■ ■

තැනෙක අතපය කඩාගත් අයය. තව තැනක පිළිස්සුණු අයය. හැම අතකම කෙඳිරිය පිරිමි වාට්ටුව මැදින් ඇවිදගිය රූමතිය කාගේත් ඇස් වශී කර ගත්තාය. පිරිමි ලෙඩුන්ගේ සියළු වේදනාවන් මොහොතකට අමතක විය.

අර්චනා හඬමින් පිරිමි වාට්ටුව පුරා ඇවිද්දාය. අන්තිමට



SL-Unlimited E-Books Spirit of Sri Lankan Creativity
Scanned by CamScanner

ඈ සෙවූ දෙය ඈ දුටුවාය. කොනේ ඇඳේ වැතිර උන් රවිශ්ක ළඟට ඈ ගියේ හඬාගෙනය.

"මගෙ රවී..."

හැම ඇහැක්ම තමා වෙත බව ඈ අමතක කළාය. මේ රෝහලක් බව තමා උන්නේ වට්ටුවක බව ඇයට කොහොමවත් සිහි නොවිණ. ඈ දුටුවේ එක දෙයකි. ඒ රවිශ්කගේ අපමණ වේදනාවෙන් පිරි දෑසය.

"රවී..."

අචර්නා ඒ මුහුණ අතගෑවාය. හිස වසා සුදු වෙළුම් පටියෙදී අතක පයක උරහිසක ශරීරයේ අතන මෙතන පැලැස්තර දමූ රවිගේ මුහුණ ඈ අපමණ ආදරයෙන් - වේදනා-වෙන් අතගෑවාය.

"අ...ර්...ච...නා..."

බිඳුණු ගොරෝසු පිරිමි හඬ අර්චනාගේ ගැහැණු ආත්මය පුරවා දැම්මේය.

"රිදෙනවාද රවී... අනේ මේ මොන අපරාධයක්ද?"

අර්චනා ඉකි ගැසුවාය. හිස තිබුණේ පුපුරණ තරමට වේදනාවෙනි. ඒ වේදනා දෙන හිස කොහේ හෝ හප්පා මියෙන්නට ඇයට හිතිණ.

"රවී..."

අර්චනා ගේ වේදනාව - ඇගේ කඳුළු රවිශ්කට ඔහුගේ වේදනාව අමතක කරවිය.



Scanned by CamScanner

"අ...ර්...චි..."

රවිශ්ක කෙඳිරිගෑවේය.

"ඔයාට අමාරුද?..."

අර්චනා ඒ කම්බුල් දෝතට ගෙන දෑසට එබිණ. මෘදු රැවුල් කොටවල කිතිය ඇගේ සියුමැලි අත්ලට දැනිණ.

"න්... නෑ..."

තරුකැට වාගේ කඳුළු කැට හීන් ඇස්වල හංගාගෙන රවිශ්ක කීවේය.

"බොරු කියනවා..."

අර්චනා කීවේ අපමණ වේදනාවෙනි.

"දැන් රිදෙන්නෑ අර්චි... ඔයා මං ළඟනේ..."

රවිශ්ක කීවේය. ඒ ඇත්තය. ඇගට වඩා රිදුනේ හිතය. ඒ ඇය අහිමි වේ කියාය. අර්චනා කීවේ ඇත්තය. මරණින් මෙහා කාටවත් ඇයව උදුරාගන්න හැකි නොවේ.

"දුක් විඳිනවා..."

අර්චනා කීවාය.

"නෑ..."

රවිශ්ක කීවේය.

"මොකද උනේ...?"



Scanned by CamScanner

"දන්නෑ... රෙස්ටුරන්ට් එක කුඩු කළා අර්චි... ගැහුව එකට දුක නෑ... මෙට අනිද්දා සනීප වෙයි... ඒත් ආයෙත් මිනිහෙක් විදියට නැගිටින්න මට ගොඩක් කල් යයි..."

රවිශ්ක කීවෙය.

"අවුරුදු ගාණක් හරි අමාරුවෙන් හම්බකරලා ගොඩනගා ගත්තු හැමදේම උන් එක මොහොතක විනාශ කරලා දැම්මා... ඇතුළේ උන්නේ මායි අපේ කුක් කෙනෙකුයි විතරයි... දහයක් එක්ක තනි මං මොනවා කරන්නද? "

රවිශ්ක කීවේය.

අර්චනා හැඬුවාය. ඉකි බින්දාය. මුළු ලෝකයම ගිනි තියන තරමට ලොකු වේදනාවක් හිතේය.

"සමාව දෙන්නෑ රවී... කාටවත් සමාව දෙන්නෑ... ගැණු හිතක උපදින ආදරේක තියෙන ශක්තිය මේ එකෙක්වත් අඳුරන්නෙ නෑ..."

අර්චනා කීවාය. ඕනෑනම් ලොව ගිනිතියන්න පුළුවන. ආදරේ නමින් මියෙන්නටත් පුළුවන. සාපකරන්න පලිගන්න පෙළඹෙන්නේ මේ වාගේ වේලාවට නොවේද? ඒත් මේ ආදරයට ඊට වඩා අර්ථයක් තිබිය යුතුය. ඊට වඩා වටිනා කමක් තිබිය යුතුය. බුද්ධියෙන් සිතා යමක් කළ යුත්තේ දැන් නොවේද?

"රවී..."

අර්චනා අත්බෑගය අවුස්සා ටෙලර් යන්ත්‍ර කාඩ්පත අතට ගත්තාය.

"මේකෙ ඇතිතරම් සල්ලි තියෙනවා... කොහෙත්හරි ඈතකින් අපට නිදහසේ ඉන්න තැනක් අරගන්න... මං ඔයා



www.sl-unlimited.com Sumee
SL - UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-com
Scanned by CamScanner

එක්ක එනවා... "

අර්චනා කීවාය.

"ඔයාගේ සල්ලි මට එපා අර්චි..."

Sumee
www.sl-unlimited.com

රවිශ්ක කීවේය.

"මේවා අපේ තාත්තිගේ සල්ලි නෙමේ රවිශ්ක... මේවා අපේ අම්මිගේ සල්ලි... දැන් ලොකු සල්ලි කාරයා වගේ දඟළුවාට ඒ කාලෙ අපේ තාත්ති කරලා තියෙන්නේ බ්‍රෝකර් වැඩ... අම්මා තමයි පෝසත්.... අම්මාගේ ගෙදර ඉඩමක් විකුණන්න ආගිය කාලේ තමයි තාත්ති අම්මාව යාළුකරන් තියෙන්නේ... තාත්ති අද ඉන්න තත්වයට ආවේ අම්මිගේ සල්ලි වලින්..."

අර්චනා ලොකු කතාවක් කියාගෙන ගියාය.

"අම්මාගෙ මරණින් දේපල තුනට බෙදුණා... තාත්තිට භාගයයි. අක්කිටයි මටයි ඉතිරි භාගේ වෙන වෙනම එකවුන්ට්ස්වල දැම්මා... මේ ඒ සල්ලි... මේ සල්ලි ගත්තාට වරදක් නෑ රවී... තාත්තා අපට විරුද්ධ වුණාට මගෙ අම්මා ජීවතුන් අතර උන්නානම් අපිව තේරුම් ගන්නවා... ඒක මට විශ්වාසයි..."

අර්චනා කාඩ්පත රවිශ්කගේ අතේ මිට මෙළවීය.

"නංගී...."

චන්දනා රෝගී යහන ළඟට ආවාය.

"අපි දැන් ගියොත් හොඳයි..."

ඇ කීවාය.

SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"ගිහිං එන්නං රවී..."

අර්චනා රවිශ්කගේ කැරලි කොණ්ඩය මෘදුව අතගෑවාය.

"ඔයාගෙ පණිවිඩේ එනකං මං මග බලා ඉන්නවා..."

ඈ කීවේ ඔහුගේ කණට කරය.

"අපි යනවා මල්ලී..."

චන්දනා කීවේ අර්චනාගේ අතකින් අල්ලාගෙනය. වාට්ටුවෙන් පිටවෙනතුරුත් අර්චනා රවිශ්ක දෙස හැරී හැරී බලමින් ගියාය. මේ සමුගැනීම කොයිතරම් වේදනාවක්ද කියා දුරින් බලා උන් කිසිවෙකුටත් නොතේරිණ.

■ ■ ■ ■ ■ ■

අර්චනා දින තුනක් සොයුරියගේ ගෙදර උන්නාය. හිතේ ගිනි නිවුණා නොවේ. ඒත් ඇතුළත කළබලය වේදනාව හිත පතුලේ හැංගිණි. අර්චනා යළි ගෙදර ආවේ උන්නාටත් වඩා නිහඬ චරිතයක් සේය.

උදේ, දවල්, රෑ ඈ බලා උන්නාය. කොයි මොහොතක හෝ රවිශ්කගේ කටහඬ අහන්නට ලැබේයි හිත නොඉවසිල්ලෙනි.

අන්තිමේ ඈ බලාපොරොත්තු වූ දෙය අහන්නට ලැබිණ.

"රවී..."

අර්චනා කතා කළේ ගොඩක් දේ දරාගෙනය.



www.srunlimited.com
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"හෙට පාන්දර දෙක වෙද්දී... මං ගේ ඉස්සරහා පාර ළඟ ඉන්නවා අර්චි..."

රවිශ්ක කීවේය.

www.sl-unlimited.com Sumee

"හා..."

අර්චනා කීවාය.

"මා එක්ක එනවද?"

රවිශ්ක ඊළඟට ඇහුවේය.

"එනවා... මේ හැමදේම දාල එනවා රවී..."

අර්චනා කීවාය. එය පොරොන්දුවකි.

ඉතිං ඒ රැය අර්චනාට නිදි නැතිවිය. අත්‍යාවශ්‍ය බොහෝ දේ මල්ලක දාගෙන ඈ මගබලා උන්නාය. වාසනාවට හෝ අවාසනාවට තාත්තා ගෙදර නොවීය. පළාතේ ආසන සංවිධායකගේ ගෙදර පිරිතකි. තාත්තා එතන මුල්තැනය.

මහ ඔරලෝසුවේ දෙක වැදිණ. අයිරංගනී කුස්සි කැල්ලේ සැප නින්දකය. අර්චනා මල්ලත් කරේ එල්ලාන කාමරයෙන් පැන්නේ ජනේලයෙනි. තාප්පෙන් පැන්නේ ස්ටූලයක් තබාය. රවිශ්කගේ මරුටිය වංගුව ළඟ අඳුරේ නතරව තිබිණ.

"අර්චි..."

රවිශ්ක අඩියට දෙකට ඉදිරියට පැමිණ අර්චනා අතින් මල්ල ගත්තේය.

SL-UNLIMITED E-BOOKS
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"පුළුවන් තරම් ඉක්මණට මාව මෙහෙන් ඈතට අරං යන්න රවී..."

අර්චනා කීවේ රියට ගොඩවී රවිශ්කගේ උකුලේ හිස තියාගෙනය. රිය පණගන්වා ඉදිරියට ගනිද්දී ඇගේ උරහිස ගැහෙනු ඔහුට දැනිණ.

www.sl-unlimited.com
Sumee

අර්චනා ඉකිබින්දාය. ඒ කඳුළු තුළ හිම්වීමක් මෙන්ම අහිමි වීමක්ද තිබිණ. මේ හඬන්නේ දුකටද සතුටද කියා රවිශ්කට සේම ඇයටත් නොතේරිණ. පෙම්වතුන් රැගත් රිය අනාගතය කරා ඉදිරියට ඇදිණ.

■ ■ ■ ■ ■ ■ ■

අර්චනා රිය කවුළුවේ එල්ලී උන්නාය. හරියට පොඩි එකෙකු වාගේය. මගදිගට දකින කොළ පාට ගහකොළ ඇගේ හිත නිව්වේය. මේ රජරටය. පළාත අයිති මධ්‍යමටය. දඹුල්ල ටවුම පේන දුරකය. ඒත් අනුරාධපුරයට පොළොන්නරුවට උරුම ශුෂ්ක කටුක රස්නය හෝ ගිනිගහන අව්ව පේනමානයක නොවේ. කොහොඹ, පියඹලා, නැඳුන්, කෝන් ගසින් සෙවණ ලද ඇසට අසුවන මානේ සුන්දරය.

"මොනාද මෙච්චර එබී එබී බලන්නෙ?"

රිය පදවන අතරේ රවිශ්ක ඇසුවේය. අර්චනා හැරුණාය. පැහැදිලි සුදු පසුබිමේ තදම තද කළුපාටින් ඇස් බැබලිණ. නෙළුම් පොත්තේ පාට හොරාගත් තුනී දෙතොල පුරුදු හුරතල් හිනාවෙන් නැටවිණ. විසිතුන් වියේ වීද ඈ සුන්දරත්වයෙන් හැසිරීමෙන් ඊයේ පෙරෙයිදා නාවා ගෙට ගත් යුවතියක සේය.

"සීගිරිය, දඹුල්ල පේන දුර කිව්වාම මං හිතුවෙ හුඟක් රස්නෙ ඇති කියලා... ඒත් රවී දැන් බැලුවම අපි හිටපු පැත්තට

SL UNLIMITED E-BOOKS
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

වඩා ගොඩක් හොඳයිනෙ..."

අර්චනා සතුටු වූවාය. ඈ ගහකොළට ආදරය කළේ අදක ඊයෙක සිට නොවේ.

"කොළඹ දැන් කොන්ක්‍රීට් වනාන්තරයක් වෙලානෙ... අර්චි... කොළඹ විතරක් ද ඒ ළඟ හැම ටවුමක්ම තට්ටු තනහතරේ බිල්ඩින් වලින් පිරිලා... පදිංචියට ගන්න පර්චර්ස් දහය පහළොව ඇතුළෙත් මිනිස්සු තට්ටු තුනට දෙකට ඉඩම පිරෙන්න ගෙයක් හදනවා... පොල් ගහක් කොස් ගහක් තියා අඹ ගහක්වත් හදා ගන්න ඉඩක් නෑ... හිටෙව්වත් හිටවන්නෙම අතින් ගෙඩි කඩාගන්න පුළුවන් බද්ධ කරපු පැළ... ඉතිං කොහෙද මේ වගේ ගහක් කොළක්...? ගහක් කොළක් නැති තැනක හෙවණක් හීතලක් ඇත්තේ නෑනෙ..."

රවිශ්ක කියවාගෙන ගියේය.

"මේ ඔක්කොම ඔය කියන වලව්වට අයිති ඉඩම්ද?..."

අචර්නා ඇසුවාය.

"ඔව්... අක්කර විස්සක්... වලව්වෙ ඉඩම..."

රවිශ්ක කීවේය.

"මොකද්ද රවී ඔය වලව්වෙ නම කිව්වෙ..."

අර්චනා රවිගේ - සැමියාගේ වම් කකුල මත මෑදුව අත තැබුවාය. විවාහය ලියාපදිංචි කර දැන් දින දෙකක් ගෙවිලා ඉවරය.

"කේසර වලව්ව..."

www.slsumeedunlimited.com
SL UNLIMITED E-Book
Descent of Sri Lankan e-community



Scanned by CamScanner

"ඒක අමුතු නමක්..."

"හ්ම්... සීගිරියට සිංහගිරි කියලත් කියනවානෙ... වලව් වත්තේ දකුණු මායිම වැව... වැවෙන් එගොඩ සීගිරිය... කේසර කියන්නෙත් සිංහයාට කියන නමක්නෙ... මේ වලව්වට ඒ නම ලැබිල තියෙන්නෙ සීගිරිය පේනදුර හින්ද කියලා කියන්නෙ..."

www.sl-unlimited.com
Sumee

රවිශ්ක කියවාන ගියේය. අර්චනා ඇස් ලොකු කළාය. ඇයට පුදුමය..

"කොහොමද ඔච්චර විස්තර දන්නේ... ?"

"බ්‍රෝකර් තමා මට හැමදෙයක්ම කිව්වෙ අර්චි... මිනිහා මට ෆෝටෝස් ටික පෙන්නුවා විතරයි... මට තිකම්ම වලව්වට හිත ඇදිල ගියා... අපේ ප්‍රොජෙක්ට් එකට මෙතන නියමෙට මැච් වෙනවා..."

රවිශ්ක කීවේය. අනාගත බලාපොරොත්තු ගොන්නක් ඔහුගේ හිතේ තිබිණ.

රවිශ්කට හුරුපුරුදු හෝටල් රස්සාවය. අර්චිගේ නමට තිබූ මුදලින් ඔහු තැනක් හෙව්වේ ජීවත්වන්නට විතරක්ම නොවේ. හෝටලයක් කරන්නත් එක්කය. දෙස් විදෙස් සංචාරකයින් ඇදෙන තුනක දූකුම් කළ හෝටලයක් පවත්වාගෙන යන්නට ආසාවක් රවිශ්ක තුළ තිබුණේ බොහෝ කාලයක සිටය.

සීගිරිය පේන දුර දඹුල්ල දිස්ත්‍රික්කයෙන් "කේසර වලව්ව" මිලට ගත්තේ ඒ හින්දාය. පියල් මොරගොල්ලගෙන් හා ඔහුගේ සහචරයන්ගෙන් කලකට හැංගි ඉන්නට මේ තැන වඩාත් සුදුසුය.

"අර පේන්නෙ වලව්වද රවී..."



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

රූස්ස ගහකොල අතරින් ටිකෙන් ටික ළංවන දූවැන්ත මන්දිරය දෙස අර්චනා ගෙල නවා බැලුවාය.

"කොහොමද?... හරි ගරුගාම්භීරයි නේද?"

රවිශ්ක බැලුවේ බිරියගේ සුන්දර මුහුණ දෙසය. ඇගේ කතා කරන ඇස්... ඒවා මොහොතකට වශී වීගෙනම ඉදිරියේ පෙනෙන සුන්දර දසුන දෙසම ඇලවීගෙන හිඳී.

කේසර වලව්ව - සුදුහුණු පිළියම් කර ලා නිල් පාටින් ජනෙල් හා දොරවල් වටා රමුවක් පින්තාරු කරන ලද එය දුරට බොහෝ සුන්දරව පෙනිණ. සිංහල උළු සෙවිලි කළ වහලය , අඩියක් පමණ පළලැති මල්ලියකම් කළ වඩිම්බු ලෑලි වලව්වේ තේජස වැඩි කළේය.

"අද ඉඳලා මේක අපේ ගෙදර..."

සුවිසල් පෝටිකොව යට රතුපාට මරුටිය නතර කරමින් රවිශ්ක කීවේය. අර්චනා ඔහුට පෙර රියෙන් බැස්සාය. තැනින් තැනින් සතර දිශාවට විශාල සඳළුතල ඇති උඩුමහල ඉතාමත් දැකුම් කළුය. හිත මේතරමට මේ තැනට ආදරය කරන්නේ ඇයිද? අර්චනාට නොතේරිණි.

"මහත්තයා..."

නිල්සුදු ඉරි සරමට තනිසුදු කමිසය හැඳ කලබයෙන් දිව ආ මැදිවියේ පිරිමියෙක් රවිශ්ක ළඟ කොන්ද පහත් කර කතා කළේය.

"සුගතන් කොහොමද?"

සාක්කු දෙකේ අත්දෙක ඔබාගෙන රවිශ්ක වටපිට බැලුවේය.



www.sl-unlimited.com
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"යතුරු බාරගන්න මහත්තයා ඒවි කියලා මට බ්‍රෝකර් කියලා තිබ්බේ..."

කේසර වලව්වේ සියලු යතුරු ඇතුලත් යතුරු පොදිය සුගතන් දෝතින්ම දිගු කළේය.

"ඕක බාරදෙන්න ඕන මට නෙමේ නෝනාට..."

www.sl-unlimited.com

රවිශ්කගේ හඬින් ගේ වටේ ගිය අර්චනාගේ ඇස් සුගතන් ළඟ නතර විය.

"අර්චනා සුගතන් තමා මෙච්චර කල් වලව්ව බලාගත්තේ... මං කිව්වා දිගටම අපි ළඟ වැඩ කරන්න කියලා..."

රවිශ්ක කීවේය.

සතුටු සිනාවක් මුව පුරවාගත් සුගතන් යතුරු කැරැල්ල දෝතින් අර්චනාගේ අත තැබුවේය.

"මහත්තයලා ඇතුලට යං... මං බෑග්මලු ටික අරං එන්නං..."

සුගතන් රියේ පසු අසුන මත වූ බෑග් කීපය වෙත එබිණ.

අර්චනා ඉස්සර වූවාය. තනිකොස් ලීයෙන් කළ පලු දෙකේ දැවැන්ත ඉදිරි දොර අගුල තනි පිත්තලය. වසර සීයකට එකසිය පනහකට වඩා පැරණි වීද හොඳින් නඩත්තු කර තිබුණ නිසා දොර අගුල එක් වරක් යතුර කැරකූ පමණින් ඇරිණ.

අර්චනා රවිශ්කගේ සවිමත් බාහුවක එතී කේසර වලව්වේ පුළුල් ආලින්දයට පයක් තැබුවාය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"කව්ද රවී මේ?..."

ආලින්දයේ බිත්තිය සැරසු අඩි තුනක් උස එපමණ පළල තෙල් සිතුවම දෙස බලා අර්චනා ඇසුවාය. හේ පිරිමියෙකි. කළු කබායක් හැඳ, කඩුකස්තාන පැළඳ, ඇත්දළ බස්තමට බරවී ගරුගාම්භීර ලීලාවෙන් උන් පිරිමියා දෙස රවිශ්කත් බැලුවේය.

www.sl-unlimited.com Sumee

"ඔය කොහොඹ තැන්නෙ ආරච්චිල මහත්තයා... "

උත්තර දුන්නේ දෝතින් බෑග් දෙකක් ගෙන ගෙට ගොඩ වූ සුගතන්ය.

"මේ උන්දෑගෙ වලව්ව කියලනෙ කියන්නෙ..."

ඔහු නැවත කීවේය.

"සුගතන් ආරච්චිල දැකලා තියෙනවද?..."

අර්චනා ඇසුවාය.

"නෑ නෝනා... අපි උපදිනකොටත් උන්දෑ මියපරලොව ගිහිල්ලා... මං මේ වලව්වට එද්දි උන්දෑගෙ පරම්පරාවෙ කවුරුත් මේ වයේ උන්නෙ නෑ... ඒත් ඉතිං මේ වලව්ව හැදුවේ උන්දෑගෙ මුත්තා කියලයි කියන්නෙ..."

සුගතන් කීවේය.

සනව වැඩුණු උඩු රැවුල දෙකොනින් උඩට කරකවා හිසකේ පසුපසට පීරා අඩහඳක හැඩැති නැමි පනාව ගසා උන් මේ තේජමාන පිරිමිරුවේ උකුසු ඇස් බඳු දෑස දෙස අර්චනා බලා උන්නේය. තෙල් සායමින් කළ සිතුවමක් බව හැබැවි. වසර සියයක් පමණ පැරණි බැවින් පලින් පල පැහැය දුර්වර්ණව යමින් තිබුණ බවද සැබැවි. ඒත් ඒ රුවේ ඇස් ඒවා ජීවමාන



SL UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

පිරිමියෙකුගේ තරමට ජීවයෙන් පිරී ඇතැයි අර්චනාට හිතිණි.

"අර්චි..."

රවිශ්ක බිරියට කතාකළේ එහෙමය.

www.sl-unlimited.com Sumee

"අපි යං උඩට..."

අර්චනාගේ අතක් මෑදුවට ඩැහැගත් රවිශ්ක ලී තරප්පුව නැගිණ. කේසර වලව්වේ දකුණු දිසාවේ සඳලුතලය වෙතට ඔහු ඈ රැගෙන ගියෝය.

"ෂාහ්..."

අර්චනාට කැගැසිණ. නෙත ඉදිරිපිට තිබුණේ ඒතරම් මනහර දසුනකි. වලව් වත්තේ මායිමේ පිහිටි නෙලුම් මලින් වැසුණු වැවත් ඊට එහායින් සීගිරියත් මෙතනට මනාව පෙනිණ.

"මාවලස් රවී... ඇත්තමයි... අයි කාන්ට් බිලීව් දැට්..."

අර්චනා සැඳැල්ලේ ලී වැටට බර වූවාය.

"මගෙ තේරිම හොඳයි නේද?"

අර්චනා පිටුපස හිටගත් අවිශ්ක දෑත ඇගේ දෙවුරමත තැබුවේය.

"සුපර්බ්... ඇත්තමයි මෙතන හොටෙල් එකකට කියාපු තැන..."

අර්චනා කීවාය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"වෙනස් කරනවා කියලා එහෙමකට කඩල බිඳල වෙනස් කරන්න දේකුත් නෑ වගේ නේද?"

රවිශ්ක ඇහුවේ බිරියගේ අදහස් දැනගන්නත් එක්කය.

"අනේ ඔව් රවී... මේ තියන නැවුරල් ගතිය කොහොමවත් වෙනස් කරන්න එපා... ෆොරිනස්ලා උනත් මේකෙ තියෙන සිංහල කමට කැමති වෙයි... බලන්නකො කොච්චර ග්‍රේට්ද කියලා..."

අර්චනා කීවාය.

"අපි ෆුල් රිපෙයා(ර්) එකක් දීලා ගම්මු... එතකොට තවටිකක් මොඩ්ෆයි වෙයිනෙ..."

රවිශ්ක කීවේය.

මීට වඩා දැවැන්ත නවීන පන්නයේ මන්දිර අර්චනා දැක තිබිණ. කොළඹදී අපමණවත් ඒවාට ගොඩ වැදී තිබිණ. එහෙත් ඒ කිසිතැනක නොවූ සිත් වශී කරන ගතියක් අර්චනාට කේසර වලව්වේදී දැනිණ. යටි හිතට ඉතා තදින් දැනෙන මේ සමීප බව තමන්ගේ කම මොකක්දැයි පැහැදිලිව තෝරා බේරාගන්නට තරම් මතකයක් අර්චනාට නොවිණ.

■ ■ ■ ■ ■ ■

අර්චනා ළාතිල් රාත්‍රී නිදන ගවුම ඇන්දාය. සිහින් උරහිස් පටි යෙදූ සේද ගවුම විලුඹ තෙක් දිගුය. ගමන් මල්ල පෙරලා අළුපාට සීත කබාය අතට ගත් ඈ එය දෙවුර වැහෙන්න ඇන්දාය. රජරට දහවලට පායන හිරු නිසා උණුසුම්ය. රාත්‍රියට එපමණටම ශීතලය. තවමත් හැර දමා ඇති දිගු ජනෙල් පියන් අතරින් ඇදෙන හුළඟට ඇඟ හිරිවැටෙන ගානය. නිතඹේ වදින කඩා දැමූ කැරලි කොණ්ඩය අතින් හදමින් අර්චනා උඩු මහල්

The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ආලින්දයට ආවාය.

"රවී..."

රවිශ්ක හා සුගතන් දෙදෙනා පටු කොරිඩෝව කෙළවර උන්නා ඇයට පෙනිණ.

www.sl-unlimited.com Sumee

"මොකද කරන්නෙ?..."

කොරිඩෝවේ කෙලවර දුවැන්ත දෙපලු දොර ළඟ උන් රවී හැරී බැලුවේය.

"අපි බැලුවෙ මේ දොර අරින්න සුදු... හරි පුදුමයක්නෙ මේ එක යතුර කින්වත් මේ දොර අරින්න බෑනෙ..."

රවිශ්ක කීවේය.

කේසර වලව්වේ කාමර ගණන තිස් අටකි. ගබඩාකාමර, විසිත්ත කාමර හා නාන කාමරත් ඒවාට අමතරව තිබිණ. මේ හැම තැනකම යතුරු එකම රවුමක රැන්දූ යතුරු පොදිය තනි අතින් දරන්නට බැරි තරමට බරය. ඒත් මේ දොරේ යතුරක් එහි නොවේ.

"ඒක වෙන්නේ කොහොමද සුගතන් කිව්වේ ඔක්කොම යතුරු ඔතන තියෙනවා කියලා..."

අර්චනා කීවාය.

"වලව්ව බලාගත්තට මමවත් තාම හරියට මේකෙ දිග පලල දන්නේ නෑ නෝනා... පහල ඔය පාවිච්චියට නිතර ගන්න කාමර දෙකතුන ශුද්ධ පවිත්‍ර කරල තියාගත්තා මිසක මං මේ අහට නම් ඇවිත්ම නෑ ඕං... මහත්තයා මේ කියනකන් මේ දොරේ යතුරු නෑ කියල මං දන්නෙ නෑ නෝනා..."



The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සුගතන් කීවේ බයාදුවය.

"ඒකත් එහෙමද...? හරි ප්‍රශ්නෙ තමා..."

රවිශ්ක අත්දෙක ඉනට තියාගත්තේය.

www.sl-unlimited.com Sumee

"ඇයි රවී...?"

"මේ හැම රූම් එකක්ම පේන්ට් කරවල හෝදවල ගන්න එපායැ... එකක් හරි වහල දලා තියන එක අපට පාඩුයි..."

රවී කීවේය.

"මහත්තයල කලබල වෙන්න එපා... දඹුල්ල ටවුමෙ ඉන්නවා හොඳ වඩුවෙක්... මං හෙට එක්කල එන්නං... සුටුස්ගාල අගුල ඇරල දෙයි..."

සුගතන් කීවේය.

"ඔව්... එහෙමවත් කරමු..."

රවී ආපසු හැරිණ. ඒ අර්චනාගේ අතින් අල්ලාගෙනය. මහත්තයාටත් නෝනාටත් ඉඩ දී කොරිඩෝවේ බිත්තියට හේත්තු වුණ සුගතන් දුටු දෙයින් මොහොතකට ගැස්සිණ.

දොරත් ගෙබිමත් අතර අගල් පහක පමණ තීරය හිස්ය. ඒ හිස් තීරුව ළා නිල්පාට ආලෝකයක් පැතිර තිබිණ. හරියට හඳ එළිය වගේය. එළියේ අහස පුරවා එකක් හඳපායා ඇති බව හැබෑය. ඒත් වලව්ව ඇතුලේ කාමරයකින් හඳ එළිය විහිදෙන්නේ කොහොමද?

SL-UNLIMITED E-Book

සුගතන් මොහොතක් ඒ පටු දාරය දෙස බලා උන්නේය. යමක් ඒ අසල එහා මෙහා විය. සුගතන් ගැස්සිණ. දෑස දුටු දෙය

The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

විශ්වාසයට ගත නොහැකිව ඔහු ගල්ගැහිණ.

දෑස බොරු නොකළේ නම් ඒ එළිය තීරුව අතරින් පෙනුනේ දොර ඇතුලතින් ඇවිදයන පා දෙකකි. නිරුවත් දෙපයකි ! සුගතන්ගේ දෑතේ රෝම ඉල්පුනේ හිතලට නොවේ. කළු ඉංගිරියාව ඉදිරියට නෙරා ආවේ හිතාමතාමත් නොවේ.

www.sl-unlimited.com

"සුගතන්..."

කොරිඩෝවේ එහා කොණතෙක් පියමංකර උන් රවිශ්ක ආපහු හැරිණ.

"මක්කරනවද?..."

ඔහු ඇහුවේය.

"ම්... මේ... මේ... එන...වා..."

සුගතන්ට ගොත ගැහිණ.

"කෑම මේසෙට අරින්න... මට හරි නිදිමතයි..."

රවිශ්ක කීවේය.

"හොඳයි මහත්තයා..."

කියාගෙන සුගතන් රවිශ්ක පස්සේ අඩිය ඉක්මන් කළේය. අර ඉදහිට දවසක කේසර වලව්වේ තැනින් තැනින් ඇහෙන අද්භූත ශබ්ද වාගේ මේ දුටු දෙයත් කිටින් පිට නොකර සුගතන්ගේ ඇතුළු හිත යටම වැළලිණ.

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

■ ■ ■ ■ ■ ■

කොළඹ සිට දඹුල්ලට එක දිගට රිය පැදවීම පහසු දෙයක් නොවේ. රවිශ්කට දැනුණේ ඒ ගමන් වෙහෙසය. කාබි හමාර කළ සැනින් ඔහු ගැඹුරු නින්දකට වැටිණ.

www.sumee.sl-unlimited.com

එහෙත් අර්චනාට එතරම් පහසුවෙන් නිදිමතක් ළඟා නොවිණ. රවිශ්කට තුරුළුව යහනේ වැතිර උන්නත් ඇය උන්නේ අවදියෙනි. අර්චනා නැගිට කාමරයෙන් එළියට ආවාය.

"හඳේ ලස්සන... ! "

ජනෙල් බීරලු අතරින් පෙරී එන සඳවතුරේ හිටගනිමින් ඈ හිතුවාය. කැටයම් බීරලු අතරින් දුර ආකහේ හඳ මතුවී පෙනිණ.

"මෙතෙන්ට මෙහෙම ලස්සන නම් බැල්කනි එකට කොච්චර ලස්සන ඇත්ද?"

අර්චනා හිතුවාය. ඈ ලී තරප්පුව නැග්ගේ දෙවරක් නොහිතාය. කොහොඹ තැන්නෙ අරච්චිගෙ පින්තූරය ළඟ මොහොතකට ඇගේ ඇස නතර විය. තරප්පුව නගින ඈ දිහා ඔහු ජීවමානව බලා ඉන්නවා සේය.

"අවුරුදු සියකට වඩා පරණ පින්තූරයක් වුණාට අදත් ජීවතුන් අතර ඉන්නව වගේ... බලන විදියට හිතෙන්නෙ රවාගෙන ඉන්නවා වගේ..."

අර්චනා වහා ඇස් අහකට ගත්තාය. සිතුවමේ නපුරු බැල්ම දරන්නට ඇගේ සියුමැලි හිතට තවදුරටත් නොහැකිවිණ. අර්චනා වහ වහා උඩු මහලට නැගුණාය.

SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ඈ හිතුවා හරිය. විශාල රවුම් හඳ වැවට උඩින් ආකහේ රැඳී උන්නේ බැබලෙමිනි. වැව්දියට වැටුණු සඳ එළිය රිදී පාටට බැබලිණ. මේ වාගේ දසුනක් පියවි ඇසින් දකින්නට තමා බොහෝ පින්කර ඇතැයි ඇයට හිතිණ.

"මේක රවි දැක්කා නම්..."

www.sl-unlimited.com Sumee

රවිශ්ක ළඟ නැති අඩුව ඇයට දැනිණ. වෙහෙසින් බරව උන් ඔහු නිදිසුවයෙන් නැගිටවාලන්නට ඇය කැමති නොවිණ.

"අපි දෙන්නාගෙම වාසනාව අපට මේ වගේ ලස්සන තැනක් හම්බවෙච්ච එක..."

අර්චනා හිතුවාය. ඈ හීන දැක්කාය. ළගදීම අමුත්තන් වෙනුවෙන් නවාතැන් පහසුකම් ආහාර පාන එක්ක විවෘත වෙන 'කේසර වලව්ව රිසෝට් ඇන් හොලිඩේ ඉන්' වෙත නොනැවතී පිරිස ඇදී එන අයුරු ඈ මනසින් දුටුවාය. හීත හුළඟක් වැව පිස හමා ආවේය. අර්චනා ගිත කබා දෙකොණ පපුවට උඩින් තදකොට පොරවා ගත්තාය. පරිසරය නිසලය.

ඒත් !

ඒ නිසල පරිසරය මොහොතකට සසල විය. වැව හරහා මෙගොඩට එන ඔරුව ඇය දුටුවාය.

"මේ ර... ඔරුවක්....?"

අර්චනා පුදුම වූවාය. ඔරුව එන්නේ වළව් වත්තේ මායිමටය. ඔරුවෙ එන කෙනා එන්නේ වලව්වත්තටය. දැන් මේ වලව්වේත් එහි අක්කර එකසිය විස්සක් වූ වත්තෙත් අයිතිකරුවන් ඔවුන්ය. වලව්වත්තට මේ රාත්‍රියේ රහසේ ගොඩවෙන්නේ කවුරුන්දැයි තමා දැනගත යුතු නොවේද? අර්චනාගේ හිත කලබලවිය. ඈ ලී වැටට බරදී තව ටිකක් වැව පැත්තට එබිණ.



SL Unlimited E Books The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

මෙගොඩට ආ ඔරුව ගහකොළ අතරේ නොපෙනී ගියේය. ඊට එහා ඒ ගැන සලකුණක්වත් නොවිණ.

"කර කරස්... කර කරස්..."

අර්චනා ගැස්සිණ.

ඈ වහා ආපසු හැරිණ. ඒ හඬ ආවේ වලව්ව ඇතුළෙනි. පිටතින් නොවේ.

"සුගතන්ද?..."

අර්චනා සැක මුසු හිතින් මොහොතක් කන් දුන්නාය.

"කර කරස්... කර කරස්..."

අර හඬ නැවතත් නැගේ.... මෙවර පෙරට වඩා පැහැදිලිව ඇසේ. දැන් අර්චනාට හොඳටම විශ්වාසය. ඒ සුගතන් නොවේ. ඒ හඬ එන්නේ කොරිඩෝවේ ඈත කෙළවරිනි.

"කා... වි... ද...?"

අර්චනාගේ හිත ගැහිණ. උගුරකට වියලිව තිබිණ. අඳුරු කොරිඩෝවේ කෙළවර අර වසා දමා ඇති කාමරය දෙසින් මේ ශබ්දය නොකඩවා ඇසේ.

"දෙයියනේ මේ රෑ කවුද?"

අර්චනා බිය විය. කුතුහලය ඊට වැඩි වූවාය. ඇගේ දෙපය හෙමින් හෙමින් ඒ දෙසට ඇදිණ. හඬ එන්නේ කාමරය ඇතුළෙනි.

අර්චනා වැසූ දොර ඉදිරිපිට නතර වූවාය. ඈ ඒ හඬ



www.sl-unlimited.com Sumee
SL UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අඳුනාගත්තාය. ඒ එන්නේ කාලෙකින් තෙල් බිඳක් පහස නොලද මළකඩ කෑ බොලක්කයක හඬය. කාමරය ඇතුළෙන් එන්නේ කිසිවෙක් බොලක්කය ඇති ලිඳකින් වතුර අදින හඬය.

"දෙයියනේ කාමරේ ඇතුලෙන් ලිඳක සද්දේ එන්නෙ කොහොමද?"

www.sl-unlimited.com Sumee

අර්චනාට අදහාගත නොහැක. කනට ඇසෙන දෙය හිතට විශ්වාස කල නොහැක. මෙය විය හැකිද? දුවැන්ත කේසර වලව්වේ වසා දැමූ කාමරයක් ඇතුළෙත් බොලොක්කයකින් වතුර අදින හඬ ඇසේ.

"මට වැරදුනාවත්ද?...."

අර්චනා නැවත කන් දුන්නාය. ඊළඟට ඇයට ඇසුණේ බාල්දියක් ළිං බැම්මක වදින හඬය. වැරදීමක් නොවේ. ඒ ගැටීමේදී බාල්දියෙන් ඉහිරෙන වතුර නැවත ළිංදිය මත වැටෙන ශබ්දයද ඇයට ඇහිණ.

"දෙ...යි...ය...නේ... !"

අර්චනා වෙව්ලා ගියාය. ඇගේ අත එසවුණේ දොරට තට්ටු කරන්නය. හයියෙන් කෑගසා ඇතුළේ ඉන්නේ කව්දැයි අහන්නට උවමනා වුණත් අර්චනාගේ උගුර කට වියලී තිබිණ. බර අතක් අර්චනාගේ උරහිසට වැටුණේ ඇගේ පිටුපසිනි.

"ඊය්හ්..."

ගැස්සීගෙන - කෑගසාගෙන අර්චනා ආපසු හැරිණ. තිදිබර දෑසින් ඈ පසුපස හිටගෙන උන්නේ රවිශ්කය.

"රවී..."



SL UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

අර්චනා රවිශ්කගේ උස් පපුතුරට තුරුළු විය. ඇගේ හිත පෙලු බිය කොහෙ ගියාද නැත.

"සුදූ... මොකද මේ?... මක්කරනවද මේ රෑ මෙතන?..."

අහන්නට දාහක් දේ රවිශ්ක ළඟ තිබිණ.

www.sl-unlimited.com Sumee

"රවී... රවී... අනේ රවී... මේ කාමරේ ඇතුළෙන් මහ අමුතු සද්දයක් ඇහෙනවා..."

"අමුතු සද්දයක් මොකද්ද?..."

"ළිඳකින් වතුර අදිනවා වගේ..."

"ළිඳකින් වතුර අදිනවා වගේ...?"

රවිශ්කගේ ඇස් කුඩා විය. කට කොණක හිනාවක් මතුවිය. අර්චනා, ඇය බයගුල්ලියකි. රවිශ්ක එය දන උන්නාය. බැඳපු අලුත ඔහු ඇයට විහිළු කළේ ගහකින් කොළයක් වැටුණත් බය වෙනවා කියාය.

"ඔයා කියන්නේ කාමරේ ඇතුළෙන් ළිඳකින් වතුර අදිනවා වගේ සද්දයක් එනවා කියලද?"

රවිශ්ක ඇහුවේය.

සැමියාගේ මුහුණේ තිබු සිනාව දුටු අර්චනා මොහොතක් පසුබා ගියාය.

"මං කිව්වේ මට එහෙම ඇහුණා කියලා..."

ඈ සිහින් හඬකින් කීවාය.

SL-UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

රවිශ්ක දොරට කණ තියා සවන් දුන්නේය. සියල්ල නිහඬය. මේ රාත්‍රිය සේ නිහඬය. රාත්‍රියේ කළුවර සේ නිහඬය.

"කෝ... මට ඇහෙන්නේ නෑනේ කිසි දෙයක්..."

රවිශ්ක කීවේය.

"ඒත්... මට එහෙම ඇහුණා... රවී මං කිව්වේ ඇත්ත..."

පරාජිත දෑස අර්චනා බිමට බර කළාය. දුක් අඳුරින් වැසුණු බිරියගේ මුහුණ දුටු රවිශ්කට දුක හිතිණ.

"සමහර විට මීයෙක් වෙන්නැති අර්චනා..."

රවිශ්ක කීවේය.

"මීයෙක්...?"

අර්චනා පුදුමයෙන් ඇස් ඔසවා බැලුවාය.

"ඔව්... ගොඩක් කල් වහලා තිබ්බ කාමරනෙ... මියෝ බෝ වෙලා ඇති..."

"ඒත් රවී මට ඇහුණේ බොලොක්කයක සද්දයක් නෙ..."

අර්චනා කීවාය.

"බොලොක්කයක්?... ළමයෝ ඒව තිබ්බෙ අපි පොඩි කාලෙනෙ... ඔය මීයෙක් මොකක් හරි හයිය දෙයක් හපන්නැති... උන් එක එක ඒවා හපන කොට එන්නෙ එක එක සද්ද..."

රවිශ්ක කීවේය. අර්චනා කල්පනාවට වැටිණ. 'ඇත්තටම



www.sl-unlimited.com Sumee
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඒ මට ඇහුණ හැටිද? ඒ මීයෙක්ද? ' ඇයට විශ්වාස නොවිණ.

"අපි යං පහළට..."

අර්චනාගේ උරහිසට වටා අත දමාගෙන රවිශ්ක පහළට කැඳවාගෙන ගියේය.

"අර්චනා..."

යහනේ වැතිර තමාට තුරුළු වූ බිරියගේ කණට රවිශ්කගේ දෙතොලේ උණුසුම දැනිණ.

"ම්..."

"ඇයි ඔයා උඩට ගියේ...?"

"හඳ බලන්න..."

"හඳ බලන්න...?"

රවිශ්කට පුදුමය.

"ඕ... බැල්කනි එකට ගියහම වැවට උඩින් හඳ පායල තියෙන හැටි හරි ලස්සනට පේනවා..."

අර්චනා කීවාය. රවිශ්ක ඇගේ හිසකේ සිපගත්තේය.

"මේක හරි වාසනාවන්ත තැනක් අර්චි... ඔය අනම් මනම් ඔලුවට දාගන්න එපා... ඇහැට පේන ලස්සන විතරක් දකින්න පුරුදු වෙන්න... එදා බ්‍රෝකර් මට කේසර වලව්වේ ෆොටෝස් ටික පෙන්නුවම මගෙ හිත ටක්ගාලා ඇදිලා ගියා... මටම තේරෙන්නෑ මං මෙතෙන්ට කැමති වුණේ ඇයි කියල... ඒත් කාගෙ උනත් හිත ඇදිලා යන ගතියක් මෙතන තියෙනවා...



www.sl-unlimited.com Sumee
SL UNLIMITED E-BOOKS
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අපට මෙතැනින් කිරි උතුරන්න වගේ හරියයි අර්චි..."

රවිශ්ක කීවේය. අර්චනා ඔහුගේ සවිමත් අත ගෙන පපුවට තුරුළු කර ගත්තාය. මොහොතකට පෙර දැණුනු අවිනිශ්චිත ගතිය දැන් නැත. මුළු ලෝකයම ළඟදී නැති සුරක්ෂිතබවක් රවිශ්ක ගේ දැවැන්ත සෙවනැල්ල ළඟ තමාට දැනෙනවා නොවේදැයි ඇය සිතුවාය. අර්චනා සැනසිල්ලේ දෑස පියා ගත්තාය. ජනෙල් වීදුරුව ළඟින් එහාට ගිය ආගන්තුක මිනිස් රූපය ඒ නිසා ඈ කොහොමටවත් දුටුවේ නැත.

▪ ▪ ▪ ▪ ▪ ▪ ▪

අර්චනා රවිශ්කට පෙර අවදිවිය. උස් ජනෙල් පළු දෙක ඈ හැර දැමුවාය. හීත හුළඟක් ඇගේ කැරලි කොණ්ඩය සිප හමා ගියේය. රැය සේ උදයද ශීතලය. රැයසේම උදය කාලයද සොඳුරුය. නිමක් නැති කුරුළු ගී හඬවල් කේසර වලව්වට හතර දිසාවෙන්ම ඇසේ. ඒ අතරින් මල් කොවුලෙකුගේ මිහිරි නාදයත් මොනරෙකුගේ ඇඟ හිරිගඬු නංවන හඬත් අර්චනා හඳුනාගත්තාය.

"ම්හ්..."

කෙදිරිගාගෙන රවිශ්ක ඇඳේ ගුලිවිය. අර්චනා හැරී බැලුවාය. ඇහි බැම් වසාගත් අකීකරු කෙස් කළඹ රවිශ්කගේ කඩවසම් මුහුණේ සුන්දරත්වය වැඩිකර තිබිණ. රවිශ්කගේ සිරුර උණුසුම් වෙන්නට පොරවනය සැකසූ අර්චනා කාමරයෙන් පිට වූවාය.

සුගතන් හොඳටම වැඩය. ගෑස් ලිප මත ඇති තාච්චි දෙක සට පට ගා එහෙට මෙහෙට කරයි. කරකවයි. අරියි. නැවත ඔසවයි. අර්චනා කුස්සියට ඇතුලු වූවාය.

"සුගතන් බරටම වැඩ වගේ..."

අර්චනා කීවාය. සුගතන් හැරිණ. ආප්ප ගලවන ඇළුමිනියම් හැන්ද අතේය.



www.sl-unlimited.com Sumee
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"උදේට සුදු අප්ප ටිකක් හැදුවා නෝනා..."

සුගතන් කටපුරා හිනාවිය.

"හොඳට කෑම බිම හදන්න දන්නවා වගේ..."

www.sl-unlimited.com Sumee

ආප්ප තැබ්බෙන සුවඳට අර්චනාගේ මුව තෙත් විය.

"අවුරුදු ගාණක් තිනකඩව හැදිච්ච එකානෙ නෝනා..."

"ඇයි කසාද බැඳලා නැද්ද?"

"මොකො නැතුව..."

"කසාද බැඳලා නම් මොකද කතිකඩව ඉන්නේ...?"

"බැඳල අවුරුද්දෙන් ඒ ගෑණි මාව දාලා ගියා... නෝනා..."

"දාලා ගියා..."

අර්චනාට පුදුමය.

"ඒ මොකෝ..."

ඈ ඇසුවාය.

"සරමට වඩා කලිසම හොඳා කියලා හිතෙන්ඩැති... පාන් කාරයා එක්ක පැනලා ගියේ..."

සුගතන් කීවේය.

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"සමහර මිනිස්සුන්ගේ හිත හොඳ වැඩි කමත් ගෑණු සතා දකින්නෙ නෝන්ජල් කමක් විදියට..."

ඔහු නැවත කීවේය.

"ළමයි එහෙම නැද්ද?"

www.sl-unlimited.com Sumee

"මට ළමෙක් හදාදෙන්න ඒ ගෑනිට උවමනාවත් තිබ්බෙ නෑ නෝනා..."

අර්චනා ඊට එහා යමක් අහන්න මැලි වූවාය. ඒ රිදෙන අතීතයකි. දුක හිතෙන වැලලු කතාවකි. ඔහුට රිදෙන බව දූන දූන තව හාරා අවුස්සන්නට බැරිය.

"නෝනා ආප්පයක් උණු උණුවේ කනවද?..."

ගැලවූ ආප්පයක් වට්ටියට දාන අතරේ සුගතන් ඇසුවේය.

"කමු එහෙනම්... සුවඳට බඩගිනි වෙලා ඉවරයි..."

අර්චනා කීවාය. දුම් දමන ආප්ප කීපයක් ලුණුමිරිස් තලියක් එක්ක පිගානට දමා සුගතන් මේසය මත තැබුවේය. අර්චනා මේසයට හිඳගත්තේ ජනේලය පැත්තට මුහුණ දමාය. දුර ඇතින් ගහකොළ අතරින් මෙතනට වැව් දියේ ඡායාව යන්තමට පෙනේ. පෙරදා රැයේ දුටු ඔරුව ඇයට සිහි විය.

"සුගතන්... වැවේ රෑට කවුරුහරි ඔරු පදිනවාද?"

අර්චනා ඇසුවාය.

"සලං !..."



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සුගතන් අතින් ආප්ප හැන්ද බිම වැටිණ.

"අ...න... ලි...ස්සුවා..."

කලබලයෙන් කී සුගතන් බිමට නැමී ආප්ප හැන්ද අහුලා ගත්තේය.

"මං ඊයේ රෑ දැක්කා ඔරුවක් වැවේ තියෙනවා..."

www.sl-unlimited.com Sumee

අර්චනා කීවාය.

"මාළු අල්ලන කවුරුහරි වෙන්ඩැති..."

සුගතන් කීවේ මුහුණ හංගාගෙනය.

"ඔය මහ රෑ මාළු අල්ලනවද?"

අර්චනා පුදුම වූවාය.

"මොකෝ නැත්තේ නෝනා... දවාලියට වඩා නිදහසේ රෑට මාළු බෑවහැකිනෙ... හඳ එළියට මාළු ඇහුවෙනවා වැඩිය කියලත් කියනවානෙ..."

සුගතන් කීවේය.

"ඒත් මං දැක්කා ඒ ඔරුව වලව්වත්තට එනවා... මාළු අල්ලනවා නම් ඔරුව වැවේ තියෙන්න එපායැ..."

අර්චනා කීවේ තමාටම කියාගන්නවා වගේය. එය සුගතන්ට ඇහුණාද නැද්ද සැකය. ඇහුණා නැතා සුගතන් එයට උත්තර දෙන්නට ඉස්සර වූයේ නැත.

"මං මේ නෝනලා බය කරන්න කියනවා නෙමේ...



SL Unlimited E-Book The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

වැටමායිමක් නැති වලව්වත්තට මොකා උනත් රිංගන්න බැරිය. කළුවර වැටුණාට පස්සේ මං නම් කියන්නේ මේ වලව්ව ඇතුලේ උනත් එහා මෙහා ඇවිදින්න යන්නේ නැත්නම් තමයි හොඳ..."

සුගතන් කීවේය.

"ඇයි එහෙම කියන්නෙ..."

අර්චනා පුදුමයෙන් ඇහුවාය.

"කාලයක් වහලා තිබ්බ තැන්නේ නෝනා... අවුරුදු ගාණක් මං උන්නත් මේ කුස්සියේ මැද කෑල්ලයි ඒ එක්ක තියෙන කාමර දෙක තුනටයි ඇරෙන්න ඉන් එහාට ගිහින් නෑ... වලව්වක් උනත් කාලයක් නිකම් තියෙනකොට ඉලව්වක් වෙනවා..."

"සුගතන් කියන්නේ වලව්වේ හොල්මන් තියෙනවා කියලාද?"

වහෙන් ඔරෝ සුගතන් කියන කිසිදෙයක් නොවැටහුණු අර්චනා කෙලින් ඇසුවාය.

"මං ඔය හොල්මන් විශ්වාස කරන මිනිහෙක් නෙමේ නෝනා... මෙච්චර කාලෙකට මට කවදාවත් හොල්මනක් මූණට මුලිච්චි වෙලා නෑ..."

සුගතන් කියන්නේ බොරුමත් නොවේ. සමහර අමාවක දවස්වලටත්, පුරහඳ පායා ඇති දවසටත් එහෙන් මෙහෙන් අමුතු සද්ද ඇහෙනවා ඇත්තය. ඒත් කවදාවත් තාමත් සුගතන් හරියාකාරව හොල්මනක් නම් දැක නැත.

සුගතන් කීවේ සියයට සියක් ඇත්ත වේවා, නොවේවා අර්චනාගේ හිත නිවිණ.



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"මෙච්චර කාලයක් මෙහෙ උන්න එකේ... වලව්වේ අමුතු දෙයක් තියෙනව නම් සුගතන් ඒක දකින්න ඕනනෙ..."

ඈ හිතුවාය. අර්චනාට සැණින් පෙරදා රැය සිහිවිය. බොලක්කය හෙළවන හඬ, වතුර කැලතෙන හඬ සිහිවිය. සමහර විට ඒ සියල්ල හිතින් මවාගත් ඒවා වෙන්නට පුළුවන. අර්චනා හිතුවාය. නුදුරේම කේසර වලව්ව ඇතුලේ සිදුවීමට නියමිත අද්භූත සිදුවීම් ජාලය පිළිබඳ කිසිවක්ම නොදත් ඈ එසේ හිතා හිත සැහැල්ලු කර ගත්තාය.

■ ■ ■ ■ ■ ■

කේසර වලව්ව පිළිසකර කලයුතුය. ඇත්තටම තිබුණේ දොර ජනෙල් හා තරප්පුව ඔප දැමීමත් බිත්ති නැවත පින්තාරු කිරීමත්ය. ගෙන්වාගත් කොන්ත්‍රාත්කරුවන්ට අදාල උපදෙස් දෙමින් රවිශ්ක මිදුලේ උන්නේය. අර්චනා ගහකොළ පිස එන සනීප සුළඟ විදිමින් උන්නාය.

"මේ තියෙන කලර්ස් දෙකම බිත්ති වලට හොඳයි... මට ඕන කරන දේවල් ටික ලියලා දෙන්නකො..."

රවිශ්ක කීවේය. ඒ ප්‍රධාන බාසුන්නැහේටය. තාමත් විසිවන වියේ පසුවන ගෝලයෝ හතර දෙනාගේ ඇස් තිබුණේ වෙනතකය. රවිශ්ක හැරී බැලුවේ ඒ අතය.

අර්චනා !

ඈ කොහොඹ ගස් අතර ඇවිදිමින් උන්නාය. දම්පාට කලිසමට සුදු කුර්තා කමිසයක් හැඳ කොණ්ඩය විදා උන් ඈ සිතුවමක් තරමට සොඳුරුව පෙනිණ.

"මගෙ කෙල්ල..."

The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

රවිශ්කගේ හිතේ ආඩම්බරයක් පිරිණ. අර්චනා ළඟ ඇත්තේ පිරිමි ඇසක් අලවා බැඳ දමා ගන්නා විදිහේ අමුතු ලස්සනකි.

"ඕගොල්ලන්ට වලව්ව පිටිපස්සෙ කාමරේක නතර වෙන්න පුළුවන්... සුගතන් මේ කට්ටියට කාමරේ පෙන්නන්නකො..."

www.sl-unlimited.com Sumee

රවිශ්ක කීවේ පිරිමින්ගේ අවධානය අර්චනා කෙරෙන් මුදවාගන්නය.

මොණරෙකුගේ කෑගැසීමක් පළාතේ නිසල බව සුණු විසුණු කළේය. අර්චනා මොහොතකට උන් තැනම ගල් ගැසිණ. මොනරා ලස්සන බව හැබෑය. ඒත් උගේ හඬ ! ඒ හඬ අර්චනා බිය වද්දයි.

"මේ සතා කෑගහද්දි මට මහා පාළු මුසල ගතියක් දැනෙන්නේ..."

අර්චනා හිතුවාය. රුස්ස ගස් අතරින් පෙරී එන හිරු එළිය විඳිමින් අර්චනා තව ටිකක් ඉදිරියට ගියාය. ඇහැපේනමානේ එක යායට ඇත්තේ කේසර වලව්වේ ඉඩකඩම්ය. දැන් ඒවා තමන්ගේත් රවිශ්කගේත් නොවේද? එහෙම හිතද්දී අර්චනාට දැනෙන්නේ අමුතු සතුටකි.

"සර... සර... සර..."

වියළි කොළ පොඩිවෙන පෑගෙන සද්දයක් ඇසිණි. අර්චනා ගැස්සිණ. ඈය වටපිට බැලුවාය. ඒත් පේන තැනක කිසිවෙකු නොවේ.

රුස්ස ගහකොළ මතින් ගිළිහෙන වියළි කොළ තට්ටුවක් පොළවට මතුපිටින් තිබිණ. වලව්වත්තේ ඇවිදින කාගේ



SL UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

උනත් පයට මේ කොළ රොඩු පෑගී බිදේ. තමාට ඇහුණේ ඒවාගේ හඬකි. අර්චනාට විශ්වාසය. ඒත් ඒ කව්ද? අර්චනා හෙමිහිට හිස හරවා වටපිට බැලුවාය. ලොකු මාදං ගහයට පඳුර හෙළවිණ. අර්චනාගේ අතක් පපුවට ගියේ නිකම්මය.

www.sl-unlimited.com Sumee

"ක...ව්....ද? ....කව්ද... ම...න...න..."

අර්චනා බයටම ඇසුවාය. පඳුරින් එළියට පැන්නේ හාවෙකි. දුඹුරු සුදු මිශ්‍ර ඝන ලොම් තට්ටුවක් ඇති හාවා අර්චනා දෙස බැලුවේ කන් උස්සාගෙනය.

"අනේ පැටියො උඹද මාව බය කළේ...?"

අර්චනාගේ හිත සැහැල්ලු විය. අනතුරක් ඉව වැටුණා වාගේ හාවා පිම්මක් දෙකක් පැන පඳුර තුළ සැඟවිණ.

"හරි දඟයෙක් !..."

අර්චනා තවත් ටිකක් ඉදිරියට ගියාය.

"සර... සර... සර..."

විශ්වාසය. නැවතත් අර කොළ පෑගෙන හඬය. ඒ කවුරුන්ද? අර හාවාමද? නැත ඌ පැනගියේ වෙනතකය. මේ හඬ එන්නේ තමාගේ දකුණු පැත්තෙනි. අර්චනා තේරුම් ගත්තාය. ඈ ගෙල හැරවූයේ බියෙනි.

සෙවණැල්ලක් ! සෙවණැල්ලක් වාගේ ඡායාවක් දුවැන්න කොහොඹ ගහකට මුවාවිය. අර්චනා ගැස්සිණ. ඈ තමා ආ දුර හැරී බැලුවාය.. කේසර වලව්ව පේන්නේ දුරිනි. නොදැනුවත්වම තමා මීටර පන්සීයක් විතර දුර ඇවිදගෙන ඇවිත්ය. අනාරක්ෂිත බවක් - මහා බියක් අර්චනාට දැනිණ. සුගතන් වත්තට තනියම එන්න එපායි තමාට අවවාද කළා නොවේද?

SL UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"සරස්... සරස්..."

එවර - අර්චනා පිටුපස බලා යලි ඉදිරිය බලන පමාවට අර ඡායාව කොහොඹ ගහින් තවත් ගහකට මුවාවිය. මෙවර පෙරටත් වඩා හොඳින් අර්චනා ඒ දුටුවාය.

Sumee
www.sl-unlimited.com

"ක...වි...ද?..."

අර්චනා ඇහුවේ වෙව්ළන හඬකිනි. ඒ කට හඬින්ම ඇය කොයිතරම් බියපත්ව උන්නාද තේරේ.

"කව්ද... ඔ...ය...?"

අර්චනා නැවත ඇසුවාය. ඒත් පිළිතුරක් නැත. ඇස් ලොකු කරගෙන මුව ඇරගෙන අර්චනා ඒ ගහ දෙසම බලා උන්නේ ගල් ගැසීය. වම් පැත්තේ කොහොඹ ගහේ වසා උන් කුරුලු ගොයෙක් අත්තටු විහිදා පියඹා ගියේ අර්චනාගේ හිස ළඟිනි.

"ඊය්..."

කැගසාගෙන අර්චනා ආපසු හැරිණ. කුරුල්ලා මොකාද අර්චනා අඳුනන්නේ නැත. ඒත් ඌ අත්තටු විදාගත් කළ උකුස්සෙක් වාගේය. හිස ළඟින් පියඹා ගියේ මුහුණේ ගෑවී නොගෑවීය. අර්චනා කේසර වලව්ව තෙක් දුර දිව්වේ පසු නොබලාය.

"හිහ්... හිහ්... හිහ්... හී..."

ඡායාව සැඟව ගිය දූවැන්ත ගහ මුල අඳුරින් නැගුණු ඒ වියරු හිනාහඬ ඒ හින්දා ඇයට නෑසිණ.

හතිදාගෙන අර්චනා වලව්වට ගොඩවිය. සුගතන්ගේ පණිවිඩයට වඩුබාසුන්නැහේ ඇවිත්ය. රවිශ්ක උන්නේ ඔහු

SL UNLIMITED E Books
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

එක්කය.

"අර්චනා..."

තාමත් ඇස් ලොකු කරගෙන පපුවට අතකුත් තියාගෙන හතිදමන අර්චනා දෙස රවිශ්ක බැලුවේය.

www.sl-unlimited.com Sumee

"මොකෝ මේ..."

ඔහු ඇසුවේ පුදුමයෙනි.

"මං මේ ටික වත්තේ ඉඳලා දුවගෙන ආවෙ..."

අර්චනා මුහුණට හිනාවත් මවාගත්තාය. රවිශ්කට කියා පලක් නොවේ. ඔහු කිසිවක් විශ්වාස කරන්නේ නැත. පෙරදා රැයේ දොර වැසූ කාමරයෙන් ආ හඬත් ඔහු විශ්වාස කළේ නැත.

"අපි අර කාමරේ දොර අරින්න හදන්නෙ... බාසුන්නැහේ යං උඩට..."

රවිශ්ක ඉස්සර විය. බාසුන්නැහේ ඊට පස්සෙනි. අර්චනා ඊටත් පස්සෙනි. පටු කොරිඩෝව කෙලවර පලු දෙකේ දැවැන්ත දොර නිසලව උන්නේය. ගල් ගැහී වගේය. ආම්පන්න මල්ල දිග හැරගෙන බිම දණගහගෙන බාසුන්නැහේ අගුල අරින්නට සූදානම් වූවාය. අර්චනාත් රවිශ්කත් පිටුපස්සෙනි.

"මීට වඩා පරණ අගුල් මං ඇරල තියෙනවා මහත්තයො... මේක උනත් මං හිතන්නේ ජේන විදිහට අවුරුදු සීයක් දෙසීයක් පරණ අගුලක්... කාලයක් යනකොට නිතර ඇරෙන්නෙ වැහෙන්නෙ නැති වුණාහම ජනෙල් අගුලක් උනත් හිරවෙනවා... ඒක හැටි..."



SL UNLIMITED E-BOOKS
The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

බාසුන්නැහේ කීවේය.

ඉස්කුරුප්පු නියනක් අතට ගත් ඔහු එහි සිහින් තුඩ සීරුවෙන් යතුරු හිලට බස්සනවා එහා මෙහා කළේය. එවිට දොර පලු දෙකම සෙලවිණ.

www.sl-unlimited.com Sumee

අර්චනා බැලුවේ මේ දොරට ඉහලින් බිත්තිය දෙසය. හරියටම දොරට ඉහලින් බිත්තිය මැද එල්ලා තිබුණේ ගෝණෙකුගේ හිසකි. අඩි එකහමාරක් පමණ දිගට වැවුණු අං තට්ටුව දෙපසට විහිදී තිබුණේ වියලී ගිය දර ඉපල් දෙකක් වගේය. ඒත් ඒවායේ තියුණු කෙරවලවල් මනාව ඔප වැටී තිබිණ. බාසුන්නැහේ අගුල කරකවන පාර දොර උළුවස්ස පමණක් නොවේ අර ගෝණ අං තට්ටුවත් සෙළවේ.

"ටකස්..."

ඒ අගුලය. රවිශ්ක බැලුවේ අගුල ඇරුණාද කියාය. නොවේ. ඉස්කුරුප්පු නියනේ ලී මිට කැඩී ගිහින්ය.

"හරි වැඩේනෙ... මේක මේ අලුත් එකක්... මෙහෙම කැඩිලා යන්න බාල එකකුත් නෙමේ... එකපාරටම කැඩුණා..."

බාසුන්නැහේ කැඩුණු ඉස්කුරුප්පු නියනේ කෑලි දෙක අතේ තියාගෙන කීවේය.

"අලුතින් එකක් ගෙන්න ගන්න වෙයිද බාසුන්නැහේ..."

රවිශ්ක සැකයෙන් ඇහුවේය.

"ඕන්නෑ මහත්තයෝ... මා ළඟ බඩු තියෙනවා..."

අම්පන්න මල්ල ඇවිස්සූ බාසුන්නැහේ තව ඉස්කුරුප්පු නියනක් අතට ගත්තේය. එහි තුඩ තරමක් මහතය. ඒ



SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

හින්දා යතුරු කට ඇතුලට රිංගාගන්නට ඔහුට මහත් වෙහෙසක් දරන්නට සිදු විය.

"කට... කට... කට..."

ඒ හඬින් දොර පලු දෙක සෙළවිණ. අර්චනා උඩ බැලුවාය. ගෝණ හිස පෙරටත් වඩා තදින් හෙලවිණ. හෙලවී හෙලවී තිබී අන්තිමේදී එය එල්ලා තිබු ඇණයෙන් ගිලිහිණ.

"ඔ...න්...න... !"

අර්චනාට කෑගැහිණ. හැමෝගෙම ඇස් සැණින් ඉහල සිට වැටෙන ගෝණ හිසට යොමුවිණ. ඒත් පමා වූවා වැඩිය. එය බිම වැටුණේ තියුණු අගකින් අගුල දරා උන් බාසුන්නැහේගේ දකුණත අඩියක් පමණ දිගට සිදුර කරගෙනය.

"අම්මෝහ්... !"

බාසුන්නැහේ මරහඬ දුන්නේය. අතේ පැලුණු විවරයෙන් නොනවත්වා ලේ ගැලුවේය.

"ජංජාලයයි... !"

සුගතන් අතින් නළලට ගහගත්තේය.

"සුගතන් විගහට රෙදි කෑල්ලක් ගෙන්න..."

බාසුන්නැහේ වත්තත් කර ගනිමින් රවිශ්ක කෑගැහුවේය. සුගතන් පිම්මේ පහලට දිව්වේය. රවිශ්ක බාසුනැහේව හිමිහිට බිම ඉන්දුවේය.

"අප්පච්චියේ ඉන්න බෑ... කැක්කුමයි..."



Scanned by CamScanner

බාසුන්නැහේ විලාප දුන්නේය. පැලුණු අතින් ලේ දහරාවක් බිම දිගේ ගලා ගියේය. සුගතන් වතුර භාජනයකුත් පිරිසිදු රෙදි කිහිපයකුත් උස්සාගෙන දුව ආවේය. පිරිමින් දෙන්නා එකතුව බාසුන්නැහේගේ අත සීතල වතුරින් සෝදා තවත් රෙදි කඩකින් බැන්දෝය. අර්චනා සියල්ල දෙස බලා උන්නේ බිත්තියට හේත්තු වීගෙනය.

www.sl-unlimited.com Sumee

"සුගතන් බාසුන්නැහේ පහලට එක්ක යමු... වවුමට ගිහින් බේත් ටිකක් දාගම්මු... මං කාරෙක එළියට ගන්නං..."

අවිශ්ක වේගයෙන් තරප්පුව බැස්සේය. බාසුන්නැහේව වත්තන් කරගෙන සුගතන් හෙමින් හෙමින් ඒ පැත්තට ගියේය.

අර්චනා ගල්ගැහි උන්නාය. ලේ තැවරුණ ගෝන හිස ඇගේ දෙපාමුලය. එහි බියකරු තියුණු උල් මතට හිරු එළිය වැටී බැබළිණ.

"ජබොග්... !"

අර්චනා පස්සට විසිවිණ. ඒ හඬ ආවේ වැසූ දොරට ඇතුල් පැත්තෙනි. වැරදීමක් නොවේ. ජලය මතුපිටට බරතියමක් වැටෙන හඬකි. අර්චනාගේ දෙපය පණ නැතිවිය. මේ කාමරය ඇතුලේ අමුතු යමක් සිදුවේ. දැන් අර්චනාට එය විශ්වාසය. ඒත් ඒ කුමක්ද? ඇයට හිතාගන්න බැරිය.

"නෝනා... !"

සුගතන් ආපහු තරප්පුව නැග්ගේය. මරුවිය පිටව යන හඬ අර්චනාට ඇහිණ.

"මේ මනුස්සයගෙ ආම්පන්න මල්ලත් මෙතන..."

විසිරී තිබූ ඉස්කුරුප්පු නියන්, මිටි, කුඩා කියතක් ආදිය



SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

යළි මල්ලට එකතුරගනිමින් සුගතන් කීවේය.

"නෝනා... !"

බඩුමල්ල අතකට ගෙන සුගතන් අර්චනා දෙස බැලුවේය. ඇගේ මුහුණ රතු වී දහඩියෙන් පෙඟී තිබිණ.

"මේ සිද්ධ වුණේ මහා අසුභ දෙයක් නෝනා...! කරදරයක් අත ළඟ කියලා මට හිතෙනවා... කේසර වලව්වට මොනවා වෙන්න යනවාද කියලා දන්නේ දෙයියො තමයි..."

සුගතන් කීවේ ගෙබිම විසිරි ලේ රෙදි කෑල්ලකින් පිහදමන අතරේය.

අර්චනාගේ හිත සැළිණ. ඈ ඒ බියපත් ඇස් වලින්ම කේසර වලව්වේ උස් වහල හා නිහඬ බිත්ති දෙස බලා උන්නාය. අනාගතයට සෙතක් පතා ආ තැනින් ජීවිතය සුබ අසුබ දෙකෙන් කොයි පැත්තට පෙරලේද ඇයට හිතාගත නොහැකි විය.

■ ■ ■ ■ ■ ■ ■

බාසුන්නැහේගේ අතට මැහුම් අටක් දමා තිබේ. ඔහු වාට්ටුවට ඇතුලත් කර ඇත.

"අතින් ගොඩක් ලේ ගියානෙ... ඇතුලට ගන්නකොටත් බාසුන්නැහේ උන්නේ කලන්තෙ දලා..."

පෙරලා පැමිණි අවිශ්ක කීවේය. ඔහු සුගතන් ලේ පිසදමා පසෙක තැබූ ගෝන හිස අතට ගත්තේය.

"මෙච්චර කල් බිත්තියෙ එල්ලිලා ඉදලා මේකත් ඒ වෙලාවෙම ඒ මනුස්සයාගෙ ඇඟට වැටුණානෙ..."



Scanned by CamScanner

ඔහු කම්පා විය.

"ඒක ඒ මිනිහාගෙත් වෙලාව මහත්තයෝ... අපි තුන්-දෙනාම ඔතන හිටියා... කෝ අපට මොකවත් උනැයි... කරාපු කරුම එලදෙන කොට ලීයක තීන්තෙන් ඇඳපු නයි රූපෙටත් පණ එනවා කියල අහල නැතෙයි..."

www.sl-unlimited.com Sumee

සුගතන් කීවේය.

"ඒ කතාව මොකද්ද සුගතන්... මං අහල නෑ..."

අර්චනා කීවේය.

"මාත් අහලා නෑ..."

රවිශ්ක කීවේය.

"ඒක බොහොම පරණ කතාවක් මහත්තයො... එක මිනිහෙකුගේ වෙලාව බලපු නැකැත් කාරයෙක් කිව්වලු අහවල් දවසේ දහවල් වෙලාවට නයි විෂකින් මේ මනුස්සයා මැරෙනවය කියල..."

සුගතන් කතාව පටන් ගත්තේය.

"ඉතිං..."

අර්චනා හූමිටි තිබ්බාය.

"මොනාද ඉතිං මේ මනුස්සයා ඒ දවසේ ඒ වෙලාව වෙනකොට මුහුද මැද්දේ නැවක හිටියාලු... ගොඩබිමේ හිටියොත්නේ සර්පයින්ට අහුවෙන්නේ කියලා... දැන් ගොඩබිමෙත් ගොඩක් ඈත මුහුද මැද නැව නැංගුරම් දාගෙන ඉන්නවා... මේ මනුස්සයාගේ පිරිවරත් සර්පයෙක් කොහෙන් හරි මතුවෙයිද



The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

කියන හිතේ සැකේට ආයුධත් ලැස්තිකරගෙන රැකගෙන ඉන්නවා... ඔන්න දන්නම් නයෙකුට තියා කුඹියෙකුටවත් මිනිහට කිට්ටුකරන්න බැරි තරමට මිනිහට ආරක්ෂාවයි ! මා ළඟට නයෙකුට තියා කුඹියෙකුටවත් කිට්ටුකරන්න බෑ කියලා මිනිහත් සතුටින් හිටියා..."

www.slunlimited.com Sumee

අර්චනාවත් රවිශ්කවත් සුගතන්ට බාධා කළේ නැත. මේ කතාන්දරය ඒ තරමට ඔවුන්ට රහ වැටී තිබිණ.

"කියපු වෙලාවත් ආවා... ඒත් තමන්ට ඔය කියන නයි විෂෙන් හානියක් නොවන වග දන් මේ මනුස්සයාට හොඳටම විශ්වාසයි... මේ මෝඩයා කරපු දේ දන්නවාද?"

උත්තරයක් බලාගෙන වාගේ සුගතන් මොහොතක් තරුණ යුවල දෙස බලා උන්නේය.

"මේ මනුස්සයා කළු තින්තෙන් නැව් තට්ටුවේ නයෙක්ගෙ රූපෙ ඇන්දා... කෝ මට දෂ්ට කළාද? හු... හු... මට දෂ්ට කළාද කියල විහිළු කර කර අර නයිරූපෙ පෙනේ උඩ විෂ දළ තියෙන තැනට ඇඟිල්ලෙන් ඇන්නා... හොඳම වැඩේ උනේ අන්න ඒ වෙලාවේ... මේ නැව් තට්ටුව හදල තිබ්බෙ තනිකරම පොල්ලීයෙන් නයාගේ රූපෙට ඇණුපු ඇඟිල්ලට පොල් කීරක් ඇනිලා ලේ විද්දා... නැවේ උන්න වෙදා මරහඬදෙන රෝගියව පරික්ෂා කරලා බලල කිව්වේ දවසයි හෝරාවයි අනුව පොල් කීර උනත් නයිවිෂ දෙනවා කියලා... ඔය කියපු නයි විෂ වේගයෙන් මිනිහගෙ ඇග ඇතුළෙ පැතිරුනා... හරියට වෙදකමක් කරන්නත් කළින් උන්දෑ පරලොව ගියා... වෙලාව ආවාම සත් සමුදුර මැද්දෙ හිටියත් හැංගෙන්න බෑ මහත්තයෝ..."

සුගතන් කතාව නිම කළේය.

රවිශ්ක බැලුවේ අර්චනා දෙසය. ඈ බර කල්පනාවකය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

පෙම් කල කාලේ දුටු දඟකාරිය රවිශ්කට සිහිවිය. ඈ ගෙවූයේ කුරුලු පිහාටුවක් තරම් සැහැල්ලු දිවියකි. මොරගොල්ල මැදුරේ උන් සමනළිය අර්චනාය. මේ හදිසි විවාහය - ඉන්පසු ඇවිත් වැටුණු තැන ඇගේ ඔළුවට අමතර බරක් එක් කළාද?

www.sl-unlimited.com Sumee

"අර්චනා..."

රවිශ්ක අර්චනාගේ අතක් මත අත තැබුවේය. සුගතන් කුස්සිය දෙසට ලිස්සා ගොස් තිබිණ. අර්චනා ගැස්සිණ. ඈ නෙත් පිහාටු සලා රවිශ්ක දෙස බැලුවේ ඒ තිගැස්ම බැල්මේ තියාගෙනය.

"ඇයි අර්චි... කොච්චරවත් බය වෙලා වගේ..."

"මගෙ හිතට අමුත්තක් දැනෙනවා රවී..."

අර්චනා කීවාය.

"තාත්තට හරි එයාගේ සෙට් එකට හරි අපි අහුවෙයි කියලා බයද?..."

රවිශ්ක අර්චනාගේ සිතුවිලි ඉව කළේය.

"නෑ... අපි මේතරම් දුරකට එන්න ඇති කියලා තාත්ති කියටවත් හිතන එකක් නෑ... අවුරුදු දෙක තුනක් ගිහින් තාත්තිට අහු උනත් කමක් නෑ... එතකොට ඔය තියෙන තරහා නිවිලා තියෙයි. මට බය ඒක නෙමෙයි..."

අර්චනාගේ මුහුණ මැලවී තිබිණ.

"එහෙනං..."

"මට ඒක පැහැදිලි කරන්න තේරෙන්නෑ රවී... ලොකු



SL - UNLIMITED eBook The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

අනතුරක් අතළඟ කියලා මට හිතෙනවා... අපි නොදන්නා මොනා හරි අපි වටේ සිද්ධ වෙනවා කියලා මට හිතෙනවා රවී..."

"ඔයා සුගතන්ගේ කතා අහලා බයවෙලා අර්චි..."

"නෑ..."

"එහෙනං..."

"ඊට වඩා දෙයක් මට දැනෙනවා..."

හිතට දැනෙන්නේ ලොකු බියකි. ඒ බිය මේ කේසර වලව්ව වටා එතුණකි. මේ ඔහු තෝරාගත් තැනය. සාර්ථක අනාගතයක් ගොඩ නගන්නට පියවර තැබූ තැනය. ඒ හින්දා හිතට දැනෙන ඉතිරිය අර්චනා ඉදිරියට නොදී රැක්කාය.

"යං... කෑම කාල නිදාගමු... මට අද හරි මහන්සියි..."

රවිශ්ක කීවේය.

කෑම මේසයට යැවූ සුගතන් පිට කාමරයේ නවාතැන් ගෙන උන් පිරිසට කෑම බෙදා යවනවා රවිශ්ක දුටුවේය.

"හෙට ඉඳලා පේන්ට් වැඩ පටන් ගන්න යන්නේ... ඉක්මණට අපිට හොටෙල් එක ඕපන් කළ හැකි..."

කෑම ගන්නා අතරේ රවිශ්ක කීවේය. මේ අනාගත හීන කවදා හෝ හැබෑවනු ඇත. අර්චනාට එය විශ්වාසය. රවිශ්ක ව්‍යාපාරික කටයුතු වලට දක්ෂය. ඔහු දහඩියෙන් උත්සහයෙන් ඉහලට ආ කෙනෙකි. ඒ හින්දා ඒ ගැන බයක් නැත. අර්චනාගේ හිත පෙලුනේ නොදන්නා යමක් ගැන බියෙනි.

www.sl-unlimited.com Sumee



The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

වෙනදා තරම් කෑම පිරියක් අර්චනාට නොවිණ. ඈ රවිශ්කට තුරුළුව නිදාගත්තත් ඇහැපිය වූණේ බොහෝ වේලාගතවය.

"මාලතී මැණිකෙ..."

කවුරුන් හෝ එහෙම කීවා අර්චනාට ඇහිණ. ඒ කටහඬ ඉතා හුරුය.

"මාලතී මැණිකෙ..."

ආයිමත් ඒ කටහඬය. විශ්වාසය. ඒ කතා කළේ තමාටය. ඒ නම ඇහෙන්නේ ජීවිතේ මුල් වරටය. ඒත් ඒ හඬගාන්නේ තමාටයැයි අර්චනාට හිතිණ.

"මැණිකේ මං මෙහේ... මං මෙහේ හිරවෙලා මයෙ මැණිකෙ..."

වේදනාබර ඒ පිරිමි කටහඬ එන්නේ කේසර වලව්ව ඇතුලෙනි. ඒ අර දොර වසා දමා ඇති කාමරය තුලිනි.

"අනේ මැණිකේ මාව බේරගන්න... මං මෙතන හිරවෙලා..."

අර්චනා ඒ කාමරය තුළ දුටුවාය. දොරින් එහා වූයේ මැද මිදුලකි. වහලක් නැති ඇතුලත උස් අවකාශය පෙනිණ. මිදුල මැද ළිඳකි. ගැඹුරු ළිඳකි. තනමත්තක් උසට බැම්ම බැඳ බොළොක්කය දමූ ළිඳකි. ළිඳට ළංවීමට නම් පහලට බැසිය යුතුය. එයට කවාකාර පඩි පෙළකි.

"මැණිකෙ මං මෙහේ... මයෙ මැණිකෙ මං මෙහේ..."

සද්දය එන්නේ ළිඳ ඇතුලෙනි. අර්චනා පඩිපෙළ



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

බැස්සාය. ළිඳ තුලට එබුණාය.

ළිඳ ඇතුලේ බොලොක්කයෙන් එල්ලී තිබුනේ තිරුවත් පිරිමි සිරුරකි. අර්චනා දුටු ඒ නෙත් ඇරිණ.

www.sl-unlimited.com Sumee

"මාව බේරගන්න මාලතී මැණිකෙ..."

ඇස්වල කඳුළු තියාගෙන නාඳුනන පිරිමියා අර්චනාට කීවේය.

"අම්මේහ් !..."

අර්චනා විලාප දුන්නේය. ලොකු විලාපයක් නගාගෙන ඇය ඇඳ මත හිඳ ගත්තාය. රවිශ්ක ඇහැරුණේ අර්චනාගේ විලාප හඬටය.

"අර්චනා... ඇයි?..."

රවිශ්ක ඇහුවේ අදහාගන්න බැරිවය.

එය සිහිනයකි. ලේසි පහසු සිහිනයක් නොවේ. හිත බියවද්දන සිහිනයකි. අර්චනාට හැඬිණි. දෙදණ නවා ඒ මත මුහුණ හංගා අර්චනා හඬා වැටුණාය.

"අර්චි ඇයි...? "

රවිශ්ක අන්දමන්දව උන්නේය.

"අඬන්නැතුව මොනාද වුණේ කියන්නකො..."

ඔහු අර්චනාව වැළඳගත්තේය.

"රවී... අර කාමරේ ඇතුළෙ ළිඳක් තියෙනවා... අර වහලා

SL-UNLIMITED E-Book.m The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

තියෙන කාමරේ ඇතුලේ ළිඳක් තියෙනවා..."

අර්චනා හඬමින් කීවාය.

"ඒක වෙන්නේ කොහොමද බබා... කාමරයක් ඇතුළේ ළිඳක් තියෙන්නේ කොහොමද? ඔයා හීනයක් දැකලා..."

www.sl-unlimited.com

රවී කීවේය.

"ඒක හීනයක් තමා... ඒත් ඒක බොරුවක් නෙමේ... ඒ කාමරේ ඇතුළෙ ළිඳක් තියෙනවා... ඔය දොරින් එහා පැත්තේ තියෙන්නේ මැද මිදුලක්... පරණ වලව්වල තියෙන විදියේ මැද මිදුළක්... ළිඳ තියෙන්නෙ එතන..."

අර්චනා කීවාය. බිරිය කියන දේ පිළිගත යුතුද? නැතිද? රවිශ්ක දෙලොවක අතරමං විය.

"රවී... මාව විශ්වාස කරන්න රවී... මං දැක්කා ඒ ළිදේ බොලොක්කේ මිනිහෙක් එල්ලිලා ඉන්නවා... ඒ හරිය හීනයක් කියමුකො... ඒත් ඒ කාමරේ ඇතුලේ ළිඳක් තියෙන්න බැරිද?..."

අර්චනා ඇසුවාය.

"හීනයක් ටිකක් හරි ඇත්ත වෙන්න බැරිද?..."

අර්චනා නැවත ඇසුවාය.

"හරි අර්චි... අපි ඔය ප්‍රශ්නෙ හෙට විසඳගමු..."

"ඒ කොහොමද?..."

"මං හෙට දොර කඩනවා... වැඩට ආව ජේන්ට් බාසුන්නැහෙයි ගොලයොයි ඉන්නවා නේ... ඒ ගොල්ලො උදවු

SL UNLIMITED E BOOK The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

වෙයි... දොර කඩලා අපි බලමු... ඇතුලෙ මොනාද තියෙන්නේ කියලා... එතකොට ඔයාගේ හිතේ සැකෙත් නැනෙ... අපි දෙන්නට මීට වඩා සැනසීමෙන් නිදාගන්න පුළුවන් වෙයි..."

රවිශ්ක අන්තිම ටික කීවේ මූණේ හිනාවකුත් එක්කය.

www.slsumee unlimited.com

"එළිවෙන්න තව ගොඩක් වෙලා තියෙනවා අර්චි... දැන් ඕක අමතක කරලා නිදාගන්න..."

රවිශ්ක කීවේ ඇඳේ යළි ඇලවෙන අතරය.

අර්චනා ඔහුට තුරුලුව ඇඳේ වැතිරිණ. එහෙත් නින්ද ඇය වෙත නොවිණ.

හෙට - හෙට මේ කතාවේ ඇත්ත නැත්ත දැනගන්න ලැබෙනු ඇත. ඒ දොරින් එහා තමා දුටුවා වාගේ කිසිවක් නැත්නම් ප්‍රශ්නයක් නැත.

එහෙත්... ඒ දොරින් එහා තමා දුටුවා වාගේ ළිඳක් මැද මිදුලක් තිබුණොත් ? අර්චනා ඒ ගැන හිතන්නට පවා බිය වූවාය.

■ ■ ■ ■ ■ ■

උඩු මහලින් ඇහෙන නාන ප්‍රකාර ශබ්ද වලට කන්දීගෙන අර්චනා පහල මාලයේය. රවිශ්කත් පින්තාරු බාසුන්නැහේගේ ගෝලයෝත් උඩු මහලේය. පැයක් හෝ දෙකක් ගෙවෙන්නට ඇත. මේ දහිරිය දාන්නේ අර වැසූ දොර ඇරගන්නය. කේසර වලව්වේ දෙපෙති දොරවල් ඒ තරමට සවිමත් ය. ලොකු රහසක් හංගාගත් මේ කාමරේ දොර ඔක්කෝම දොරවල් වලට වඩා සවිමත්ය.

"දඩස්..."



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

මොහොතකට කේසර වලච්ච දෙදරා ගියාසේය.

"ඇරුනා..."

අර්චනාගේ හිත කීවේය. අර්චනා හොඳින් කන්දුන්නාය. ඊළඟ තත්පරය පුදුම තරම් නිහඬය. උඩුමහලින් නැගෙන ඊළඟ හඬ අහන්නට අර්චනා හොඳින් කන් දුන්නාය. එහෙත්... මුළු කේසර වලච්චම නිහඬය. ඒ නිහඬබව අත්භූතය. ඇරුණු දොරින් එහා ඔවුන් මොනවා ඇහැට දකින්නට ඇත්ද? අර්චනාගේ හිත නොඉවසිල්ලෙනි. ඇ තරප්පුව තෙක් ඇවිද ආවාය.

පලමුව තරප්පුව බැස්සේ රවිශ්කය. කෙළින් ඒ මුහුණ දැකී අර්චනා තිගැස්සිණ. රවිශ්කගේ ඇස් මත වූ තැතිගැන්ම අර්චනාට නොවැටහිණ.

"රවී..."

ඇ කීවේ සෙමිනි.

"දොර ඇරුණා අර්චනා..."

රවිශ්ක කීවේය. ඒ ද සෙමිනි.

"ඉතිං...?"

අර්චනාගේ ඇස් රවීගේ මුහුණ මතම ඇලවී තිබිණ.

"ඔයා හරි අර්චනා..."

රවී පරාජිත හඬකින් කීවේය.

"ඒ කිව්වෙ?"

"ඒ කාමරේ ඇතුලෙ ළිඳක් තියෙනවා..."



www.sl-unlimited.com
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අර්චනාගේ ආත්මය වෙව්ලා ගියාය.

"එහෙනම් ඒ ඔක්කොම ඇත්ත..."

ඇය කීවේ බියපත් හඬෙනි.

"මට කාමරේ බලන්න ඕන රවී..."

www.si-unlimited.com Sumee

අර්චනා ආයෙම කීවාය.

රවිශ්ක මෘදුව - ඉතා මෘදුව අර්චනාගේ අතක් අල්ලාගෙන තරප්පුව නැග්ගේය. ලී තරප්පුවේ දෙපය වැදී නැගෙන හඬ අර්චනාට ඇසිණ. මේ ඇහෙන්නේ පය පොළොවේ වදින හඬ නොවේ. තමාගේ හදවත ගැහෙන හඬ කියා අර්චනාට හිතිණ.

පටු කොරිඩෝව කෙළවර දොර දෙපලුව තිබිණ. තාමත් එතන උන් ගෝලයින් දෙදෙනා අර්චනාටත් රවිශ්කටත් ඉඩදී දෙපැත්තට වූහ.

අර්චනා දොරින් ඇතුළු වූවාය. ඇගේ පය තැබුණේ මැද මිදුලකටය. වහලය නැති ඉහට උඩින් පෙනුණේ අහසය. පහල බැලූ විට බොළොක්කය ඇති ළිඳය. කවාකාර පඩි පෙළක් පහලට බැසීමට තිබේ.

"කිසිදෙයක් වෙනස් නෑ..."

අර්චනා රවිශ්කගේ මුහුණ බැලුවාය.

"හැමදෙයක්ම හීනෙ තිබුණ විදියටමයි... මේ මැදමිදුල මේ අහස, මේ පඩිපෙළ, ළිඳ හැමදේම මං ඊයේ රෑ දැකපු විදිහමයි..."

අර්චනා කියවාගෙන ගියාය.

SL UNLIMITED E Book The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"මට පුදුමත් ඒකයි අර්චි..."

රවිශ්ක උන්නේ අදහා ගන්න බැරිවය.

"මට බය ඒක නෙමේ රවී..."

www.sl-unlimited.com Sumee

අර්චනා ළිඳ දෙසට එබිණ.

"ඒ හීනෙ මං දැකපු ඉතිරි ටිකත් ඇත්තද කියලයි... මං හිතන්නෙ..."

අර්චනා කීවාය.

"ඒ කිව්වෙ...?"

"අර කඹෙන් එල්ලිලා හිටපු පිරිමි කෙනා..."

"කීයටවත් ඒක ඇත්ත වෙන්න බෑ අර්චි... බලන්න ළිඳේ බොලොක්කයක් කඹයක් තිබ්බට එහෙම දෙයක් නෑ..."

රවිශ්ක කීවේය.

අර්චනා නිහඬය. ඒ ඇස් පහල පෙනෙන ළිඳ වෙතටම එබී තිබිණ. ඈ පහලට බහින්නට බිය වූවාය. මේ ළිඳ ඇතුළේ කොහේ හෝ තැනක රයේ දුටු අර කඳුළු පිරි පිරිමි මුහුණ හැංගී ඇතැයි ඈ සැක කළා.

"කිරි අප්පච්චියෙ ! "

ඒ හඬ අඹු සැමියන්ට පිටුපසිනි. සුගතත් උන්නේ කම්මුලේ අතකුත් තියාගෙනය. ඇස්දෙක කුරුම්බා ඇට්ටි දෙක වගේ ලොකුය. විට කන කට අන්තයටම ඇරිලාය. අර්චනාත් රවිශ්කත් පස්සෙන් ඉදගෙන ඔහු බැලුවෙත් උඩ අහසය. යට



SL-UNLIMITED E-BOOKS The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

ළිඳය.

"එහෙනම් ඉතිං පුදුම වෙන්න දෙයක් නෑ... මේ කාමරේ ඇතුළේ හඳ එළිය පෙනුණ එක පුදුමයක්ය..."

සුගතන්ට කියවිණ.

"කාමරේ ඇතුළෙ හඳඑළිය පෙනුණා..."

රවිශ්ක ඇහුවේ නළල රැලිකර බලාය.

"ඒ කියන්නෙ සුගතන් මීට කළින් එහෙම දෙයක් දැකල තිබුණද?"

රවිශ්ක ආයෙම ඇසුවේය. තාමට කට වැරදුණු බව සුගතන්ට තේරෙන්නේ දැන්ය.

"ආ...නෑ... මේ.... මේ..."

ඔහුට ගොතගැහිණ. දැන් ඉතිං ඇත්ත නොකියා බැරිය.

"නෑ මහත්තයො... හොඳට හඳ පායල තියෙන සමහර දවස් වලට මේ කාමරේ වහපු දොර අස්සෙන් එළියට හඳ එළිය පේනවා... ඇතුළෙ මිදුලක් තියෙන බව කවුරු දන්නවය. මං මෙච්චර කල් හිතාන උන්නේ මගෙ මනස්ගාත කියලා..."

සුගතන් විස්තර කළේය.

"සුගතන් දැකල තියෙන්නෙ එච්චරද? වෙන මොනාක්කත් දැකල නැද්ද?"

අර්චනා ඇසුවාය. ඇයට වුවමනා කළේ තමා දුටුවාසේ මිනිස් රුවක ඡායාවක් වත් ඔහුත් දැක තිබේද කියා දැනගන්නය.



www.sl-unlimited.com Sumee
SL UNLIMITED E BOOKS
The Spirit of Sri Lankans-community
Scanned by CamScanner

සුගතන් පලමුව ගැස්සිණ. එය තරුණ යුවළට හොඳින් පෙනිණ.

සුගතන්ට සිහිවුණේ සඳ එළිය මත්තේ දොරට අස්සෙන් දිස්වූ කකුල් දෙකය.

www.sl-unlimited.com Sumee

"ඊට වඩා ඉතිං අහවල් දේ දකින්නය නෝනෙ... දොර වහල ලොක්කරල තියෙන කොට..."

සුගතන් කීවේ අහක බලාගෙනය. නෝනාත් මහත්තයාත් දැනටමත් උන්නේ බයවෙලාය. තවත් බය කරන්න ඕනෑ නැත.

"අපි එළියට යං අර්චි..."

රවිශ්ක ආපහු හැරිණ. අර්චනාත් ඒ පස්සේම හැරිණ. ඒත් සුගතන් කී වචන ගැන සතපහක විශ්වාසයක් අර්චනාට නොවිණ. ඇයට හිතුණේම ඔහු ඊට වඩා දෙයක් දන්නා බවය.

"මාත් ඉතිං වලව්ව ඇතුළෙ අවුරුදු ගාණක් ඉඳපි... කව්ද දන්නෙ මේක ඇතුළෙ මෙහෙම ඉලව්වක් තියේය කියලා..."

තරුණ යුවල පිටව ගිය පසු සුගතන් හිතුවේය. දොර අස්සෙන් දුටු සඳ එළිය මේ ආකහෙන් පෙරී ආ ඒවාය. එතකොට ඒ කකුල් දෙක... ඒ නිරුවත් කකුල් දෙක කාගේද?

සුගතන්ගේ ඇඟ කිලිපොලා ගියේය. එහි අයිතිකරුවාත් මේක ඇතුළේ ඉන්න ඕනෑ නොවේද? බියපත් ඇස්වලින් වටයක් දෙකක් අවට බැලූ සුගතන් අඩියට දෙකට කාමරයෙන් පිටවිය.

■ ■ ■ ■ ■ ■ ■

කේසර වලව්වේ පින්තාරු වැඩටික බාර ගත්තේ ගුණරත්නය. ඔහුට ගෝලයෝ හතර දෙනෙකි. ගුණරත්නත්

SL-UNLIMITED E-Books The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ගෝලයෝ හතර දෙනාත් කේසර වලව්වේ පිට කාමරයේ නවාතැන් ගෙන උන්හ.

"කවද වෙනකොට වැඩ ටික ඉවර කරගන්න පුළුවන්වෙයිද බාසුන්නැහේ...?"

www.sl-unlimited.com Sumee

රවිශ්ක ගුණරත්නගෙන් ඇහුවේය. ඔහු උන්නේ හෝටලය විවෘත කරන දිනය එනතුරු ඇගිලි ගැන ගැනය.

"මේවා එහෙම කලබලේට කරන්න පුළුවන් වැඩ නෙමේ මහත්තයෝ... ගාණට මිම්මට, නූලට යන්න ඕන... කොහොමත් මාසයක් යන්න කළියෙන් මං මහත්තයට වැඩ ටික ඉවර කරළා දෙන්නං..."

ගුණරත්න කීවේය.

ඉන්දික, චමින්ද, පාල, සේනක ගෝලයින් හතර දෙනාට ගුණරත්න වැඩ පැවරුවේය. ඉන්දික සුදුපාට තීන්ත බාල්දියත් ගෙන ඉනිමඟ නැග්ගේය. පිටත බිත්තියේ තීන්ත ගාන්න කීවේ උඩසිට පහලටය.

ජනප්‍රිය ගීතයක් උරුවම්බාමින් ඔහු වැඩ පටන් ගත්තේය. මේ පැත්ත බිත්තියේ තීරු තුනේ ජනෙල් හතරකී. ඉන්දික තීන්ත ගෑවේ වැසූ ජනේලයක් ළඟය.

නිකමට ඔහු ජනෙල් වීදුරුවෙන් ඇතුල බැලුවේය. දුටු දෙයින් ඔහු තිගැස්සිණ.

"පට්ට... පට... පට..."

ඉන්දිකට කියවිණ.

වලව්වේ රෝස මලක් වැනි තරුණ නෝනා කාමරයේ

SL-UNLIMITED E-Books
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

තිදිය. කේසර වලව්වේ වැඩට ආ මොහොතේ පටන් ඉන්දික හොරෙන් හොරෙන් නෝනා දිහා ඇහැ ගහගෙන වින්දේ ලේසි පහසු රසයක් නොවේ.

අර්චනා ගැඹුරු නින්දක වැටී උන්නාය. ඊ කාලයේත් හරියට නින්දක් නැති ඈ තම අවට සිදුවන කිසිවක් නොදැනෙන ගැඹුරු නින්දක උන්නාය. ජනේලය තිබුණේ ඇතුළින් අගුල දමාය. ඒත් තිර දෙක දෙපසට ඇද දමා තිබිණ. ඒ හින්දා විදුරුව ඇතුලින් පෙනෙන නෝනාගේ සුන්දර ඉරියව්ව රස විඳින්නට ඉන්දිකට බාධාවක් නොවිණ. ඕනැවට එපාවට තින්ත බුරුසුව බිත්තියේ උලමින් ඉන්දික දුහුල් නිදන ඇඳුමින් එහා මෙහා වුණ අර්චනාගේ සුදුපාට ඇගපත දෙස ගිජුව බලා උන්නේය.

"හිහ්... හි... හිහ්... හි..."

රළු හිනාහඬක් ඉන්දිකට ඇසිණ. ඒ ඔහුගේ පිටුපසිනි. ප්‍රවේශමට ඉනිමග අල්ලාගත් ඉන්දික වටපිට බැලුවේය. තමා උන්නේ අඩිගාණක් මහපොළොවට උඩිනි. තමා වටා ඇත්තේ ගස්කොළ අතරින් ඇදී එන හුළඟ විතරය. එහෙම දෙයක් ඇහෙන්නට විදියක් නැත. මෙය මනස්ගාතයකි.

ඉනිදික ආයිමත් ඉදිරිය බැලුවේය. එවර නෝනා නින්දෙන්ම වම් ඇලයට හැරිලාය. උරහිස් පටි එහාමෙහා වී ළමැදත් මතුව පෙනේ. ඉන්දිකට දැනුණේ තම ඇගපත උණුසුම් ව එන අයුරුය.

"චටාස්..."

සිද්ධ වුණේ මොකද්ද කියා හිතාගන්නවත් කාලයක් නොවිණ. ඉන්දිකගේ කණ හරහා වැරෙන් පාරක් වැදිණ.

"ඌහ්..."



Scanned by CamScanner

නිල් කොළ රතු තරුකැට ඔහුගේ ඇස් ඉදිරිපිට විසිවිණ. වේදනාවට ඔහුට කන අතගැවිණ. ඉනිමග අත ඇරිණ.

"දඩබඩාහ්...."

ඉනිමග වැටිණ. ඒ ඉන්දිකත් එක්කය.

www.Sumee sri-unlimited.com

"බුදු අම්මෝහ් ! "

ඉන්දික මරලතෝනි දුන්නේය. අඩි ගාණක් දෙමහල් පියස්සෙන් බිමට වැටුණු ඉන්දිකගේ කොඳු ඇට පෙළ බිඳිණ. සුදු තීන්ත බාල්දිය ඔහුගේ සිරුර පුරාමත් නිල් තණ පලසේත් විසිරිණ.

"ඉන්දික වැටුණෝ.... පාල... චමින්දෝ... විගහට වරෙල්ලා..."

ගුණරත්තන කෑගැවේය. පාල චමින්ද විතරක් නොවේ. රවිශ්කත් සුගතනුත් එතනට ආවේ එක තත්පරයටය.

"ඉන්දික... ඉන්දික... මූට සිහිනැති වුණා... "

ගුණරත්න ඉන්දිකගේ කම්මුලට තට්ටු කළේය.

"බොස් මට පේන විදියට කොල්ලගේ කොන්ද කැඩිලා..."

පාල කීවේය.

"දැන් මොකද කරන්නේ බාසුන්නැහේ...?"

රවිශ්ක ඇහුවේ අන්දමන්දවය.

SL-UNLIMITED E Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"කොල්ලව ඉක්මණට ඉස්පිරිතාලෙකට ගෙනියන්න ඕන මහත්තයෝ... ජීවිතයක් නේ..."

ගුණරත්න කීවේය.

"මං කාරෙක ස්ටාට් කරන්නද?"

Sumee
www.sl-unlimited.com

රවිශ්ක ඇසුවේය.

"ඕන්නෑ... අපේ ලොරිය ඇතිනෙ... පාල උඹයි චමින්දයයි ඉන්දිකව උස්සල ගනිල්ලා... මං වාහනේ ගන්නං... සේනක අපි එනකං උඹ පුලුවන් හැටියට වැඩේ කරගෙන පලයං.."

විනාඩි දෙක තුනක් ඇතුලත රෝගියාව පටවාගත් ඩිමෝ බට්ටා කේසර වලව්වේ රූස්ස ගහකොළ අතරින් වැටුණු රතුගුරු පාරේ ඉගිළිණ.

අර්චනා ගැස්සී තිත්දෙන් ඇහැරුණාය. ඒ ඉන්දික බිම වැටෙන විට නැගූ විලාපයටය. තිත්දෙන් හදිසියෙන් අවදි වූ කම්පනය මොහොතක් දෙකක් ඇ වෙත තිබිණ. ඊළඟට ඇඳෙන් බැස්ස ඇ හඬ ආ දෙසට පියවර තැබුවාය.

"රවී..."

රවිශ්කත් සුගතනුත් ලොකු කතාවකය. විසිරුණු තීන්ත බාල්දියත් පෙරලුණු ඉනිමගත් දෙස අර්චනා පුදුමයෙන් බැලුවාය.

"මොකද උනේ... ?"

ඇ රවිශ්කගේ මුහුණ බැලුවාය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"පොඩි කරදරයක් වුණා අර්චි..."

රවිශ්ක සිද්ධිය කෙටියෙන් කීවේය. ඒ හැකිතාක් බර අඩුකරය. ඉන්දිකගේ තත්වය අමාරුය. ජීවිතේ බේරුණාත් ඔහු යළි දෙපයින් නැගිට්ටවන එක හිතන්න අමාරුය. බිම වැටී සිටි ඉන්දික දුටු පිරිමි හැම ඒකාම එය තේරුම් ගෙන උන්හ. ඒත් රවිශ්ක ඒ ඇත්ත අර්චනාට හෙළි කළේ නැත.

www.Sumee.sl-unlimited.com

"දෙයියනේ..."

අර්චනා බියපත් වූවාය. වෙච්ච දේ හරියට නොදන්නා ඈ ඉනිමගෙන් වැටුණු 'අසරණයා' ගැන දුක්වූවාය.

"මේ මොනවද වෙන්නේ රවී..."

අර්චනා බියපත් දෑසින් රවිශ්ක දෙස බැලුවේය.

"අපි වටේ මොනාද මේ සිද්ධවෙන්නේ?"

ඈ ආයිමත් ඇසුවාය.

"ඒක එක්සිඩන්ට් එකක් අර්චි... එහෙම දේවල් නොසිතපු වෙලාවට වෙනවා... මේ මනුස්සයා හරියට ඉනිමග අල්ලාගෙන ඉන්න එපායැ..."

රවිශ්ක කීවේ හිතට එකගව නොවේ.

"නෑ රවී... අපි නොදන්නා මොකක්හරි දෙයක් අපි අවට වෙනවා..."

අර්චනා කීවේ රවිශ්කත් එක්ක තනිවුණ පසුය.

"එදා අර වඩුබාසුන්නැහේ... අද පේන්ට් කරන ළමයා...



SL-UNLIMITED E-Books
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

මේ වලව්වට එන හැම කෙනාටම මේ මොකද වෙන්නේ..."

"එච්චර දුර හිතන්න එපා අර්චි... කෝ එහෙනං... අපිදෙන්නට මුකුත් වුණාද... අර සුගතන් දැන් අවුරුදු ගාණක් කේසර වලව්වේ ඉන්නවා... මොකුත් උනාද?"

රවිශ්ක ඇහුවේය. ඔහුට උවමනා කළේ අර්චනා හිතන විදිහ වෙනස් කරන්නය.

"සුගතන් මොකද ඉතිං... මොනා උනත් කම්මලේ බල්ලාට හෙණ ගැහුව වගේ තමා... සද්ද නැතුවම ඉදී... නොදන්නා ගාණට..."

කිව් අර්චනා රවිශ්ක මහහැර වලව්වට වැදිණ. රවිශ්ක කල්පනාවට වැටිණ. අර්චනා කියන්නේ නිකම්ම ඉවත දැමිය හැකි කතාවක් නොවේ. මේ කේසර වලව්ව ඇතුලේ අත්භූත යමක් සිදුවෙමින් පවතී. දැන් ටිකින් ටික රවිශ්කටත් එය තේරේ.

"කමක් නෑ... බලමුකෝ... ඕන එකෙක් එකක් හැප්පෙන්න මං ලෑස්තියි..."

ඔහු හිත හයිය කරගන්න එහෙම හිතුවේය. තමා අගුපිලේ හිඳ මන්දිරයට ආ එකාය. ජීවිතේ කොයි අතට ගහගෙන ගියත් ඔහුට බයක් නැත. ඔහු බයවූණේ ඔහු ගැන නොවේ. අර්චනා ගැනය. ඈ මැදුරක ඉපිද සැප මැද හැදුන කෙනෙකි. දුක් විඳ පුරුදු නොවේ.

"මං ඔයාව බලා ගන්නවා අර්චනා... ඔයාට මොකුත් වෙන්න මං ඉඩතියන්නෑ..."

රවිශ්ක හිතුවේය. ඇයට ආදරය කළ හිතේ ගැඹුරු තැනක ඒ සිතුවිල්ල තැන්පත් විය.



www.sl-unlimited.com
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

■ ■ ■ ■ ■ ■

බොහෝ දවසකට පසු සඳ අහසේය. අර්චනා සඳැල්ලේය. වැවත් සීගිරියත් එක සිතුවමකි. ඒ සිතුවම නෙත ඉදිරිපිටය. අර්චනා උන්නේ හුස්මකින් පවා මේ සුන්දරත්වය බිඳින්නට බයෙනි.

www.sl-unlimited.com Sumee

ඒත්....

දවැන්ත කොහොඹ ගහේ කොළ ඇතුඉති අතරේ හැංගී උන් මූකලන් බස්සා මේ කිසිවක් දැන උන්නේ නැත.

"හ්ම්... හ්ම්... හ්ම්...."

ඌ තාමත් මුණ නොගැසුණු පෙම්වතිය නමට ගැයුවේය. තමන්ගේ කටහඬ මේ මැදුරට එක් කරන්නේ කොයි තරම් භයංකාරයක් ද ඌ දන්නේ නැත. දැන උන්නා නම් අසරණ සතා කවදාවත් රැයට හඬන්නේ නැත.

අර්චනා බකමූණු හඬ ආ දෙසට හිස හැරවූවාය. අඳුර මිස - අඳුරු කීරි ගන්වන බියකරු හඬ මිස කිසිවක් ඇයට පැහැදිලි නැත. බරැති යමක් ඇගේ උරහිසේ ගැටිණ.

"ඊහ්..."

කෑගසාගෙන අර්චනා පසෙකට පැන්නාය.

"අර්චි..."

රවිශ්ක වහා අර්චනාගේ උරහිස මත තැබූ අත ආපසු ඇදගත්තාය.

SL - UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"ම්... මං බයවුණා..."

අර්චනා කීවේ පපුවට අතකුත් තියාගෙනය. මොහොතකට මේ පපුව හිරවුණා ඇයට දැනිණ.

"රවිශ්ක..."

අර්චනා ගොත ගැහුවාය. රවිශ්ක ඇගේ අතින් ඇද තුරුළට ගත්තේය.

"බය වුණා නේද...?"

ඔහු ඇසුවේ ඇගේ නළල සිපය.

"පහල බලල නැති හින්දා හොයාගෙන ආවේ..."

රවිශ්ක කීවේය.

"හඳ පායලා හින්දා මෙතෙන්ට ආවා රවී..."

අර්චනා කීවාය.

"මගෙ කෙල්ල පව්... "

ඒ මුණ දෝතට ගෙන දෑසට එබී රවිශ්ක කීවේය.

"ඇයි...?"

අර්චනා සෙමින් ඇසුවාය.

"මේ ඔයා බලාපොරොත්තු වුණ ජීවිතේ නෙමේ නෙ..."



www.sl-unlimited.com Sumee
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

[illegible]

[illegible]

'අචී... මට ඇත්ත කියන්න...'

[illegible]

[illegible]

[illegible]

[illegible]

[illegible]

'ඔව්...'

[illegible]

[illegible]

www.sl-unlimited.com Sumeet
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ගැන නොහිතාය. තමා ගැන විරතක් හිතාය. ඒ තමාගේ සතුට ගැන හිතාය.

"මට මෙහෙ හොඳයි..."

www.sl-unlimited.com Sumee

අර්චනා දැඩිව කීවාය. ඇත්තටම කේසර වලව්වේ වරදක් නොවේ. මේ වගේ සොඳුරු වටපිටාවක මේ තරම් ගාම්භිර තැනක් ලැබුණේ වාසනාවටය. වරද ඇත්තේ කේසර වලව්වේ නොවේ. ඒ වටා සිදුවන අද්භූත සිදුවීම් ජාලාවේය.

"ඇත්තටමද..."

රවිශ්ක ඇහුවේය.

"ඉස්සරහ බලන්න රවී..."

අර්චනා අවිශ්කගේ අතකින් අල්ලාගෙන ලී වැටට බරවිය.

"ආකහේ ලොකු හඳ කොච්චර ලස්සනද? මං මෙතෙන්ට කැමතී රවිශ්ක... අපි කොහොම හරි මේක හොටෙල් එකක් කරමු රවී..."

අර්චනා කීවාය.

ජීවිතය පටන්ගත්තේ මෙතැනිනි. දුර ජේන ආනගතයට ඔහු එක්ක යා යුත්තේ මෙතන ඉදලාය. අර්චනා ඒ තීරණයේ උන්නාය.

"රවී..."

ඈ හිස ඔහුගේ උරහිසට බර කළාය. ගලවාදමන ඔහුගේ ඇඳුම් වල පවා දැනෙන පිරිමි සුවඳ මේ වෙලාවේත් අර්චනාට දැනිණ.

SL-UNLIMITED E-BOOK The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"ඇත්තටම ගහකොළ පරිසරයට ආදරේ කළේ මම නෙමෙයි මගේ අක්කා..."

අර්චනාට වන්දනාට සිහිවිය.

"ඉස්සර ස්කූල් එක නිවාඩු දුන්නාම අක්කි තාත්තිට කියන්නේ කොහෙහරි ඇවිදින්න එක්ක යන්න කියලා... තාත්ති අපිව යාල, සිංහරාජ, කතරගම, අනුරාධපුරේ එක්ක යනවා... අක්කි තමයි හැමදාමත් සතුටු වෙන්නේ... බැන්දායින් පස්සේ මාධවන් අයියාත් අක්කිව හරියට ඇවිදින්න එක්ක යනවා... මං හිතන්නේ අක්කි මේ රටේ නොගියපු තැනක් නැතුව ඇති...."

අර්චනා කීවාය.

"නොගිය තැනක් තියෙනවා..."

රවිශ්ක කීවේය. අර්චනා ඇස් ලොකු කර ගත්තේය.

"මෙහේ... කේසර වලව්වට ඇවිත් නැතුව ඇති..."

රවිශ්ක කිවේ හිනාමුණෙනි.

"ඇත්ත... කවදාහරි ආවොත් සතුටු වෙයි..."

අර්චනාට නොහිතාම සුසුමක් හෙළිණ.

"දුකයිද?..."

රවිශ්ක ඇහුවේය.

"මොනාටද?"

"ගෙදර අය නැතිවුණාට..."



Scanned by CamScanner

"කවදාහරි එගොල්ලෝ අපට සමාව දෙයි රවී... මාධවන් අයියායි, අක්කියි නම් අද උනත් අපි දෙන්නාව බාරගනී. ඒත් තාත්තා තම ඇත්තේ තරහින්.... කවදාහරි අවුරුද්දක් විතරගියාම තාත්තිත් අපට සමාව දෙයි... දෙමාපියෝ හැමදාම දරුවෝ එක්ක තරහවෙල ඉන්නෙ නෑ..."

අර්චනා කීවාය. එහෙම දුර බලාපොරොත්තුවක් ඇත්තටම ඇගේ හිතේ තිබිණ.

www.sumeraunlimited.com

"නිදිමතයි අර්චි..."

රවිශ්ක පොඩි එකකුවාගේ කීවේය. ඇත්තය ඔහු දවසම වෙහෙසේ - කේසර වලව්වේ අළුත් වැඩියාවත් ඉක්මනින් ඉවර කර ව්‍යාපාරය පටන්ගන්නට හීන දකියි.

"නිදාගන්න යං..."

අර්චනා රවිශ්කගේ අතක ඇගිලි අතර ඇගිලි සිරකර ගත්තාය.

"අද හීතල වැඩී... උඩ කාමර සීතලයි... අපි පහල කාමරේ නිදාගම්මු..."

රවිශ්ක කීවේය. අර්චනා එකගවූවාය. හායිගා ඇරදමා තිබෙන මැද මිදුල පෙනෙද්දී උඩ ඉන්නවාට වඩා පහල නිදාගන්නා එක හොඳය. ඇය හිතුවාය.

වැව පැත්තේ නිදන කාමරය ඇතුලත් තරමක් එළිය තිබේ. ඒ සඳ කිරණ නිසාය. රවිශ්කට ළංව ඇඳේ ඇලවුණු අර්චනා වහා නින්දට වැටුණි. නින්ද එය කොයි තරම් සැපයක්ද අර්චනාට නොදැනිණ. ඇය නින්දේ ගැඹුරුම ඉසව්ව පහුකරමින් උන්නාය. තදින් යමක් ජනේලයේ වැදිණ.



SL Unlimited E-Book
The Home of Sri Lankan e-community
Scanned by CamScanner

"තග්..."

ඒ කුමක්ද පැහැදිලි නොවේ. අර්චනා ගැස්සී අහැරිණි. ඇය පළමුව දුටුවේ කළුවය. කළුවරට ඇහැ හුරුවෙද්දී ජනෙල් වීදුරුවෙන් ගලා එන තුනී සඳ එළිය ඇ දුටුවාය. ඒ සඳවතුරේ ජනේලයට පිටතින් තිබූ ඡායාව අර්චනාගේ ඇගේ හිරිගඩු නැංවීය.

www.sl-unlimited.com Sumee

"දෙයියනේ..."

අර්චනාට කෑගැහෙන්නට ආවේය. ඒත් කටින් එක වචනයක්වත් පිට නොවිණ.

හිසේ පටන් කම්බිලියක් පොරවාගත් රුවක් සැරයටියක් අතින් ගෙන ජනේලය ළඟ හිටගෙන උන්නාය. වැසු ජනෙල් පියන තුළින් කාමරයට එබීගෙන උන්නාය. උස් සැරයටියේ මුදුනේ ගැටය පවා අර්චනා පැහැදිලිව දුටුවාය. ඒත් මේ ගැහැනියෙක්ද? පිරිමියෙක්ද? ජීවතුන් අතර ඉන්නා කෙනෙක්ද? මැරුණු කෙනෙක්ද? අර්චනා නොදත්තේය. අඳුරු කම්බිලිය හිස වසා වැක්කෙරිණි.

"ක... වු... ද?..."

අර්චනා කෑගැවාය. පළමුව හඬ පිටවුනේ උගුරෙනි.

"කව්ද ඕතන...?"

ඊළඟවරෙ ඇ රැල් බුරුල් හැර කතා කළාය.

"අර්චනා..."

ඇහැරුනේ රවිශ්කය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ජනේලය ළඟ රුව කලබල විය. මොහොතකින් රුව අතුරුදහන් විය.

"අර්චනා ඇයි...?"

රවිශ්ක කලබලව ඇඳේ හිඳගන්නාවිටත් ජනේලය ළඟ හිස්ය.

"කවුරුහරි ජනේලෙ ළඟ හිටගෙන උන්නා රවී..."

අර්චනා බියෙන් කීවාය.

"ජනේලෙ ළඟ කව්ද?"

රවිශ්ක ඇඳෙන් පැන්නේය. ජනෙල් පියන්පත විවරකර වටපිට බැලුවේය. අඳුරත් අඳුර අතරින් පෙරෙන හඳ එළිය තීරුවත් හැරෙන්නට අන් කිසිවක් නොවේ.

"මෙහෙ කවුරුත් නෑ අර්චනා..."

ජනෙල් පියන්පත වසා දැමූ රවිශ්ක ඇඳට ගොඩවිය.

"ඔයා ආයිමත් හීනෙන් බයවෙලා..."

රවිශ්ක කීවේ යහනේ වැතිරෙමිනි.

"නෑ රවී... කවුරුහරි ජනේලෙ ළඟ හිටියා... මං හොඳටම දැක්කා... හීනෙන් නෙමේ හැබැහින්..."

අර්චනා කීවේය.

"නිදාගන්න අර්චි... එළිවෙන්න තව ගොඩක් වෙලා තියෙනවා..."

www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-BOOK The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

රවිශ්ක කීවේ දෑස් පියාගනිමිනි.

අර්චනාගේ හිතට අසරණකමක් දැනිණ. රවිශ්කගේ දොසක් නැත. ඔහු නැගිටිද්දී අද්භූත රූපය අතුරුදහන්ය. එය එතන තිබූ බව ඔප්පු කරගන්නට සාක්ෂියක්ද නැත. ඉතිං තමාව විශ්වාස කරන්නේ කවිද?

www.sl-unlimited.com Sumee

අර්චනා වේදනාවෙන් හිතුවාය. කොට්ටයට හිස තියාගත්තත් ඇය වෙත නින්ද නොවිණ. රැයේ ඉතිරි පැය කිහිපය ඇය උන්නේ අනන්ත සිතුවිලි අතරය.

■ ■ ■ ■ ■ ■ ■

උදේ කාලයට කේසර වලව්ව වටකොට ඇත්තේ සොඳුරුතම ලෝකයකි. රාත්‍රියට කේසර වලව්ව අවට කොයිතරම් බියකරුවේද උදය කාලයට ඒ තරමට සොඳුරුවේ. දස අතින් නැගෙන නොනවතින කුරුලු ගී පුදුම තරම් මිහිරිය. කොළ පැහැයෙන් පිරුණු වටපිටාවේ විසුල තුනී මීදුම් ගතිය සීතලක් ගෙනාවද ඒ අතරින් පෙරී වැටෙන හිරු එළිය රත්තරං පාටට බැබළිණ.

තුන්කාලේ ඩෙනිමකට අත් දිග ඉරි වී ෂර්ටයක් හැඳගත් අර්චනා වලව්වේ මිදුලට පය තිබ්බාය. සුගතන් රෝස පාත්ති වලට වතුර දමමින් උන්නේය. පළල් වාටියක් ඇති තොප්පියක් ඔහුගේ හිසේය.

"සුගතන්..."

අර්චනා කීවේ ළංවීය.

"නෝනා... තාම හරියට එළිය වැටිලත් නෑ... පිනිබානවා නේද?..."

SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ඔහු වරක් හැරී ඇහුවේය.

"ගාණක් නෑ..."

අර්චනා කීවේ හිනාවීය. ඒ හිනාව කුඩා දරුවෙකුගේ මෙනැයි සුගතන්ට හිතිණ. අර්චනා හෙමිහිට පෙරදා රැයේ ආගන්තුක රූපය දුටු ජනේලය ළඟට ඇවිද ගියාය. තණ පිඩලි නොවූ වැලිබිම දුටු දෙයින් ඈ පුදුම වුවාය.

www.slsumeunlimited.com

නිරුවත් දෙපයක ළකුණත් රිටක් බිම වැදී හැරුණු වලවලුත් තැනින් තැනය. ජනේලය ළඟ කවුරුන් හෝ ඉද තිබේ. දැන් ඒ බව විශ්වාසය. ඒත් ඒ කව්ද? මේ තියෙන්නේ ඒ ආගන්තුකයගේ පා සළකුණුත් අත තිබු සැරයටියේ සළකුණුත්ය.

"නෝනා..."

සුගතන් වතුර බටය හකුලාගෙන අර්චනා පස්සේය.

"බිමට නැමීගෙන මොනා හොයනවද?"

ඔහු ඇහුවේ පොලොවට පහත් වි උන් අර්චනා දෙස විපරමින් බලාය.

"ඊයේ රෑ මේ ජනේලෙ ළඟ කවුරුහරි හිටියා සුගතන්..."

අර්චනා කීවාය.

"මක් කිව්වා..."

සුගතන්ගේ ඇස් දෙක නළලේය.

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"ඔව්... මහ රෑ..... මං ඇහැරලා බලනකොට කව්ද මන්දා මේ ජනේලෙ අයිනේ හිටගෙන කාමරේට එබීගෙන උන්නා... දැන් මෙතන අඩි සලකුණුත් තියෙනවා..."

"අප්පද බොල ඇත්ත නේන්නං..."

www.sl-unlimited.com Sumee

බිමට පත්වී අඩි සලකුණු දෙස බලා සුගතන් අත නළලෙ ගහගත්තේය.

"මොකාද බොල ඒ නොසණ්ඩාල වැඩේ කරපු එකා... ඒයේ රෑ හොඳට හඳ පායලත් තිබ්බනෙ... මොකාද කියලා නෝනාට අඳුරගන්න බැරිව ගියාද? "

සුගතන් ඇහුවේය.

"බැරිවුණා සුගතන්... ඔළුවෙ ඉඳල රෙද්දක් පොරවාගෙන උන්නෙ..."

අර්චනා කීවාය.

"නෝනා..."

වටපිට විපරමින් බලා සුගතන් හඬ පහත්කොට කතා කළේය.

"තීන්ත බාස්ගේ ගෝලයෙක් වත්ද?"

ඔහු ඇසුවේය. අර්චනාගේ වත මැලවිණ.

"දන්නේ නැද්ද නෝනා කොල්ලොනෙ... මනමාලකමට කාමරේට එබිල බැලුවද දන්නෑ... පිට කාමරේනෙ නතර වෙලා ඉන්නෙත්..."

SL UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

සුගතන් කීවේය.

"වෙන්න බෑ... කවුරු උනත් ඒ හිටපු කෙනාගෙ අතේ ලොකු හැරමිටියකුත් තිබ්බා..."

"කිරි අප්පොච්චියෙ..."

www.sl-unlimited.com Sumee

වතුර බටය බිම දමා සුගතන් අත්දෙක එකට ගැහුවේය.

"ඔහොම කියන්න එපායැ නෝනෙ..."

"ඇයි සුගතන් අඳුනගත්තාද හිටිය කෙනා..."

"එහෙනං... ඔය කියන්නෙ අපේ පිච්චි අක්කා ගැනනෙ..."

"පිච්චි අක්කා..."

අර්චනාට පුදුමය.

"ඔව්... ඔළුවෙ ඉදන් රෙද්දක් පොරවගෙන අතේ හැරමිටියක් තියාගෙන මේ කේසර වලව්වත්තේ හක්මන් කරන්නෙ උන්දෑ තමා..."

"එයා මක්කරනවද මෙහේ..."

අර්චනා පිච්චි අක්කා ගැන තවත් තොරතුරු දැනගන්න කැමති වූවාය.

"කාත් කවුරුත් නැති උන්දැනෙ නෝනා... වයසත් අනූව පැනලා මා හිතේ... දන්න කාලෙ ඉඳල ඉන්නෙ කේසර වත්තෙ ගහකොළ අස්සෙ තමා..."



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

අර්චනා තිගැස්සිණ. එහෙම චරිතත් අප අතර වේ. ළඟදී දිනෙක වත්තේ ඇවිදිද්දී ගහින් ගහට මාරුවී හැංගුණ ඡායාව අර්චනාට සිහිවිය. සැක නැත. ඒ ඇය විය යුතුය.

"එයා ඇයි අපි දෙන්න ඉන්න කාමරේට එබුණේ?"

www.sl-unlimited.com Sumee

අර්චනා ඇහුවාය.

"ඒක නම් උඩ ඉන්න දෙයියන්ටවත් කියන්න බෑ නෝනා... ඔල්මාද කාරයින්ට අරක මේක කරන්න හේතු ඕනය. උන් උන්ගෙ හිතට එන ඕන දෙයක් කරනවා..."

"පිච්චි අක්කාට පිස්සුද?"

අර්චනා ඇහුවාය.

"හ්ම්... කොල්ලො කුරුට්ටන්ට අහුවුණාම සෙල්ලමට ගන්න නිසා හැංගිලාම තමා ඉන්නෙ..."

"එතකොට කන්නේ බොන්නේ..."

"ඔය අතනින් මෙතනින් අහුලගන්න මොනා හරි කාලා දානවා... බඩගින්න උහුලගන්න බැරිවුණොත් වලව්වෙ කුස්සිය දොර ගාවට එන වෙලාවලුත් තියෙනවා... ඒ වෙලාවට මං මොනාහරි දෙනවා... නෝනල ඇවිත් පදිංචි උනත් හරි මං තාම පිච්චි අක්කව ඇහැට දැක්කෙ නෑ..."

සුගතන් කීවේය.

අර්චනා සෝදිසියෙන් වටපිට බැලුවාය. මේ මොහොතේත් මේ උස් ගහ කොළ අතරේ කොහේ හෝ ඇය හැංගී ඉන්නවා විය හැකිද?



SL UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ගහ කොළත් ඒවායේ සෙවණැලිත් මිස අර්චනා කිසිවක් නොදුටුවාය.

එහෙත්....

කේසර වලව්වේ දකුණු පැත්තේ දැවැන්ත සියඹලා ගහට මුවා වූ දෙනෙතක් - කම්බිලියෙන් වැසුණු හිසකට යටින් වූ අඳුරු දෙනෙතක් මේ මොහොතේත් කේසර වලව්ව දෙසට යොමුව තිබිණ.

■ ■ ■ ■ ■ ■ ■

ඉන්දිකව දඹුළු මහ රෝහලේ හදිසි අනතුරු ඒකකයට ඇතුලත් කර තිබිණ. ගුණරත්න උදෙන්ම රෝහලට ගොස් රෝගියා බලා කියා ගත්තේය. ඒ ගමන කෙලින්ම කේසර වලව්වට ආවේය. ඩිමෝ බට්ටාව සියඹලා ගහක් මුල නතර කළ ගුණරත්න කෙළින්ම වලව්ව පැත්තට ගියේය.

"ගුණරත්න..."

රවිශ්ක ගුණරත්න දැක ඉදිරියට ආවේය.

"කොහොමද ලෙඩාට..."

ඔහු ඇසුවේය.

"කොල්ලාට අද සිහිය ඇවිත් තිබ්බා මහත්තයෝ... ඒත් ඉතිං..."

ඉතිරිය ගුණරත්නගේ මුවතුළම සැඟවිණ.

"ඇයි බාසුන්නැහේ..."

රවිශ්ක හඬ පහත්කර ඇහුවේය.



Scanned by CamScanner

"ඉන්දික ආයේ කෙලින් හිට ගනීද කියන්න අමාරුයි මහත්තයෝ... ගොඩදාන්න කාලයක් මහන්සි වෙන්න සිද්ධ වෙයි..."

ගුණරත්න කීවේ යටි තොල පෙරලාගෙනය. රවිශ්කගේ කඩවසම් මූණ හේබා ගියේය.

"අපටත් බොහොම කණගාටුයි ගුණරත්න බාසුන්නැහේ... මෙහෙම වෙයි කියලා අපි කවදාවත් හිතුවාද? ඉන්දිකව ගොඩගන්න අපිත් පුළුවන් උදව්වක් කරන්නං..."

රවිශ්ක කීවේ හදවතෙනි. ඉන්දික තරුණයෙකි. මේ වාගේ ඉරණමක් සැරවැඩිය.

"ඒක යැ... මහත්තයෝ..."

ගුණරත්න වටපිට බැලුවේය. ජේන තැනක කවුරුවත් නැත. තව ටිකක් රවිශ්ක පැත්තට බරව කට ඇරියේය.

"ඉන්දික මාර කතාවක් කිව්වනෙ..."

"මොකද්ද?..."

"ඉණිමගෙන් වැටුණේ අත ලිස්සලා නෙමේ කියන්නෙ..."

"එහෙනං..."

"කව්ද පස්සෙන් ඉදගෙන කනට ගැහුවලු..."

"ත්නෑ..."

රවිශ්කට පුදුමය. හිත ඇතුලේ තැනක ඇතිවුණ තිගැස්ම



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The heart of Sri Lankan e-community
Scanned by CamScanner

ආත්මයටම දැනිණ.

"එහෙම වෙන්නෙ කොහොමද? ඉන්දික උන්නෙ තට්ටු දෙකක් උසට ඉනිමගේ... තනියමනෙ..."

රවිශ්ක හිතට දැනෙන අනතුර හංගාගෙන වාද කළේය.

www.sl-unlimited.com Sumee

"ඒක නම් එහෙම තමයි... ඒත්..."

බාසුන්නැහේ දෙපැත්තට ඇද්දේ හිතේ තියනදේ කියම්දෝ නොකියම්දෝ කියාය.

"ඉන්දික කියන්නේ ඒ කණට ගැහුවේ මනුස්සයෙක් නෙමේ කියලා..."

"ඒක වෙන්න බෑ බාසුන්නැහේ... සුගතන් මේ වලව්ව අවුරුදු ගාණක් බලාගත්ත කෙනා... සුගතන්ටත් කවදාවත් ඔහොම දෙයක් වෙලා නෑනෙ..."

මහත්තයා කිසිවක් පිළිගන්න සූදානමක් නැත. සල්ලි වියදම් කර මිලට ගත් වලව්ව - හෝටලයක් කරන්න ලෑස්ති කරගෙන යන තැන දෝෂ තියෙනවායි ප්‍රසිද්ධ වෙනවාට කවුරුත් උනත් කැමති වෙන්නේ නැත.

"අනේ මන්දා මහත්තයෝ... කොහොම උනත් අනිත් තුන්දෙනාටත් පරිස්සමින් වැඩකරන්න කියන්න ඕන..."

ගුණරත්න කීවේය.

"බාසුන්නැහේ..."

යන්න ගිය බාසුන්නැහේ රවිශ්කගේ හඬට ආපහු හැරිණ.



SL UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"ඔය කවුරුහරි කනට ගැහුවා කියන කතාව වැඩිය ඇහෙන්න කියන්න එපා...නෝනාට ඇහුණොත් හොඳ නෑ... දන්නැද්ද අපි වගේ නෙමේ නෙ ගෑණු උදවිය පොඩ්ඩක් ඇත්නම් බයවෙනවනෙ..."

රවිශ්ක කීවේය.

www.sl-unlimited.com Sumee

"නෑ මහත්තයො... මං ඔය කතාව අපේ කොල්ලෙකුටවත් කියන්න යන්නෑ... ඊළඟට මට උන්ගෙන් වැඩක් පලක් හරියකට කරවගන්න බැරිව යනවා..."

ගුණරත්න කීවේය. ඔහු පිටව යන දෙස රවිශ්ක බලා උන්නේ ගල් ගැහීය. මේ කතාවල ඇත්ත බොරු දන්නේ දෙවියන් පමණි. ඇත්තටම කේසර වලව්ව ඇතුලේ අද්භූතයමක් සිදුවෙනවාද? රවිශ්ක ඒ ගැන හිතන්නටවත් අකමැති වුවේය. අර්චනාගේ ජීවිතයට අනතුරක් වේයැයි හිතා - ඇගේ සතුටට වලව්ව හැරයන්නට යෝජනා කළා ඇත්තය. ඒත් ඒ වෙලාවේ බිරියත් තෝරාගත්තේ මෙතනය. ඒ හින්දා දැන් කොහොමටවත් කේසර වලව්ව දමා යන අදහසක් රවිශ්ක වෙත නොවේ.

"රවී..."

කුස්සියේ හිඳ අර්චනා කෙළින්ම රවිශ්ක සොයා ආවාය.

"මං අද දඹුල්ලට යනවා අර්චි..."

රවිශ්ක කීවේය.

"ඇයි?"

"වැඩ වගයක් කරගන්නත් තියෙනවා... ඔක්කොටම වඩා අර ඉතිමගෙන් වැටිච්ච කොල්ලා බලල එන්න ඕන..."



SL UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

රවිශ්ක කීවේය. දඹුල්ල ටවුම තිබුණේ පේන දුරකය.

"මාත් එන්නද?"

අර්චනා ඇහුවාය. අවිශ්ක මොහෙතකට ගොළුවිය.

"ගොඩ දවසකින් මටත් එළියට යන්න බැරිවුණා නෙ රවී... ආව දවසෙ ඉඳලා මේකෙ ඇතුලෙමයි..."

අර්චනා කන් කෙඳිරිගෑවේ පොඩි එකෙකු සේය.

"එක්ක යන්නං... හැබැයි ලෙඩා බලන්න යන්න ඔට්ටු නෑ..."

"ඇයි ඒ..."

"ඒ ළමයාට ටිකක් සීරියස් අර්චි... ඔයාට දුක හිතෙයි..."

රවිශ්කට උවමනා කළේ ඉන්දික කියන කම්මුල්පාර අර්චනාගෙන් හංගා තියන්නය.

"හරි... මං වාහනේට වෙලා ඉන්නංකො..."

අර්චනා පොරොන්දු වුවාය.

ඈ දහවල මේ දඹුලු ගමනට ලෑස්ති වුණේ ආසාවෙනි. තැඹිලි කුර්තාවක් සුදු කලිසමට හැඳි අර්චනා බොහෝ සොඳුරුව උන්නාය. රවිශ්ක රතු මරුටියේ ඉදිරිපස ඇයව නග්ගාගත්තේ ආඩම්බරයෙනි. ටවුම දුක්වා දුර ඈ ගියේ වටපිට බල බලාය. සීගිරියට යන පාරේ ඇති අඹ , දිවුල් විකුණන පොඩි පොඩි කඩ දෙස ඈ බලා උන්නාය.

"මං ගිහින් එනකං... ඔතන ඉන්න..."



www.sl-unlimited.com Sumee
SL UNLIMITED E Book
Scanned by CamScanner

රිය ගාලේ නතර කර මරුට්යෙන් රවිශ්ක බැස්සේය. අර්චනා හිස වැනුවාය. රිය අසුනේ හොඳින් හරි බැරි ගැසී ඈ නොපෙනී යන රවිශ්කගේ රුව දෙස බලා උන්නේ ආදරයෙනි.

අර්චනාට ඒ සොඳුරු දවස සිහිවිය. රවිශ්කව මුලින්ම මුණ ගැහුණ දවස ඇයට සිහිවිය.

www.sl-unlimited.com Sumee

එය කුඩා රෙස්ටුරන්ට් එකකි. අර්චනාත් මිතුරියන් දෙන්නාත් සාප්පු සවාරිය හමාරකර එහි ගියේ මොනවා හරි සුළුවෙන් කාබී වෙහෙස නිවාගන්නය. දහයක දොළහක පමණ අමුත්තන් පිරිසක් ඇතුලේය. සේවකයින් හතර පස් දෙනෙක් මේස අතර ගැවසෙමින් සංග්‍රහ කටයුතු වලය.

රවිශ්ක ... රවිශ්ක උන්නේ අත්නැති සරල ටී ෂර්ට් එකකට කොට කලිසමක් හැඳගෙන සාලය කොණේ මේසයකට නැගී සිවිලිමේ විදුලිපහනක් මාරු කරමිනි. සිහින් ඉස්කුරුප්පු නියනක් කටේය. පැන්ඩා කාරයකින් පැමිණ කිච්බිච් ගාමින් ඇතුළු වූ සොඳුරු කෙල්ලන් තුන්දෙනා දිහා ඔහු යටැසින් බැලුවේය. එයිනුත් තුන්කාලෙ කලිසමට කොට ටී ෂර්ටයක් ඇඳ උන් අර්චනා ඔහුගේ හිත ඇඳගත්තේය.

"අර කොල්ලගෙ වැඩේ අපේ අර්චි දිහා බලන එක..."

මේසයට හිඳගත් පසු කිත්මි කීවාය.

"මාත් බලාගෙන..."

ඒ හසාරාය.

"පොර නිකං රිතික් වගේ... උසත් මාරයි... ඒත් වැඩක් නෑ කරන්නෙ වයරින් වැඩ නෙ..."

කිත්මි ආයෙම කීවාය.

SL UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

අර්චනා කතා නොකළාය. ඈ උන්නේ තිගැස්සිගෙනය. ඒ ඝන ඇහි බැමියට දිගු ඇස්වල පිරිමි බැල්ම අර්චනාව කලබල කර තිබිණ. ඇගේ හිතට මොකද්දෝ සිදුව තිබිණ.

පිච්චී ගිය බල්බය මාරු කළ රවිශ්ක අම්පන්න ටිකත් ගෙන ඇතුළට ගියේය. ඊළඟට ඔහු එළියට ආවේ ඇඟපත හෝදාගෙන නිල් ඩෙනිමකට බතික් රටා දමූ සැහැල්ලු කමිසයක් හැඳගෙනය.

www.sl-unlimited.com Sumee

"වාව්... දැන්නම් තලුවෙක්ම තමයි..."

කිත්ම ඒ දැක කෑගෑවාය.

"බල බලා ඉන්න ගෙදර අරන් යන්න හිතෙනවා..." හසාරාත් කීවාය.

වටවී උන් කෙල්ලන් දෙන්නා තමා දිහා බලබලා හිනාවෙනවා රවිශ්කත් බලාගෙනය. ඒත් හිතගිය තැන නිහඬය.

කාබී අහවර බිල ගෙවන්නට ගිය මොහොතේ

"සර් මේ බිල දාන්න..."

වේටර්වරයා කීවේ රවිශ්කටය. කෙල්ලන් තුන්දෙනා ගැස්සිණ.

"ආ... ඒ ඔගොල්ලන්ගෙ සර්ද?"

මෙතෙක් මේසයට කෑම බීම ගෙනා තරුණයාගෙන් හසාරා ඇහුවාය.

"මේ රෙස්ටුරන්ට් එක සර්ගෙ තමා..."



SL UNLIMITED E Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඔහු කීවේය. හසාරාවත් කිත්මිවත් ඊට එහා විහිළු කළේ නැත.

පිටත් වෙන්න රිය ළඟට ගිය යුවතියන් වැටුණේ ලොකු අමාරුවකය. රෝදයක් සිදුරුව කළ සුළං බැසගොස් තිබිණ. කරකියා ගන්න දෙයක් නැතිව බලද්දී රවිශ්ක ඔවුන් වෙත ආවේය.

"ඇයි මිස් මොනාහරි ප්‍රශ්නයක්ද?"

ඔහු ඇහුවේය. ඇහුවා විතරක් නොවේ රෝදය මාරුකරගන්න කෙල්ලන්ට උදව් කළේය. ඒ අතරේ අර්චනා එක්කත් දුරකතන අංක හුවමාරු කරගන්න රවිශ්ක සමත්විය. ඇඳුනුම් කම් දුර ගියේය. තමාට ඔහු තරමට ගැලපෙන කෙනෙක් මේ විශ්වයේ කොතනකවත් නොවන බව ඇය හැදින්නාය.

ඉතිං අර්චනා රවිශ්කගේ වූයේ ඒ නිසාය.

"අ... ර්... චි..."

කලබලයෙන් ආ රවිශ්ක රියට ගොඩවිය. සැණින් රිය පණගන්වා හරවා ගත්තේ දුවිලි නංවාගෙනය.

"ඇයි ඇයි රවී...."

අර්චනා උන්නේ මේ කලබලය තේරුම් ගන්න බැරිවය.

"මං තිලක්ව දැක්කා අර්චි..."

රවිශ්ක කීවේය. තිලක් යනු අර්චනාගේ පියා පියල් මොරගොල්ලගේ ප්‍රධාන සහචරයාය.



www.sl-unlimited.com
SL UNLIMITED EBook
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"තිලක් මෙහේ...."

අර්චනාට අඳහාගන්න අමාරුය.

"හ්ම්... තව හතර පස් දෙනෙක් උන්නා..."

www.sl-unlimited.com Sumee

"තාත්තිත් උන්නාද?"

"නෑ... මං හිතන්නේ ලෙඩක් බලන්න ඇවිත් ද කොහේද?..."

රවිශ්ක කීවේය.

කාරය ගේට්ටුවෙන් පාරට දැම්මා විතරය. පිටුපස බැලූ අර්චනා දුටුවේ තිලක් , සහන්, පනාගොඩ හා රණා යන හතරදෙනා රථගාල දෙසට එන අයුරුය.

"තාත්තිගෙ සෙට් එක තමා... ඒ ගොල්ලොත් ආපහු යන්න හදන්නේ..."

අර්චනා බියෙන් කීවාය. මේ කට්ටියට තමන් දෙදෙනා අහුවුනොත් හොඳක් නම් වන්නේ නැත. රවිශ්කට පහර දී තමාව කොළඹ ගෙනියනවා සිකුරුය.

"ෂිට්.... පාර දිගේ කොච්චර වේගයෙන් ගියත් අපිව අහුවෙනවා... කරන්න තියෙන්නෙ එක දෙයයි..." .

රවිශ්ක රිය පළමු අතුරු පාරට හැරවීවේය. එහි කඩයක් ඉදිරිපිට නතර කර උන්නේය.

විනාඩියක් දෙකක් ගතවිය. අර්චනාත් , රවිශ්කත් වචනයක්වත් කතා කළේ නැත. එහෙත් උනුන්ගේ හදවත්



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ගැහෙන හඬ පවා ඔවුනොවුනට ඇහිණ. තිලක් ගේ ජීප් රථය දූවිලි විහිදුවාගෙන ප්‍රධාන පාර දිගේ ඇදී ගියේ විදුලි වේගයෙනි. අතුරුපාර ළඟින් එකම තත්පරයකදී එය ඉදිරියට ඇදිණ.

මොහොතක් දෙකක් නිහඬව ගෙවිණි. තරුණ යුවලට හුස්ම වැටෙන්නේ දැන්ය.

www.sl-unlimited.com Sumee

"ඇති යන්තං..."

අර්චනා කීවාය. රවිශ්ක රිය මහපාරට ගත්තේය. කෙලින් පාරේ ඈත කළුපාට ජීප්රිය තිතක්ව තිබිණ.

"මං හරි බයගුල්ලෙක් කියලා හිතුණද?"

රවිශ්ක අර්චනාගෙන් ඇහුවාය.

"අනේ නෑ රවී... මේ වෙලාවේ මීට වඩා ගන්න හොඳ බුද්ධිමත් තීරණයක් නෑ.... විහින් ප්‍රශ්න ඇතිකරගන්නවට වඩා හොඳම දේ මග අරින එක..."

අර්චනා කීවාය.

"මට බය මං ගැන නෙමේ අර්චි... ඔයා ගැන... අපි උන්ට අහුවුනා නම් මාව මරලා හරි උන් ඔයාව අරන් යයි... එක පාර හතරපස් දෙනෙක් එක්ක ගහගන්න මට බෑ... මට නෙමේ කොයි මිනිහාටත් බෑ... ඒව තියෙන්නෙ ෆිල්මිස් වල විතරයි..."

"ඒක මං දන්නවා රවී..."

"මාව මරලා හරි ඔයාව ගෙනිහින් ඔයාගෙ ගෙදරට බාර දෙනවා නම් කමක් නෑ... ඒත් මුංගෙ හැටියට එහෙම කරයි කියලා හිතන්න අමාරුයි..."

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"එහෙනං..."

අර්චනා පුදුමයෙන් ඇහුවාය.

"උන්ට ඕන ටික ඔයාගෙන් කරගෙන බෙල්ල මිරිකලා කැලේට විසිකරලා යයි..."

අර්චනාගේ ඇග වෙව්ලා ගියාය.

www.sl-unlimited.com Sumee

"ඔය මන්ත්‍රී ඇමති ගොල්ලන්ගෙ ගෝල බාලයෝ ගැන මං හොඳට දන්නවා... උන් උන්ගේ බොස්ගෙ වචනෙට කීකරු වෙන්නෙ බොස් ළඟ ඉන්න කම් විතරයි. බොස්ට අහුවෙන්නෙ නෑ කියලා තේරුණොද තමන්ට වාසියක් වෙන ඕන දෙයක් උන් කරනවා..."

රවිශ්ක තේරුම් කළේය. අර්චනාට ඒ තරම් අත්දැකීම් නොවිණ. නිතර දෙවෙලේ තාත්තා එක්ක මේ හතරදෙනා ගැවසෙනවා දැක තිබුණත් අර්චනා ඔවුන් එක්ක වචන කීපයකට වඩා කතාකර තිබුණේද නැත.

"අපි යං රවී..."

අර්චනා කීවේ හිත හොඳටම කැළඹී තිබුණ හින්දාය.

"ඔව්... මගෙත් හිත අවුල් වුණා... මොනා උනත් අපි මෙහෙ ආවේ ටික කාලෙකට දන්න කියන අයගෙන් හැංගිලා ඉන්නනෙ... අපි ඒක අමතක කරන්න නරකයි..."

රවිශ්ක රිය· කේසර වලව්වට යන පාරට දැම්මේය. අර්චනා ඔහුගේ උරහිසක හිස තියාන දෑසපියා ගත්තාය.

■ ■ ■ ■ ■ ■ ■

කේසර වලව්වට ඉහලින් ආකහේ ලොකු අළුපාට වලාකැරලි රොක් වෙමින් තිබිණ. අළුපාට ගහකොළ අතරේ



SL UNLIMITED EBOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

හුළඟක්වත් හමායනවා අර්චනා දැකියේ නැත. බුම්මාගෙන උන් වලාකැරලි හවස තුන හතර වෙද්දී කඩාහැලෙන්නට පටන්ගත්තේය.

මුලින්ම ආවේ සිරි සිරි පොදයකි. විනාඩි ගණනක් ඇතුලත එය මහා වැස්සක් විය. ඈතින් අහස ගොරවන විදුලි කොටන හඬ ඇසිණ.

www.sl-unlimited.com Sumee

"උඩ මොනවා වෙනවාද දන්නෑ..."

අර්චනා කීවේ මැද මිදුල සිහිකරය. මේ මහ වැස්ස මැද මිදුලටත් ඇද හැලෙනවා සිකුරුය.

"මට ඒක අමතකම වුණා... බලල එන්න වෙයි... කව්ද දන්නෙ වතුර පාර පහලට බැහැලා යනවද නැත්තං ගේ දිගේ ගලනවාද කියලා..."

රවිශ්ක පුටුවෙන් නැගිට්ටේය.

"ඔයත් එනවාද?..."

ඔහු විදුලි පන්දම එළියට ගත්තේය. තාම කළුවර වැටෙන්න වෙලාව නොවේ. ඒත් වැහි අඳුර හින්දා කේසර වලව්වම කළුවරව තිබිණ.

"ඔයත් එනවාද අර්චනා..."

රවිශ්ක ආයිමත් ඇහුවේය.

"බෑ රවී... මං මෙහෙම ඉන්නං..."

අර්චනා කීවේය. රවිශ්ක බල කළේ නැත. විදුලි පන්දම ඉස්සර කරගෙන ඔහු තරප්පුව නැග්ගේය.

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

අර්චනා මැද මිදුලට අකමැති වූවාය. ඇත්තටම ඇය එයට බිය වූවාය. නොදන්නා හේතුවක් නිසා තමා බිලිගන්නට අල්ලාගන්නට තනන කවුරුත් හෝ එහි හිරවී ඉදිවියි අර්චනාට සිතේ.

"මාලතී මැණිකේ..."

ළිඳ තුළ දුටු පිරිමි රුවත් ඒ පිරිමි කටහඬත් අර්චනාට මතකය. 'මාලතී මැණිකේ' කිව්වේ තාමටයි අර්චනාට හිතේ. ඈ එය විශ්වාස කළේය. ඒ හඬ අයිතිකාරයා උන්නේ ඔය මැද මිදුලේය. ඒ හින්දා ඒ දොරකඩ පතින්නට අර්චනා අකමැති වූවාය.

විනාඩි දහයක් පහලොවක් ගෙවිණ. උඩුමහලින් සද්දයක් නැත. අර්චනා හොඳින් කන් දුන්නාය. වැස්සේ හඬ හොඳින් ඇසේ.

"ජබෝග්..."

පැහැදිලිය. අර්චනාට ඒ හඬ විශ්වාසය. ඒ ඇහුණේ මොනවා හෝ ජලය මත වැටෙන හඬය. අර්චනාට මැද මිදුලේ ළිඳ සිහිවිය. ඒත් එක්කම රවිශ්ක සිහිවිය. පය ලිස්සා ඔහු ළිඳට වැටුණා වත්ද?

"රවී..."

තරප්පුව ළඟට ගිය අර්චනා හැකිවෙර යොදා කෑ ගැවාය. පිළිතුරක් නැත.

"රවී.... ඔයා ඉන්නවාද?..."

ඈ ආයිමත් කෑගැවාය. ඒත් පිළිතුරක් නැත. සුගතත් අඩුවැඩිය ගේන්න දහවල ටවුමට ගිය ගමන්ය. පිත්තාරු



www.sl-unlimited.com Sumee
SL UNLIMITED EBOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

බාසුන්නැහේත් ගෝලයෝත් උන්නේ පිට කාමරේය. වලව්ව ඇතුලේ මොනා උනත් ඔවුන්ට ඇහෙන්නේ නැත. අර්චනා අකමැත්තෙන් - බියෙන් නමුත් තරප්පුව නැග ඉහලමාලයට ආවාය.

ඇරදමා තිබෙන දොරකඩින් පෙනෙන මැද මිදුලට හෝ ගා වැස්ස වැටේ. අර්චනා හෙමින් හෙමින් පරිස්සමින් ඒ දොරකඩ පැන්නාය.

"රවී..."

ඈ කතා කළාය. වැස්සත් - වැස්සේ හඬත් - අඳුරත් අවට වසාගෙන තිබිණ. මැද මිදුලට ඇදවැටෙන ජලකදින් තිවසට කරදරයක් නැත. ඒවා කවාකාර පඩිපෙල ඔස්සේ පහළට බැස ළිං මිදුල හරහා ඇති උමං කාණුව දිගේ කේසර වලව්වෙන් බැහැරව යයි. කොහොඹ තැන්නේ ආරච්චිගේ මුත්ත මේ වලව්ව තනා ඇත්තේ දුරදිග බලා හොඳට සැලසුම් කරගෙනය.

"රවී කොහෙද?"

අර්චනා බිත්තිත් උස් වැරැණ්ඩා කුළුණුත් අතගාගෙන පරිස්සමට ඇවිදිමින් රවිශ්ක කෙහේද බැලුවාය.

අකුණක් හමා ගියේය. එහි එළියට අර්චනා කවාකර පඩිපෙළෙන් පහල දුටුවාය. රවිශ්ක - සැමියා පහල ළිං බැම්මට බරව ළිඳට එබීගෙන උන්නාය.

"රවී..."

අර්චනා කතා කළාය. ඒත් රවිශ්ක සෙළවුණේවත් නැත. මේ වැස්සේ හඬ නිසා සමහර විට පහලට තමාගේ කටහඬ ඇහෙන්නේ නැතුවා වෙන්න පුළුවන.



Scanned by CamScanner

අර්චනා හිමිහිට පඩිපෙළ බැස්සාය. බයවෙන්න දෙයක් නැත. රවිශ්ක පහලය.

"රවී..."

අර්චනා රවිශ්කගේ පිටට අත තැබුවාය. රවිශ්ක ගැස්සිණ. ඔහු හැරී බැලුවේ තින්දෙන් ඇහැරුණාසේය. ඒ ඇස්වල බැල්ම අමුතුය.

"රවී... ඇයි මේ තෙමුණේ..."

අර්චනා ඇහුවාය. රවිශ්ක කතා කළේ නැත.

"කෝ ටෝච් එක...?"

අර්චනා ඇහුවාය. රවිශ්ක හෙමිහිට ළිඳ දෙස බැලුවේය. අර්චනා ළිඳ තුළට එබිණ. දැල්වුණු විදුලි පන්දම ළිං දිය මත පාවෙමින් තිබිණ. පහලට ඇහෙන්න ඇත්තේ එය දියට වැටෙන හඬය.

"අපි යං රවී... පස්සෙ ඇවිත් ටෝච් එක ගන්න පුළුවන්නෙ..."

අර්චනා රවීගේ අතින් අල්ලාගෙන කවාකර පඩිපෙල උඩට නැංගාය.

සුගතන් ගෙදර එන විට රවිශ්ක උන්නේ වෙව්ලමිනි. අර්චනා ඔහුගේ තෙත ඇඳුම් මාරුකර හිස පිස දැම්මාය. ඒත් රවිශ්ක කතා කළේ නැත. ඔහු අමුතුය. ඇයට හිතිණ.

"මොකෝ නෝනා වුනේ...?"

සුගතන් ඇහුවේ සුදුමැලිව වෙව්ලන රවිශ්ක දෙස



Scanned by CamScanner

බලාය.

"මැද මිදුලට එන වතුර යන්නේ කොහාටද බලන්න මහත්තයා ටෝච් එක අරගෙන උඩට ගියා... ඒ පාර වැස්සට අහුවුණා... ටෝච් එක ළිඳට වට්ටාගෙන... තෙමුණ හින්දද කොහෙද දූන් වෙව්ලනවා..."

www.sl-unlimited.com Sumee

අර්චනා කීවාය.

"ඔහොම ගියොත් උණසන්නිපාතෙ හැදෙයි... මං කොත්තමල්ලි ටිකක් රත්කරන්නං... පෙනඩෝල් දෙකක් එක්ක දෙමු..."

සුගතන් කීවේය.

පැය භාගයක් යද්දී සුගතන් දුම් දමන කොත්තමල්ලී කෝප්ප දෙකක් කාමරයට ගෙනාවේය.

"නෝනාත් බොන්න... ඉදල ඉදලා රජරටට වහින වැස්ස... හිරිකඩ වැදුනත් ඇති උණ ගන්නවා..."

ඔහු කීවේ අත්දැකීමෙනි.

රවිශ්ක උන්නේ යම් කිසිවකින් බිය වැදුණ ගානටය. මේ ශරීරය ඔහුගේ නොවේ වාගේය. ළඟ උන්නේ - හිස අතගෑවේ ඔහුගේ සොඳුරු බිරිය නොවේ වගේය. දිගු නින්දකට පසු ඇහැරුණු එකකු වාගේ රවිශ්ක දෑස් හැරි සෑම මොහොතකම පුදුමයෙන් වටපිට බැලුවේය.

"රවී..."

අර්චනා වෙනිවැල්ගැට කෝප්පයත් පෙනඩෝල් පෙති දෙකත් පෙව්වේ වදෙන් පොරෙනි. ඒ බී හමාර කළ රවිශ්ක



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

නින්දට වැටිණ. ඒද අතපය වකුටුකරගෙනය.

"පව් ! අසනීපයක් හැදුනාම පොඩි එකෙක් වගේ..."

අර්චනා හිතුවාය. රෑ වද්දී රවිශ්කගේ ඇගේ උණුසුම වැඩිවිය. ඔහුගේ ඇගට අත තැබූ අර්චනා ගැස්සී ගියාය. වෙව්ලමින් රවිශ්ක මොන මොනවා දෝ දෙඩුවේය.

"නෝනා..."

බොහෝ රෑ වීත් සුගතන් කාමරයට එබිණ.

"මහත්තයා නිදි නැද්ද?"

ඔහු ඇසුවේය.

"නෑ සුගතන් ඇඟ ගිනි කබලවගේ රස්නෙයි... ඒ මදිවට වෙව්ලනවා..."

අර්චනා වේදනාවෙන් කීවාය.

"මක්කරන්නෙයි... බෙත් ටිකක් ගන්න යන්නත් එළිය වැටෙනකන් ඉන්න වෙනවා..."

සුගතන් කීවේය.

අර්චනා කතා නොකළාය. නිහඬවම ඇඳ ළඟ පුටුව තියාගෙන රවිශ්කගේ හිස අතගෑවේය.

"නෝනා වෙන කාමරේකට ගිහින් නිදාගන්න... මහත්තයාගේ තනියට මං ළඟ ඉන්නං..."

සුගතන් කීවේය.



www.sl-Sumee unlimited.com
SL Unlimited E-Books
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"සුගතන් ගිහිං නිදාගන්න... මං මහත්තයාව බලාගන්නං..."

අර්චනා කීවේ අමනාපයකින් නොවේ. එකමොහොතකට හෝ රවිශ්කව තනිකරන්නට බයවූවාය.

කොයිතරම් නිදිමත දූනිත් අර්චනා රවිශ්කගේ ඇඟ පොරෝනයෙන් වහමින් ඈ අවදිව උන්නාය.

ඒත්... වෙහෙසත් නිදිමතත් ඉස්සර වී තිබිණ. රෑයේ කොයි මොහොතක හෝ අර්චනාට පුටුවේම නින්ද ගිහින් තිබිණ. ඈ ඇහැරුනේ පුටුවේ එහා මෙහා වද්දී අත බිත්තියේ වැදීමෙනි.

නින්දෙන් අවදිවූ අර්චනා යහන දෙස බැලුවාය. යහන හිස්ය. පොරෝනය බිම වැටී තිබේ. රවිශ්ක කාමරයේ නැත. ඔහු කොහේ ගියාද? අර්චනා නොදත්තාය.

"රවී..."

අර්චනා නානකාමරයේත් සාලයේත් රවිශ්කව සෙව්වාය. ඔහු නැත. මහ වැස්ස පායා තිබිණ. ඒ මදිවාට එළියේ හඳත් හොඳින් පායා තිබේ.

"රවී..."

අර්චනා තරප්පුව ළඟට විත් කතා කළාය. රවිශ්ක උඩුමහලේ උන්නානම් ඇහෙන්න ඕනෑය.

"නෝනා..."

අර්චනාගේ හඬට නින්දත් නොනිදත් අතරේ උන් සුගතන් අවදිව ආවේය. පොරෝනය ඔහු උරහිස වටා ඔතාගෙන



www.sl-unlimited.com
SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

උන්නේය.

"මොකෝ නෝනෙ උනේ?.."

ඔහු ඇහුවේ කලබලයෙනි.

"මහත්තයා කාමරේ නෑ සුගතන්... නාන කාමරේත් නෑ..."

අර්චනා කීවාය.

"උඩටවත් ගියාද?..."

සුගතන් අඩමානයට ඇහුවේය.

"උඩට යන්න උවමනාවක් නෑ... ඒත් මැද මිදුල තියෙන හරියටවත් ගියාද සැකයි..."

"යංකො බලන්න..."

සුගතන් ඉස්සර විය. අර්චනා ඒ පස්සේ තරප්පුව නැග්ගාය.

"ඉර පැව්ව වගේ යස අපුරුවට ඔය හඳ පායල තියෙන්නේ.... මුරුගසං වරුෂාව කොහෙ ගියාද නෑ..."

පටු කොරිඩෝව දිගේ යන අතර සුගතන් කීවේය. අර්චනා ඉදිරිය බැලුවාය. ඇත්තය. දොරකඩින් එහා මැද මිදුල දවාල වාගේ හඳ එළියෙන් පිරිලාය.

"කෝ මේ මහත්තයා..."

පලමුව මැද මිදුලට පය තැබූ සුගතන් වටපිට බලා



www.slunlimited.com Sumeera
SL-UNLIMITED E-Book
Scanned by CamScanner

ඊළඟට පහල බැලුවේය.

"කිරි අප්පෝච්චියේ..."

ඊළඟට නළලට අත්දෙක ගසාගත්තේය.

අර්චනා පහළ බැලුවාය. දුටු දසුනින් ඈ වෙව්ලා ගියාය. තන මත්තක් උස ළිං බැම්ම මත හිටගත් රවිශ්ක ළිං පතුල දිහා බලාගෙනය.

"අනේ රවී..."

අර්චනාට කෑගැහිණ.

"මහත්තයා මේ සෙල්ලං කරන තැනක් ද?"

සුගතන් දාහක් අඩපාලි කිය කියා කවාකාර පඩිපෙළ පහලට දිව්වේය.

"රවී බලාගෙන රවී... බලාගෙන..."

අර්චනාත් අත්දෙකින්ම පපුව අල්ලාගෙන පහලට දිව්වේය.

රවිශ්ක සද්දයට හැරිණ.

ඒත්.....

ඒ ඇත්තටම රවිශ්කද? හිතාගත නොහැක. කොණ්ඩය අවුල් වෙලාය. ඇස් දෙක රතුවෙලාය. මුණ විරූපිය. බියකරුය. හඳඑළිය මැද්දේ මේ සුදුමැලි මුහුණ තවත් බියකරුව පෙනිණ.

"ර...වි...ශ්...ක..."



www.slsumeeunlimited.com
SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඒ බියකරු පෙනුම දුටු අර්චනාගේ දෙකකුල් ගල් ගැහිණ.

"හිහ්... හිහ්... හිහ්... හිඃ..."

මහා බියකරු උස් හිනාවක් රවිශ්ක නැගුවේය. ඔහු කවදාකවත් ඒ විදියට හිනාවෙනවා අර්චනා මින්පෙර අසා නැත.

"රවී... "

අර්චනා හඬ පහත් කර කතා කළාය. විමතියෙන් මුත් පැහැදිලිව කතා කළාය.

"මාලතී මැණිකෙ... කොහොමද?"

රවිශ්ක කතා කළේය. නොවේ. මේ රවිශ්ක නොවේ. එදා රැයේ දුටු බියකරු සිහිනය අර්චනාට සිහිවිය. ඒ සිහිනේ ළිඳ ඇතුලේ උන් මිනිහා කතා කළේත් මේ විදිහටය. ඒ හඬත් මේ වගේය. බැල්මත් මේ වගේය.

"මාලති මැණිකේ... ඔන්න අපි ආයිමත් හම්බවුණා... කොච්චර කල්.... කොච්චරකල්... මං මේ දවස එනකං බලා උන්නද?"

රවිශ්ක කීවේය.

"හප්පච්චියෙ මේ මොකෙක් වැහිලද?"

සුගතන් බියෙන් වෙව්ලුවේය.

"අනේ රවී... ඔතනින් බහින්න රවී... අපි බිමට බැහැලා කතා කරමු..."



www.slunlimited.com
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-communi
Scanned by CamScanner

අර්චනා බැගෑපත් වුණාය. රවිශ්ක හිටගෙන උන්නේ අඩමානයටය. ඒ බියකරු විදියටය. එකම එක සෙලවීමකින් ඔහු නතර වෙන්නේ ළිං පතුලේය. අර්චනා ඒ ගැන හිතන්නටත් බිය වූවාය.

"අනේ රවී... ඔයා ළිඳට වැටෙයි... ඔතනින් බිමට බහින්නකෝ..."

අර්චනා හඬමින් කීවාය.

"රවී... රවී... රවී... රවී..."

රවිශ්ක ඒ වචනය තාලයට කීවේය. ඒ හිස නටව නටවාය.

"රවීට ආදරේද?... ආ... රවීට ආදරේද? මං රවී අරගෙන යන්න හදන්නෙ..."

රවිශ්ක කීවේය. නොවේ. කවුරු නමුත් රවිශ්කගේ සිරුරට ඇතුළුව උන් භූතයා කීවේය.

"අනේ එපා..."

අර්චනා විලාප දුන්නාය.

"රවීට ආදරෙයි නේද?... මට ආදරේ නැද්ද මාලතී මැණිකෙ...? උඹ මේ සිරිපාලට ආදරේ නැද්ද?..."

රවිශ්ක තුළ උන් භූතයා කෝපයෙන් විලාප දුන්නේය.

"සිරිපාල...?"

අර්චනාට මේ කිසිවක් සිතාගන්නට බැරිය.



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"ඔව්... මාලතී මැණිකෙ.... දූන් උඹට මතක නෑ... මං උඹෙ සිරිපාල... උඹ හින්දි මං ජීවිතේ දුන්නා... උඹට දූන් මාව මතක නෑ... ඒත් මට හැමදේම මතකයි... මට හැමදේම මතකයි..."

මේ රවිශ්ක නොවේ. එය දූන් අර්චනාට විශ්වාසය. රවිශ්කගේ සිරුරට රිංගාගෙන ඉන්නා මේ මිනිහා කවුද? අර්චනාට මේ කියන කිසිවක් පැහැදිලි නොවේ.

"හිහ්... හිඃ... හිහ්... හිඃ..."

ආයිමත් අර බියකරු හිනාවය. රවිශ්ක ඉග සොළවා හිනාවෙද්දී ළිං බැම්මෙන් ලොකු කබොක් ගලක් ගැලවිණ.

"ජබොග්..."

ඒ ගල වතුර උඩට විහිදාගෙන ළිඳට වැටිණ. ඊළඟට රවිශ්ක විය නොහැකිද? පතුලක් කිසිදා නොපෙනෙන මේ ළිඳ කොයිතරම් නම් ගැඹුරුද කවුරු දනීද? අර්චනා වෙව්ලා ගියාය.

"අනේ රවී..."

ඈ විලාප දුන්නාය.

"බලා ඉදල බෑ... මොනා හරි කරන්න වෙනවා..."

සුගතන් ආපහු කවාකර පඩිපෙළ උඩට දිව්වේය. අර්චනා උන්නේ දෙකකුල් ගල් ගැහීය. ඇරත් රවිශ්ක මේ වගේ අනතුරක හිදියදී තනිකර යන්නේ කොහොමද?

"රවී..."



www.Sumeed.slunlimited.com
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඈ හැඬුවාය. ඒ හැර පිහිටක් ඉල්ලාගත හැකිකෙනෙක් ඇයට නොපෙනිණ.

"රවී නෙමේ මැණිකෙ... සිරිපාල කියපං... සිරිපාල කියපං.."

www.slunlimited.com

රවිශ්කගේ ඇගේ උන් භූතයා කෑගැවේය.

"සිරිපාල..."

අර්චනා සෙමින් මිමිණුවාය.

"අන්න හරි... මං සිරිපාල... මාලතී මැණිකෙ මං උඹේ සිරිපාල..."

රවිශ්ක තුළින් නැගි ඒ කටහඬ බොහෝ මෘදුව තිබිණ.

"මැණිකේ මං උඹට ගොඩක් ආදරේ කළා... උඹ මට ආදරේ නැද්ද මැණිකෙ... උඹ මට ආදරේ නැද්ද.."

ඔහු ඇහුවේ මහා අසරණ විදිහටය.

"නෝනෙ..."

හතිදමින් ආපහු සුගතන් අර්චනා පස්සේය.

"මේක ගන්න අතට ..."

වතුර කෝප්පයක් සුගතන් අර්චනාට දුන්නේය.

"මොනා හරි කියලා ටිකකට රවට්ට ගන්න බලන්න... මං මහත්තයගෙ පිටිපස්සෙ හිට ගනිද්දි නෝනා ඔය වතුර එක මූණට ගහන්න..."



SL UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සුගතත් කීවේය. අර්චනා රවිශ්ක දෙස බැලුවේය. ඒ අතරේ සුගතත් ළිං බැම්මට කිට්ටු කළේය.

"සිරිපාල කවුද?..."

අර්චනා ඇහුවාය. ඇය හැඬුවේ නැත. රවිශ්කගේ ජීවිතය කොහොම හරි බේරාගත යුතුය.

"ඇයි මගේ මැණිකේ... මාව අඳුරගත්තේ නැතෙයි... මං නෙ සිරිපාල... මාලතී මැණිකෙගෙ සිරිපාල... මාලතී මැණිකෙට ආදරේ කරපු සිරිපාල..."

රවිශ්කගේ ඇගේ උන් භූතයා කීවේය.

"මට ආදරේ නැද්ද මැණිකෙ... මට ආදරේ නැත්නම් මං මෙතනින් පහලට පනිනවා... මේකාවත් අරගෙනම යනවා..."

ආයිමත් ඔහු කෑගෑවේය.

"අනේ එපා ! ..."

අර්චනා කලබලයෙන් කෑගෑවාය.

"එහෙනං... මට ආදරේයි කියපං... සිරිපාලට ආදරෙයි කියාපං..."

භූතයා ආයිමත් කෑගෑවේය.

"ආදරෙයි... මං ආදරෙයි...."

අර්චනා බියෙන් කීවාය. හිතට එකග නොවුණත් කීවාය. සුගතත් අර්චනාට අතින් සංඥාවක් දුන්නේ ඒ වෙලාවේය. අර්චනා ඉදිරියට පැන කෝප්පේ වූ වතුර රවිශ්කගේ මුහුණට



www.sl-unlimited.com Sumee
SL UNLIMITED E-BOOK The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඉස්සේය.

"ඊය්හ්..."

රවිශ්ක ඇසිඩ් ඇඟ වැටුණා වගේ විලාප තිබ්බේය. ඒ හාම ඔහු සිහිනැති විය. සුගතන් මේ මොහොතේ දිවැසින් දක්කා වගේ පැන රවිශ්කගේ සිරුර වත්තන් කරගත්තේය. ඒ ළිඳට වැටෙන්න නොදීය.

"මොකද උනෙ සුගතන්... මහත්තයාට කරදරයක් නෑ නේද?"

රවිශ්ක ළිං බැම්මෙන් පහලට ගන්නට සුගතන්ට උදව් වෙමින් අර්චනා ඇහුවාය.

"බයවෙන්න දෙයක් නෑ... දැන් ඕන කොහොම හරි මහත්තයාව මේ නරකාදියෙන් ගොඩට ගෙනියන්න..."

සුගතන් කීවේය.

"මං කොහොම හරි මහත්තයාගේ උරපතු දෙකෙන් උස්සන් යන්න නෝනාට පුලුවන්ද කකුල් දෙක උස්සන් එන්න..."

සුගතන් ඊළඟට ඇහුවේය. අර්චනා එකගවිය. සුගතන් හා අර්චනා රවිශ්කගේ සිරුර කාමරයක ඇඳකට දමා ගත්තේ අමාරුවෙනි.

"මොනාද අර කෝප්පෙ තිබ්බෙ?"

අර්චනා සුගතන්ගෙන් ඇහුවාය.

"හත්පාරක් ඉතිපිසෝ ගාථාව කියලා මතුරපු වතුර



www.Sumee Unlimited.com
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

නෝනා... මං අහල තිබ්බා වතුර පිරිත් කරලා ගැහුවම ඕන දෝෂයක් අයින්වෙනවා කියලා..."

සුගතන් කීවේය.

"නෝනා ගිහින් නිදාගන්න... තව චූට්ටෙන් එළිය වැටෙනවා... මං මහත්තයට තනියට ඉන්නං..."

අර්චනා එකඟ වූවාය. ඒ දරන්නට බැරි වෙහෙස නිසාය. වෙහෙස දැණුනේ කයට ද හදවතටද කියා ඇයට නොතේරිණ. බර වූ හිස කොට්ටය මත තියාගත් සැණින් ඇයට නින්ද ගියේය.

අර්චනා ඇහැරුණේ දවල් වීය. බොහෝ දවල් වීය. හිරු හොඳට පායා තෙමුණු පොළොව වේලා දමමින් තිබිණ. අවදි වූ ගමන් ඇයට සිහි වුණේ රවිශ්කය. පෙරදා රැයේ සියල්ල මේ දැන් වූවා වගේ තාමත් මතකයේය. අර්චනා ඇඳෙන් පැන්නාය. ඈ රවිශ්ක උන් කාමරයට ගියාය. එය හිස්ය. සුගතන්වත් රවිශ්කවත් එහි නොවීය.

"සුගතන්..."

අර්චනා සුගතන් සොයා කුස්සියට ගියාය. කම්මුලේ අතක් ගහගෙන සුගතන් කුස්සි දොරකඩ ඉඳගෙන ඉවත බලානය.

"සුගතන් කෝ මහත්තයා..."

අර්චනා ඇසුවාය. සුගතන් කුස්සියේ මිදුල පෙන්නුවේ හිසිනි. අර්චනා දොරකඩින් එබිණ. පින්තාරු බාසුන්නැහේත් එක්ක රවිශ්ක ලොකු කතාවකය. ගෝලයින් දෙන්නා තීන්ත වාගයක් කලවම් කරමින් උන්හ.



Scanned by CamScanner

"රවී..."

අර්චනා රවිශ්කට ළංවූයේ පුදුමයෙනි.

"අර්චි... ඔයාට හොඳට නින්ද ගිහින් හිටිය නිසා මං කතා කළේ නෑ... බාසුන්නැහේ තව ගෝලයෝ දෙන්නෙක් ගෙනල්ලා... අපට මේක ඉක්මණටම ඉවරයක් කරගන්න එපායෑ..."

රවිශ්ක කීවේය. ඔහු කතා කළේ පෙරදා රැය වාගේ රැයක් ජීවිතයේ කවදාවත් නොදැක්කා සේය. එය විය හැකිද?

"බාසුන්නැහේ එහෙනං වැඩේ කරගෙන යං... මොනාහරි අඩුවක් තිබ්බොත් කියන්ඩ කෝ..."

ගුණරත්තනට කී රවිශ්ක අර්චනා එක්ක කුස්සියට ගොඩ විය.

"නෝනා... කිරි රත්කරලා තියෙනවා..."

සුගතන් කීවේය.

"මහත්තයාටයි මටයි වක්කරලා දෙන්න..."

අර්චනා කීවේ කුස්සියෙ කුඩා මේසයට හිඳගන්නා අතරේය. රවිශ්ක අර්චනා ළඟින් හිඳගත්තේය.

"රවී..."

අර්චනා රවිශ්කගේ මුහුණ හොඳින් බැලුවාය. පෙරදා රැයේ දුටු බිහිසුණු පෙනුම දැන් කොහේ ගියාද නැත. ඇස් දෙක පමණක් තරමක් රතුව තිබේ. ඒ හරියාකාර නින්දක් නොවූ නිසාය.



Scanned by CamScanner

"රවී ඊයේ රෑ..."

අර්චනා කිසිවක් කියාගත නොහැකිව ළතැවිණ.

"ආ... මං ඊයේ අර කාමරේට තනියෙන් නිදාගන්න ගියේ ඇයි කියලද අහන්නෙ... ? ඇත්තටම අර්චනා මටත් එක මතක නෑ... මං හිතන්නේ මැද මිදුලට වහින හැටි බලලා මං එහෙම්ම ඒ කාමරේ නිදාගෙන උදේ ඇහැරෙන කොට මං දන්නේ රෑ හිටියෙ ඒ කාමරේ කියලා..."

ඔහුට කිසිවක් මතකේ නොවේ. අර්චනාට එය තේරිණ. ඈ සුගතන් දිහා බැලුවාය. ඔහු ඉගියෙන් කීවේත් ඊයේ රෑ ගැන කිසිවක් මතක් කරන්න එපා කියාය.

ඔහුට කිසිවක් මතකේ නැති එක හොඳය. ඔහු ආයේම පරණ රවිශ්ක වී හිඳීම ගැන අර්චනා සතුටු වූවාය.

ඒත්....

ඒ කොතරම් කාලයකටද?

අර්චනා ඒ ගැන හිතන්නත් බය වුවාය.

■ ■ ■ ■ ■ ■ ■

කේසර වලව්ව තුළ තමා නොදන්නා අභිරහසක් තිබෙන බව දූන් අර්චනාට විශ්වාසය. මාලතී මැණිකේ සිරිපාල වටා ගෙතුණු ඒ කතාන්දරය අභිරහසකි. ඒ අභිරහස විසඳාගන්නට අර්චනාට සිදුව ඇත්තේ තනිවමය.

"අර්චනා හඳ බලන්න උඩට යං..."

රවිශ්ක රාත්‍රියේ කීවේය.



www.slunlimited.com
SL-UNLIMITED E Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

දැන් උඩ තට්ටුවට පයක් තියන්නවත් අර්චනා කැමති නැත. විශේෂයෙන් අර මැද මිදුල ඇහැට දකින්නවත් අර්චනාගේ හිතේ කැමැත්තක් නැත. ඒත්...

ඒත් රවිශ්කට වෙනසක් අගවන්න බැරිය. අර්චනා ඔහු පස්සේ අර සොඳුරු දර්ශනය පෙනෙන සැඳැල්ලට ගියාය.

www.sl-unlimited.com

වැව් දියත් හඳ එළියත් එකතු වී තිබේ. සීගිරිය දූවැන්ත හස්තියෙක් වගේ ගහකොළ අතරින් මතුවී පෙනේ. අර්චනා නිහඬවම ඒ දෙස බලා උන්නාය.

කේසර වලව්ව සුන්දරය. ඒත් හැම සොඳුරු දේකම අනතුරක ඉව ඇතිබව දූන් අර්චනා විශ්වාස කරන්නීය.

"අර්චි... අර ඔරුවක් නේද?"

රවිශ්කගේ හඬින් අර්චනා සිතුවිලි වලින් මිදිණ. ඇත්තය. පෙරදාක දැකි ඔරුව අදත් වැව් දිය මතය.

"මං ඕක මීට කළිනුත් දැකල තියෙනවා රවිශ්ක..."

අර්චනා කීවේය.

"මේ රෑ වෙලා ඔරුවක් මක්කරනවාද?..."

රවිශ්ක ඇහුවේ පුදුමයෙනි.

"මට නම් සුගතන් කිව්වේ මාළු බානවා කියලා..."

"මාළු බානවා... මේ රෑ..."

රවිශ්ක පුදුමයෙන් කීවේය.

SL-UNLIMITED E-Book



Scanned by CamScanner

"ඒක වෙන්න බෑ අර්චි... මට පේන්නේ ඔරුව කෙළින්ම අපේ වලව්වත්තට එනවා වගේ..."

ඔහු හරිය. ඔරුව කෙළින්ම එන්නේ වලව්වත්තටය. ඔය සැකය එදා තමා තුළත් තිබුණා නොවේද?

www.sl-unlimited.com Sumee

"මෙච්චර රෑ වෙලා කව්ද ඔරුවකින් වලව්වත්තට එන්නේ... ඇරත් ඒ මොකටද එන්නේ...?"

රවිශ්ක ඇහුවේ තමන්ගෙන්මය.

"දැන් මේ ඉඩකඩම් අයිති අපට... කවුරු මේවට ඇතුල් උනත් හොයා බලන්න ඕනෙ... මට හිතෙනවා අර්චි වත්තට ගිහින් සෝදිසි කරල බලන්න... මේ එන්නේ කව්ද කියලා..."

රවිශ්ක කීවේය.

"අනේ එපා..."

අර්චනාට වහා කියවිණ. රවිශ්ක උන්නේ තමාගේ තත්වය නොදැනය. එදා රෑ ඔහු තුළ වූ වෙනස ඔහු නොදන්නේය. ඒත් අර්චනා එය දැක තිබිණ. ගෙවන හැම තත්පරයම ඇය ගෙව්වේ නැවත කොයි මොහොතක හෝ රවිශ්ක වෙතින් ඒ තත්වය මතුවේ යැයි බියෙනි. ඒ ගැන හිතා වදවෙමිනි. මේ අලුයට සැඟවුණ ගින්නක්ම නොවේද?

"තනියම කළුවරේ වත්තට යන්න එපා රවී... දවල්ටත් වැව පැත්ත කළුවරයි... මේ රෑ කොහොමද කවුරුහරි හැංගිලා හිටියත් හොයාගන්නෙ?"

අර්චනා කීවාය.

"මට මුකුත් වෙන්නෑ අර්චි..."



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

රවිශ්ක කීවේය.

"අනේ එපා රවී... ප්ලිස්..."

ඉකිගහගෙන අර්චනා රවිශ්කගේ විසල් පපුතුරට හිස තියාගත්තේය. ආදරය - උණුසුම ඇගේ කොපුලතට දැනිණ. මේ අහිංසකයා කිසිවක් දන්නේ නැත. ඔහුගේ ජීවිතයට සිදුවමින් පවතින දේ හැබෑවටම දන්නේ නැත. ඔහු උන්නේ ජීවිතය ගැන හුඟක් හීන පපුවේ හංගාගෙනය. අර්චනාගේ හිතට මහා වේදනාවක් දැනිණ. ඇගේ නෙතින් කඳුළක් හැලුණේ නොදැනීමය.

"අර්චි..."

අර්චනාගේ කඳුළක තෙතමනය රවිශ්කට දැනිණ.

"අඩන්නෙපා අර්චි... මං ඔයාව මං ළඟට ගත්තේ කඳුළු දෙන්න නෙමේ... මං ඔයා අකමැති කිසිම දෙයක් කරන්නේ නෑ..."

රවිශ්ක කීවේය. අර්චනාගේ පපුව පැලෙන්නට ආවේය. මේ ඒ තරමට තමාට ආදරය කරනා කෙනෙකි. බේරාදෙන්න කියන්න ඉන්නේ උඩ ඉන්න දෙවියන් පමණි. අර්චනා හිතුවාය. ඇ හිස එසවූවාය.

වැව්දිය හිස්ය. ඔරුව දැන් පේන්නට නැත. ඒ ඔරුව දැන් ඇත්තේ කේසර වලව්වේ වැව් මායිමේය. ඔරුවේ ආ පුද්ගලයා කවුරු උනත් දැන් ඉන්නේ කේසර වලව් වත්තට පය ගහලාය. අර්චනා ඉන් එහා කිසිදෙයක් හිතන්නට සවිමත් නොවිණ.

■ ■ ■ ■ ■ ■

කේසර වලව්ව වටා අද්භූත සිදුවීම් ඡාලාවක් සිදුවෙමින් තිබිණ. එහෙත් කේසර වලව්වේ මේ කිසිවක් නොදන්නා සේ



www.sri-unlimited.com
SL-UNLIMITED E-BOOKS
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

විසල් ගහකොළ අතරේ තේජ මානව උන්නේය. තවත් දවසකට හිරු උදාවී තිබිණ. ඒ හිරු අහසේය. අර්චනා හිරු එළිය විඳින්නට හිතා එළියට ආවාය. දූන් ඉදිරිපස බිත්තිය බාගයක් දුරට තීන්ත ගා ඉවරය.

"නෝනා..."

ගුණරත්න බාසුන්නැහේ අර්චනා දැක ඉදිරියට ආවාය.

"මහත්තයා කෝ නෝනා..."

ඔහු ඇහුවේ රවිශ්ක ගැනය. අර්චනා උන්නේ රවිශ්කත් එළියේ කියාය.

"මං මෙහේ..."

ගෙතුල උන් රවිශ්ක අර්චනා පස්සේ එළියට බැස්සේය.

"මොකුත් අඩුපාඩුවක් තියෙනවද බාසුන්නැහේ?"

රවිශ්ක ඇහුවේය.

"අඩුපාඩුවක් නම් නෑ මහත්තයො... මං මේ වෙන කාරණාවක් කියන්න කියලා..."

ඔහු යටැසින් බැලුවේ අර්චනා දෙසය. අර්චනා ඉදිරියේ මේ කතාව කියනවාද නැද්ද කියා අහන්නා වගේය.

"නෝනා හිටියාට කමක් නෑ... ඕන දෙයක් කියන්න.."

රවිශ්ක හිනාවී කීවේය.



SL - UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community

"අපි මෙහෙ ඉන්නවට කවුරුහරි හරියට අරියාදු කරනවා මහත්තයෝ..."

ගුණරත්න කීවේය.

"මොනා?"

www.sl-unlimited.com Sumee

රවිශ්කට අදහගන්න අමාරුය.

"ඔව්... මෙච්චර දවසක් අපි මහත්තයාට නොකියා උන්නේ ඒත්... දැන්නම් අපට හොඳටම ඒක තේරිලා තියෙන්නෙ..."

බාසුන්නැහේ නැවත කීවේය.

"මොනාද මේ බාසුන්නැහේ කියන්නෙ..."

රවිශ්ක ඇහුවේය. ඔහුට මෙන්ම අර්චනාටත් මේ කියන කිසිදෙයක් නොතේරිණ.

"දවස් දෙක තුනකට කලියෙන් රෑක අපේ ලොරියෙ පස්සෙ ටයර් දෙකම පිහියකින් පතුරුගහල තිබ්බා..."

"මොනවා..."

රවිශ්ක නළල රැළි කළේය.

"එහෙමයි... අපි මහත්තයාට කිව්වෙ නෑ... සද්ද නැතුව ටයර් දෙක මාරු කළා... අයෙ දවසක එළියෙ වැලේ දාල තිබ්බ ඇඳුම් ටික අතුරුදහන්..."

"ඉතිං ඇයි මට කිව්වේ නැත්තේ?"



SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

රවිශ්ක ඇසුවේය.

"අපට නෝනාවයි මහත්තයාවයි බය කරන්න ඕන වුණේ නෑ... ඒත් ඊයේ රෑ බලනකොට එළියෙ තිබ්බ තීන්ත බකට් දෙකකටම කළුතෙල් කලවම් කරල ගිහිං..."

www.sl-unlimited.com Sumee

බාසුන්නැහේ තීන්ත බඳුන් දෙක තිබූ තැනට අර්චනාවත් රවිශ්කවත් කැඳවාගෙන ගියේය.

"පේනවද?..."

රවිශ්කත් - අර්චනාත් එබී බැලුහ. ඇත්තය සුදු තීන්ත බඳුන් වලට කළු තෙල් කලවම් කර තිබේ.

"කවුද මෙහෙම කරන්නෙ...?"

රවිශ්ක උන්නේ කිසිවක් හිතාගන්න බැරිවය.

"මේ අහල පහලක මහත්තයාගේ තරහ කාරයෝ කවුරු හරි ඉන්නවාද?"

ගුණරත්න ඇහුවේය.

"තරහාකාරයෝ තියා මේ අහල පහල අපට යාළු මිත්‍රයෙක්වත් නෑ බාසුන්නැහේ... අපි තාම වලව්වට ඇවිත් ටික දවසනෙ..."

රවිශ්ක කීවේය. ඔහු හරිය. තරහකාරයින් කියද්දී මුලින්ම මතකයට එන්නේ තාත්තාත්, තාත්තාගේ තිලක් ඇතුළු සහචරයිනුත්ය. ඒත් ඔවුන් තාමත් තමන් දෙදෙනා ඉන්න තැනක් දන්නේ නැත. දැනගතහොත් කෙළින් ඇවිත් පහර දෙනවා මිස හැංගි හැංගි අරියාදු කරන්නේ නැත. අර්චනා හිතුවාය.

SL-UNLIMITED E-BOOK The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"ඇත්තට කව්ද මෙහෙම කරන්නෙ ?..."

රවිශ්ක ඇහුවේ හිතාගන්න බැරිවය.

"ඊයේ අපි දැක්කා කවුරුහරි මේ ගස් අස්සේ හැංගිලා ඉඳලා වැව පැත්තට දිව්වා... අපේ දෙන්නෙක් පස්සෙත් එළෙව්වා... ඒත් අල්ලාගන්න බැරිවුණා... හැබැයි වලව්වත්තේ ඉඳලා ඔරුවක් හරි හයියෙන් එගොඩට පැදන් යනවා කොල්ලො දෙන්නා දැකල තියෙනවා... මොකා නමුත් ඔරුවෙන් එන එකා තමා අපට කරදරකරන්නෙ..."

බාසුන්නැහේ කීවේය.

රවිශ්කත් අර්චනාත් මුහුණෙන් මුහුණ බලාගත්හ. පෙරදා රැයේ වැව් දිය හරහා මෙගොඩට ආ ඔරුව ඔවුන් හොඳටම දුටුවා නොවේද?

"කව්ද මේ කරදරකාරයා..."

රවිශ්ක අතකින් නළල පොඩි කළේය.

"කවුරු උනත් තව වැඩි දවසක් අපි මිනිහාට හැංගි මුත්තන් කරන්න ඉඩ දෙන්නෑ... මහත්තයා... අපේ කට්ටිය හය හත් දෙනෙක් ඉන්නවනෙ... හෙට අනිද්දම අපි රෑට මිනිහව අල්ලගන්නවා..."

ගුණරත්න කීවේය.

"කරන දෙයක් පරිස්සමට ගුණරත්න බාසුන්නැහේ... කාගේවත් ජීවිතයක් අනතුරේ දලා බෑ..."

රවිශ්ක කීවේය.



Scanned by CamScanner

අර්චනාගේ දෙපතුල පවා ගැහෙමින් තිබිණ.

"මේ මොකද වෙන්නේ රවී..."

ඈ රවිශ්කගෙන් ඇහුවේ පින්තාරු බාසුන්නැහේ යනතුරු හිඳය.

බලමුකො අර්චි... මේක කරන්නෙ කව්ද කියලා අපට දැනගන්න ලැබෙයි..."

රවිශ්ක කීවේය. අර්චනාගේ හදවත බිය ගත්තාය. ලොකු අනතුරක් අත ළඟයි ඇගේ හිත ඇයට කීවේය.

■ ■ ■ ■ ■ ■ ■

සුගතන් ලහි ලහියේ දවල් කෑම හදයි... අර්චනා බලෙන්ම කුස්සියට වැදී ඔහුට සුළු සුළු අත් උදව් දෙයි. හෝටලය පටන් ගත් පසු කෝකියන් වැඩට ගනී. ඒ නිසා කරදරයක් නැත. දැන් දවල් කෑමට දහදොළොස් දෙනෙක් ඉන්නා නිසා සුගතන් දවස තිස්සේ කුස්සියේය.

"නෝනා..."

තැම්බූ අල ටික පොතු අරින ගමන් අර්චනා හිස ඔසවා බැලුවාය.

"මහත්තයාගෙ අසනීපෙට මක්කරන්නෙයි කල්පනාව?"

ඔහු ඇසුවේය. අර්චනා ගැස්සිණ.

"ඒ කිව්වේ..."

"එක සැරයක් බැල්මක් ඇගට වැටිච්ච කෙනාට ආයෙ



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
www.sl-unlimited.com
Scanned by CamScanner

කොයි මොහොතක හරි ඒ ටික වෙනවා නෝනා..."

"සුගතන් කියන්නේ එදා රෑ වගේ කොයි වෙලාවක හරි මහත්තයාට ආයෙ අසනීපවෙයි කියලද?"

අර්චනා බියෙන් ඇසුවාය.

Sumee
www.sl-unlimited.com

"එහෙනං..."

අර්චනාගේ ඇග වෙව්ලා ගියේය. ඒ බියකරු බැල්ම - හඬ අර්චනාට සිහිවිය. ඇගේ ඇඟිලි පවා වෙව්ලිණ.

"ඒත් මහත්තයා දැන් හොඳට ඉන්නවානෙ..."

ඈ කීවාය.

"හොඳට ඉන්නවා නේන්නං මතුපිටින් පෙන්න... ඒත් ඇතුළෙ ඉන්නෙ මොකාද කියල දන්නෙ උඩ ඉන්න දෙවියො විතරයි නෝනා... නෝනාට තිකමටවත් මහත්තයාගේ වෙනසක් තේරෙන්නේ නැද්ද?"

අර්චනා ගල්ගැහිණි. ඇත්තය. රවිශ්කගේ පැහැදිලි වෙනසක් තිබේ. ඔහු දැන් කැමති තනි ඇඳක පාඩුවේ නිදාගන්නය. තමා ඔහු ළඟ වැතිරුනත් ඔහුට ගාණක් නොවේ. තාම විවාහයේ මුල් කාලය නොවේද?

"ඇයි ඉක්මණට රෑ වෙන්නැත්තේ?"

රවිශ්ක සමහර දවස් වලට ඇස් පුංචි කර මනමාල හිනාවක් පා අර්චනාගේ කනට කර කියා ඉවත යන හැටි අර්චනාට සිහිවිය. සමහර දවස් වල දවාලේ පවා බදා වැළඳ ගන්නා රවිශ්කව තමා එළවාගත්තේ බොරුවට සැර කරය. ඒත් ඒ ආදරණීය පිරිමියා දැන් මහපොලව ගිලගත්තාසේය. රවිශ්ක

SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

බිත්තිය පැත්තට හැරී නිදාගන්නේ ගොරව ගොරවාය.

පෙර දුටු අර ආදරණීය උණුසුම් පිරිමියාව ආයෙමත් දකින්නේ කවදාද කියා මහා ලෝබකමක් අර්චනාගේ හිතේය.

www.sl-unlimited.com Sumee

"නෝනා..."

සුගතන්ගේ කටහඬින් අර්චනා කල්පනා ලොවින් මිදිණ. යාන්තමට දෙනෙත් තෙමූ කඳුළ ඈ උරිස්සේ පිසගත්තාය.

"මහත්තයා ඒ ගැන දන්න කාටහරි පෙන්නුවොත් හොඳයි නෝනා..."

සුගතන් කීවේය.

"ඔය සිරිපාල ගැනයි මාලතී මැණිකෙ ගැනයි මොනවද සුගතන් දන්නෙ..."

හදිසියේ සිහිපත් වූ කලක මෙන් අර්චනා ඇසුවාය.

"දෙයියන්පා... මං මොකුත් දන්නෑ නෝනෙ.... ඔය නම් දෙක මං ඇහුවාමයි... කොහේ උන්න භූතයෙක්ද කවුද දන්නෙ..."

සුගතන් කීවේය. අර්චනා කල්පනාවක වැටිණ. සිරිපාල කෙනෙක් ගැන හෝ මාලතී මැණිකේ කෙනෙක් ගැන ඇගේ මතකයක් නැත. ඒත් එදා මාලතී මැණිකේ කියා කතා කළේ තමාටම කියා හේතුවක් නැතුවත් අර්චනාට හිතේ.

"කමක් නෑ රවී... මං මගේ පණ දීල හරි ඔයාගෙ ජීවිතේ බේරගන්නවා..."

නැවත ඒ භූතයාට මුහුණ දීමේ කැමැත්තක් හිතේ නො-

SL-UNLIMITED E-Books The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

වේ. ඒත් වුවමනාවන් වුණොත් ආදරය වෙනුවෙන් සැමියාගේ ආදරය ජීවිතය වෙනුවෙන් ඕනෑම රාක්ෂයෙකුට මුහුණ දෙන්නට හයියක් අර්චනාගේ හිතේ හැංගී තිබිණ. ගැහැණියකගේ හිතේ තමන්ගේ පිරිමියා වෙනුවෙන් උපදින ආදරය ගැන දන්නෝ කවුරුන්ද? අවශ්‍ය විටක ගංගාවක් වී හැම දෙයක්ම සෝදාගෙන යන්නට ඒ ආදරයට පුළුවන. උවමනාව නම් ඒ ආදරයටම මහා ගින්නක් වී ආදරය නමින් සියල්ල ගිනි තියන්නට පුළුවන. ඔව් අවශ්‍ය නම් මේ මුළු කේසර වලව්වම ගිනි තියන්නට පුළුවන. අර්චනා වේදනා දෙන හිත ආදරය නමින් රවිශ්ක නමට හිතේ වූ ආදරය නමින් හයිය කරගත්තාය.

■ ■ ■ ■ ■ ■ ■

රැය සොඳුරුය. එහෙත් රැයේ සොඳුරු බව දැනෙන්නේ සැනසීම හිතේ ඇතිවිටය. එළඹෙන ඊළඟ මොහොත කොහොමවේද නිරන්තරයෙන් බියෙන් පසුවන හිතටකට මේ රැයේ සොඳුරු බව දැනේන්නේ නැත. දැනෙන්නේ රැයේ නිසල බව වසාගත් අනතුර පමණය. අර්චනා උන්නේ නින්දේය. ඒ නින්ද ගැස්සී ගියේ කෑකෝගැහීමක හඬිනි.

"අල්ලපියව්... අල්ලපියව් පැනගන්න දෙන්නෙපා..."

එකකට එකක් පැටලුණු පිරිමි කටහඬවල් රාශියක් එළියෙන් ඇසේ. අර්චනා ඇඳේ හිඳගත්තාය. ඇයට පෙර රවිශ්ක ඇඳෙන් බැස උන්නේය. කළුවරේ හිටගෙන ඔහු එළියේ ඇහෙන කාලගෝට්ටියට ඔළුව හරවා හරවා කන්දේ.

"රවී..."

අර්චනා ඇඳෙන් බැස්සාය.

"මොකද්ද ඒ සද්දේ...."



www.sl-unlimited.com
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඈ රවීට ළංවූවාය.

රවී ඈ දෙසට හැරිණ. ඒ ඇස්වල වූ බැල්ම දුටු අර්චනා වෙව්ලා ගියාය. ඒ ඇස් අමුතුය.

"මාලතී මැණිකෙ..."

www.sl-unlimited.com Sumee

රවිශ්ක කීවේය. අර්චනා පස්සට විසිවිය. මේ රවී නොවේ. රවිගේ ශරීරයේ ඉන්නා වෙනම කෙනාය.

"වෙලාව ඇවිත්..."

ඔහු ආයෙම කීවේය.

"මො...ක...ට...ද?"

අර්චනා ගොත ගැහුවාය.

"මගේ උන්ට කතාකරන්න..."

ඔහු කීවේය. අර්චනා ට නොතේරිණ. දොරහැරගත් රවිශ්ක එයින් පිටවිය. බියෙන් බියෙන් අර්චනාත් දොරකඩ පතිද්දී සුගතන් එතනය.

"මොකද සුගතන් එළියේ වෙන්නෙ...?"

අර්චනා ඇහුවාය.

"බාසුන්නැහේ අර ඔරුකාරයා පස්සෙ පන්නනවා නෝනා..."

සුගතන් කීවේය.

SL-UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"දෙයියනේ..."

අර්චනා එළියට බැස්සාය. පින්තාරු බාසුන්නැහේගේත් ඔහුගේ ගෝලයින්ගේත් සද්ද ඇහෙන්නේ වැවට කිට්ටුවෙනි. ඉදිරියෙන් රවිශ්ක ඒ දිහාවට යමින් උන්නේය. අර්චනා දිව්වාය. ඒ රවී පස්සෙනි. සුගතන් ඊටත් පස්සෙනි.

www.sl-unlimited.com Sumee

වැවට මෙහායින් මාදං පඳුර ළඟ අඩක් ජලයේ අඩක් ගොඩබිම නතර කර තිබුණේ ඔරුවය. එතන අඳුරේ හිටගත් මිනිහෙක් දඩයම් තුවක්කුවක දිග බටය හතර අතට එල්ල කරමින් හිදී.

"වටකරපල්ලා පැන ගන්න දෙන්න එපා..."

බාසුන්නැහේත් ගෝලයෝත් දියෙන් ගොඩින් අගන්තුකයාව වට කරමින් උන්හ. මේ සිද්ධිය පේන දුරින් රවිශ්ක නතරවිය. ඊ අඳුරේ දෑත දෙපා විහිදුවා රවිශ්ක සඳ එළිය අතරේ හිටගෙන හිටියේය. ඒ කොණ්ඩය අවුල්ව දෑසට වැටී තිබිණ.

"පැනපු ගමන් අල්ලපල්ලා..."

ගුණරත්න කොල්ලන්ට අණ දේ.

"එකෙක්වත් කිට්ටු වෙන්නෑ..."

තුවක්කු බටය අරමුණක් නැතිව එහා මෙහා වනමින් ආගන්තුකයා කෑගෑවේය.

"එකෙක් කිට්ටු වෙන්නෑ... තියනවා ඔළු කටු කුඩුවෙන්ඩ... මට උන්නත් එකයි... මළත් එකයි බොල..."

ඔරුකාරයා - අත්භූත ඔරුකාරයා කෑගෑවේය.



SL UNLIMITED E-Book
Home of Sri Lankan e-community
Scanned by CamScanner

"සේදර මලයා... ! "

අර්චනා වෙව්ලා ගියාය. රාත්‍රිය විනිවිද ගිය රවිශ්කගේ ඔහුගේ හඬ කේසර වලව්වත්තේ උස්ගස් අතර රැව්දිණ.

"සේදර මලයා.... !"

www.sl-unlimited.com
Sumee

රවිශ්ක ආයෙමත් කෑගැහුවේය. එවර අඳුරේ උන් ඔරුකාරයා වෙව්ලා ගියේය. ඔහු පමණක් නොවේ ගුණරත්න බාසුන්නැහේත් තැන තැන උන් ඔහුගේ ගෝලයොත් වෙව්ලා ගියහ.

"මොකාද බොල ?..."

ඔරුකාරයාගේ විමතියට පත් කටහඬ අඳුර තුළින් ඇහිණ.

"සේදර මලයා... උඹට මාව අඳුනාගන්න බැයිද බොල? මං සිරිපාල... මං උඹේ අයියා සිරිපාල..."

රවිශ්ක කීවේය.

"කිරි අප්පච්චියෙ !"

අර්චනාට පස්සේ උන් සුගතන් කම්මුලට අතතියා ගත්තේය.

"සි...රි....පා...ල..."

අදහාගත නොහැකි ඔරුකාරයාගේ කටහඬ පහත් හඬින් ඇහිණ.

"ඔව් බොල... මං සිරිපාල..."



SL-UNLIMITED E-Book
The best of Sri Lankan e-community
Scanned by CamScanner

රවිශ්ක ආයෙම කිව්වෙය.

"ඒක වෙන්නෙ කොහොමද බොල... සිරිපාල මැරුණා... මං මගෙ ඇස් දෙකෙන්ම දැක්කා උඹව අපේ ඉඩමෙ වලදානවා..."

ඔරුකාරයා කීවේය.

"උඹ වල දානවා දැක්කෙ මගෙ ඇග විතරයි බොල... ඒත් මං තාම ඉන්නවා... උඹට මාව අඳුරන්ඩ බැයිද?"

රවිශ්ක ඇහුවේය.

"ඔය කෙප්පවලින් මාව තම්පන්න බෑ... සිරිපාල එගොඩ ගිහින් දැන් අවුරුදු පනහක් විතර වෙනවා බොල..."

ඔරුකාරයා කීවේය.

"ඇවිත් බලාපිය... තොට එතකොට මාව මතක නැද්ද...? තෝ එතකොට ගැටයා... මතකද තොට කිරි කන්ඩ ආස හිතිලා දවසක් රෑ අපි කේසර වලව්වේ කුස්සියට පැනලා කිරියි පැණියි බඩ පැලෙනකන් හොරා කාපු හැටි..."

"අප්පොච්චියෙ..."

ඔරුකාරයාගේ කටහඬේ වේදනාවක් කැටිව තිබිණ.

"මේ උඹම තමා අයියණ්ඩි... ඒ රහස දැනං උන්නෙ අපි දෙන්නා විතරයි..."

ඔරුකාරයා වෙව්ලමින් තුවක්කු බටය දික්කරගත්ත ගමන්ම අඩි කීපයක් ඉදිරියට ආවේය. මේ වන විටත් සිදුවෙන දේ අදහාගත නොහැකිව ගුණරත්න බාසුන්නැහේත් ඔහුගේ

www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Books
Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ගෝලයෝත් උන්නේ එකතැනකට රොක්ව ගල්ගැහීය.

ඔරුකාරයා තව අඩි කීපයක් ඉදිරියට ආවේය. එවර සඳ එළියෙන් අර්චනා ඔහුගේ මුහුණ දුටුවාය. ඔහු ගැමියෙකි. වයස අවුරුදු හැටක පමණ වන ගැමියෙකි. එහෙත් හොඳ සවිශක්තිමත් ඇගපත ඇත්තෙකි.

www.sl-unlimited.com Sumee

"මං මළේ නෑ මලයා... මං තාම ඉන්නවා..."

රවිශ්ක කීවේත් පෙරට වඩා තැන්පත් කටහඬිනි.

"උන් උඹව මැරුවා අයියා... මට ඒක විශ්වාසයි... මං එදා ඉඳලා කවදාවත් උන්ගෙ එකෙකුටවත් මේ වලව්වේ සැනසීමෙන් ඉන්න දුන්නේ නෑ... උඹව විනාශ කරපු මේ කේසර වලව්ව ඇතුළෙ කිසි එකෙකුට සැනසීමෙන් නිදාගන්න මං ඉඩ තියන්නෑ සිරිපාලයියා..."

කෑගසා හඬමින් ඔරුකාරයා කීවේය.

"මං දැන් ඉන්නවා බොල... මං දැන් නිදහස්.... මේ වලව්ව දැන් මගේ... උඹ ආයෙ මෙහෙ එන්න ඕන්නෑ... පලයං කේසර වලව්ව හතර මායිමෙන් එහාට පලයං... කේසර වලව්ව දැන් මගේ !"

රවිශ්කගේ ඇග තුළ උන් භූතයා නැගූ ඒ බියකරු හඬ රැයේ විනිවිද ගියේය. සුළඟක් හමා වියළි කොළ අහසට ඉගිලිණි.

"කේසර වලව්ව මගේ... !"

ආයිමත් ඒ හඬ දෙදරවා ඇසිණ. ඔරුකාරයා පල්ලම් බැස්සේය. මිනිස් ඉන්ද්‍රයන්ට අසුනොවන යමක් සිදුවෙමින් පැවති බව ඔහු තේරුම් ගන්නට ඇත.



SL-UNLIMITED E-BOOK The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

රවිශ්ක හැරිණ. ඔහු දුටුවේ බියපත් දෑසින් ඔහු ළඟ උන් අර්චනාය.

"මාලතී මැණිකෙ... අපි යං වලව්වට..."

ඔහු ඉස්සර විය. අඩියට දෙකට සුළගේ වේගයෙන් වලව්ව දෙසට ගියේය. අර්චනා ඒ පස්සෙන් ගියේ හීනෙන් ඇවිදින්නාසේය.

www.sl-unlimited.com Sumee

■ ■ ■ ■ ■ ■ ■

රැය ඇහැරී තිබිණ. එළඹුණු දවසට මුහුණ දෙන්නට අර්චනා බියපත් වූවාය. සිදුවෙමින් පැවතියේ ජීවිතේ කිසිදාක ප්‍රාර්ථනා කළ දේ නොවේ. කලින් රවීගේ තත්වය දැන උන්නේ සුගතන් පමණි. දැන් එය ගුණරත්න බාසුන්නැහේත් ඔහුගේ ගෝලයනුත් දනිති මේ මිනිස්සුන්ට මුහුණ දෙන්නේ කොහොමදැයි අර්චනාට හිතාගන්නට බැරිය.

ඈ අවදි වද්දී රවිශ්ක නිදිය. යහනේ බිත්තිය පැත්තට හැරී වකුටු වී නිදිය. පොරවනය ඔහුගේ ගත වැසෙන්න දැමූ අර්චනා ඒ බොකුටු හිසකේ මෘදුව අතගෑවේය. ඒත් ඔහු නිදිය. තමාගේ ඇඟිලි වල පහස පෙර මෙන් දැන් ඔහුට නොදැනේ. වරින් වර රවිශ්කගේ ඇඟ ඇතුළට රිංගාගන්නා මේ භූතයා කවුරුන් උනත් ඌ නිසා තමන් දෙදෙනාගේ බැඳීම ඈත් වනවා අර්චනාට දැනේ.

මුණ කට සෝදාගත් අර්චනා ගවුමකට මාරුවී එළියට එනවිටත් රවිශ්ක නිදිය. අර්චනා ඉස්සරහා පැත්තෙන් මිදුලට බැස්සාය. මිදුල කොණක ගුණරත්න බාසුන්නැහෙත් ගෝලයෝ රොත්තත් ලොකු කතාබහකය.

"නෝනා..."

SL UNLIMITED E-Books The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

අර්චනා දුටු ගුණරත්න බාසුන්නැහේ ඉදිරියට ආවේය.

"තාම වැඩ පටන් ගත්තේ නැද්ද".

අර්චනා ඇසුවාය. වෙනදානම් මේ වෙලාවට වැඩපටන් අරගෙනය.

www.sl-unlimited.com Sumee

"මහත්තයත් අසනීපෙන් නිසා අපි වැඩ නතර කරනවද කියලා කල්පනා කළේ..."

ගුණරත්න බාසුන්නැහේ කීවේ හොරැහින් ගෝලයින් දිහා බලබලාය. ඔවුන් හැම එකාම උන්නේ බය වෙලාය. ඇත්තය. එහි පුදුම වෙන්න දෙයක් නැත. අර වගේ අද්භූත සිදුවීමකට මුහුණ දුන් පසු බය නොවන්නේ කව්ද?

"මහත්තයාට ටිකක් අසනීපයි තමා... ඒත් වැඩ නතර කරන්න ඕන නෑ... ඔය ගොල්ලො ඉතුරු වැඩ ටිකත් කරගෙන යන්න..."

අර්චනා කීවාය. මේ කේසර වලව්ව ඇතුළේ ආගන්තුකයින්ට ඇවිත් යන්න - රසවිඳින්න ඉඩහැරීම ඔහුගේ බලාපොරොත්තුවය. අර්චනා සැමියාගේ අදහස ඉටුවනු දකින්ට රිසි වූවාය.

"ඒත් නෝනා, මහත්තයා ටිකක් සනීප වෙනකම්වත්..."

ගුණරත්න ඉතිරිය නොකියා අර්චනාගේ මුහුණ බැලුවේය.

"මහත්තයාගෙන් ඔයලාට කරදරයක් වෙන්නෑ... මං ඒක ස්තීරෙටම කියනවා..."

අර්චනා දෘඩිව කීවාය. ඔවුන්ට උවමනා කළේ ඒ



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

පිළිතුරය.

"දැන් ඉතිං රට රට ඔරුකාරයා එන්නේත් නැති හින්දා ඕගොල්ලන්ට කරදර කරන්න කවුරුත් නෑ... ඔයාලට ඔයාලාගේ පාඩුවේ වැඩේ කරගෙන යන්න පුළුවන්..."

Sumee
www.sl-unlimited.com

අර්චනා කීවාය.

"මෙච්චර දුරට කරගෙන ආව වැඩේ අතරමග දමල ගහල යන්න අපටත් ඕනෙ නෑ නෝනා... අපිත් කැමති මේ වැඩේ ඉවර කරල දීලා අතට කීයක් හරි අරගෙන දෙයියනේ කියල යහතින් ගෙවල්වලට යන්ඩ..."

ගුණරත්නගේ මුහුණට තරමක් එළියක් වැටී තිබිණ.

"ඒක තමයි... මං කිව්වේ අපි දෙගොල්ලන්ටම හොඳක් වෙන දෙයක්... අනිත්තෙක එයාට මෙහෙම අසනීපයක් තියෙන බව තාම මහත්තයා දන්නෙත් නෑ... ඒ හින්දා කවුරුත් මහත්තයාගෙන් ඒ ගැන අහන්න යන්න එපා... රෑ නිදාගෙන උදේ නැගිට්ටාම අපේ මහත්තයාට ඔක්කොම අමතකයි..."

තත්වයේ බරපතල කම අකාමකා දමන්නට අර්චනා ඒ මොහොතේ හිනාවක් මුහුණට නගාගත්තාය.

"හා ළමයිනේ.... එහෙනම් ඇඳුම් මාරු කරගෙන වැඩ පටන් ගමු..."

ගුණරත්න එහෙම කියාගෙන ගෝලබාලයින් අතරට ගියේය. අර්චනා ගේ මැදින් කුස්සියට ආවාය.

"සුගතන්"

සුගතන් හාල් වගයක් හෝදනවාය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"කට්ටිය ගියාද නෝනා...?"

ඔහු ඇහුවේ හැරී බලාය.

"මොන කට්ටියද...?"

අර්චනා ඇහුවාය.

www.sl-unlimited.com Sumee

"ඇයි ඔය බාසුන්නැහෙයි ගෝලයෝ රොත්තයි කදමලු බැදගෙන මිදුලෙ උන්නෙ... ගෙවල්වල යන්න ඕන කියල කංකෙඳිරි ගෑවා... මං කිව්වා මට නම් කිසිදෙයක් කියන්න එපල්ලා... ඕන ගණුදෙණුවක් නෝනායි මහත්තයායි එක්ක බේරගන්න කියලා..."

සුගතන් කීවේය.

"වැඩ නතර කරලා බෑ සුගතන්... අපි දෙන්නාගේ බලාපොරොත්තුව හෝටලේ පටන් ගන්න එක අපට කවදා හරි ආදායම් මාර්ගයක් වෙන්නේ ඒක..."

අර්චන කීවාය.

"නෝනා..."

සුගතන් සේදූ හාල් ටික විදුලි උදුනට දමා අර්චනාට කිට්ටු විය.

"ඇහුවට අමනාප හිතන්න එපා... දෙපැත්තෙම වැඩිහිටියො කව්රුවත් නැතෙයි?"

SL-UNLIMITED E-Book

අර්චනාට මහා ආත්මානුකම්පාවක් දැනිණ.

"මහත්තයාගේ අම්මායි තාත්තායි දෙන්නාම නෑ... මගෙ



Scanned by CamScanner

අම්මා නෑ... ඒත් තාත්තායි සහෝදරියකුයි ඉන්නවා... ඒ ගොල්ල මේ මගුලට කැමැත්තක් තිබ්බෙ නෑ..."

අර්චනා ඇත්තම කීවාය. සුගතන්ට හංගා එලක් නොවේ. මේ ගෙදර වැඩිහිටියෙක් වාගේ දුකට සැපට ඉන්නේ ඔහුය.

www.sumee
www.sl-unlimited.com

"ඒකත් එහෙමද?.... එහෙනමනම් මක්කරන්නෙයි... නැත්නම් මේ වෙලාවේ වැඩිහිටියෙක් ඉදිරිපත්වෙලා මහත්තයා ගැන හොයලා බලන්න ඕන..."

"අපි මහත්තයාට මොකද කරන්නෙ සුගතන්...?"

අර්චනා පත්වූයේ මේ ප්‍රශ්නය සුගතන්ගෙන් අහන්නේ නැතුව බැරි තැනකටය.

"මහත්තයාගේ ඇගට දෝෂයක් වැහිලා නෝනා... මීට කලින් එහෙම දෙයක් වෙලා නැත්නම්... ඒ දෝෂේ වැහිලා තියෙන්නෙ මෙහෙන්... කේසර වලව්වෙන්..."

සුගතන් කීවේය.

"නෑ... සුගතන්, මහත්තයා මෙහෙ එන්න කලින් ඔහොම දෙයක් වෙලා නෑ... ඕක වුණේ මෙහාට ආවට පස්සේ..."

"එහෙනං මං හිතුවා හරි... අවුරුදු ගාණක් මං මේ ගෙදර උන්නා කෝ මට මුකුත් උනැයි... ඒ කාලෙ අර උඩ කාමරේ දොරවල් වහලනෙ තිබ්බනෙ... ඉඳහිටලා රෑට එක එක සද්ද ඇහුණට ඔහොම එකෙක් මේක ඇතුලෙ ඉන්න බවක් මං දැනගෙන උන්නෙ නෑ... ඇයි ඇර මැද මිදුලට යන තැන දොර වහලනෙ... මට හිතෙන්නෙම නෝනා ඔය දොර කැඩුවයින් ඇතුළෙ උන්න මොකාහරි එකා නිදහස් වුණා... ඌ තමා අපේ මහත්තයාට දුන් වින කරන්නෙ..."



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සුගතන් කියවාගෙන ගියෙය්. අර්චනාගේ ඇඟපත වෙව්ලා ගියේය. මේ කතාව පිළිගන්නට පුළුවන. ඔය දොර අරින්න පළමු දා රැයේ දුටු සිහිනය අර්චනාට සිහිවිය. කඹයෙන් ළිඳ ඇතුලේ බොලොක්කේ එල්ලී පැද්දෙමින් තිබූ සිරුර අර්චනාට සිහිවිය. ඒ පිරිමියා තමාට මුලින්ම කතා කළේත් මාලතී මැණිකේ කියාය. මගේ මාලතී මැණිකේ කියාය. දූත් වරින් වර රවිශ්කගේ සැබෑ ස්වරූපය ඉවත්ව ගියවිට කතාකරන්නේත් එහෙමය. රවිශ්කගේ ඇඟට එන්නේ ඒ පිරිමි ආත්මයද? හිතට ආ ඒ සිතුවිල්ල නිසා අර්චනා වෙව්ලා ගියාය.

"අපි මොකද කරන්නෙ සුගතන්..."

අර්චනා ඇසුවේ අසරණ හඬකිනි.

"මහත්තයාගේ ඇඟෙන් මළගිය ප්‍රාණාකාරයාව අයින් කරන්න පුලුවන් කෙනෙක් අපට හොයා ගන්න වෙනවා..."

"මොනා කළත් මහත්තයාට රහසින් කරන්න වෙන්නෙ... එයාට මෙහෙම දෙයක් සිද්ධ වෙන බවක් එයාවත් දන්නේ නෑ..."

අර්චනා කීවාය.

"මං ප්‍රතිකර්මයක් කරන්න පුළුවන් විදියක් හොයා බලන්නම්කෝ නෝනා..."

සුගතන් කීවේය. අර්චනා කුස්සියෙන් පිට වූයේ පුංචි බලාපොරොත්තුවක් හිතේ තෙරපෙද්දීය.

. . . . . . .

අඳුර එන්නේ සෙමිනි. ඒත් ඊට වඩා වේගයෙන් හිතට බිය ගොඩ වේ. අන්ධකාරයත් එක්ක එන අද්භූතසිදුවීම් වලට

www.sl-unlimited.com



Scanned by CamScanner

අර්චනා බය වූවාය. දිනපතාම කුමක් හෝ නපුරු දෙයකට මුහුණ දෙන්නට වීම දැන් පුරුද්දක් වීය. රාත්‍රියත් , රාත්‍රියේ ලැබෙන මේ බියජනක සිදුවීමුත් නැති දිනක් උදාවූයේ නම් ඒ ඉතා කලාතුරකිනි.

"නෝනා... නෝනා..."

අර්චනා ඇහැරුනේ සුගතන්ගේ දොරට ගසන හඬටය. අර්චනා අන්දමන්දව යහනේ හිඳගත්තාය. ඇඳ ළඟ කුඩා ඔරලෝසුවේ අඳුර විනිවිද යන ළා කොළපාට විදුලි එළියෙන් බැබලුන ඉලක්කම් කීවේ මේ මහ රෑය බවය. අර්චනා බැස දොර හැරියාය.

"නෝනා ගේ පිළිකන්නෙන් අමුතු සද්දයක් ඇහුණා..."

සුගතන් විදුලි පන්දම අතේ තියාගෙන කීවේය.

"අමුතු සද්දයක්..."

"ඔව්... මොකෙක් හරි සතෙක් මරණ බයෙන් කෑගැහුවා වගේ..."

සුගතන් කීවේය. ඊළඟ තත්පරයේ මොනවා වෙන්න යනවාද දන්නේ නැත. අර්චනා බයෙන් ආපහු හැරී යහන දෙස බැලුවාය.

"දෙයියනේ..."

ඇගේ දෙපතුළින් ගිනිපිටවිය. යහන හිස්ය. රවිශ්ක එහි නොවේ. ඔහු කොහේද?

"ඇයි නෝනා...?"



Scanned by CamScanner

[illegible]

"[illegible]..."

[illegible]

"[illegible]..."

[illegible]

"[illegible]..."

[illegible]

"[illegible]... [illegible]... [illegible]... [illegible]... [illegible]..."

[illegible]

"[illegible]..."

[illegible]

"[illegible]..."

[illegible]

[illegible]



Sumee
www.sl-unlimited.com
SL UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

පුරවන බැරලයකි. සද්දය එන්නේ ඊට එහා පැත්තෙනි. සුගතන් විදුලි පන්දම එතනට එල්ල කළේය.

"කිරි අප්පොච්චියෙ..."

සුගතන්ට කෑගැහිණ.

www.sl-unlimited.com Sumee

"දෙයියනේ..."

අර්චනා සිහිනැතිවෙන්න අවේය. ඈ හිමිහිට බිත්තිය අල්ලාගත්තේය.

රවිශ්ක - ඔහු එතැන උන්නේය. ඒත් ඒ නිකම්ම නොවේ. අමු අමුවේ මරාගත් දුඹුරු හාවෙක්ගේ මස් තලු මරමින් කන අතරේය.

"හිහ්... හිඃ... හිහ්... හිඃ..."

රවිශ්ක ලේ තැවරුන මුවින් භයංකර හිනාවක් නැගුවේය. ඒ හිනා හඬ කේසර වලව්වෙ බිත්ති අතර වැදී දෝංකාර දුන්නේය. ඔහුගේ වත පුරාම ලේය.

"මහත්තයො..."

සුගතන් වෙව්ල වෙව්ල කතාකළේය. මැරුණු හාවාගේ ඉතිරි කොටස් ටික සුගතන්ගේ ඇඟට දමාගැසූ රවිශ්ක අඳුර අතරේ නොපෙනී ගියේය.

"නෝනා..."

සුගතන් හැරී බැලුවේ අර්චනා දෙසය. බිත්තිය පමුල හිඳගෙන ඈ දෝතින්ම මුණ වසාගෙන හඬා වැටිණ.

SL-UNLIMITED E-Books



Scanned by CamScanner

"නෝනා..."

සුගතන්ගේ හදවතට මහා වේදනාවක් දැනිණ. මේ සොඳුරු තරුණ යුවළ වලව්වට පය තැබූ මුල් දවස ඔහුට සිහිවිය. ඔවුන් අහිංසකය. මේවාගේ විපතකට මුහුණ දෙන්න ඔවුන් ගිය ආත්මේක ලොකු පාප කර්මයක් කරන්න ඇතිය.

www.sl-unlimited.com

"මේ මොනද වෙන්නේ සුගතන්... අනේ මං කොහොමද මේවා දරාගන්නේ..."

අර්චනා හැඬුවාය.

"අපි යං නෝනා... නැගිටිමු... අඬලා දොඩලා බෑ මේ වෙලාවේ... හිතට හයියගන්න ඕන... හා... හා... නැගිටිමු..."

සුගතන් අර්චනාගේ අතකින් අල්ලා නැගිටවාලීය. ඔහුගේ හදවත ඇ නමට දුකක් තිබිණ. මේ නොමේරූ අලුත් බිරියට මේ ප්‍රශ්නය බරපතල වැඩි වග ඔහුට නොතේරුණා නොවේ. එහෙත් මුලින්ම කළ යුත්තේ ඔවුන්ව ආරක්ෂා කිරීමය.

අර්චනාගේ අතින් අල්ලාගෙන සුගතන් තව ටිකක් ගස් අතරට ගියේ දෙපැත්තට විදුලි පන්දම එළිය කරමිනි. ඒ හොඳ සෝදිසියෙනි. ටිකක් ඉදිරියෙන් සුදු පොදියක් බිම වැටී තිබෙනු දෙදෙනාම දුටුවෝය.

ඒ රවිශ්කය. මුනින් අතට බිම වැටී උන්නේ රවිශ්කය.

"අනේ රවී..."

අර්චනා හඬමින් ලේ තැවරුන රවිශ්කගේ මුහුණ අතගෑවේය.

"බලබලා ඉඳලා බෑ නෝනා.... මං මේ පැත්තෙන්



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අල්ලන්නං... නෝනා කකුල් දෙක උස්සමු..."

සුගතන් කීවේය.

රවිශ්ක උන්නේ සිහිසන් නැතුවය. සුගතන් හා එකතුව ඉතා අමාරුවෙන් අර්චනා රවිශ්කව කාමරයට ගෙනාවාය. රවිශ්කගේ සිරුරේ තැවරුණ ලේ තෙත රෙදි කඩකින් පිසදමා ඇඳුම් මාරු කරද්දී ඇගේ නෙතින් නොකඩවා කඳුළු ගැලුවේය.

"අ...ර්...ච...නා..."

අතරින් පතර ඔහු සිහින් කෙඳිරියක් නැගුවේය. ඔහු උන්නේ සිහියත් - අසිහියත් අතරය. හරියට මත්වුණු අයෙකු සේය.

"ම...හ...න්සියි..."

නිදි ඇඳට වැටුණු රවිශ්ක බිත්තිය පැත්තට හැරී වකුටු විය. ඔහුගේ ලොවේ තමාට තිබූ ඉඩකඩ අහිමි වී යනවා අර්චනාට දැනේ. ඇත්තම කතාව නම් දිනෙන් දිනම ඔහුට ඔහුව අහිමි වෙමින් තිබිණ. දුර්වල වන පියවි සිහියෙන් ඈතට යන රවිශ්කගේ ජීවිතය දෙස අර්චනා බලා උන්නේ මහා වේදනාවකිනි. ඔහුගේ ඇග වැහෙන්නට පොරෝවනය දැමූ අර්චනා හීතලේම ඇදේ ගුලි ගැහුණේ වැරදීමකින් වත් ඔහුගේ ඇගේ අතක් පයක් නොවදින්නට වගබලා ගන්නා ගමන්ය. මේ නින්ද ඔහුට අවශ්‍යය. ශෛවීගිය ශක්තියත් පියවි සිහියත් යළි ලබන්නට ඔහුට මේ නින්ද උවමනාය. අර්චනා ඒ හින්දා රවිශ්කගේ නින්දට බාධා නොකරන්නට පරිස්සම් වූවාය.

■ ■ ■ ■ ■ ■ ■

රවිශ්ක දිනෙන් දින දුර්වල විය. ඔහු කෑම ගත්තේ අඩුවෙනි. ඒද අර්චනා පෙරැත්ත කර පසුවය. පියවි සිහියෙන්



Scanned by CamScanner

උන් වෙලාවකත් ඔහු උන්නේ තෝනතුවෙන්ය. බලාගත් අත බලාගත් ගමන්ය. පෙරදී මෙන් දුව පැන ගේදොර වැඩ සොයා බැලුවේ නැත. සියල්ල සොයා බැලුවේ අර්චනාය. ඇය කී යමක් වේනම් රවිශ්ක එය ඉටුකර දුන්නේය.

"මහත්තයා එන්න එන්න දුර්වල වෙනවා සුගතන් අපි මොකද කරන්නේ... ?"

www.Sumee www.sri-unlimited.com

අර්චනා ඇසුවාය.

"මං දන්න තැනක කට්ටඩියෙක් ඉන්නවා නෝනා... හවසට ගිහින් මං එක්කන් එන්නං..."

සුගතන් කීවේය. අර්චනා එකඟ වූවාය.

කට්ටඩියාට පණිවිඩය කියා ආ සුගතන් වැඩට බැස්සේය. පොල්කටු පහක් හයක් පිච්චෙන්නට දමා මල් බුලත් තට්ටුවක් හැදුවේය. පාට හතේ මල්, තුන්පාට නූල්, බුලත් හුරුල්ල, ආදී අඩුම කුඩුම දෙස අර්චනා බලා උන්නාය. සුගතන් කබලට පිච්චෙන අගුරු දමා දුම සැරට හදාගත්තේය. ගේ ඇතුලේ කලබලය වැඩි වෙන්න වැඩි වෙන්න රවිශ්කගේ කලබලයද වැඩිවිය. ඔහු වරක ඇඳේ හිඳගත්තේය. වරෙක පෙරලුනේය. එහාට මෙහාට හැරුණේය. හිනාවුණේය. කෝපයෙන් ගෙරෙව්වේය. ගුරුන්නාසේත් ගෝලයාත් ආවේ හවස හයට විතරය.

"ආතුරයාව ගේමු මෙහාට..."

කියාගෙන ගුරුන්නාසේ මල් බුලත් තට්ටුව ඉදිරිපිට මිටි පුටුවේ හිඳගත්තේය.

අර්චනා කාමරයට හිස පෙව්වේය. රවිශ්ක ඇඳේ හිටගෙන දෙපැත්තට පැද්දේ. කාලයකින් නොකැපූ කැරලි

SL UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

කොණ්ඩය මුහුණට වැටිලා දෑසත් වැහිලාය.

"මාලතී මැණිකේ..."

යටැසින් බලා රවිශ්ක ගෙරෙව්වේය.

"මොකද මේ වෙන්නෙ..."

ඔහු කෑගැහුවේය.

"අපි එළියට යං..."

අර්චනා හැකිතරම් සන්සුන්ව කීවාය. ඒ හිතට බොහෝ දිරිගෙනය.

රවිශ්ක ඇඳෙන් පැන්නේය. අඩියට දෙකට මල් බුලත් තට්ටුව ඉදිරිපිට හිටගත්තේය. කට්ටඬියා රවිශ්කගේ බිහිසුණු මුහුණ දෙස බැලුවේ ඔළුව උස්සාය. මොහොතකට ඔහුගේ ඇස්වලත් තිගැස්මක් ලකුණුවෙනවා අර්චනා දුටුවාය.

"කවුද මේ අතුරයට වැහැලා ඉන්නේ... දැන් කලබල නොකර කියමු බලන්න..."

ගුරුන්නාන්සේ රැල් බුරුල් හැර කීවේය.

"හිග්... හිඃ.... හිහ්... හිඃ..."

රවිශ්ක අර බිහිසුණු හිනාව පෑවේය.

"මං සිරිපාල බොල..."

ඔහුගේ ගම්භිර උස් හඬ කේසර වලච්ච දෙදරවා දැම්මේය. පැතිර තිබූ කට්ට කුමංජල් දුමාරය අස්සේ රවිශ්කගේ



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

රතු වී ගිය ඇස් ඇති සුදුමැලි මුහුණ වඩාත් බියකරු දසුනක්ව තිබිණි.

"තමා මොකද මේ අතුරයාගේ ඇගට ආවේ..."

"මං ඉන්න ඕන මාලතී මැණිකේ ළඟ..."

රවිශ්කගේ ඇගේ උන් සිරිපාල කීවේය.

"මාලතී මැණිකේ...? කවුද මාලතී මැණිකේ....? "

ගුරුන්නාස්සේ ඇහුවේය.

"මං ඉන්නේ මගෙ මාලතී මැණිකේ එක්ක බොල..."

සිරිපාල නැවත කීවේය. සුගතන් ගුරුන්නාස්සේගේ කණට ළංව යමක් කීවේය. මාලතී මැණිකේ කියා භූතයා කීවේ අර්චනාට බව ඔහු කියන්නට ඇත.

"ඒ මේ ආතුරයාගේ බිරිඳ... තමා මේ ලෝකෙට අයිති කෙනෙක් නෙමේ.... ආතුරයාට එයාගේ නෝනා එක්ක සතුටින් ඉන්න දීලා තමුන් දැන් මේ ඇගෙන් අයින් වෙන්න ඕන..."

ගුරුන්නාන්සේ කීවේය.

"මං යන්නේ නෑ බොල... කාටවත් මාව මෙහෙන් යවන්න බෑ... මේ කේසර වළව්ව මගේ... මං අවුරුදු ගාණක් මෙහෙ උන්නා... අවරුදු පනහක් හැටක් ගියත් මට මගේ මාලතී මැණිකේ අඳුනාගන්න පුළුවන් බොල...."

සිරිපාල කෑගැවේ අඩි පොලවේ හප්පමිනි. අර්චනා බිය වූවාය. සිරිපාල - මේ භූතයා ගුරුන්නාසේට උනත් අඩංගු වන පාටක් නැත.



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"ඕං මහපොලොව දෙබෑකර වර...
මහ සයුර දෙබෑකර වර...
සතර දිශාවේ යකුන් යකින්නියන් යටපත් කර
ඊරියකුනි වර... වර... වර..."

ගුරුන්නාසේ මතුරන්න පටන් ගත්තේය.

ඇගපත දැවිල්ල ගත්තා වගේ රවිශ්කගේ ඇග අරක් ගත් සිරිපාල දඟලුවේය.

"මාලතී මැණිකේ..."

ඒ රතු ඇස් පසෙක උන් මාලතී දෙස බැලුවේය.

"උඹ මේ කරන්නෙ වරදක්.... මේක නතර කරපං.. මාලතී මැණිකෙ... මේක නතර කරපං..."

අර්චනා ගුරුන්නාසේ දෙස බැලුවේ කිසිවක් හිතාගනන්න බැරුවය. ඒත් ගුරුන්නාසේට වගක් නොවේ. ඔහු දිගටම මතුරයි.

"මාලතී මැණිකෙ... මං යන්නේ මේකාවත් අරගෙන බොල... මං යන්නේ මේකාවත් අරගෙන...."

රවිශ්කගේ ශරීරය ගෙයි බිම හතර ගාතෙන් වැටිණ.

"අ...ර්...ච...නා..."

රවිශ්කගේ කෙඳිරිලි හඬ එවර අර්චනාට ඇසිණි.

"මගෙ... බෙල්ල.... හි...ර... වෙනවා... අ....ර්...චි...."

රවිශ්ක බෙල්ල අල්ලාගෙන විලාප දුන්නේය. අර්චනාට



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Books
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

බලා ඉන්න බැරි විය.

"අනේ දූන් ඇති..."

අර්චනා ගුරුන්නාසේට කීවාය.

"භූතයින්ට ඕන ඕන වෙලාවට ඕන ඕන වේශයන් මවාගන්න පුළුවන් නෝනා... උන් කොහොමත් රගපාන්න දක්ෂයි.... බයවෙන්න එපා..."

www.slunlimited.com Sumee

ගුරුන්නාසේ කීවේ ඔහුගේ අත්දැකීමෙනි. ඔහු නැවත මතුරන්න පටන් ගත්තේය.

"මාලතී මැණිකේ..."

රවිශ්කගේ මුවින් ආයෙත් සිරිපාලගේ කටහඬය.

"මං මැරුනේ උඹ හින්දා... උඹට ආදරේ කරපු හින්දා... මාලතී මැණිකේ උඹ මාව ආයෙත් මරාගන්නවා... මං යනවා... මං යන්නේ මූවත් අරගෙන..."

සිරිපාල කේසර වලව්ව දෙදරවා යන්න කෑගැසුවේය.

"අනේ එපා..."

රවිශ්කගේ සිරුර ළඟ දණගසාගෙන අර්චනා හඬා වැටිණ.

"අ...ර්...ච...නා..."

කඳුළු පිරුණු ඇස්වලින් බලා රවිශ්ක කීවේය.

"අනේ එපා..."



SL UNLIMITED E-Books
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අර්චනා විලාප දුන්නාය.

"ඉමූ... මං ඔයිට වඩා යක්කු මට්ටු කරලා තියෙනවා..."

මෙතෙක් මල් තට්ටුවේ තිබූ තූන්පාට නූල අතට ගත් ගුරුන්නාන්සේ මිටි පුටුවෙන් නැගිට්ටේය. තූන්පාට නූල බෙල්ලට දැමූ පසු ආතුරයාගේ ඇගේ ඉන්නා භූතයා ඉවත්ව යා යුතුය. ගුරුන්නාසේ රවිශ්කගේ බෙල්ලට තූන්පාට නූල දමන්නට හැදුවේය.

"හිහ්... හිඃ.... හිහ්.... හිඃ...."

අර බියකරු හිනාවත් එක්ක නැගිට ගත් රවිශ්ක ගුරුන්නාන්සේගේ බෙල්ල දතින් අල්ලා උස්සාගත්තේ පුළුන් රොදක් සේය.

"කිරි අප්පච්චියෙ...."

සුගතන් කෑගැවේය.

"අප්ප... ම...ගෙ.... බෙ....ල්...ල.... මිහ්..."

ගුරුන්නාන්සේ ගැලවෙන්න දඟළුවේය. ඒත් ඔහු යකඩ අඬුවකට හිරවුණා සේය. අදහන්න... ගුරුන්නාන්සේ දෙකකුල් බිම නොගෑවිණ. ඒවා තිබුණේ මහපොලවට අගල් කීපයක් උඩිනි.

"උඹට මාව විනාශ කරන්න බෑ... මාව විනාශ කරන්න උඹට බෑ..."

රවිශ්කගේ ඇගේ උන් සිරිපාල කීවේය.

SL UNLIMITED E Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"නෝනා සිරිපාලයා ගුරුන්නාසේගේ බෙල්ල මිරිකලා දාන්න කලින් මොනවා හරි කරන්න වෙයි..."

සුගතන් කෑගැවේ කල යුත්තක් හිතාගන්නට බැරිවය

"රවී..."

අර්චනා රවිශ්කගේ දෑතේ එල්ලිණ.

"අනේ අතාරින්න රවී... අතාරින්න..."

අර්චනා ඒ අත්වල එල්ලී පොර බැදුවාය.

"මාලතී මැණිකෙ..."

රවිශ්කගේ රතුඇස් අර්චනා වෙත යොමු විය. අර්චනාගේ ඇස් වලින් නොනවත්වා ගලාගිය කඳුළු දහරාව දුටු ඔහු තරමකට මෙල්ල විය.

"අඩන්න එපා මයෙ මැණිකේ... මට මැණිකෙ අඩනවා බලන්න බෑ..."

සිරිපාල කීවේය.

"අනේ එහෙනං ගුරුන්නාන්සේව අතරින්න..."

අර්චනා කීවේය.

"ඔන් අතෑරියා..."

රවිශ්කගේ දෑත ලිහිල්විය. ගුරුන්නාසේ බිම ඇද වැටිණ.

"මාලතී මැණිකේ... මට මැරෙන්න කියපං මගෙ



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

මැණිකේ.... මං මැරෙන්නං... හැම ආත්මේකම උඹ වෙනුවෙන් මැරෙන්නම්... මේ ආත්මේත් මං උඹ හින්දා පණ දුන්නා මැණිකේ... උඹ දන්නෑ... උඹ හින්දා පණ දුන්නා..."

සිරිපාල කීවේය.

"ඉහිඃ... ඉහිඃ... ඉහිඃ... ඉහිඃ..."

www.sl-unlimited.com Sumee

ඔහු මහා අසරණ හඬකින් කේසර වලව්ව දෙදරා යන්න තරම් හැඬුවේය.

මේ තරම් ආදරයක්?

අර්චනා වෙව්ලාගියාය. සිරිපාල කවුද ඇය දන්නේ නැත. ඒත් මේ ආදරය එය ඇයට දැනෙයි. මේ තරමට ගැහැණියකට ආදරය කරන පිරිමි ආත්මයක් තිබිය හැකිද?

අර්චනාගේ හිතට මහා වේදනාවක් දැනිණ. ආදරය නමින් වේදනා විඳින මේ දුක්ඛිත ආත්මය ගැන අපමණ වේදනාවක් ඇගේ හදවතට - ලෙයට - ඇට මිදුළු වලට දැනිණ.

රවිශ්කගේ සිරුර බිම පතිත විය. ඒ සිහිසුන්වය.

"රවී..."

අර්චනා ඔහුගේ නෙතු පියවුණු හිස උකුළට ගත්තාය.

"ඔන්න දැන්නම් තූල බෙල්ලට දම්මැහැකි ගුරුන්නාන්සේ..."

සුගතන් කීවේය.

"වැඩක් වෙන්නේ නෑ..."



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

තාමත් බෙල්ල අතගගා උන් කට්ටැඩියා කීවේය.

"ඔය නූල්වලින් මේ භූතයා පන්නන්න බෑ.... මේක බලගතු ආත්මයක්... ඒ වාගේම බලවත් ආසාධාරණයකට පත්වෙච්ච ආත්මයක්..."

www.sl-unlimited.com Sumee

ගුරුන්නාන්සේ කීවේය.

සුගතන් බැලුවේ අර්චනා දෙසය.

"මෙතන අපි නොදන්නා කතාවක් තියෙනවා නෝනා... යක්කු භූතයෝ එක්ක වැඩ කලාට අපිත් පන්සිල් පද පහ අඳුනන මිනිස්සු... මේ භූතාත්මේ ලොකු අසාධාරණයකට ලක්වෙච්ච කෙනෙක්... සමහර විට... සමහර විට... මෙතන අපි නොදන්නා අපරාධයකුත් හැංගිලා තියෙන්න පුළුවන්..."

තමාගේ වෘත්තිය ජීවිතේ අත්දැකීම් වලින් ගුරුන්නාන්සේ කීවේය.

"අපි මොකද කරන්නෙ...?"

අර්චනා අසරණ හඬින් ඇහුවාය.

"ඔය වාගේ ආත්ම වලට හරි සාධාරණයක් වෙනකන් ආතුරයව අතාරින්නේ නෑ... ඔහොම ආත්ම යන්ත්‍ර මන්ත්‍ර ගුරුකම් වලින් මෙල්ල කරන්න බෑ... නෝනලා මේකට පරිසමාප්ත වෙන විදියක් හොයා ගන්න... හැබැයි මොනා කළත් පරිස'සමින්... විනාඩියක දෙකක පමාවෙන් කාගේ උනත් ජීවිතයක් නැතිවෙන්න පුළුවන්..."

ගුරුන්නාසේත් ගෝලයාත් ඔහුගේ අඩුම කුඩුම ටික හකුලා ගත්හ.

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"එහෙනං අපි ගිහිං එන්නං නෝනා..."

අර්චනා කලින් සූදානම් කරගෙන උන් මුදල ඉදිරියට පෑවාය.

"වැඩක් පලක් නොකර සල්ලි ගන්න බෑ නෝනා... මොනා උනත් කරන දෙයක් අද හෙටම කරලා මහත්තයාව නිදහස් කරගන්න බලන්න... අපි ගිහිං එන්නං..."

www.slunlimited.com

කට්ටඩියාත් ගොලයාත් එළියට බැස්සාහ. අර්චනා රවිශ්කගේ බොකුටු හිසකේ අතර මුහුණ හොවාගෙන බිම වකුටු විය. ඇගේ සිරුර ගැහෙන අයුරින් ඇය හඬන බව සුගතන් දැනගත්තේය. ඔවුන් අහිංසකය. අසරණය. මේ යුවල නමට සුගතන්ගේ පපුව බර විය.

■ ■ ■ ■ ■ ■ ■

පරණ වී ගිය තේක්ක අල්මාරියේ දැවැන්ත කැඩපත ඉදිරිපිට හිට ගනිමින් අර්චනා ඇගේම රුව දෙස බලා උන්නාය.

මේ දෑස ඉදිරිපිට පෙනෙන කය ඇතුලේ දෑසට නොපෙනන තැනක අමුතු යමක් සිදුවෙමින් පවතින බව අර්චනාට දැනෙමින් තිබිණ. හැබෑය. මේ සිරුර ඇතුලේ තවත් ජීවියක් ගැහෙමින් තිබිණ. අර්චනාගේ අත නිකම්ම කුසට ගියේය.

"දරුවා... මගෙ දරුවා... මගේත්... රවීගේත් දරුවා..."

අර්චනාගේ උගුර හිරවිය. පපුව රිදිණ. නෙත් තෙමිණ.

මේ සතුටු දායක ආරංචියක් නොවේද? හැම කළු වලාකුලකම හැංගී තියෙනවා කී රිදී රේඛාව මේද? සියලු දුක්



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

වේදනාවන් අතරේ දූන් අමුත්තෙක් කුසට ඇවිත්ය.

"අනේ රවී..."

අර්චනාගේ හදවත විලාප දුන්නේය. අද මේ සතුටු ආරංචිය ඇයත් එක්ක බෙදාගන්න කෙනෙක් නැත. රවිශ්ක උන්නේ ඇස් ඇරන් උන්නත් නින්දෙන් වගේය. දරුවෙක් ගැන තියා තමන්ගේ බිරිඳ ගැනවත් ඔහුට වගක් නොවිණ. තමන්ට බිරිඳක් උන් බවක් වත් ඔහු නොදන්නේය.

"මගේ පුතේ... අපට ගොඩක් දේවල් දරාගන්න වෙයි..."

අර්චනා කුස පිරිමදිමින් කීවේය.

යහනේ තාමත් වකුටු වී නිදන සැමියාට කිට්ටු වූ ඈ අපමණ සෙනෙහසින් ඔහුගේ හිසකේ සිපගත්තේය. මේ උතුම් තිළිණය තමාට දුන්නේ ඔහුගේ දඟකාරකම් නොවේද?

විවාහපත් වූ අළුත ගත කළ සොඳුරු දවස් කීපය අර්චනාට සිහිවිය. මේ ඒ මතකයන්ගේ තිළිණයකි.

"මං ඔයාගේ තාත්තිව බේරගන්නවා පුතේ... කොහොමහරි බේරගන්නවා..."

අර්චනා කුස තුල උන් දරුවාට ඇසෙන සේ කීවාය. ඈ කුස්සියට ගියේ සුගතන් සොයායාය. සුගතන් උදේ කෑම හදමින් උන්නේය.

"මහත්තයා නිදිද නෝනා...?"

සුගතන් අර්චනා දුටුවිට ඇසුවාය.



Scanned by CamScanner

"තාම නිදි..."

අර්චනා රවුම් මේසයෙන් පුටුවක් ඇඳ වාඩිවිය.

"අපි මොකද කරන්නේ සුගතන්... ? මට මහත්තයාව බේරගන්න බැරිවෙයිද? මගේ හිතට හරි බයක් දැනෙනවා..."

www.sl-unlimited.com Sumee

අර්චනාගේ කටහඬ බිඳීතිබිණ. නෙත් කඳුළින් වැසිණ.

"ඇප නූලක් මතුරන - දෙහි ටිකක් කපන සමාන්‍ය කට්ටඩියෙක්ට මේක කරන්න අමාරුයි නෝනා... ඔය භූතයා මෙල්ල කරන්න වෙන්නේ හොඳ වැඩකාරයෙක්ට..."

සුගතන් කිරි හොද්ද හැදි ගා අල්ලට ටිකක් දා ලුණු ඇඹුල් බැලුවේය.

"අර ඔරුකාරයා සේදරව සුගතන් අඳුනනවද?"

දවස් ගානක් තිස්සේ සිතේ එහෙ මෙහෙ වෙමින් තිබූ ප්‍රශ්නය අර්චනා ඇසුවාය.

"මයෙ ඇස්දෙක පල්ලා නෑ නෝනා... මාත් මිනිහාගේ මූණ දැක්කේ එදාමයි... ඒත්..."

සුගතන් පොල් කටු හැන්ද පසෙක තියා අර්චනාට කිට්ටු විය.

"මීට කලියෙනුත් මෙහෙ පදිංචියට ආව පවුල් කීපයක-ටම හරියට අරියාදු සිද්ධ වුණා නෝනා... රෑට රෑට කරදර වුණා... මං හිතන්නේ ඒත් ඔය ඔරුකාරයාගේ වැඩ... මිනිහා තමා මේ කේසර වලව්ව ඇතුලේ මනුස්සයකුට යහතින් ඉන්න ඉඩ දුන්නැත්තේ... ඇත්ත කිව්වාම මොකෝ... රෑට රෑට ඔරුවකින් එගොඩ ගොඩේ මිනිහෙක් වලව් වත්තට එනවා කියලා මටත්

SL UNLIMITED E-BOOK The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

දැනිලා තිබ්බෙ... නෝනා මුලින්ම රෑ ඔරුවක් දැක්කා කියල කියපු දවසෙ මං බය වුණේ ඒකයි... මට හිතුණේ නෝනලත් මිනිහගෙ කරදර හින්දා වලව්ව වෙන කාටහරි විකුණලා යයි කියලා..."

www.sl-unlimited.com Sumee

සුගතන් කියවාගෙන ගියේය.

"අපට එහෙම පැනලා දුවන්න බෑ සුගතන්... අපි දෙන්නා අලුත් ජීවිතයක් පටන් ගන්න මෙහෙට ආව අය... මොන ප්‍රශ්න ආවත් විසඳාගෙන කේසර වලව්ව ඇතුළෙම හෝටලේ පටන් ගන්න එක ඇරුණම වෙන විසඳුමක් අපට නෑ..."

අර්චනා වේදනාවෙන් කීවාය.

"නෑ ඉතිං... දූන් ඔරුකාරයාගෙ කරදරෙත් ඉවරයි නේ..."

සුගතන් කීවේය.

"කොහොම හරි සේදරව හොයාගන්න පුළුවන්නම් අපට එයාගෙන් උදව්වක් ගන්න පුළුවන් වෙයි කියලා මට හිතෙනවා සුගතන්..."

"ඒ කිව්වෙ?"

"සිරිපාල කියලා කෙනෙක් රවිශ්කගේ ඇගට එනවා කියලා දන්නවා මිසක්... ඒ මනුස්සයා කව්ද? මැරුණේ කොහොමද කියලා ඇත්ත කතාව මුකුත්ම අපි දන්නෙ නැනෙ... මතකද ගුරුන්නාන්සේ කිව්වා... මෙතන අපි නොදන්නා කතාවක් - අබිරහසක් තියෙනවා කියලා... ඒත් වෙච්ච දේ සේදර දන්නවා වෙන්න පුළුවන්... මට එදා කතාවෙන් තේරිච්ච හැටියට සේදරයි සිරිපාලයි අයියයි මල්ලියි වෙන්න ඕන..."

අර්චනා මේ කතාව හරා අවුස්සා ගන්නට පොටක්



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සොයමින් උන්නාය.

"නෝනාට විතරක් නෙමේ එදා මටත් එහෙම හිතුණා... ඒත් දැන් කොහොමද සේදරව හොයාගන්නෙ මිනිහා වැවෙන් එගොඩ එකෙක් නේ..."

www.sl-unlimited.com Sumee

සුගතන් කල්පනාවට වැටිණ.

"වැවෙන් එගොඩ සුගතන් දන්න කවුරුත් නැද්ද...?"

"නෑ නෝනා... වැවක් කිව්වාට ඒක මහා සාගරයක් වගේ... ඉවුරට ගිහින් එගොඩ බැලුවාම පෙන්නේ යාන්තමට..."

"සේදරගෙ ඔරුව ඇරුනම වෙන ඔරු මොකවත් වැවේ නැද්ද..."

"මොකෝ නැතුවා... රාත්තිරියට ගමන් බිමන් නැතුවට දවාලියට නම් ඔය තරම් ඔරු පාරු වැවේ එගොඩ මෙගොඩ යන්නෙ..."

සුගතන් කීවේය. එය අර්චනාට අලුත් ආරංචියකි. ගුරුන්නාසේ කිව්ව විදියට රවිශ්කගේ ඇඟට එන සිරිපාලට අසාධාරණයක් සිදුවී තිබෙයි. ඔහුට සාදාරණයක් ඉටුවන තුරු ඔහු රවිශ්කගේ ශරීරයෙන් ඉවත් නොවේ. ඉදිරියට කර යුත්ත තීරණය කරන්න නම් තමා මේ කතාන්දරය අගමුල දැනගත යුතුයැයි අර්චනාට හිතේ.

"සුගතන්..."

අර්චනා පුටුවෙන් නැගිට්ටේය.

"මහත්තයා ගැන පොඩ්ඩක් බලන්න... මං ටිකක් ඇවිදින්න යනවා..."

SL UNLIMITED E-BOOKS Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

අර්චනා කේසර වලව්වෙන් එළියට බැස්සේය. රුස්ස ගස් අතර වැටී තිබූ වියළි කොළ තට්ටු මතින් ඈ වැව තෙක් දුර ඇවිද ගියාය. කේසර වලව්වේ පදිංචියට විත් දින් කලක් ගෙවීය. ඒත් අර්චනා මේ වැව් ඉවුරට යන්නේ පළමු වතාවටය.

සුගතන් කීවා හරිය. ඉවුරට ගිය පසු මේ මහා ජලකඳ පේන්නේ වැවක් ලෙස නොවේ. සාගරයක් ලෙසය. දුර ඈත පෙනෙන ගස්වල තුරු මුදුන් එගොඩ ගොඩය. ඕලු, නෙළුම්, මානෙල් මල් අතරින් ඔරුවක් එගොඩට හබල්ගා යයි. ඒ මල් කඩන්න ආ එකකි. ගැහැණියක් ඔරුව පදිමින් මල් කඩන අතර ඔරුවේ පසෙක කන්දක් සේ ගොඩගැසූ මල්ය.

අර්චනා හිරු රැසින් දෑස වලකාලන්නට ඇස් මුවා කරමි-න් නළලට දෑත තියා ඈත මෑත බැලුවාය. තවත් කොට-න් පහුරක් මෙගොඩට ඒ. එහි පටවා ඇත්තේ ගෝනි කීපයකි. පෙනුමේ හැටියට එළවළු හෝ පළතුරුය. වලව්වත්ත ඉවුරේ ඉන්නා සොඳුරු තරුණිය දිහා බල බලා ඒ පහුර කේසර වත්ත පහුකරගෙන ගියේය. ගස් මුල් අතර දිය පහර වදින 'තක්... තක්...' හඬට කන් දෙමින් අර්චනා බොහෝ වේලා වැව් ඉවුරේ උන්නාය.

ඇත්තය. මේ වාගේ සොඳුරු වටපිටාවක් උරුමයෙන් ලබන්නට රවිශ්කත් තමාත් වාසනාවන්තවයින්ය. ඒත්...ඒ සුන්දරත්වයට යටින් වූ මායාව - අද්භූත භයංකාරත්වය එය කලින් හඳුනාගන්න බැරිවුණා නොවේද?

අර්චනා ආපසු හැරිණ. ඈ ඉවුරෙන් ගොඩවුණා විතරය. සියඹලා ගහ ළඟින් ඡායාවක් නැඳුන්ගහට මාරුවිය.

"පිච්චී..."

සුගතන් කී මැහැල්ල අර්චනාට සිහිවිය. මේ ඇය විය යුතුය. මොකද්දෝ හේතුවක් නිසා පිච්චී එක්ක කතා කරන



www.sl-unlimited.com
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ආසාවක් අර්චනාගේ හිතේ දළුලෑවේය. කාලයක් තිස්සේ ඇය මේ කේසර වලව්වෙ ගහකොල හෙවනැලි අතරේ හැංගී හැංගී ජීවත් වී තිබේ. ඒ කතාව ඇත්තය. එසේ නම් පිච්චිත් අයිතිවන්නේ කේසර වලව්වටම නොවේද?

නැවත වතාවක් පිච්චී ගහකින් ගහකට මාරුවිය. උස් සැරයටියත් 'සර සර' ගා සෙලවෙන ඇගේ කඩමලු පොරවනයත් අර්චනා දුටුවාය.

"පිච්චී..."

අර්චනා කතා කළාය. ඒ බෙහෙවින් මෘදුවය. මොහොතකට ගහකොළ පවා ගල්ගැසුණු ගාණය.

"පිච්චි අම්මා...."

අර්චනාගේ හඬ එවර පෙරටත් වඩා මෘදුව තිබිණ.

"ඔයා ඔය ගහ අස්සෙ හැංගිලා ඉන්නවා කියලා මං දන්නවා පිච්චි අම්මා..."

අර්චනා ආයෙම කීවාය. එවර නහර වැල් පෑදිගිය නිය දිගට වැවුණු කෙසඟ අතක් අඹගහ පිටුපස්සෙන් කඳදිගේ ඇතිල්ලීගෙන ඉදිරියට ආවේය.

"බයවෙන්න එපා පිච්චි අම්මා... මගෙන් ඔයාට කරදරයක් වෙන්නෑ..."

අර්චනා කීවාය.

සෙමින් සෙමින් පිච්චී ගහේ සෙවණැල්ල අතරින් එළියට ආවාය. ඒ රූපය හරියාකාරව දුටු අර්චනාගේ හිතේ පලමුව ඇතිවුණේ තිගැස්මකි.



www.sl-unlimited.com
SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඇය හැත්තෑවන වියේ පමණ හෝ ඊට වැඩිවයසක පසුවන මැහැල්ලකි. කිසිදා නොපීරූ වැඩිහරියක් සුදුව ගිය කොණ්ඩය හැඩපලු ගෙතී මුහුණ වසා වැටිණ. දත් දෙක තුනකට වඩා නැති කට බියකරුය. ඉරි වැහැරීගිය ඇඳුමත් හිසේ පටන් පොරවා උන් රෙද්දත් ඇගේ බාහිර පෙනුමේ අද්භූත බව වැඩිකළේය.

www.sl-unlimited.com Sumee

"පිච්චි අම්මා... එන්න..."

අර්චන කතා කළාය. සුගතන් කීවේ ඇයට පිස්සු කියාය. ඒත් කතා කරන දේවල් තේරුම් ගන්න බැරි තරමට ඔල්මාදයක් ඇයට නැත. අර්චනාට එය තේරිණ.

පිච්චී අඩි දෙකතුනක් ඉදිරියට ආවාය.

"බ...ඩ....ගි....නි...යි..."

ඈ කීවාය.

අර්චනාගේ බඩ පත්තු විය. අසරණී... මේ විසල් ගහකොළ අතරේ වැටෙන දෙයක් අහුලාගෙන කන්නී... වැඩිහරියක් ඉන්නේ කුසගින්නේ විය යුතුය.

"අපි වලව්වට යං... මං කෑම දෙන්නං..."

අර්චනා ඉස්සර විය. කතාවක් බහක් නැතුව පිච්චී ඒ පස්සෙන් ආවාය. අර්චනා ඉදිරි පාරෙන් වලව්වට එන එක මගෑරියාය. ගුණරත්න බාසුන්නැහේ හෝ ඔහුගේ ගෝලයින්ගේ ඇහැකට නොවැටෙන්න අර්චනා පිච්චිව එක්ක ආවේ පස්සා දොරෙනි.

"සුගතන්..."

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

අර්චනා කුස්සියට ගොඩවිය.

"යාළුවෙන් එක්ක ආවා..."

ඈ කීවාය.

සුගතන් කුතුහලයෙන් කුස්සියෙන් එළියට එබිණ.

"කිරි අප්පොච්චියෙ... මේ අපේ පිච්චී අක්කානේ..."

පිච්චී ඉතිරි දත් කැලිටික ඔක්කොම පෙන්වා හිනාවිය.

"පිච්චී අම්මාට බඩගින්නෙ සුගතන්... කෑම ටිකක් දෙන්ඩ..."

අර්චනා කීවාය.

සුගතන් වහ වහා ප්ලාස්ටික් පිගානකට කොතගසා එකක් බත් මාලු පිනි බෙදුවේය. පිච්චී අතට පිගාන ගෙන ගියේ අර්චනාය.

අර්චනාගේ දතින් පිගාන උදුරාවගේ ළඟට ගත් පිච්චී කටට දෙකට බත් ගුලි ගුලි ගිල දැම්මාය. ඈ කෑම ටික අනාගන්නවත් පමා නොවුණාය.

"හොඳටම බඩගින්නේ ඉඳලා..."

අර්චනාට හිතිණ.

"බඩගිනි දැනෙන ඕනෑම වෙලාවක වලව්වට ඇවිත් කෑම ඉල්ලන් කාල යන්න..."

අර්චනා කීවේය. පිච්චීගේ ඇස් පවා ඒ වචන වලට



Scanned by CamScanner

සතුටින් නැටුවේය. ජීවිතය ගලා යද්දී වරින් වර ප්‍රශ්න වලට මුහුණ දෙන්නට සිදුවීම එකකි. ඒත් ජීවත් වීමම ලොකු ප්‍රශ්නයක් වූ අයත් මේ මහපොළව මත ඉන්නවා නොවේද කියා අර්චනාට හිතිණ.

■ ■ ■ ■ ■ ■ ■

www.sl-unlimited.com Sumee

දැන් බොහෝ දුරට කේසර වලව්වේ පිත්තාරු කටයුතු ඉවරය. අළුතින් පැහැ ගැන්වුණු බිත්ති වලින් හැඩ වී කේසර වලව්ව උන්නාටත් වඩා තේජමානව සොඳුරුව තිබිණ. මේ ගම්භීර සොඳුරු බවට යටින් බව භයානක බව පිටින් බලන කිසිවෙකු කිසිදාක තේරුම් ගන්නේ නැත.

"දැන් ගොඩක් වැඩ ඉවරයි නේද?"

අර්චනා ගුණරත්න බාසුන්නැහේගෙන් ඇසුවාය. රවිශ්ක අසනීප වූදා පටන් සියල්ල හොයා බැලුවේ ඇය.

"එහෙමයි නෝනා... දැන් තියෙන්නේ දොර ජනෙල් පොලිෂ් කරන්න..."

බාසුන්නැහේ කීවේය.

අර්චනා සතුටු වූවාය. අනෙක් අතට බිය වූවාය. ළඟදීම හෝටලය ආරම්භ කරන්නට පුළුවන් වෙනු ඇත. ඒත් එය භාරදූර වගකීමකි. තමාට තනිවම කළ නොහැකි දෙයකි. රවිශ්ක සනීපෙන් උන්නානම් මෙළහකටත් විවෘත කිරීමට දිනත් දාගෙන ඉවරය. ඔහු නැතුව තනිව ඉදිරි කටයුතු කිසිවක් කළ හැකි නොවේ. ඒ නිසා කෙසේ හෝ ඔහු යළි සනීපකරවාගත යුතුය. අර්චනා අළුතින් පැහැගැන් වූ බිත්ති අත ගාමින් ටික දුරක් ඇවිද ගියාය.

"නෝනා..."



SL-UNLIMITED E-Book The Spirit of SriLankan e-community

Scanned by CamScanner

හාල්තුන පහේ ගේන්නට දඹුල්ල ටවුමට ගිය සුගතන් අර්චනා පස්සේය.

"මට හොඳ ආරංචියක් ලැබුණා නෝනා..."

සුගතන්ගේ ඇස් වලින් පවා සතුටක් උනන්දුවක් දොරේ ගලයි.

"මහත්තයා සනීප කරගන්න පුලුවන් තැනක් ගැන මං එහෙන් මෙහෙන් සෝදිසි කරල බැලුවා... ඔය වගේ යක්කු පේරේතයෝ වැහෙන ඒවා අයින් කරන හමුදුරුනමක් ගැන අහන්න ලැබුණා... දඹුල්ල ටවුමට මෙහායින් පොඩි පන්සලක් තියෙනවාලු නැදුන්ගම විහාරය කියලා... ඒකෙ ඉන්නවාලු ඇහැට නොපෙනෙන උන්වත් දකින උන් එකක් කතාකරන හාමුදුරුවො නමක් ... මිනිස්සු කිව්වා පුලුවන් නම් ගිහින් කතා කරලා බලන්න කියලා..."

අර්චනාගේ හිතට සතුටක් දැනිණ. අන්තිමට උඩ ඉන්නා දෙවියන් තමන්ගේ මුණ බලා තියෙන හැඩය.

"අපි දෙන්නම ඔය ගමන ගිහින් බෑ සුගතන්... මහත්තයාව බලාගන්න කෙනෙක් අනිවාර්යයෙන්ම වලව්වේ ඉන්න ඕනනෙ... මං විතරක් ගිහිං එන්නං..."

අර්චනා දෙපැත්තම හිතාබලා කීවාය.

"තනියම..."

සුගතන්ගේ ඇස් නළලේය.

"මට කාරෙක අරං යන්න පුළුවන්.... ගෙදර ඉන්න කාලෙ මං ලයිසන් ගත්තා... වාහනේ ගත්තම පාර හොයන් යන්න මොන තනියක්ද?..."



Scanned by CamScanner

අර්චනා කීවේය. සුගතන් වාද කළේ නැත. යන්නේ පන්සලකටය. ඒ හින්දා තනියෙන් ගියා කියා වරදක් වෙන්න විදියක් නැත. බඩු මලු කිහිපයත් දෝතින් උස්සාගෙන සුගතන් කේසර වලව්වට වැදිණ.

■ ■ ■ ■ ■ ■ ■

www.sl-unlimited.com Sumee

අර්චනා හිතට දිරිගත්තාය. මේ ගමන තවත් කල් දැමිය යුතු නොවේ. ගතවෙන හැම තත්පරේම රවිශ්කගේ ජීවිතේ අනතුරේය.

"මාලතී මැණිකේ මං මූව අරගෙන යනවා... දවසින් දවස ටික ටික මං මූවත් අරගෙන යනවා..."

රවිශ්කගේ ඇගට එන සිරිපාල එහෙම කියා තිබිණ. දවසින් දවස රවිශ්ක දුර්වල විණ. වදෙන් පොරෙන් කටට දමන දෙයක් උනත් ආපිට වමනය කළේය. අර්චනා හැඬුවාය. හඬා හිත හයිය කරගත්තාය. සිරිපාලට රවිශ්කව ගෙනියන්න හම්බවෙන්නේ නැත. රවිශ්ක යනු තමාගේ ජීවිතයයි. තම නූපන් දරුවාගේ තාත්තායි.

"අපට තාත්තිව ඕන... නේද පුතේ..."

රිය පදවාගෙන නැදුන්ගම පන්සල හොයා යන අතරේත් අර්චනා එහෙමය හිතුවාය. එහෙම හිතා හිත හයිය කරගත්තාය.

අන්තිමට අර්චනාට සෙවූ දෙය ලැබිණ.

"නැදුන්ගමුව ඓතිහාසික රජමහා විහාරස්ථානය"

අර්චනා පරණ මකර තොරණ ඉදිරිපිට සඳහන් පාට පේදුණු අකුරු කිහිපය තෝරා ගත්තාය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ලොකු නාගසක් යට ඈ මරුටිය නවතා බැහැගත්තාය. පන්සලේ දෙතුන් දෙනෙකුට වඩා නැත. අවුරුදු විසිඅටක නවයක තරුණ හාමුදුරුවෝ නමක් මලුව අතුගායි. අර්චනා පාවහන් මුදා තබා හාමුදුරුවන්ට කිට්ටු විය.

www.sl-unlimited.com Sumee

"සුවපත් වේවා !"

තමා ළඟ දණගැසූ සොඳුරු යුවතියට හාමුදුරුවෝ කීවෝය.

"මේ ඇත්තී මිට කලින් මේ අහක දැකලා නෑ..."

හාමුදුරුවෝ නළල රැළි කර අර්චනාගේ මුහුණ හොඳින් බැලුවෝය.

"අපි මෙහෙට අලුතින් පදිංචියට ආවේ හාමුදුරුවනේ... අර දඹුල්ල පාරෙ කේසර වලව්ව අරගත්තේ අපි..."

අර්චනා යටහත් පහත්ව කීවාය. සුදුමුදු වැල්ලේ සුවය ඇගේ නිරුවත් දෙපයට දැනිණ.

"ඔය කියන්නේ කොහොඹ තැන්නේ ආරච්චි පරම්පරාවෙ කේසර වලව්ව වෙන්ඩැති..."

හාමුදුරුවෝ ඇසුවේය.

"එහෙමයි... මං ආවේ පොඩි කාරණයක් දැනගන්න කියලා..."

අර්චනා අදිමදි කළාය. ඒත් ඇත්ත නොකියා බැරිය. ඈ මෙතෙක් කතාව හැකිතරම් ලුහුඬින් හාමුදුරුවන්ට කීවාය.

"අපට තේරෙන විදිහට මහත්තයාගෙ ඇගට සැරින්



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සැරේ එන්නේ මැරුණු පිරිමි කෙනෙක්... ඒ එන කෙනා සමහර වෙලාවට හරිම දරුණුයි... මේ අසනීපේ හින්දා මහත්තයාට හරියට නින්දක් නෑ... කෑමක් නෑ... මහත්තයා දවසින් දවස දුර්වල වෙනවා... අපට ආරංචි උනා මේ පන්සලේ ඔය වගේ ලෙඩ වලට ප්‍රතිකාර කරනවා කියලා..."

අන්තිම ටික කියද්දී අර්චනාට හැඬිණ.

www.sl-unlimited.com Sumee

"ඔය වගේ දේවල් වලට ප්‍රතිකාර කළා තමා... ඒ කළේ අපේ නායක හාමුදුරුවෝ... හැබැයි දැන් තුන්මාසයක් වෙනවා උන්නාන්සෙ වනගත වෙලා..."

අර්චනාගේ හදවත කඩා වැටිණ. කේසර වලව්වෙන් පිටව එද්දී හිතේ ගොනුව තිබූ දහසක් බලාපොරොත්තු බිඳිණ. මහා වේදනාවක් ආත්මය වසාගත්තේ සැණිනි.

"කවද්ද උන් වහන්සේ ආපහු වඩින්නෙ...?"

අර්චනා බිඳුණු හඬින් ඇසුවාය.

"ඒක නම් ඉතිං දන්නෙ උන්නාන්සේම තමයි... වෙන සැරවල මාස දෙකෙන් තුනෙන් ආපහු වඩිනවා... මේ පාර තාම නෑ..."

හාමුදුරුවන් කීවේය.

"නායක හාමුදුරුවෝ වැඩ ඉන්න තැනක් හරියටම දන්නේ නැද්ද අපේ හාමුදුරුවනේ... මට උන් වහන්සේ ඉන්න තැනකට ගිහිං හරි පිහිටක් ගන්න පුලුවන් නං..."

අර්චනා වේදනාවෙන් කීවේය. ඇගේ ඇස් වලින් කඳුළු ඉතිරිණි. කහ චීවරයෙන් වත වහගෙන උන්නාට හදවත තාමත් දුකක් වේදනාවක් ළඟදී කම්පිත වෙන බැවින් හාමුදුරුවන්ගේ



SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

හදවත උණුවිය. මේ දෑස ඉදිරිපිට හිඳගෙන හඬාවැටෙන තරුණ බිරින්දෑ ගැන වේදනාවක් උන්නාන්සේටත් දැනිණ.

"එහෙම තැනක් ගැන හරියටම දන්නේ නෑ නෝනා... මේ මහ වනන්තරේ මනුස්ස ප්‍රාණියෙක් තියා සතෙක් සීපාවෙක් ඉන්න තැනක්වත් හරියාකාර කියන්න අමාරුයි..."

"මගේ මහත්තයගෙ ජීවිතේ අනතුරේ හාමුදුරුවනේ... ඉක්මණින්ම පිළියමක් කළේ නැත්නම් මං විතරක් නෙමේ මගෙ බඩේ ඉන්න දරුවත් තනිවෙනවා..."

අර්චනාට ඊට එහා කිසිවක් කියාගත නොහැකි විය. ඇය දෝතින් මුණ වසා.හඬා වැටිණ.

"අපි දෙයියන්ට කියමු නෝනා, මහත්තයාගේ ජීවිතේ ආරක්ෂා කරලා දෙන්න කියලා... ඒ විතරක් නෙමේ ඉන්න තැනකින් ලොකු හාමුරුවන්වත් දවසකට දෙකකට හරි පන්සලට ගෙනත් දෙන්න කියලා අපි දෙයියන්ට කියමු.... නෝනා ගෙදර යන්න... ලොකු හාමුදුරුවෝ අවොත් මම විගහින් පනිවිඩයක් එවන්නං..."

හාමුදුරුවෝ කියවාගෙන ගියෝය. අර්චනා තේරුම් ගත්තාය. මේ පන්සල් භූමියේ තවදුරටත් හඬා වැටීම තේරුමක් නොවේ. ඈ හාමුදුරුවන්ගෙන් සමුගෙන රියට නැගුණේ වේදනා-වෙන් බරව ගිය හිතෙනි.

■ ■ ■ ■ ■ ■ ■

"නෝනලාගෙ දශාව ගෙවෙන්නෙ අන්තිම නරක පැත්තට... ඒකයි මේ කරන කියන හැම දෙයක්ම අනිත් පැත්තට කැරකෙන්නේ..."



www.slunlimited.com
SL Unlimited E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සුගතන් කිවේ නායක හාමුදුරුවන් වනගත වූ පුවත අසාය.

"දැන් ඉතිං මක්කරන්නෙයි..."

ඔහු තැවිණ.

"මනුස්සයෙකුට මැරෙනවට වඩා වැඩි දෙයක් වෙන්නෑ සුගතන්... මං මැරෙන්න බය කෙනෙක් නෙමේ... මහත්තයා නැතුව ජීවත්වෙනවට වඩා මහත්තයත් එක්ක එයා යන තැනකට යන එක මට වටිනවා... ඒත්..."

ඉතිරිය කියාගත නොහැකිව අර්චනාට ඉකි වැටිණ. ඈ බිත්තියට හිස තියාගත්තාය.

"නෝනා..."

සුගතන් උන්නේත් මේ දුක දරාගනු බැරිවය.

"ඒත්... ඒත් මට දුක මං ගැන නෙමේ සුගතන්... මේ බඩේ ඉන්න දරුවා ගැන..."

"කිරි අප්පොච්චියෙ..."

සුගතන්ගේ දෙකකින් ගිනිපිටවිය.

"මහත්තය ඔය වගක් දන්නවද නෝනෙ...?"

ඔහු සැණින් ඇහුවේය.

"ඔහේ නෑ..."

බුරුල් වූ නාසය උරහිස්සේ අතුල්ලමින් අර්චනා



www.sl-unlimited.com Sumee
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

කීවාය.

"කිව්වෙ නැත ?"

සුගතන් ආයෙම ඇහුවේය.

"එයාට නෝනෙක් ඉන්නවා කියලවත් මතකයක් තේරුමක් නෑ සුගතන්... ඉතිං එයාගෙ නෝනාට ළමෙක් ලැබෙන්න කියලා කිව්වාට තේරුමක් තියෙයිද?

අර්චනා ඇහුවාය.

"සන්දුක්කාරේ... ඒකත් හැබැව...."

සුගතන් කම්පාවිය.

මහත්තයා මොලොව උන්නේ එලොව අතගගාය. කසාදයක් බැඳපු බවක් වත් මතකේ නැත. මුලින්ම කේසර වලව්වට පය තැබූ කඩවසම් ක්‍රියාශීලී තරුණයා සුගතන්ට සිහිවිය. ඒ තරුණයාව හොරු අරන් ගිය ගාණය. දැන් ඉන්නේ මේ කේසර වලව්වෙ සාපයට ගොදුරු වූ අසරණයෙකි. දිනෙන් දින දිරාපත්වන මරු වැළඳගන්නා අසරණයෙකි. සුගතන් එය හොඳාකාරවම තේරුම් ගත්තේය.

"මං විතරක් උනානම් මං මෙච්චර දගලන්නෑ සුගතන්... අපේ උරුමෙ මේ කේසර වලව්ව ඇතුලේ දී විනාශ වෙලා යන එකනම් මං ඒකත් සතුටින් බාර ගන්නවා... ඒත් දැන් එහෙම කරන්න බෑ... මගෙ බඩේ ඉන්න දරුවා ජීවත් වෙන්න ඕන... එයාට එයාගේ තාත්තාගේ අයිතිය ලැබෙන්න ඕන...තාත්තෙක් නැති දරුවෙක් ලෝකේට බිහි කරන්න මට බෑ..."

අර්චනා ආයිමත් දෝතින් මුහුණ වසා ගත්තාය.



www.sl-unlimited.com
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඇගේ අල්ලට වැටෙන කඳුළු ඇඟිලි කරු අතරින් ගලා ගියේය.

"ඔයාකාර අඬන්නෙපා නෝනා... දරුවාට හොඳ නෑ... මොනා උනත් දරාගන්න දැන් ඉතිං හිත හයිය කරගන්න වෙනවා..."

www.sl-unlimited.com Sumee

සුගතන් කීවේය.

ඔහු හරිය. දරාගන්න අර්චනා තිරණය කළාය. දරුවා වෙනුවෙන් - ඔහුගේ යහපත වෙනුවෙන් සියල්ල දරාගන්න අර්චනා හිතට ගත්තාය.

ඇය ගෙයින් එළියට බැස්සාය. වැව් ඉවුර තෙක් ආවාය. ඒ අරමුණක් ඇතිවය. වැව්දිය මත මල් නෙලන ඔරුව නුදුරින් තිබිණ.

සාය හැට්ට ඇඳි ඔරුකාරිය චීත්ත රෙද්දක් හිස වටා ජටාවක්සේ බැඳ උන්නේ හිරු රශ්මියෙන් බේරෙන්නය. අර්චනා හැකිතරම් වැව් දියට ළංවූවාය. ඇයට උවමනා කළේ මේ ගැහැණියගේ අවධානය දිනා ගන්නය.

සුදු නෙළුම් මලක් අත දිගු කර කඩාගන්නා ගමනේ ගැහැණිය මෙගොඩ බැලුවාය. අව් රශ්මියට බැබලෙමින් ඉවුරේ ඉන්නා සුන්දර ළාබාල ගැහැණිය ඇය දුටුවාය. අර්චනා අතවනා අඬගැහුවාය. ඔරුකාරිය මොහොතක් අන්දමන්දව බලා උන්නාය. අර්චනා ආයිමත් අතවනා කතා කළාය. එවර හිතේ බය හා සැකය තරමකට තිබුණත් ඔරුකාරිය සෙමින් සෙමින් ඉවුරට ළංවූවාය.

තාලයකට ළඟ ළඟ එන ඔරුව දකිද්දී අර්චනාට අපමණ සතුටක් දැනිණ.

SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"නෝනා..."

ගැහැණිය කතා කලේ හබල ඔඩොක්කුව හරහා හරහට තබාගෙන ඔරුව මත සමබර වෙමිනි.

"උදව්වක් ඉල්ලගන්න කතා කළේ..."

www.sl-unlimited.com Sumee

අර්චනා හෙමිහිට කීවාය. කේසර වලව්වෙන් එළියට බහිද්දි හයියකරගෙන ආ හිත දැන් කොහේද නැත. අර්චනා ළතවුණේ හිතේ තියන හැමදේම වචනයට නගාගන්නේ කොහොමද හිතාගන්න බැරිවය.

"පුළුවන් දෙයක් නම් කරලා දෙන්නම් කියන්න නෝනා..."

ගැහැණිය කීවාය. ඇගේ ළෙංගතු හිනාව අර්චනාගේ හිතට දිරියක් දුන්නේය.

"මේ වැවේ ඔරුපදින සේදර අයියාව දන්නවද?"

අර්චනා ඇහුවාය. ගැහැණිය මොහොතක් කල්පනාවට වැටිණ.

"ඔය කියන්නෙ කාණු පහේ ලොකු තුවක්කුව තියෙන සේදර අයියද?"

ඈ ඊළඟට ඇසුවාය.

"ඔව්වොව්... එයා අතේ තුවක්කුවක් තියෙනවා..."

අර්චනා සතුටු වූවාය.

"මේ අපේ සේදර අයියනෙ... මං මොකෝ



SL-UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

නොදන්නෙ..."

ගැහැණිය පුළුල් සිනා පෑවේය.

"අනේ... මාව සේදර අයියාගේ ගෙදරට එක්කන් යන්න පුළුවන්ද?..."

අර්චනා කීවාය. එවර ගැහැණියගේ මූණ මැලවිණ. ලොකු ගැටළුවකට අතපෙව්වා වාගේ ඇය කල්පනාවට වැටිණ.

"ඇයි මුකුත් ප්‍රශ්නයක් ද?..."

අර්චනා උන්නේ නොඉවසිල්ලෙනි.

"එක්ක යන්න නම් පුළුවන්..."

ගැහැණිය දෙපැත්තට ඇද්දාය.

"මට ගාණ ප්‍රශ්නයක් නෑ... ඉල්ලන ගානක් දෙන්නම්... අනේ බෑ කියන්න නම් එපා..."

ඇස්වල කඳුළු පුරවාගෙන අර්චනා බැගෑපත්විය.

"ප්‍රශ්නෙ සල්ලි නෙමේ නෝනා... මනුස්සයෙක් උදව්වක් ඉල්លුවාම ඒක සල්ලි වලින් මනින කැත පුරුද්ද අපට නෑ... මට සතයක් එපා... මං නෝනාව එගොඩ කරන්නං... ඒත් ආපහු එන්න නම් නෝනාට වෙන ඔරුවක් අල්ලා ගන්න වෙයි..."

ගැහැණිය කීවාය.

"ඒකට කමක් නෑ... මාව එහෙට එක්ක ගියොත් ඇති..." අර්චනා කිවාය. ආපහු එන විදිහක් ගැන හිතන්න තාම

www.sl-unlimited.com Sumee
UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

වේලාසන වැඩිය. ඒත් කරබාගෙන ඉන්න බැරිය. රවිශ්කගේ ජීවිතය බේරාගන්න දූත් ළිංකටට උනත් පනින්න වේලාව ඇවිත්ය.

"එහෙනං නගින්න නෝනා..."

Sumee
www.sl-unlimited.com

ඔරුව තව ටිකක් ඉවුරට ළංවිය.

ගවුම දණහිස තෙක් උස්සාගෙන වතුරට බැහැගත් අර්චනා සීරුවට ඔරුවට ගොඩවිය.

"එහා පැත්ත මෙහා පැත්ත බර වෙන්නෙ නැතුව ඉන්න වෙයි නෝනා... නැත්නම් දෙන්නම වතුරේ..."

ගැහැණිය මුහුණේ සිනාවක් ඇතිව කීවාය.

"දෙන්නා නොව තුන්දෙනාම වතුරේ යි" නොකියා අර්චනා මුනිවත රැක්කාය. ඒ ගැන හිතන්නවත් ඈ බිය වූවාය. කුසට අතක් තබාගත් අර්චනා ඔරුව මැද තිබූ මල් ගොඩ දෙස බලා ගත්තාය.

ඒත්....

ඔරුව පදින අතරේත් ගැහැණිය විපරමින් බැලුවේ අර්චනාගේ මුහුණේ හැඩතල දෙසය. දුරදී දුටුවාටත් වඩා මේ තරුණිය සොඳුරුය. ඒත් මොකද්දෝ එකවර තේරුම් නොයන දුක්බර බවක් මුහුණේය.

"නෝනා ඉන්නේ මේ අහල පහලකද?"

ගැහැණිය ඇසුවාය.

කේසර වලව්වේ කියන්න අර්චනා බියවූවාය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

"ඔව්..."

ඒ කෙටි උත්තරයෙන් පමණක් සෑහෙන්නට ගැහැනියට සිදුවිය. අමුත්තිය වැඩි දෙයක් හාර අවුස්සනවාට අකමැති බව වටහාගත් ඔරුකාරිය ඉතිරි දුර ගෙව්වේ නිහඬවමය. අන්තිමේදී ඔරුව එහා ඉවුරට ළංවිය.

www.sl-unlimited.com Sumee

"ඔය පේන වැලි පාරේ පස්වෙනි ගෙදර සේදර අයියගේ තමා... නෝනාට ඔය චුට්ට තනියම යන්න පුළුවන්නෙ..."

ගැහැනිය කීවාය.

"පුළුවන්..."

අර්චනා ඔරුවෙන් බැස්සාය. අතරැදි බෑගයෙන් නෝට්ටුවක් ගෙන දිගු කළාය.

"සල්ලි ගන්න එක හරි නෑ නෝනා..."

මල් විකුණා තුට්ටුව දෙක එකතු කරන ගැහැණිය අර්චනා අත තිබු ලොකු නෝට්ටුවට ආසා නොකළා නොවේ. ඇය වෙත වූයේ එයට අත දිගු කරන්නට ඇති මැළිකම පමණි.

"ඔයා මට කළේ මුදලින් මනින්න බැරි උදව්වක්... මේ සල්ලි ගන්න... මං කැමැත්තෙන් දෙන්නේ..."

අර්චනා කීවාය. එවර ගැහැණිය නෝට්ටුව දෝතින් ගත්තාය.

"මේ මගෙ මල් කඩන වෙලාව... අව්ව සැරවෙන්න කලියෙන් මල්ටික කඩලා ඉවර කරගන්න ඕන...නැත්නම් මං නෝනාව ආපහු අරලින්නත් බාරගන්නවා..."

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ගැහැණිය කීවාය.

"කමක් නෑ..."

අර්චනා ළා හිනාවක් පා ඉවුරෙන් වැලිපාරට ගොඩ වූවාය.

www.sl-unlimited.com Sumee

වැලිපාර එක්පසෙක සොහොන් බිමය. ගෙවල් තිබුණේ අනිත් පැත්තේය. අර්චනා හෙමින් හෙමින් ඉදිරියට ගියාය. වැලි මිදුල් වල කෝම්පිට්ටු ඇණු දරුවෝ පවා පළමු වතාවට දකින මේ අමුත්තිය දෙස උවමනාවෙන් බැලුහ.

අර්චනා වටපිට නොබලන්න පරිස්සම් වූවාය. කළින් බොහෝවරක් ගිය පාරක යන්නාසේ අඩිය ඉක්මන් කළ අර්චනා පස්වෙනි ගෙය ඉදිරිපිට නතර විය.

ඉඩමේ ගෙවල් දෙකකි. එකක් භාගයට තැනූ නවීන පන්නයේ නිවසකි. එහි පිටුපසට වෙන්නට තිබුණේ කබොක් ගලින් බැඳි පුළුල් බරාදයක් ඇති පැරණි පන්නයේ නිවසකි.

"කාවද බැලුවේ...?"

අලුත් ගෙදර දොරකඩ අත දරුවකුට කිරි පොවමින් උන් තරුණ ගැහැණිය ඇහුවාය.

"සේදර උන්නැහේ..."

අර්චනා මීට වඩා ගරු නම්බු දී කතාකරන්න නොදන උන්නාය.

"අප්පච්චි ගෙදර ඉන්නවා නෝනා යන්න..."

ඈ කීවාය.



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

"පුතේ සීයාව හම්බවෙන්න ඇවිත් කියපං..."

අඹ ගහේ දෙබලක උන් අවුරුදු හයක හතක පමණ පිරිමි දරුවාට ඈ ඊළඟට කීවාය.

කොල්ලා අඹ අත්තෙන් පැන රූං කියා පරණ ගේ තුලට දිව්වේය. අර්චනා හිමිහිට ඒ ගෙයි පුළුල් බරාදය ඉදිරිපිටට ගියාය.

මොහොතක් නිහඬව ගතවිය. ඊළඟට සරම වළාපට ගසාගත් උඩුකය නිරුවත් සේදරගේ රුව ඉදිරි දොරින් මතුවිය. මිදුලේ උන් අර්චනාගේ රුව දුටු ඔහුගේ මුහුණ කළුවිය.

ඔහු අර්චනාව දැන උන්නේය. අර්චනා ඔරුකාරයාව අඳුනාගන්න බොහෝ කාලයකට පෙර සිට සේදර අර්චනාව දැන උන්නේය. මේ තරුණ යුවළ කේසර වලව්වේ පදිංචියට ආදා පටන් ඔවුනට නොපෙනී ඔවුනට නොදැනී සේදර උන්නේ ඔවුන් ගැන ඇහැගහගෙනය. මෑතකදී සිදුවූ සිදුවීම් නොවන්නට සේදර ලේසියෙන් පහසුවෙන් කේසර වලව්වට යෑම අතහැර දාන්නේ නැත. මුලින් ඔහු හිතා උන්නේ මේ ළාබාල ජෝඩුවත් බොහොම ඉක්මණට කේසර වලව්වෙන් පන්නා දමන්නටය.

"නෝනා මොකද මෙහෙ ආවේ....?"

සේදර ඇහැව්වේ කිසි ගරු සරුවක් නැතුවය. කාලයකට පස්සේ මූණ ගැසුණු තරහාකාරයෙකුගෙන් අසන්නා සේය.

"පිහිටක් ඉල්ලාගෙන..."

අර්චනා හිතට දිරිගෙන කීවේය.

"එක එක්කෙනාට පිහිට වෙන්න මේක පන්සලක් වත් දේවාලයක් වත් නෙමේ නෝනා... ආපු අතක් බලාගෙන ගියොත්



www.sl-unlimited.com
SL-UNLIMITED E-Book
The spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඒක අපි ඔක්කොමගෙම ඇඟට ගුණයි..."

සේදරගේ වචන වල කිසි අනුකම්පාවක් නොවිණ. හයි-යෙන් හයියෙන් මිදුලේ කතාව යන්නේ කා එක්කද බලන්න සේදරගේ බිරිය එත්නාත් දොරින් එළියට බැස්සාය.

www.sl Sumee unlimited.com

"මං ආවෙ මගෙ මහත්තයාගේ ජීවිතේ බේරගන්න උදව් කරන්න කියන්න..."

අර්චනා බිඳුණු හඬින් කීවාය. ඇගේ පපුව හිරවිය. ඇස් කඳුළින් වැසිණ. කවදාක හෝ සැමියාගේ ජීවිතය වෙනුවෙන් නාඳුනන පිරිමියෙකු ළඟ බැගෑපත් වෙන්නට වේ යැයි අර්චනා කිසිදාක හිතා නොතිබිණ. දෛවය ජීවිතය ගෙනගොස් නතර කර ඇත්තේ කොයිතරම් අනතුරුදායක තැනකද? අර්චනාට මහා වේදනාවක් දැනිණ.

"අනේ මගේ මහත්තයා බේරාගන්න උදව් කරන්න..."

"කේසර වලව්වෙ සාපෙන් ගැලවෙන්න කිසි එකෙකුට බැරිවුණා නෝනා... පව් කරපු එවුනුයි... පව්කාර තැනට පය ගහපු එවුනුයි ඔක්කොම විනාශ වුණා... මහත්තයාව බේරගන්න සක්කරයාටවත් බැරිවෙයි...."

සේදර කීවේය.

"අනේ මං හින්දා නෙමේ.... මේ උපදින්න ඉන්න දරුවා හින්දවත් මගෙ මහත්තයාව බේරල දෙන්න... මගෙ බඩේ ඉන්න දරුවට එයාගෙ තාත්තාව නැති කරන්න එපා..."

අනවසරයෙන්ම උස් බරාදයට ගොඩවෙන පඩිය මත හිඳගත් අර්චනා දෑතින් මුහුණ වහගෙන හඬා වැටුණාය. සිංහයා වගේ තර්ජනය කළාට සේදර අනුන්ගේ කඳුළක වේදනාව නොදැනෙන අමනුෂ්‍යයකු නොවේ. අර්චනාගේ ක්‍රියාවෙන්



SL UNLIMITED EBOOKS
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

ඔහුගේ බලහත්කාරයෙන් තදකර සිටි හිත හෙළවිණ.

බිරිය - එතනාගේ හිත උණුවූයේ ඔහුටත් කළිනි.

"අනේ දෙයියනේ !..."

වහා අර්චනාට කිට්ටු වූ ඈ ඇගේ අතකින් අල්ලාගත්තාය.

"නැගිටලා මේන් මේ පුටුවකින් ඇදිගන්න නෝනා..."

ඈ අර්චනාව නැගිටුවා පුටුවක ඉන්දුවාය.

"බඩදරු අම්මෙකුට පිටුපාන්න බොලා අමනුස්සයෙක්ද? බොලාටත් දරුමල්ලො ඉන්නවා නේද?"

එතනා සේදරට බැණ වැදුණාය.

"නෝනා කතා කරකර ඉන්න... මං බොන්න මුකුත් ඇන්න එන්නං..."

එතනා ගෙට රිංගා ගත්තාය. බරාදියේ ඉතුරු වූයේ අර්චනාත් සේදරත් කෝටුවකින් බිමට තල තල උන් කොලු පැංචාත් පමණි.

"මගේ මහත්තයට මොකද උනේ කියලා දන්නවා නේද?"

අර්චනා සැකයෙන් ඇහුවේය. ඈ එහෙම අනුමාන කළාය. අනික් කාටත් වඩා හොඳින් සේදර මේ කතාවේ ඇත්ත දැන සිටිය යුතුයැයි අර්චනා අනුමාන කළාය.

"ඒක දිග කතාවක් නෝනා...."



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සේදර කීවේ අහක බලාගෙනය. පෙරතරම් ගාම්භීරකමක් ඒ හඬේ නොවිණ. ඔහුටත් නොදැනීම ඔහුගේ කටහඬ මෘදුව තිබිණ.

"සිරිපාල කියන්නේ කවුද?"

අර්චනා ඇසුවේය. සේදර සුසුමක් හෙළුවේය. පරන තාලේ ලොකු ඇඳි පුටුව බර කළේය.

"සිරිපාල කියන්නේ මගේ එක් කුස උපන් අයියා..."

ඔහු කතාව පටන් ගත්තේ එහෙමය.

"ඒ කාලේ පළාතේ හිටිය හැඩකාරයා මගේ අයියා... ඇඟපත, උස මහත, හයිය මීහරක් දහදෙනෙක් ගේ ශක්තිය තිබ්බා... මං අපේ අම්මට හම්බවෙලා තිබ්බෙ ඊට අවුරුදු දොළහකට පස්සෙ... ඒ හින්දා පොඩි කාලෙ ඉඳලාම අයියා මාව බලාගත්තේ දරුවෙක් වගේ... අපි අතරේ තිබ්බේ සහොදර කමක් නෙමේ... තාත්තෙකුයි එයාගේ එකම දරුවයි අතර තියෙන විදිහේ බැඳීමක් ..."

සේදර මොහොතක් නිහඬව උන්නේය. උගුර පාදා යළි කතාව පටන් ගත්තේය.

"අයියා මටයි මං අයියාටයි බොහොම ළෙංගතුයි... මට අයියා ගැන ආඩම්බරයකුත් තිබ්බා... අයියා වගේ ගණන්කාරයෙක් වත් හැඩකාරයෙක් වත් අහල ගම් හතක උන්නේ නැතෙ... හැබැයි ඉතිං ඇඟ මී හරකා වගේ උනාට උගෙ හිත මී කිරි වගේ දියාරුයි.... මෙළකයි... ඒක දැනන් උන්නේ මං විතරයි... අයියගෙ කරේ එල්ලෙන්න බලාන ලමිස්සියො ගොඩක් කැමැත්තෙන් උන්නා... ඒත් අයියාගේ හිත ගියේ වෙන තැනකට... පතාගෙන ආව හැටි වෙන්න ඇති..."



Scanned by CamScanner

"ඒ කාටද?..."

අර්චනා ඇහුවාය.

"මාලතී මැණිකෙට..."

සේදර කීවේය. අර්චනා වෙව්ලා ගියාය. ඔය නම නිතර සිරිපාල ගේ කටේය. සිරිපාල ඔය නම කියා කතා කළේ තමාටය.

"මාලතී මැණිකේ කියන්නෙ කව්ද?"

අර්චනා බියෙන් ඇහුවාය.

"කේසර වලව්වෙ කොහොඹ තැන්නෙ ආරච්චිලගෙ දූ සිගිත්ත... කොහොඹ තැන්න ආරච්චිට උන්නෙ දුවයි පුතයි විතරයි... පුතා වැඩිමලා... හරි සෝමාරියා... ඒත් දුව එහෙම නෙමේ... මේ අහල පහල එහෙම රූප රාජනියක් උන්නේ නෑ...මට මතකයි ඉස්සරෝම මාලතී මැණිකේ දැක්ක දවස... එදා එගොඩ පන්සලේ පිං කම් පොළ... සල්පිලකුත් තිබ්බා... අයියා ඔරුවෙන් එගොඩ ගියේ මාත් එක්ක... මල් වට්ටි වෙන්දෙසියේ මුල් තැන කොහොඹ තැන්න ආරච්චිලට... දුවයි, පුතායි, ලොකු මැණිකෙයි මුලු පවුලම ඇවිත් උන්නා..."

ඒ දෛවෝපගත දවස සේදරගේ හිතෙන් කිසිදා මැකී නොයයි. සියලු දේ ඉරණමට කැමැති සේ සිදුවෙන්න මුල පිරුනේ එදා නොවේද? පැට්රල් මැක්ස් ලාම්පු එළියෙන් බබලමින් උන් මාලතී මැණිකේගෙ මනෝහර රූපය අයියාගේ හිත හොරා ගත්තා නොවේද?

"එදා ඉදලා අයියා මාලතී මැණිකෙ ගැන හීන දැක්ක... සමහර වෙලාවට තැන්තැන්වලට වෙලා තනියම කල්පනාව... තැත්තම් තනියම කියෝනවා... මුලින් අම්මායි අප්පොච්චියි



Scanned by CamScanner

බයවුණා මේකට නුහුගුණ කියලා... රත්තරනින්ම හදපු සුරේකුත් බෙල්ලට දැම්මා... රත්තරන් සුරෙත් බෙල්ලේ දාගෙන අයියා කළේ මාලතී මැණිකේ යන එන තැන්වල හොරගල් අල්ලපු එක..."

"මාලතී මැණිකේ අයියාට ආදරේ කළාද...?"

www.sl-unlimited.com Sumee

අර්චනා අතර මැද්දෙන් ප්‍රශ්නයක් දැම්මාය.

"මාත් ඔය ප්‍රශ්නෙම අයියාගෙන් ඇහුවා... මං පොඩි එකා කියලා නෑ අයියා හැම දේම කියන්නෙ මාට... අයිය ගත්තු කටටම කිව්වෙ කොච්චර යන එන තැන් වල මග රැකලා හිටියත් මාලතී මැණිකෙ තාම මූණ දිහාවත් බලල නෑ කියලා... මාත් හිතාගෙන උන්නෙ අපේ අයියා පස්සෙන් එන බවක් මාලතී මැණිකේ දන්නේ නෑ කියලා... ඇත්තටම අයියාත් හිතාගෙන උන්නේ ඒක..."

"ඉතිං ඒක ඇත්ත නෙමේද..?"

"දවසක්... පෝය දවසක අයියට වලව්වෙන් පණිවිඩයක් ඇවිත් තිබ්බා... එවල තිබ්බෙ මාලතී මැණිකෙ... එදා රෑට ආරච්චියි මැණිකෙයි වලව්වේ නැතෙයි ඒ හින්දා රහසෙ ඇවිත් හම්බවෙන්නය කියලා..."

"එහෙනං මාලතී මැණිකේත් කැමැත්තෙන් ඉදලා..."

"ඔව්... අයියා ඒක දැනගත්තෙත් එදා... බලාපං මල්ලියෙ මං හිතුවෙ මං බැල්ම දානවා කියලා මාලතී මැණිකෙ දන්නෙවත් නෑ කියලා... දැන් බලනකොට හිමිජ්ජි වගේ හිටියට මං ගැන ආලවන්තකමකුත් තිබිලා කිය කියා අයියා සතුටින් කියෙව්වා... රෑ ගමනට අයිය මගබල බලා උන්නා... මං අයියාට කරදර කළා මාවත් එක්ක යන්න කියලා..."

SL UNLIMITED E-BOOK The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"ඒ මොකටද?"

අර්චනා පුදුමයෙන් ඇසුවාය.

"පොඩි කාලේ මං මීකිරි කන්න හරි ආසයි... ලොකුම මී කිරි පට්ටිය උන්නෙ කොහොඹ තැන්නෙ ආරච්චිලාට... කේසර වලව්වේ පිටි පස්සේ ලොකු කාමරයක් හැමදාම මුදවපු කිරිවලින් පිරිලා තිබ්බා... දවසක් දෙකට සැරයක් මේ මී කිරි ලොරි කාරයෙක් ලව්වා කොළඹ පටවලා සල්ලි කරගන්නවා... දවසක් ඊක... මාලතී මැණිකෙට හිත වැටෙන්න කලින් දවසක ඊක අයියා මාත් එකක් ගිහින් කේසර වලව්වෙන් ඇතිවෙන්න මී කිරි හොරා කෑවා... "

ඒ ටික කියද්දී සේදරගේ මුහුණ එළියක් වැටිණ. අඳුරු දෑස දීප්තිමත් විය. මේ අයියාටත් මල්ලිටත් සුන්දර අතීතයක් තිබෙන්නට ඇත. අර්චනාට එහෙම හිතිණ.

"මගෙ වදෙන් බේරෙන්න බැරිම තැන අයියා එගොඩ ගියේ මාත් එක්ක... මාව ලොකු කොහොඹ ගහක් යට හිටවලා ඉස්සරෝම මට මී කිරි හට්ටියක් ගෙනත් දුන්නා... බඩ පැලෙනකං කාපිය කියලා... කාලා එතනම ඉන්න කිව්වා... අයියා ඊළඟට ගියේ මාලතී මැණිකේ හම්බවෙන්න... "

සේදර හදිස්සියේම ගොළු විය. ඉන් එහාට කිසිවක් කියන්නට බෑ වාගේ අර්චනාගේ මුහුණ බැලුවේය.

"ඉතිං..."

කතාවේ ඉතිරිය දැන ගන්නා තුරු අර්චනා උන්නේ නොඉවසිල්ලෙනි.

"මං කිරි හට්ටියම කෑවා... අයියා ආවේ නෑ... විකිත් ටික මහ ඊ උනා... ඒත් අයියා ආවේ නෑ... මං පොඩි එකා



Scanned by CamScanner

වෙච්චි... බලපැලෙන කන් මී කිරිත් දෙසා බලා ඉදද ඇහැපය වෙන එක අහන්න දෙයක්ද? කොහොඹ ගහ පල්ලේම මට නින්ද ගියා..."

සේදර සරම් වාටියෙන් දෑස පිස ගත්තේය. ඔහුගේ ඇස් වට කඳුළු උනා තිබුණ බව අර්චනා දුක්කේ එවිටය.

"කේසර වලව්ව ඇතුලේ මොනා උනත් පිටට ඇහෙන්නේ නෑ... හයියෙන් විලාප දුන්නත් පිටට ඇහෙන්නෙ නෑ..."

සේදර කීවේය.

ඒය ඇත්ත බව අර්චනා අත්දැකීමෙන් දන උන්නාය. සමහර දවසක රවිශ්ක වලව්ව ඇතුලේ සිරිපාලගේ වේශයෙන් යකා නටයි. ඒත් ඒ හඬ අඩුතරමේ පිට කාමරයේ උන් ගුණරත්න බාසුන්නැහේලාටවත් ඇහෙන්නේ නැත.

"මං ඇහැරෙන කොට පහුවදා එළිය වැටිලා... කේසර වලව්ව එකම එක කළබලයයි... ගමේ මිනිස්සු හතර අතින් ඇවිත් වලව්වට පිරෙනවා..."

"ඇයි ඒ...?"

"වලව්වට රෑ හොරෙක් පැනලා... මිනිස්සු කියනවා මට ඇහුණා... මාත් මිනිස්සු පස්සෙන් වලව්වට රිංගුවා... ඕක ඇතුලෙ මැද මිදුලක් තියෙනවා... ඒකේ ළිඳක් තියෙනවා... වලව්වේ මැණිකේලාට පිට මිනිස්සුන්ට නොපෙනෙන්න නාන්නලු ඒක හදලා තියෙන්නේ... මිනිස්සු වටවෙලා හිටියෙ එතන... මාත් පඩිටික බැහැලා ගිහින් ළිං බැම්මෙන් එබුණා... ඒ දැකපු දේ මගෙ ජීවිතේ කවදාවත් අමතක වෙන්නේ නෑ.. අර ළිඳේ බොලොක්කෙන් කඹේ එල්ලිලා හිටියෙ මගෙ අයියා... වලව්වේ උන් එකතු වෙලා ගහලා ගහලා මරලා මගෙ අයියාව



The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

බොලොක්කෙන් ළිඳ ඇතුළෙ එල්ලලා..."

"දෙයියනේ !..."

අර්චනාගේ පපුව පත්තුවිය. මේ මොන අපරාධයක්ද? ඇගේ හිත විලාප දුන්නාය.

"වලව්වේ කට්ටිය කිව්වේ රත්තරන් බඩු අරන් පැනලා යද්දී අල්ලාගෙන ගැහුවා කියලා...අන්තිමේදී පොලිසිය තීරණය කළේ වලව්ව මං කොල්ල කන්න ගිහිං අයියා ගුටිකාලා මළා කියලා..."

ලොකු කඳුළු ගුලි දෙකක් සේදරගේ දෑසින් ගිලිහී කම්මුල හරහා ගැලුවේය.

"මගේ අයියා හොරෙක් නෙමේ... අහිංසකයෙක්... කේසර වලව්වට ගියේ හොරකමේ නෙමේ... මාලතී මැණිකේ එන්න කියලා පණිවිඩේ එවපු නිසා... ඒත් උන් මගේ අයියාව අල්ලාගෙන ගහලා ගහලා මරලා..."

"එතකොට මාලතී මැණිකේ මොකද කිව්වේ...?"

"මං පොඩියි... ඒත් මට තේරුණ හැටියට අයියගෙ මරණෙ ගැන මාලතී මැණිකෙට ගාණක් තිබ්බෙ නෑ... මරණ පරීක්ෂණ කොරලා නඩු අහලා අපට අයියාගෙ මිනිය බාර දුන්නා... ඒ මගෙ අයියා නෙමේ... මගේ අයියා සමනලයෙක් වගේ ලස්සනයි... අපට හම්බවෙච්ච අයියාගෙ මිනිය බලන්න බැරි තරම් දසවධ දීලා තිබ්බා... ඇහැක් එළියෙ, දත් කඩලා, ඉල ඇට කඩලා, ඔළුවෙ තිබ්බ ලස්සන පොකුටු කොණ්ඩෙත් තැනින් තැනින් උදුරලා... ඔය ඉස්සරහා පේන කැරකොප්පුවේ අයියගෙ මිනිය වලදාන කොට මට අඬාගන්නවත් පණ තිබ්බේ නෑ...."



www.slunlimited.com
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"ඉතිං ඊට පස්සේ මොකද උනේ...?"

"මාලතී මැණිකෙව කොළඹ මහත්තයෙකුට බන්දලා දුන්නා... ඒ උනත් වැඩිකල් ජීවත් උනේ නෑ... දරුවෙක් ලැබෙන්න ගිහින් වැදුම් ගෙයිම මළා කියල ආරංචි උනා... අර සෝමාරි පුත්තරයා කසාදයක් නොබැඳම ලෙඩ වෙලා මළා... මැණිකෙයි ආරච්චියි නම් මළේ වයස ගෙවිලා... එයින්ම කොහොඹ තැන්නේ ආරච්චි පරම්පරාවේ ඉවර උනා... මගෙ අයියා අහිංසකයෙක්... උන් මගේ අයියාව මරා දැම්මෙ තිරිසන් සතෙකුට අන්ත විදියට... ඒක මුළු කේසර වලව්වටම සාපයක් උනා... මුළු කොහොඹ තැන්නේ ආරච්චි පරම්පරාවටම සාපයක් වුණා..."

සේදර කීවේය.

එතනා ලොකු වීදුරුවකින් එකක් දිවුල් කිරි අරගෙන එළියට ආවාය.

"බොන්න නෝනා... අපේ ගස්වල දිවුල්..."

ඇ වීදුරුව පැවේ දෝතිණි. අර්චනා වීදුරුව ගෙන හෙම්හිට බීවාය.

"එදා ඉඳලා මගේ හිතේ කේසර වලව්ව ගැන තිබ්බේ ලොකු වෛරයක්. ඉලන්දාරියා කාළෙ ඉඳලම මං හිතාගත්තා කිසි එකෙකුට ඔය වලව්ව ඇතුලේ යහතින් ඉන්න දෙන්නේ නෑ කියලා... උරුමක්කාරයෙක් නැති තැන වලව්ව නැයොන්ට නීතියෙන් අයිති වුණා... ඒ ආව කිසි පවුලකට සැනසීමෙන් ඉන්න .මං ඉඩ දුන්නේ නෑ... අන්තිමට උන් ඕක පිට වික්කා... ඒකත් එක එකා අතට අයිතිය ගිහින් අවසානෙට ආවෙ නෝනයි මහත්තයායි..."

සේදර කතාව නවතා අර්චනාගේ මුහුණ බැලුවේය.



Scanned by CamScanner

"එදා රෑ වෙච්ච දේ හින්දා මාත් කලබල වුණා නෝනා... මගෙ අයියා තාමත් ඔය කේසර වලව්ව ඇතුලේ හිරවෙලා ඉන්නවා කියලා මං කවදාවත් හිතුවේ නෑ... ඇරත් අයියා මහත්තයාගේ ඇඟට එන බවක් ඒ වෙනකන් මං දැනගෙන උන්නේ නෑ..."

සේදර ඇත්තම කීවේය.

www.sl-unlimited.com Sumee

"සිරිපාල ඉන්නේ ලොකු වෛරයකින්... එයා කියන්නෙ එයා යනවා නම් මගෙ මහත්තයාගෙ ජීවිතෙත් අරගෙන යනවා කියලා... ඒ කතාව ඇත්ත වෙයි කියලා මගේ හිතට බයයි... මහත්තයා හරියට කෑමක් කන්නෙත් නෑ... එන්න එන්න දුර්වල වෙනවා... සිහි කල්පනාව වැඩිපුර ඇත්තේත් නෑ... මොනා කරන්නද කියලා තේරෙන්නෙත් නෑ..."

අර්චනා කීවාය. ඇගේ කඳුළු අලුත් වෙමින් තිබිණ.

"මගෙ අයියා දැන් කරන වැඩේ හරි කියලා මං කියන්නෙ නෑ නෝනා... අයියට වින කරපු උන් පරම්පරාවම නැති භංග වෙලා ඉවරයි... මහත්තයා අහිංසකයෙක්නෙ... මහත්තයාව බේරගන්න ඕන උදව්වක් අපි කරනවා..."

සේදර කීවේය.

"මහත්තයාව බේරගන්න මොනා කරන්න ඕන කියලද සේදර හිතන්නේ...?"

අර්චනා ඇසුවාය. ඇය ආවේ මේකටය. මේ අභිරහස් කතාව සම්පූර්ණයෙන්ම දැන ගන්නටය. ඊළඟට මහත්තයාව බේරගන්න කළ යුත්ත අහන්නය.

"පුලුවන් තරම් ආදරයෙන් කතා කරන්න නෝනා...



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සිරිපාල අයියා ආදරේට හරි කැමතී... අම්මයි අප්පොච්චියි උනත් ආදරේ පෙන්නන කොට පොඩි ළමයා වගේ..."

සේදර කීවේය.

"ආදරෙන් කිව්වොත් අහයිද?..."

www.sl-unlimited.com Sumee

අර්චනා සැකයෙන් ඇහුවාය.

"ඇයි නැත්තේ? නෝනාට මහත්තයාව බේරගන්න වෙන්නේ ඒ විදියට තමයි..."

අර්චනා හිස් විදුරුව එතනාට පෑවේය.

"දැන් මං ගියොත් හොඳයි..."

ඈ පුටුවෙන් නැංගාය.

"යං... මං නෝනාව එගොඩ කරන්නං..."

පිලිකන්නේ බිත්තියට හේත්තු කර තිබූ හබලත් රැගෙන සේදර ඉස්සර විය. අර්චනා එතනාගෙන් සමුගෙන ඒ පස්සෙන් වැටිණ.

■ ■ ■ ■ ■ ■ ■

පිච්චි දැන් බොහෝ විට දවාලියට කේසර වලව්වේ කුස්සිය දොරින් එබෙයි. කොයි මොහොතේ ආවත් සුගතන් වෙතින් ලැබෙන කොත ගැසූ බත් පත කා බඩ පුරවාගන්නා ඈ ඉන් පසු ගහකොළ අතර අතුරුදන් වෙයි.

"පිච්චි අම්මා..."

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

අර්චනා එළිපත්ත මත බත් කන පිච්චී ළඟට කිට්ටු විය. ඈ අතේ අළුත්ම ඇඳ ඇතිරිල්ලක් තිබිණ.

"පිච්චි අම්මා මේක පොරවන්න ගන්න..."

ඈ ඒක පිච්චීට පෑවාය. දත් නැති කට හැකිතරම් ඇර සිනාවක් පෑ පිච්චී ඇතිරිල්ල ගෙන දෝතින් පපුවට තුරුළුකර ගත්තේ දෑසේ කඳුළු පුරවාගෙනය. ඈ මේ තරම් ආදර කරුණාවක් ලබන්නේ බොහෝ කාලයකිනි. මින් පෙර කේසර වලව්වට පදිංචියට ආ ඇත්තන් හිඟන්නියක් පිස්සියක් විදියට හංවඩු ගසා ඇයව පන්නා ගත්තා මිසක පිහිටක් නොවිණ.

ඇත්තෙන්ම පිච්චී ඔල්මාදකාරික නොවිණ. ජීවිතයට ඇදහැලුන දරාගත නොහැකි සිදුවීම් මාලාව නිසා ඈ උන්නේ අන්දමන්ද වෙලාය. ඒ හැර ඇයට වෙන උමතුවක් නොවූ බව දැන උන්නේ ඇයම පමණි.

"පිච්චි අම්මා..."

පිච්චී වාඩි වී උන් පඩියේම මෙහායින් හිඳගත් අර්චනා ඈ දෙස බැලුවේ දයාවක් නෙත් මත තවරාගෙනය.

"දැන් ඉතිං ඔය ගස් අස්සේ හැංගි හැංගී ජීවත්වෙන එක නතර කරන්න... පිච්චී අම්මට පුළුවන් කේසර වලව්වෙ නතර වෙන්න... මං නිදාගන්න තැනක් අස්කර දෙන්නං..."

අර්චනා කීවේ හැබෑවටමය. මේ අසරණ මැහැල්ලට පිහිට වීමේ උවමනාව ඇගේ හිතේ ලොකුවට තිබිණ.

"අපෝ බෑ..."

පිච්චී බියෙන් වාගේ ගත් කටටම කීවාය.



Scanned by CamScanner

"ඇයි බැරී..."

අර්චනා ඇහුවේ තේරුම්ගන්න බැරිවය. පිච්චී වටපිට බැලුවාය. හරියට ඇගේ කතාව කවුරුන් හෝ හැංගී අහගෙන ඉන්නා සේය.

www.sl-unlimited.com Sumee

"මෙහෙ සිරිපාල ඉන්නවා..."

තව ටිකක් අර්චනාට කිට්ටු වී පිච්චී ඒ ටික කීවේ රහසෙනි. අර්චනා වෙව්ලා ගියාය. ඇයට අදහාගත නොහැකි විය. පිච්චී සිරිපාල ගැන දන්නේ කෙසේද? ඈ සිරිපාල ගැන දන්නේ මොනවාද? අර්චනා හීනෙන් වත් පිච්චී මේ සිදු වීම් ගැන යම්කිසිවක් දන්නවා ඇතැයි හිතුවේ නැත.

"පිච්චී අම්මා කොහොමද සිරිපාල ගැන දන්නෙ...?"

අර්චනා ඇසුවාය.

"මොකෝ මං නොදන්නෙ... මං සිරිපාල ගැන හොඳට දන්නවා..."

ඔළුව දෙපැත්තට වනමින් පිච්චී කීවාය.

"ළිඳ ඇතුලේ සිරිපාල... ළිඳ ඇතුලේ සිරිපාල..."

ඈ තාලයට කීවාය.

අර්චනා වෙව්ලා ගියාය. පිච්චි අම්මා යමක් දනී. ඒත් ඒ දන්නා දෙය එළියට ගන්නේ කොහොමද?

"එතකොට පිච්චී අම්මා මාලතී මැණිකෙවත් අඳුරනවද?"

SL-UNLIMITED E-Book



The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

අර්චනා දුර දිගට සිතා ඇසුවේය.

පිච්චීගේ නැලවිල්ල නතර විය. ඇය මොහොතකට ගල්ගැහිණ. දුර ඈතක බලා හිඳ හනික අර්චනා දෙස බැලුවාය.

"මොකෝ මං නොදන්නෙ... මං මාලතී මැණිකෙවත් දන්නවා... ලොකු මැණිකෙවත් දන්නවා... කොහොඹ තැන්නෙ ආරච්චිලාවත් දන්නවා... වෙච්ච දේවල් සේරමත් දන්නවා..."

www.sl-unlimited.com

පිච්චි කීවේ හිස නටව නටවාය. වෙච්චි දේවල් දන් අර්චනාත් දනී. ඒ සේදර කී දේවල්ය. ඒ දේවලින් කොයිතරම් ප්‍රමාණයක් ඇත්තද? කොයිතරම් ප්‍රමාණයක් සේදරත් නොදන්නේද? අර්චනා කල්පනා කළාය. පිච්චී අම්මා ගේ කටිනුත් සිද්ධවෙච්ච දේ අහන්න ආර්චනා කැමති වූවාය.

"ඇත්තටම මොකද උනේ පිච්චී අම්මා...? සිරිපාල හොරෙක් නේද? වලව්වෙ රත්තරන් බඩු හොරකම් කරන්න ආවා නේද? "

මේ අර්චනා විශ්වාස කළ දේ නොවේ. ඇය එහෙම කීවේ විස්තරය මැහැල්ලගේ කටින් එළියට ගන්නය.

"නෑ... නෑ... නෑ..."

මැහැල්ල අත පොළොවේ ගහමින් සපථ කළාය.

"සිරිපාල අහිංසකයා... ඌ හොරෙක් නෙමේ..."

"එහෙනං ආරච්චිලගෙ වලව්වේ රත්තරන් හොරකමේ ආවා කියන්නෙ...?"

අර්චනා කීවාය.

SL UNLIMITED E-Book
The Spirit of Srilankan e-community



Scanned by CamScanner

"ඒක උගුලක් සිරිපාලට අටවපු.... සිරිපාල අහිංසකයා... ඒ උගුලෙ අහුවුනා පව් ...."

පිච්චීගේ නෙත් මතින් කඳුළු ඉහිරිණ.

"ඇත්තටම මොකද උනේ පිච්චි අම්මා...?"

www.sl-unlimited.com Sumee

අර්චනා මෑදුව ඇහුවාය.

"මාත් හැදුනේ මේ කේසර වලව්වෙ නෝනා... මගෙත් ගෙදර මේක තමා... මට අම්මා අප්පා දෙන්නා නෑ... ආරච්චිලා මාව හදාගත්තා... මැණිකේගේ අත් උදව්වට වාගේ... එතකොට මට අවුරුදු දහයක් විතර ඇති... මාලතී මැණිකේ හොඳ ලමිස්සී... හරිම හැඩකාරයි... සිරිපාල එගොඩ ගොඩේ එකා... ඌත් සද්දන්ත පිරිමියා... මාලතී මැණිකෙ ගැන හිත වැටිලා පස්සෙන් ආවා..."

පිච්චි අම්මා කියවාගෙන ගියාය.

"මාලතී මැණිකෙත් සිරිපාලට කැමැත්තෙන් උන්නද?"

අර්චනා ඇසුවාය.

"කොහෙද?.... සිරිපාල පස්සෙන් එන බවක් මාලතී මැණිකෙ දැනගෙන උන්නෙ නෑ... ඒත් මේක වෙන කෙනෙක් දැනගත්තා..."

"ඒ කවුද?..."

"හිච්චි අප්පො... මාලතී මැණිකෙගෙ අයියණ්ඩි... මහ කෙසඟ එකා... ඒ උනාට හරි දුෂ්ටයි.... අනුන්ට උගුල් අටවලම තමා සතුටු උනේ... සිරිපාල එක්ක කොහොමත් අමනාපයි..."



SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

"ඇයි ඒ..."

"සිරිපාල වැවේ මේ ඉවුරට ආපු දවසක හිච්චි අප්පො ඉවුරෙ ඉඳලා... මේවා වලව්වෙ ඉඩකඩම්ය මේ ඉවුරට එන්න එපාය කියලා සිරිපාලට බැනලා... වැව කාටත් අයිතියි මායිම් බෙදන්න බෑ අප්පො කියාන සිරිපාලත් කතාවට වැටිලා... මං එතනට යනකොට කතාව බොහොම දුර ගිහින්... සිරිපාල හිච්චි අප්පොව වතුරෙ ඔබාන ගුටිබැට දෙකක් දුන්නා... ඔය සිද්ධිය උනේ බොහෝම ඉස්සර... මාලතී මැණිකෙ ගැන සිරිපාල හිත වැටුණෙ ඊට පස්සෙ... ඒත් සර්පයා සර්පයාම තමා... හිච්චි අප්පො මහ කුනකට්ටා..."

පිච්චී කියවාගෙන ගියාය. අතර මැද්දේ බර සුසුම් හෙලුවාය. ඇයත් මේ කතාව කියන්නට කෙනෙක් ළඟ නොවී මේ රූස්ස ගස් අතර හැංගී හැංගී අපමණ දුක් කන්දක් විඳ තිබේ.

"එදා පෝය... ගං දෙහෙකට එහා මහ මැණිකෙගෙ මල්ලිගෙ ගෙදර පිරිතක්... ආරච්චිලයි ගෙදරඇත්තොයි යන්න ලේස්ති උනා... හිච්චි අප්පො මට කතා කරලා කිව්වා මාලතී මැණිකේ රෑට කේසර වලව්වට එන්න කිව්වා කියලා සිරිපාලට කියන්න කියලා... රෑට වලව්වෙ කවුරුත් නෑ කියලත් කියන්න කිව්වා... මං ඔය දුෂ්ටකම් තේරුම්ගන්න තරම් මොළේ පෑදිච්ච එකියෙක් නෙමේ නෝනා... යාන්තම් ගෙට වෙලා ,මාස ගාණයි ගියේ... මං සිරිපාලට පණිවිඩේ කිව්වා... සිරිපාල උන්නේ වැවේ ඔරුව පැද පැද... මට මතකයි සිරිපාලගේ මූනේ ඇඳිච්ච හිනාව... ඒ මූණ හරි ලස්සනට පෙම් පාට උනා.... මගෙ බෙල්ල ගහලා ගියත් මං එනවා කියලා මැණිකේට කියපන්... සිරිපාල කිව්වෙ ඔහොම... මං ඒ ටික කිව්වේ හිච්චි අප්පොට..."

අර්චනා හදවතින් ගැහිණ. ඇගේ සිතේ සිදුවන්නට ඇති දෙය ගැන සියුම් අනුමානයක් ඉපදිණ.



Scanned by CamScanner

"හවස වලව්වේ ඔක්කොම පිරිත් ගෙදර යන්න පිටත් වුණා... මාලතී මැණිකෙ මේ මුකුත්ම දන්නේ නෑ... කිරිල්ලි වගේ ඇඳගෙන අම්මා තාත්තා එක්ක පිටත් වුණා... හිච්චි අප්පො කල්තියාම බොරු අසනීපයක් අරන් ගෙදර නතර වුණා..."

"ඉතිං..."

www.sl-unlimited.com Sumee

"ඒ කාලෙ උන්නා අංගම්පොර සූරයෝ කියලා මහා හටන් කාරයො වගයක් උන්ගෙන් කීප දෙනෙක් සල්ලිවලට හිච්චි අප්පො වලව්වට ගෙනත් ගත්තා... කලින් කතා කරගෙන ඉන්නැති... උන් හතරයි හිච්චි අප්පොයි, මායි, උයන පිහන සෙලෙස්තිනා නැන්දයි විතරයි වලව්වේ උන්නෙ..."

පිච්චී කතාව නතර කළාය. ප්ලාස්ටික් කෝප්පය දෝතින් ගෙන වතුර උගුරු කීපයක් බීවාය.

"මායි... සෙලෙස්තිනා නැන්දායි නිදාගන්නෙ කුස්සි කාමරේ... මහ රෑ අපි ඇහැරුණේ මර ලතෝනියක් ඇහිලා... අපි දෙන්නාම වලව්ව මැද්දෙන් උඩට දිව්වා... සද්දෙ ආවේ මැද මිදුලෙන්... සිරිපාල... සිරිපාල... අංගම්පොරකාරයෝ සිරිපාලට වටකරගෙන ගහනවා... කොයිතරම් ඇඟපත හයිය පිරිමියෙක් උනත් නෝනා හතරපස් දෙනෙක් වටකරන් පොලු වලින් ගහනකොට දුරුවල වෙනවා... හිච්චි අප්පො බලබලා හිනාවෙවී සතුටු වෙනවා..."

එය කොයිතරම් අපරාධයක් ද? අසාධාරණයක් ද? අර්චනාගේ පපුව ඉරී මහා වේදනාවක් දැනිණ.

"සිරිපාල පුළුවන් තරම් උන් එක්ක ඔට්ටු වුණා... බැරිවෙන කොට කෑගහන්න පටන් ගත්තා.... කෑගැහුවෙම මාලතී මැණිකෙ ගෙ නම කිය කියා... මාලතී මැණිකෙ මාව බේරගන්න... මාව බේරගන්න... කිය කියා මහා හයියෙන් විලාප දුන්නා... උඹව බේරගන්න මාලතී මැණිකේ මෙහෙ නෑ... උඹට

SL-UNLIMITED E-Books The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

එන්න කියලා කිව්වේ මාලතී මැණිකේ නෙමේ මං කියලා හිච්චි අප්පො කිව්වා..."

කඩමාල්ලෙන් දෙනෙතින් ගලන කඳුළු පිසලූ පිච්චි අම්මා රතුව ගිය ඇස් වලින් අර්චනා දෙස බැලුවාය.

www.sl-unlimited.com Sumee

"ඒ කතාව ගුටි කනවාට වඩා සිරිපාලට වේදනාවක් වුණා... අන්තිම මොහොතේ සිරිපාල දැක්කා මමයි සෙලෙස්තිනා නැන්දයි බයේ වේවල වෙව්ලා බලා ඉන්න හැටි... උඹල ඔක්කොම එකතුවෙලා මාව රැවට්ටුව නේද කියලා සිරිපාල මා දිහා බලලා ඇහුවා... ඒ ඇස් වල කඳුළු පිරිල තිබ්බා... මුගෙ පණ හයියයි අප්පො... මූව ලේසියෙන් මරන්න බෑ කියලා ගහලා ගහලා හතිවැටුණාම අංගම්පොර කාරයෝ කිව්වා... ඊට පස'සේ තමා ළිදේ කඹේ බෙල්ලෙ දාලා ළිඳ ඇතුලෙ එල්ලලා සිරිපාලව මැරුවෙ..."

ඒ සිදුවීම අර්චනා දැක තිබේ. මෙහෙට ආ පලමු කාලේ හීනෙන් අර්චනා ඔය දෙය හැබැහින් සේම දුටුවේය. මේ මොහොතේත් ඒ භායනක සිදුවීම අර්චනාගේ ඇඟ කිළිපොලා දැම්මේය.

"වලව්වේ තිබ්බ රත්තරන් බඩු අරං යන්ඩ ඇවිත් කියලා කතාව හැදුවේ හිච්චි අප්පො... කාටවත් කටින් කෙල බිඳක් හෙලන්න බෑ කියල මාවයි සෙලෙස්තිනා නැන්දවයි බය කළා... පහුදා ආරච්චිල ආපහු එනකොට වලව්වට පොලීසියෙනුත් ඇවිත්..."

"ඉතිං... මාලතී මැණිකේ මොකද කළේ....?"

අර්චනාට දැනගන්නට උවමනා විය.

"මාලතී මැණිකෙ මිනිය දිහා බැලුවේ එක පාරයි... එයාට හිත හයිය නෑ.. සතෙක් සීපාවෙක් මැරිලා උන්නත් බලන්න බෑ...

SL-UNLIMITED E-BOOK The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

හොරෙකුට වුනත් මැරෙනකම් ගැහුව එක වැරදී කියලයි මාලතී මැණිකෙ කිව්වෙ... සිරිපාලට මේ අපරාදේ උණේ එයාට ආදරේ කරලා කියලා මාලතී මැණිකේ කවදාවත් දැන ගත්තේනෑ... එයා සිරිපාල ගැන දුක් වුණේ කාගෙ උනත් තවත් ජීවිතයක්නෙ කියලා හිතලා විතරයි...."

දෛවය මොනතරම් පුදුමාකරද? මෙතරම් වෙනස්කම් ජීවිතය තුළ අහිංසකයෙකුට විය හැකිද?

www.slunlimited.com

අර්චනා කල්පනා කළාය.

"ඊට පස්සෙ තමයි හොඳ හරිය වුණේ... කිසිම කෙනෙකුට වලව්ව ඇතුලේ සැනසීමෙන් නිදාගන්න බැරි වුණා... ගොඩ දෙනෙක් දැක්කා සිරිපාල රෑ ළිඳ ඇතුලේ කඹෙන් එල්ලිලා ඉන්න හැටි... මාලතී මැණිකෙව කොළඹ මහත්තයාට බන්දලා දුන්න නිසා බේරුණා... ඒත් ඉතිං උන්දැත් වැදුම් ගෙයි සන්නියෙන් මළානෙ...."

ඒ කතාව සේදර අර්චනාට කියා තිබිණ.

"ටික දවසක් යනකොට කොහොඹ තැන්නේ ආරච්චිලාට තේරුණා පුත්තරයා මෙතන ඊට වඩා මොකක්හරි උගුලක් අටවල තියෙන බව... අර අංගම්පොර කාරයෝ හතරදෙනා එදා රෑ වලව්වට ආවේ කොහොමද කියලා ආරච්චිලා හෙව්වා... හිච්චි අප්පො කිව්වේ ඒ එයාගේ යාළුවෝ දුක සැප බලන්න ඇවිත් උන්නේ හොරා දැක්ක ගමන් කට්ටියම අල්ලන් ගැහුවා කියලා... ඒත් ආරච්චි ඇත්ත කතාව තේරුම් ගත්තේ හිච්චි අප්පො ලෙඩ වෙලා ඇඳට වැටුණාම..."

"හිච්චි අප්පොට මොකද උනේ...?"

අර්චනා ඇහුවාය.



SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

"මුලින් මුලින් හීනෙත් බය වුණා... ඊට පස්සේ හැබැහිනුත් බය වුණා.. අර වාගේ අහස පොළව නුහුලන අපරාධයක් කරවලා මේ පොලොවේ යහතින් ඉන්න ලැබේද නෝනා...? කවදාවත් හිච්චි අප්පො රෑට නිදාගත්තේ නෑ... ඒ හින්දාම ලෙඩ වුණා... ඇඳට වැටුණා... කොහොමත් මහ කෙසඟ සෝමාරි එකානෙ... ආරච්චිල නොකරපු වෙදකමක් නෑ... පිරිත් කියෙව්වා... කට්ටඩි ගෙන්නුවා... තොවිල් කළා... මොනා කළත් වරුවකට වඩා ඇහුවේ නෑ... අන්තිමේදී ඇඳේම තමා අසූචි දා ගත්තෙත්... සතෙක් වගේ විලාප දිදී පණ ඇද්දෙ... මැරෙන කොට යාන්තම් අවුරුදු විසිනමේට ලැබුවා විතරයි..."

"එතකොට කොහොඹ තැන්න ආරච්චියි මැණිකෙයි..."

"මාලතී මැණිකේ වැදුම් ගෙයි මියදුණාට පස්සෙ ඒ දෙන්නාගෙ හිත් කැඩුනා... මැණිකෙ මුලින් නැති වුණා... ආරච්චි ඊළඟට... ආරච්චි නැතිවෙනකොට වයස හැට පහක් විතර ඇති.... සෙලෙස්තිනා නැන්දාත් වයසටම මියදුනා... මං ඉතිරි වුණා..."

පිච්චි අම්මා උස් අහස දෙස බැලුවාය. මහපොලොව දෙස බැලුවාය. නොනවත්වා ඇස් පිහාටු සැලුවාය. ඇගේ නෙත් වලින් කඳුළු කඩා හැලෙමින් තිබිණ.

"මුලින් මුලින් ළිඳ ඇතුළේ සිරිපාල එල්ලිලා ඉන්නවා පේන්න පටන්ගත් කාලෙම ආරච්චිල එතන මහදොර වහල යතුරු දැම්මා... ආයෙ කවදාවත් ඕක අරින්න ඕන නැතය කියලා යතුරු පොදියෙන් ඒ යතුර ගලවලා වැවට විසි කළා... එතකොට හිච්චි අප්පෝ එහෙම මිය පරලොව ගිහින්... ඊට පස්සෙ සිරිපාලගේ හොල්මන් කිරිල්ල ඔය දොරින් එහාට විතරයි... ඒත් නෝනා... මට මගෙ හිතින් කවදාවත් සමාවක් ලැබුණේ නෑ... වලව්ව ඇතුලේ ඉන්න හැම වෙලාවකම මට සිරිපාලගෙ ඇස් දෙක මතක් වෙනවා... ඇස් වල කඳුළු පුරෝගෙන උඹල ඔක්කොම එකතු වෙලා මාව රැවට්ටුවා නේද අහනවා...

මං වලව්වේ උන්නාට වඩා වලව්වේ ගහකොළ අස්සෙ ඉන්න පුරුදු වුනා... වලව්ව ඇතුළෙ කවදාවත් මටත් ඇහැපියවග න්න බැරිවුණා... ඒත් මේ වලව්වත්තෙ ගහකොළයට මට ඇහැපියවෙනවා... නානාප්‍රකාර අයිතිකාරයො පස්සෙ කාලෙක මේකට ආවා ගියා... ඒත් මං හැමදාම අර ගහකොළ අස්සෙ ජීවත්වුණා... අවුරුදු පනහකට වැඩිය මං මේ වත්තෙ ගහකොළ එක්ක ජීවත්වෙලා තියෙනවා නෝනා... තව ඉතිං ඇබින්දනෙ... ඉතිරි ටිකත් එහෙම ගෙනිච්චදෙන්..."

දැසේ කඳුළු පිහගත් පිච්චි අම්මා පොරෝනය ගෙන නැගිට්ටාය. පැද්දි පැද්දී හැරමිටි වාරුවෙන් රැස්ස ගහකොළ අතරේ ඇවිදයන පිච්චි අම්මා දෙස අර්චනා බලා උන්නාය.

"නෝනා..." සුගතන් අර්චනා පස්සේය.

"කුස්සියෙ වැඩපල කලත් මටත් පිච්චි අක්කාගෙ කතාව ඇහුණා නෝනා... " සුගතන් කීවේය.

"ජීවිතේ කියන්නේ මේ වගේ දුක් කන්දක්ද කියලා හිතෙනවා සුගතන්... අපි සැපයි සුවයි කියලා අල්ලාගත්තට හැමදේකම අවසානෙ ඉතිරි වෙන්නෙ ආයෙමත් දුක විතරයි නේද?"

අර්චනා කීවේය.

"බලාගෙන යනකොට මෙතන වරද කරලා තියෙන්නෙ අපිමයි නෝනා..."

"ඒ කිව්වේ..."
"අර යතුරවත් නැති වහල දාපු දොර කඩපු එක... ඒකෙන් ඇතුළෙ හිටපු සිරිපාල නිදහස් වුණා..."

සුගතන් කීවේය. අර්චනා උන් තැනින් නැගිට්ටේය.



Scanned by CamScanner

"කාලෙ ආවම කොයි රහසත් ලෝකෙට එළිවෙනවා සුගතන්... කාට උනත් සඳහටම හිරවෙලා ඉන්න බෑ... නිදහස් වෙන්න දවසක් එනවා..."

අර්චනා කීවේ ලොකු තේරුමක් ඇති කතාවකි. ජීවිතේ එක පිට එක ආ දුක් සුසුම් කන්දරාව ඇගේ සිතුවිලි අලුත් මානයකට රැගෙනවිත් තිබිණ.

www.sl-unlimited.com Sumee

■ ■ ■ ■ ■ ■ ■

රවිශ්ක අතපය පොරවාගෙන පුටුව මත උන්නේ මුරණ්ඩු විදියටය. සුගතන් බෙදූ බත්පත කවාගන්නට කොයිතරම් වෙහෙසවීද ඔහු කටක් අරින්නේ නැත.

"සුගතන්..."

දිය නාගත් අර්චනා ළඟට ආවේය.

"කටක් අරින්නෙ නෑ නෝනා... මෙහෙම ගියොත් හාමතේම තමා..."

සුගතන් වේදනාවෙන් කීවේය.

"ඕක දෙන්න මට..."

අර්චනා සුගතන් අතින් බත්පත ගත්තාය.

"මඳ රස්නෙට උණු වතුර එකක් අරං එන්න.. මහත්තයාට සීතල වතුර හොඳ මදි..."

අර්චනාට උවමනා කළේ සුගතන් ඉවත යවා ගන්නය.

"රවී..."



SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

රවිශ්කට ළංවූ අර්චනා කීවාය. ඇයට උවමනා කළේ මේ වෙලාවේ මෙතන ඉන්නේ රවිශ්කද නැත්නම් සිරිපාල ද කියා හරියටම දැනගන්නය.

"රවී..."

www.sl-unlimited.com Sumee

අර්චනා කතා කළාය. ඒත් ප්‍රතිචාරයක් නැත. කැරලි කොන්ඩයෙන් වැහී ගිය ඇස් වලින් හොරෙන් බැලුවා විතරය.

"සිරිපාල..."

අර්චනා ඉතා සෙමින් - ඉතා මෘදුව කතා කළාය.

සැණින් - එක තත්පරයක් ඇතුලතදී අර පිරිමි මුහුණේ මහා වෙනස් කමක් සිදුවිය. ඒ ඇස් තෙමිණ. ඉස්සිණ. ඒවායින් අර්චනා දිහා බැලුවේ අසරණ විදිහටය.

"සිරිපාල..." ආයිමත් අර්චනා කීවාය.

"මාලතී මැණිකේ..."

සිරිපාල අරක්ගත් රවිශ්කගේ නෙත් මත කඳුළු නලියැවේය.

"සිරිපාලට මං බත්ටික කවන්නද?" අර්චනා ඇහුවේය.

"මට බඩගිනි නෑ මැණිකේ..." ඔහු කීවේය.

"ඒ උනාට කන්න ඕන... මංනෙ කවන්නෙ..."

අර්චනා ගුලිකල බත් කටක් රවිශ්කගේ කට ළඟට ළංකළේය. වදයක් පොරයක් නොකර ඔහු බත්කට ගිල්ලේය.

"මාලතී මැණිකෙ... මට ආදරේද?" රවිශ්ක ඇහුවේය.

SL UNLIMITED E-Books
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"ඔව්..." මාලතී කීවාය.

"මාලතී මැණිකෙ මං සිරිපාල... මැණිකෙ ආදරේ මේ සිරිපාලට නේද?" ඔහු ආයෙම ඇහුවේය.

අර්චනාගේ පපුව පැළිණ. නෙත ඉතිරිණ. හයියෙන් කෑ ගසා හඬන්නට ඇයට හිතෙයි. මේ අසරණයා - ආදරය නමින් ජීවිතය පූජා කළ අසරණයා අදටත් සැරිසරන්නේ නොවිඳි ආදරය සොයායාය.

"සිරිපාල අයියාට ආදරෙන් කතා කරන්න නෝනා... සිරිපාල අයියා ආදරේට කැමතී..."

සේදර කීවා අර්චනාට සිහිවිය.

"මාලතී මැණිකේ සිරිපාලට ආදරේද?"

රවිශ්ක කටින් නැවතත් ඒ වචන පිටවිය.

"ඔව්..."

මාලතී සෘජුව කීවාය. එවර කඳුළු ඉතිරුනේ සිරිපාලගේ ඇස්වලිනි.

"මං හිතුවා මැණිකේ... මං විශ්වාස කළා... ඒකනෙ මට එන්න කියැව්වෙ... උන් මට ගැහුවා මැණිකෙ... උන් මගෙ ඇටකටු පොඩි කෙරුවා... අම්මේහ් ! අයියෝහ් ! මට දරාගන්න බෑ වේදනාවයි මැණිකෙ..."

සිරිපාල ඇඬුවේය. රවිශ්කගේ ශරීරයේ ඇතුලේ උන් සිරිපාල ඉකිගසා හැඬුවේය. අර්චනාටත් ඉකි බිඳිණ. දැන් සිරිපාල ගැන අර්චනාට බියක් නැත. ඇත්තේ මහා දුකක් විතරය.



Scanned by CamScanner

"අපි යං කාමරේට..."

අර්චනා රවිශ්කගේ අතින් අල්ලාගෙනවිත් ඇඳට දැම්මේය. ඇඳේ අතපය වකුටුකරගත් රවිශ්ක කෙඳිරිගෑවේය.

"මාලතී මැණිකෙ..."

"සිරිපාල..."

"ඔළුව රිදෙනවා මැණිකෙ... පොලුපාරවල් වැදිලා..."

අර්චනාගේ පපුව දැවේය.

"මං අත ගාන්නං..."

අර්චනා රවිශ්කගේ බොකුටු හිසකේ අතර ඇඟිලි යැව්වාය. කෙඳිරිය නැවතිණ. සෙමින් සෙමින් ඒ ඇස් පියවිණ.

අර්චනාට දුකය. තමාගැනම දුකය. සිරිපාලගේ ආත්මයට ජීවිතය බිළිදී උන් රවිශ්ක ගැන දුකය. අනේක වධහිංසා විඳ මරණයට පත්වූ සිරිපාල ගැනත් මහ හුඟක් දුකය.

අර්චනාට ඇත්තේ දැන් එකම පැනයකි. මාලතී මැණිකේ මියැදී බොහෝ කල්ය. එහෙත් සිරිපාල අර්චනාට කතා කරන්නේ මාලතී මැණිකේ කියාය. ඔහු තමාව මාලතී මැණිකේ විදියට දකින්නේ ඇයි? අර්චනාට දැන් ඇති ලොකුම ගැටලුව ඒකය.

■ ■ ■ ■ ■ ■ ■

"නෝනා... නෝනා..."

සුගතන් අර්චනා සොයා දුව ආවේ කෑගහගෙනය. අර්චනා උන්නේ රවිශ්කගේ මුහුණ සෝදවමිනි.

"පන්සලෙන් පණිවිඩයක් ඇවිත්..."

"පන්සලෙන්..."



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

අර්චනා එකපාරටම කිසිවක් තේරුම් ගන්න බැරිවිය.

"ඔව් නැදුන්ගම පන්සලෙත්... ලොකු හාමුදුරුවො පන්සලට වැඩලා ඉන්නවාලු..."

අර්චනා තිගැස්සිණ. අදහාගත නොහැකිව ඇය මොහොතක් ගල්ගැහී උන්නාය.

"මං මහත්තයාව බලා ගන්නං... නෝනා හනික යන්න... කොහොම හරි ලොකු හාමුදුරුවන්ට විස්තරේ කියලා මහත්තයව සනීප කරගන්න ක්‍රමයක් බලන්න..."

සුගතන් කීවේය.

අර්චනා තිත්දෙන් ඇහැරියා වාගේය. ඇ සුදු ගවුමකට මාරුවූවාය. රතු පාට මරුටිය පදවාගෙන නැදුන් ගම පන්සල තෙක් ආවාය. වෙනදාට වඩා සෙනගක් අද පන්සලේය. ගොඩක් අය නායක හාමුදුරුවන්ව මුණ ගැහෙන්න ඇවිත්ය.

"නෝනා..."

එදා කතාකළ තරුණ හාමුදුරුවෝ අර්චනාව පිළිගත්තේ ඉතා සුහදවය.

"මං නායක හාමුදුරුවන්ට නෝනා ගැන කිව්වා... යං ඇතුළට..."

අර්චනා ඒ පස්සෙන් වැටිණ.

නායක හාමුදුරුවෝ තලෙළුය. ඒත් බබළන පෙනුමක් උන්නාන්සේ වටාය. සම්පූර්ණයෙන්ම මුඩුකළ රවුම් හිසත් ආත්මයම විනිවිද යන කාරුණික බැල්මත් උන්නාන්සේගේ වයස හැංගුවේය.

"සසර බැඳීම් අතර ආදරේ කියන්නෙ ගලවගන්න අමාරුම බන්ධනයක් දරුවා... සිරිපාල ඒ බන්ධනේට අහුවුණා... වෙන ආත්මෙක වෙන ජීවිතයකට යන්න තිබ්බ්ච ඉඩ වික මාලතී මැණිකෙට වෙන් කෙරුණු බැඳිච්ච හිත නිසා වැහිලා



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-BOOK
Spirit of Sri Lankan ...
Scanned by CamScanner

ගියා.... අවුරුදු පනහක් හැටක් ගෙවිලා ගියා.... ශරීරයත් දිරලා පස්වෙලා ඉවරයි.... ඒත් ආත්මය තාම තරුණයි... ඒ ආත්මය එදා දවසින් නතර වෙලා... ඉදිරියට යාමක් නෑ..."

නායක හාමුදුරුවෝ කියවාගෙන ගියේ හරියට බලා උන්නා වගේය. අර්චනාට කිසිවක් කියන්නට ඉඩක් නොවිණ. නායක හාමුදුරුවෝ ඇගෙන් කිසිවක් ඇසුවේද නැත. ඒත් මුළු සිද්ධි මාලාවම දෑහින් දැක්කා වාගේ උන්නාස්සේ දනී. සියලු දේ දකින්නට නායක හාමුදුරුවන් තුළ ඇති හැකියාව අර්චනා අවබෝධ කරගත්තාය.

"සිරිපාල හිතාගෙන ඉන්නේ මං මාලතී මැණිකේ කියලා... සිරිපාල රවිශ්කගෙ ඇගේ ඉන්න වෙලාවටත් මට කතා කරන්නෙ මාලතී මැණිකෙ කියලා..."

අර්චනා කීවාය.

"සංසාරේ මහ පුදුමාකාරයි දරුවො... කර්ම ඵල ගෙවිල ඉවර වෙනකාලෙ ළංවෙන කොට ඒවට සම්බන්ධ උදවිය ආය ආයෙ මුණ ගැහෙනවා... විවිධ නම් වලින්.... විවිධ ශරීර වලින්... මාලතී මැණිකේ කියන්නේ වෙන කවුරුත් නෙමේ... ඔය ළමයා තමයි... ඒ ඔය ළමයගෙ පෙර භවය..."

අර්චනා බිය විය. ඇත්තටම ඈ ගල් ගැහිණ.

"එතකොට සිරිපාල ආදරේ කළේ මටද..."

අර්චනා අදහාගත නොහැකිව ඇසුවාය.

"ඔව්... ඒක අවංක හැඟීමක්... ඔය තරම් බලගතු ඒකයි... සිරිපාල මැරෙන මොහොතෙදිත් මාලතී මැණිකෙට තිබ්බ ආදරේයි - ආශාවයි - බැඳීමයි - ඉස්සර වුණා... ඒක හින්දා ආයෙත් තැනක උත්පත්තිය අහිමි වුණා... මාලතී මැණිකේ මියදිලා ආයේ ඉපදිලා තරුණ වයසට ඇවිත් කේසර වලව්වටම එන තැනට වැඩ සිද්ධ වුණා... ඒ මේ කර්මය මේ



Scanned by CamScanner

ආත්මෙන් ඉවර කරන්න... "

නායක හාමුදුරුවෝ කියවාගෙන ගියේය.

"ඔය ළමයට පෙර භාවය ගැන කිසිදෙයක් මතක නැතුව ඇති... ඒත් සිරිපාලට හැමදේම අද ඊයේ වගේම මතකයි... මිනිස්සුන්ට හැමදේම දකින්න බැරිවුනාට මළගිය ප්‍රේත භූත පිසාචයින්ට ගොඩක් දේවල් දකින්න පුළුවන්... ශරීරය වෙනස්වුණාට, ආත්මය වෙනස් වුණාට ඔය දරුවා මාලතී මැණිකෙමයි කියලා පය තිබ්බ ගමන් සිරිපාල අඳුනාගත්තා..."

අර්චනාගේ හදවතේ වේදනාව වැඩිය. සිරිපාල ඔහු අහිංසකය. ඉතා දුක්ඛිත ඉරණමකට ගොදුරුවුණේ ආදරය නිසාය.

"සිරිපාලගේ ආවේශය හින්දා මගේ මහත්තයාගේ ජීවිතේ අනතුරේ හාමුදුරුවනේ... දවසින් දවස මහත්තයා දුර්වල වෙනවා..."

අර්චනා කීවේය.

"ඔව්... මට ඒක පේනවා... අපි දෙන්නටම නිදහස දෙන්න ඕන... සිරිපාලත් දැන් දුක් වින්දා ඇති... කුසල අකුසල ශක්තිය අනුව උපතකට එන්න සිරිපාලගේ මේභවය නිදහස් කරලා අරින්න ඕන... ඒ වගේම සිරිපාල හින්දා අරසණ වෙලා ඉන්න මහත්තයාගේ ජීවිතෙත් අපි බේරගන්න ඕන..."

"කොහොමද හමුදුරුවනේ ඒක කරන්නෙ...?"

අර්චනා ඇසුවාය.

දෑස පියාගෙන හාමුදුරුවන් මොහොතක් කල්පනාවට වැටිණ. ඒ උන්වහන්සේගේ සමාධියයි. මොහොතක් දෙකක් නිසලව ගෙවිණි. ඉක්බිති උන් වහන්සේ දෑස හැරියේය.



Scanned by CamScanner

"ඔය කේසර වලව්ව ඇතුලෙ සිරිපාලගෙ ජීවිතේට බොහොම සම්බන්ධ දෙයක් තියෙනවා... ඒක හොයාගෙන විනාශ කරනකන් සිරිපාලගේ ආත්මේට සැනසීමක් ලැබෙන්නේ නෑ..."

හාමුදුරුවන් විස්තර කළේය.

"ඉතාම කුඩා දෙයක්... ඒක බබළනවා... ඔය කේසර වලව්ව ඇතුලෙ සිරිපාලගේ මරණය සිද්ධ වෙච්ච තැන ඒක තියෙන්නෙ..."

"එහෙමයි හාමුදුරුවනේ... මං කොහොම හරි ඒක හොයාගන්නං..."

අර්චනා කීවාය.

"සඳුන් දර ටිකක් අඟල් තුනේ විතර කෑලි වලට කපලා තියන්න ඕන... මී තෙල් බෝතලයක් හොයාගන්න වෙනවා... කව්ද වෙන ළඟ පාත වැඩිහිටියෙක් ඉන්නෙ..."

"සුගතන් ඉන්නවා..."

අර්චනාට උන් වැඩිහිටියා සුගතන්ය.

"සුගතන් කීව්වෙ...?"

"කේසර වලව්ව බලාගන්න කෙනා..."

"හොඳයි උන්දැට කිව්වම මී ඇට හින්දන තැනකින් මී තෙල් බෝතලයක් ගෙනත් තියයි... කපුරු පෙති , පාට මල් , සුවඳ කුඩු , අගුරු කබල මේ ඔක්කොම ඕනෑ... තව ලොකු පැතලි හට්ටියකුයි ඒකට හරියන දරණුවකුයි ඕනෑ... ඔය අඩුම කුඩුම ටික ලෑස්ති කරලා මං කිවව් දේත් හොයලා අද හෙටම මට පණිවිඩයක් එවමු..."

"එහෙමයි හාමුදුරුවනේ..."

අර්චනා නායක හාමුදුරුවන්ගේ දෙපා වැඳ සමුගත්තාය.



Scanned by CamScanner

දූන් ඇගේ හිතට බලාපොරොත්තුවක් තිබේ. සිරිපාලත් රවිශ්කත් යන දෙදෙනාම බේරගන්නා මාර්ගය දූන් ඇගේ දෑස ඉදිරිපිටම දිග හැරී තිබේ.

ආපසු කේසර වලව්වට ආ අර්චනා විස්තරය සුගතන්ට කීවේ ගුණරත්න බාසුන්නැහේ ඉදිරිපිටය.

www.sl-unlimited.com Sumee

"සිරිපාලට අයිති දෙයක්... ඒක මොකක් වෙන්න ඕනද?..."

සුගතන් කීවේය.

"මොකක් උනත් කමක් නෑ... අපි හොයමු නෝනා... අදින් අපේ වැඩත් ඉවර වෙනවා... හවහට මං කොල්ලො දම්මලා ඔය මැද මිදුල කෑල්ල පීරලා හරි උවමනා දේ හොයාගන්නංකො..."

ගුණරත්න බාසුන්නැහේ කීවේය.

" අනේ ලොකු දෙයක් බාසුන්නැහේ..."

අර්චනා කීවාය.

"ඔක්කොටම වඩා මහත්තයාගෙ ජීවිතේ බේරගන්න එක ලොකු දෙයක් බාසුන්නැහේ... කීවේය.

මේ ටික දවසට තමන්ගේම දෑස ඉදිරිපිට සිද්ධ වූ දෙය ගුණරත්න බාසුන්නැහේටත් අදහාගන්න අමාරුය. මුලින්ම වලව්වේ එහා මෙහා දුව පැන වැඩකටයුතු පැවරූ ක්‍රියාශීලී තරුණයා දූන් නැත. දූන් පේන්නට ඉන්නේ කොච්චරවත් අතපය වකුටුකරගෙන නිදන රෝගියෙකි. තමන් ඉන්නේ කොහේද, කා එක්කද කියාවත් ඔහුට සිහියක් නැත. අමනුෂ්‍ය ආත්මයක් මනුෂ්‍යයෙකුට කළ විපත ඔහුත් ගෝලයෝත් දෑසින් දුකගත්හ.

ගුණරත්න බාසුන්නැහේ ගේ කේසර වලව්ව අළුත්වැඩියා කටයුතු එදා හවස තුන වෙද්දී ඉවර විය. ගෝලබාලයෝ ටිකත් එක්කරගත් ඔහු ඊට පස්සේ මැද මිදුල කෑල්ල පීරුවේය. ඒ විශේෂ යමක් සොයාය.



SL-UNLIMITED E-Books
The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

කඩමලු රෙදි කෑලි කීපයක්, පනා කෑල්ලක්, බෝතල් මූඩි හා කටු වගේ අඩුම කුඩුම කීපයක් හැරෙන්නට වෙන විශේෂ දෙයක් එහි නොවිණ.

"හිහ්... හිඃ... හිහ්... හිඃ..."

මහා හයියෙන් හිනැහීගෙන රවිශ්ක මැද මිදුලට එනතෙක් කිසිවෙක් දන්නේ නැත.

"රවී..."

අර්චනා රවිශ්කගේ අතකින් අල්ලාගන්නට හැදුවාය. ඒත් ඇගේ අත ගසා දැමූ ඔහු වටයක් මැද මිදුල පුරා ගියේය.

"මාලතී මැණිකේ ...."

ඒ සිරිපාලය. හරියටම අර්චනා ඉදිරිපිට හිටගෙන කතා කරන්නේ සිරිපාලය.

"මාලතී මැණිකේ... උඹල මාව විනාශ කරන්නද හදන්නේ?... මං දන්නවා... උඹල මාව විනාශ කරන්ට හදනවා..."

කේසර වලව්ව දෙක වන්නට ඔහු කෑගැවේය. හැම එකාම හිටිතැන්වලම ගල් ගැහිණ.

"උඹලට මාව යවන්ට බෑ මැණිකෙ... මේක මගේ කේසර වලව්ව දූන් මගේ...."

සිරිපාල ආයිමත් කෑගැවේය.

"සිරිපාල..."

www.slunlimited.com
SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

මෑදුව කියා අර්චනා ඔහුගේ අතකින් අල්ලාගත්තාය. එවර ඔහුගේ බැල්ම වෙනස් විය. ඒ රතුව ගිය ඇස් ආදරයකින් - මහා ළෙංගතුවකින් තෙමිණ.

"මාලතී මැණිකෙ මං උඹට ආදරෙයි මැණිකෙ..."

අසරණ හඬකින් සිරිපාල කීවේය.

"මං සිරිපාලව එළවන්නෙ නෑ..."

අර්චනා රවිශ්කගේ අතක් තදකර ගනිමින් කීවාය.

"අපි යං කාමරේට..."

සිරිපාල - රවිශ්කගේ ශරීරයේ උන් සිරිපාල අර්චනාට යටත්විය. අර්චනා ඔහුව කාමරයට එක්ක ආවාය.

"නෝනා..."

රාත්‍රී කෑමට පෙර ගුණරත්න අර්චනාට කතා කළේය.

"මුකුත් හොයා ගන්න බැරි උනා නේද?..."

අර්චනා පරාජිත හඬකින් ඇසුවාය. සිරිපාලගේ ජීවිතයට සම්බන්ධ දෙය හොයාගන්නා තෙක් ඔහුගේ ආත්මයට ශාන්තියක් නොවේ.

"ඒක නේන්නං... අපේ කොල්ලො ටික මැද මිදුලේ වැලි කැටයක් ගානේ පීරුවා... බැලුවේ නැත්තේ ළිඳ ඇතුලේ විතරයි...."

ගුණරත්න කීවේය.



www.sl-unlimited.com Sumee
SL-UNLIMITED E-Books
Scanned by CamScanner

"ළිඳ ඇතුළ... "

ඒ වචනය අර්චනාගේ හිතේ විදුලි කෙටුවේය.

සිරිපාලගේ මරණය සිදුවූයේ එහිය. කොච්චර වධ දීලාත් නොමැරුන සිරිපාලව එල්ලා මැරුවේ ළිඳේ බොලොක්කයට දමා ඇති කඹේය. එහෙනම් ඔහුට අයිති දෙය ඇත්තේ ළිං පතුලේද? නායක හාමුදුරුවන් පවා කීවේ එය ඇත්තේ සිරිපාලගේ මරණය සිදුවූ තැන කියාය. තමාට මෙය පෙර කල්පනා නොවුණේ ඇයි? අර්චනා හිතුවාය.

"ඔය කියන දේ තියෙන්නෙ ළිඳ ඇතුළෙ වෙන්න බැරිද?"

අර්චනා ඇසුවාය.

"බොලේ හැබැට... එහෙමත් වෙන්න පුළුවන්නෙ..."

පැත්තක හිඳ කතාව අහගෙන උන් සුගතන් කීවේය.

"එහෙමනම් අපි හෙට පොම්පයක් දාල ළිඳ ඉහලා මඩ ටික අයින් කරවල බලමු..."

ගුණරත්න බාසුන්නැහේ කීවේය.

"බාසුන්නැහේට කරදරයක් නැද්ද?"

අර්චනා ඇසුවාය.

"මෙච්චර හරියක් කරපු එක ඕක මොකද්ද නෝනා...? අපටත් ඕන අපි ගම්රටවලට යන්න කලියෙන් මහත්තයා නැගිටිනවා බලන්න..."

බාසුන්නැහේ කීවේය.

"හැබැයි එහෙම දෙයක් කරනවා නම් ඊට කලින් මහත්තයව පරක්කර ගන්න ක්‍රමයක් හිතන්න වෙයි... මතකනේ අදත් මැද්දට පැනලා යකා නැටුවා... හෙටත් අපට ඔය වැඩේ



The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

කරගන්න දෙන එකක් නෑ..."

සුගතන් මතක් කළේය.

"වැඩේ පටන් ගන්න කළියෙන් මං මහත්තයව වත්තට එකක් යන්නං..." අර්චනා කීවාය.

"අන්න හොඳයි..." බාසුන්නැහේ කීවේය.

www.sl-unlimited.com Sumee

■ ■ ■ ■ ■ ■ ■

මැද මිදුලේ හරි හරියට වැඩය. වතුර පොම්පයක් ගෙනවිත් බාසුන්නැහේත් ගෝලයෝත් ළිඳ හිස් කරන්න සූදානමය. අර්චනා කාමරයට ගියේ රවිශ්කව කේසර වලව්වෙන් එළියට ගෙනියන්නය.

"රවී..."

ඈ කතා කළාය. දැන් ඉන්නේ රවීද? නැත්නම් සිරිපාලද ඈ දන්නේ නැත.

"මාලතී මැණිකෙ..."

ඒ උන්නේ සිරිපාලය. අර්චනා හඳුනාගත්තේ එහෙමය.

"මාත් එක්ක ඇවිදින්න යන්න එනවා ද...?"

අර්චනා ආදරයෙන් ඇහුවාය.

"හා... යං..."

සිරිපාල ඇඳෙන් බැස්සේය.

අර්චනා රවිශ්කගේ අත අල්ලා ගෙන වැව් ඉවුර තෙක් ආවාය. ඔහු කලබල කළේ නැත. කිසිත් කීවේත් නැත.

වැව් දියමත පිපුණු නෙකපාට මල් ඉතා අලංකාරයට ඈතට පෙනිණ. ඔරුවක් දෙකක් වැව් දියමත ඈතය. අර්චනා ලොකු කුඹුක් ගහක් මුල හිඳ ගත්තේය. රවිශ්කවත් ඒ ළඟින්

SL-UNLIMITED E-BOOK
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ඉන්දවා ගත්තාය.

"මටත් ඔරුවක් තිබ්බා..."

සිරිපාල කීවේය. අර්චනා ගැස්සිණ.

"එදා රෑ මං ආවෙ ඔරුවෙන්..." ඔහු ආයෙම කීවේය.

"මැණිකේ..." සිරිපාලගේ කටහඬ හැඬුම්බරව තිබිණ.

"මැණිකෙ මට ආදරේ කරේ නැද්ද ? එදා ගහලා ගහලා මාව මරන වෙලේ උන් මට එහෙම කිව්වා... මට ගැහුවට වඩා ඒකට හිත රිදුණා... මයෙ මැණිකෙ මට ආදරේ කරේ නැද්ද? "

අර්චනාගේ පපුව පැළිණ. ආදරය හඳුනන්නේ නැති ගැහැණියකට නම් කමක් නැත. අර්චනා හොඳින් ආදරය හඳුනන ගැහැණියකි. ඇයට මේ ප්‍රේමවන්තයා දූනේ. මහපොලව මත ජීවමානව ආදරය සිඟ යදින ගැහැණුන් බොහෝමය. හැම ගැහැණියකම ජීවිතකාලය පුරාම සොයන්නේ සිරිපාල වාගේ ආදරවන්තයෙකු නොවේද? මේ තරමටම ආදරයෙන් ගැණු ආත්මෙකට බැඳෙන පිරිමියෙක් ගැන හීනයක් හැම ගෑණියෙකුගේම හිතේ තියෙනවා නොවේද?

"මාලතී මැණිකෙ මට ආදරේ කරේ නැද්ද?"

සිරිපාල ආයෙම ඇහුවාය.

"ආදරෙයි... හැබැයි එදා නෙමේ... දැන්... දැන්... මාලතී මැණිකෙ සිරිපාලට හුඟක් ආදරෙයි..."

අර්චනා කීවේ හදපතුලෙනි. ආත්මයෙනි.

"මට උන් හුඟක් ගැහුවා මැණිකෙ... මැරෙන්න කළින් එක වතාවක් හරි මට මැණිකෙගෙ මූණ දකගන්න ලැබෙයි කියලා මං හිතුවා... උන් මගෙ මූණටත් පොලු වලින්



Scanned by CamScanner

ගැහුවා... දත් කැඩුවා... ලේ ආවා... මං හිතුවා ඒත් කමක් නෑ මට මැණිකෙව බලාගන්න ලැබෙයි කියලා... පස්සෙ බෙල්ලට කඹේ දලා ළිඳට දානකොටත් මං හිතුවා කඹේ බෙල්ලෙ හිරවලා හුස්ම හිරවෙන්න කළියෙන් එකපාරක් හරි මට මැණිකෙගෙ මූණ දකින්න ලැබෙයි කියලා... එහෙම උනානම් මැරෙන මොහොතෙ මට සැනසීමෙන් මැරෙන්න තිබ්බා මැණිකෙ..."

www.sl-unlimited.com
Sumee

මේ වචන අර්චනාට දරාගන්න අමාරුය. ඇගේ පපුව පිච්චේ... දෙනෙතින් කඳුළු කඩා හැලේ.

"ඔළුවට ගොඩක් ගැහුවා... යකඩ පොලු වලින්... ඔලුව රිදෙනවා මැණිකෙ... ගොඩක් රිදෙනවා..."

සිරිපාල දෝතින් හිස බදාගත්තේය.

"මං මැණිකෙ ඔඩොක්කුවෙන් ඔළුව තියාගන්නද?"

ඔහු කුඩා දරුවෙකු සේ ඇහුවේය.

"හා..."

අර්චනා කීවාය.

කෙනෙකු මැරෙන මොහොතේ දනෙන වේදනාව ඔහුට උපාධානය වේ. ගිනි තියාගෙන මැරෙන අයගේ ආත්ම කල්පයක් කල් ගියත් ඒ ගින්නෙන්ම දැවි දැවී භූතාත්ම ලෙස කල් ගෙවයි. හදිසි අනතුරු වලින් අතපය කුඩු වී ඔළුව තුවාල වී මැරෙන අයත් භූතාත්ම වූ පසුව ජීවත්වන්නේ ඒ වේදනාවන් එක්කය. බුදු බණේ තියෙන්නේ එහෙමය. අර්චනා ඒ බව මීට කළියෙන් කියවා තිබිණ. සිරිපාලටත් සිදුව ඇත්තේ ඒ දෙයය. අප්‍රමාණ වධහිංසාවට ලක්ව මියගිය ඔහුගේ භූතාත්මය තාමත් ඉන්නේ ඒ වේදනාවන් එක්කය.

SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

අර්චනා ඔඩොක්කුවේ තියාගත් රවිශ්කගේ හිස හිමිහිට අතගෑවේය.

වැව පිස සීතල සුළඟක් හමා ඒ... ඒ සුලඟ ඇඟට සුවදායකය. ඇගේ හැපෙන සුළගේ මෘදු බව අර්චනාගේ හිතට නොදැනිණ. ඈ දෙලොවක උන්නාය.

www.sl-unlimited.com Sumee

තමා කරන්නේ හරි දේද? ඇය ඇගේ හිතින් ඇසුවාය. සිරිපාල ඔහු දැන් තමා ළඟ තමාගේ ආදරය කරුණාව ලබමින් සුවසේ වෙසේ. ඒත් ඔහුට රහසේ ඇය සැරසෙන්නේ ඔහුව සදහටම අයින් කර දමන්නය. ඔහු ආත්මය පුරා තමාට දුන් ආදරයට පෙරලා තමාගෙන් ඔහුට ලැබුණේ මොනවාද? දුක් - කරදර - මරණය පමණි.

ඒත්...

දැන් තමා මාලතී මැණිකේ නොවේ. රවිශ්කගේ බිරියයි. ඔහුගේ දරුවා මේ වනවිටත් ඇගේ කුසේය. වඩාත් වැදගත් වන්නේ රවිශ්ක බේරාගැනීමය.

"අපි යං මැණිකෙ... අරුන්දල දැන් ඕන දේ ළිඳෙන් ගොඩදාගෙන ඇති..."

හදිසියේම ඔඩොක්කුවෙන් ඔළුව උස්සාගත් සිරිපාල කීවේය. අර්චනා ගැස්සිණ. මේවනවිට කේසර වලව්ව ඇතුළේ සිද්ධවනදේ සිරිපාල දැන උන්නාද?

"ළිඳේ වතුර හින්දවලා මඩ ගොඩදානවා කියල සිරිපාල දැනගෙන හිටියද?"

අර්චනා ඇසුවාය.

"මට හැමදේම පේනවා මැණිකෙ..."



SL - UNLIMITED E Book
The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සිරිපාල කීවේය.

"එතකොට කේසර වලව්වෙන් මා එක්ක එළියට බහින කොට මෙහෙම දෙයක් කරන්න යන්නෙ කියලා සිරිපාල දන්නවාද?"

අර්චනා ඇසුවාය.

"ඔව්..."

"එහෙනං මං එක්ක ආවෙ..."

"මාලතී මැණිකෙ එක්ක ඉන්න තියෙන ආසාවට... මැණිකෙගෙ ආදරේ විඳින්න තියෙන ආසාවට..."

අර්චනා හැඬුවාය. රවිශ්කගේ හිස පපුවට තුරුළු කරගෙන හැඬුවාය. ඉතිං කාලය ඇවිත්ය. පෙර ආත්මයක නොවිඳ අතහැරී ගිය - දූත් මුණගැසුණමුත් හඳුනාගත් නමුත් විඳින්නට අවසරයක් නැති මේ ආදරයට සඳහටම සමුදෙන්න කාලය ඇවිත්ය.

"අඬන්නෙපා මයෙ මැණිකෙ... අපි වලව්වට යං..."

රවිශ්කගේ ශරීරය තුළ උන් සිරිපාල කීවේය.

■ ■ ■ ■ ■ ■ ■

"මෙන්න මේක තමා හම්බවුණේ..."

ගුණරත්න බාසුන්නැහේ රෙදි කඩක ඔතාදුන් දෙය අර්චනා අතට ගත්තාය. එය සුරයකි. ඉර අව්වට එය බැබලිනි.

"ජේන හැටියට දඹ රත්තරං..."

www.sl-unlimited.com Sumee



SL UNLIMITED E Book The Spirit of Sri Lankan e-community
Scanned by CamScanner

සුගතන් කීවේය.

"මේක රත්තරං තමා... මේක අයිති සිරිපාලට... මට සේදර කිව්වා එයාගෙ අම්මායි අප්පච්චියි සිරිපාල අයියට රත්තරන් සූරයක් දාල තිබ්බා කියලා..."

www.sl-unlimited.com Sumee

අර්චනා කීවාය.

"එහෙනම් දැන් අනිත් අඩුම කුඩුම ටික සූදානම් කරගෙන වැඩේ පටන් ගමු..."

සුගතන් කීවේය.

ඒ කී පරිද්දෙන්ම ඔහු වෙහෙස වී සියල්ල සූදානම් කළේය. උදව්වට ගුණරත්න බාසුන්නැහේත් ගොලයෝත් උන්හ. ඒ සිකුරාදාවේ හවස් යාමේ නායක හාමුදුරුවෝ කේසර වලව්වට වැඩම කළහ.

රෙදි දරණුව මත තැබූ හට්ටියට සඳුන් ලී දමා මී තෙල් වක්කර ගින්නක් හැදුවේ උන්නාන්සේය. කපුරු පෙති එක එක ඒ ගින්නට දැමූ නිසා නගින ගින්න වඩාත් සුවඳවත්ය. ඒ ඖෂධීය සුවඳ කේසර වලව්ව සිසාරා පැතිරිණ.

සිරිපාල වෙනස තේරුම් ගෙන උන්නේය. සියල්ලට සමුදෙන්න වේලාව පැමිණ ඇතිවග ඔහු තේරුම් ගත්තේය. හාමුදුරුවන් ඉදිරිපිට පැදුරේ හිඳ උන් ඔහු දඟලුවේය.

"මාලතී මැණිකේ... මාලතී මැණිකෙ මට බොරු කලා... මාව යවන්නෙ නෑ කිව්වා..."

ඔහු දඟලමින් කීවේය. ගුණරත්න බාසුන්නැහේගේ ශක්තිමත් ගෝලයෝ දෙන්නෙක් දෙපැත්තේ හිඳ ඔහුව දැඩිව අල්ලාගත්හ.

SL-UNLIMITED E-BOOK



The Spirit of Sri Lankan e-community

Scanned by CamScanner

"ආදරය කියන්නේ මේ සංසාරේ තවත් එක් බැඳීමක් විතරයි දරුවා... සංසාර චක්‍රයෙ අනිත් හැමදේම වගේ ඔය ආදරේත් දුකම වේදනාවම විතරක් උරුම කරවන දෙයක්..."

නායක හාමුදුරුවෝ සිරිපාලට කරුණු පැහැදිලි කරදෙන්න පටන් ගත්ත.

www.sl-unlimited.com
Sumee

"මේ දරුවා ඔය ගත කරන ජීවිතේ ඔය දරුවාට වැඩකුත් නෑ... අනික් කෙනෙකුට වැඩකුත් නෑ... ඔය දරුවා ඉන්නෙ දැන් සංසාර චක්‍රය ඇතුලේ හිරවෙලා... සිරිපාල මේ සංසාර චක්‍රයෙන් නිදහස් වෙන්න ඕන... ඒකට ඉස්සෙල්ලාම ඔය හිරවෙලා ඉන්න තැනකින් මනුස්ස ආත්මේකට හරි වෙන ආත්මෙකට හරි එන්න ඕන... කුසල් රැස්කර ගන්න ඕන... අපි ලෑස්තිවෙන්නෙ සිරිපාලට හොඳක් කරන්න... සිරිපාල ඔය විඳින වේදනාවෙන්... ඔය දුක්ඛිත ආත්මයෙන් නිදහස් කරලා යවන්ඩ..."

නායක හාමුදුරුවෝ දීර්ඝ දේශනාවක් කළෝය.

"මාලතී මැණිකේ මට ආදරෙයි... මට මැණිකෙ දාලා යන්න බෑ..."

සිරිපාල විලාප දිදී හැඬුවේය.

"නෝනා..."

නායක හාමුදුරුවෝ අර්චනා දෙසට හැරිණ.

"ඔන්න නෝනා දැන් තමා වේලාව්... සිරිපාලයි මාලතී මැණිකෙයි අතර තිබ්බ බන්ධනේ බිඳලා දාන්න දැන් තමා නෝනා යුතුකම කරන්න තියෙන්නෙ... කතා කරන්න සිරිපාල එක්ක... පුළුවන් තරම් එයාගේ හිත හදන්න..."

නායක හාමුදුරුවෝ කීවෝය.

SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

"සිරිපාල..."

අර්චනා සිරිපාලට කතාකළේය. කඳුළු පිරුණු ඒ ඇස් අර්චනාගේ මුහුණට යොමු විය.

"මට මේ ආත්මේ සිරිපාලගේ වෙන්න බෑ... මං දැන් රවිශ්ක මහත්තයාගේ නෝනා... අනුන්ගෙ ශරීරයකට ඇතුල් වෙලා ඉඳගෙන සිරිපාලට හැමදාමත් මට ආදරේ කරන්න බෑ... සිරිපාල නිදහස් වෙලා හොඳ තැනකට යන්න ඕන...මං මේ ආත්මෙ මාලතී මැණිකේ නෙමේ... මං රවිශ්ක මහත්තයාගෙ නෝනා..."

අර්චනා කීවේය.

"මට මැණිකෙ දාල යන්න බෑ... මට යන්න බෑ..."

සිරිපාල කීවේය. හැඬුවේය. අර්චනාටත් හැඬිණ.

"මට ආදරේ නම් සිරිපාල යන්න ඕන... රවිශ්ක මහත්තයාගේ දරුවා මගෙ බඩේ ඉන්නවා... ඒ දරුවාට තාත්තා ඕන... මට මගෙ දරුවාගෙ තාත්තා ඕන... ඒ හින්දා සිරිපාල යන්න ඕන... මට ආදරේ නම් සිරිපාල යන්න ඕන..."

අර්චනා ඉකිබිඳිමින් කීවාය.

"මැණිකෙගෙ කැමැත්ත ඒකද මැණිකෙ...?"

සිරිපාල ඇහුවේය.

"ඔව්..." අර්චනා සෘජුව කීවාය.

"එහෙනං මං යන්නං... මං මාලතී මැණිකේට ආදරෙයි... මැණිකෙගේ සතුට මැණිකෙගේ කැමැත්ත



Scanned by CamScanner

මැණිකේට ලැබෙන්න ඕන... මාව සුදුසු තැනකට යවන්න හාමුදුරුවනේ..."

සිරිපාල වඳිමින් කියා හඬා වැටුණේය.

"මං ඔය දරුවා අනුරාධපුරේ ශ්‍රී මහා බෝධිය ළඟට යවනවා... පින්වන්ත මච්චරු එතැනට එනවා... සිරිපාල ඒ කාගේ හරි සුදුසු කුසකට යන්න... එතකොට ආයිමත් මනුස්ස උත්පත්තියක් ලබන්න පුලුවන්... හා දැන් වැදගම්මු..."

ලොකු හාමුදුරුවන් සිරිපාලට කියා අර්චනා දෙසට හැරිණ.

"අර බුලත් කොලේ උඩ තියෙන සුරේ අතට ගන්න නෝනා... පෙර භවයක සිද්ධ වුණත් මේ තමන් නිසා දුකට පත් වෙච්ච කෙනෙක්... අසීමාන්තිකව තමන්ට ආදරේ කල කෙනෙක්... නෝනා දැන් හදන්නෙ තමන්ගේ දෑතින්ම ඒ තැනැත්තාට සැනසීම ලබාදෙන්න තේරුණාද?..."

"එහෙමයි..."

අර්චනා සුරය අතට ගුලිකරගෙන හඬා වැටිණ.

"නමෝතස්ස භගවතෝ අරහතෝ සම්මා සම්බුද්ධස්ස..."

නායක හාමුදුරුවෝ බුදු ගුණ කියාගෙන ගියේය. අතර මග තැනකදී සුරය ඇවිලෙන ගිනි හට්ටියට දමන්නැයි අර්චනාට කීවේය. අර්චනා සුරය ගින්නට දමා දෝතින් මුහුණ වසාගත්තාය.

"මට සමාවෙන්න සිරිපාල.... අනේ මට සමාවෙන්න..."

ඈ තොල මැතිරුවාය.

www.sl-unlimited.com
SL-UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

රවිශ්කගේ ශරීරය ගැස්සිණ. ඊළඟට සිහිසුන් විණ. ඒ ශරීරයෙන් නික්මුණ අළුපාට දුමාරයක් හිස් අවකාශයට එකතුවෙනවා දුටුවේ ලොකු හාමුදුරුවන් පමණි.

"නෝනා දැන් වතුර ටිකක් ඉහලා මහත්තයාට කතා කරමු..."

www.sl-unlimited.com Sumee

හාමුදුරුවන් කීවේය. අර්චනා රවිශ්කගේ හිස උකුලට ගෙන වතුර බිඳක් ඉස්සාය. දෑස් හැර වටපිට බැලූ ඔහු "අ...ර්...ච...නා..." කීවේය.

ඉතිං සිරිපාල සමුගෙන ගිහින්ය. සඳහටම සමුගෙන ගිහින්ය. ඔහු පිළිගත් දහම ආදරයයි. ඔහු මෙල්ල වූයේ ආදරයටයි.

"මාලතී මැණිකෙට මං ආදරෙයි... මට ඕන මැණිකෙගෙ කැමැත්ත ඉටුවෙනවා දකින්න..."

ඔහු අවසානයටත් එහෙම කීවේය. තමාගේ ආදරය හැමදේම බව ඔප්පුකර ඔහු යන්න ගියේය.

"දැන් ඉතිං කිසිදේකට බයවෙන්න එපා... අද ඉදලා සේරම දෝෂ කම්මුතුයි..."

නායක හාමුදුරුවෝ ඇදි පුටුවෙන් නැගිටින ගමන් කීවේය. අර්චනාගේ හිතට සතුටක් දැනිණ. හෙට සිට කේසර වලව්වට අලුත් ඉරක් පායා එනු ඇත.

SL UNLIMITED E-Book
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

■ ■ ■ ■ ■ ■ ■

ඉතිං ඊට පස්සේ.................

පිච්චි අම්මා මිය ගියාය. ඒ සිරිපාලගේ ආත්මයට සැනසීම ලබාදුන් රැයට පහුදාය. ගස් අතර තිබී සොයාගත් ඇගේ දේහය කේසර වලව් වත්තේම මිහිදන් කෙරිණ. පිච්චි අම්මා පස්වලට යටව ගියේ කේසර වලව්වේ එක් යුගයක නිමාව සටහන් කරමිනි.

කේසර වලව්වේ අලුත් යුගය ආරම්භ වූයේ එහි හෝටලය විවෘත කිරීමත් සමඟය. ඉතා කෙටි කාලයක් තුළ "කේසර වලව්ව රිසෝට් ඇන්ඩ් හොලිඩේ ඉන්" ප්‍රදේශයේ ඉතා ජනප්‍රියය.

අර්චනාගේ සතුටුම දිනය උදා වුණේ ඊටත් මාසයකට පස්සේය. අක්කා වන්දනාත් - මාධව අයියාත් ඔවුන්ගේ පුතු මහිමත් කේසර වලව්ව හෝටලයට ආවේ එහි අයිතිකරුවන් කව්රුන්දැයි දැන නොවේ. මේ හමුවීම දෙපාර්ශවයටම සතුටක් ගෙනාවේය.

"අපි තාත්තලට හොරෙන් ජෝඩුව ගිය අතක් හරියට හෙව්වා.... අන්තිමට අපි තීරණය කළා ඔය දෙන්නා ලංකාවෙ නැතුව ඇති කියලා..."

මාධවත් කීවේය.

"වෙච්ච දේ ගැන තාත්ති හරියට දුක් වෙනවා නංගි... ඔයාව දැක්කොත් ගොඩක් සතුටු වෙයි... ළඟදීම ඇවිත් යන්න එන්න... අලුත් අමුත්තා අවාට පස්සේවත්..."

වන්දනා කීවේ නැගණියගේ ඉදිරියට නෙරා ආ කුස අතගාගෙනය.

අර්චනා දුන් කේසර වලව්වේ කුස්සියට යන්නේ එහෙමත් දවසකය. ඒ හෝටලයේ ඉවුම් පිහුම් වැඩට කෝකියන් ඉන්න නිසාය. අක්කා ඉන්න නිසා තමාගේ අතින් රහට මොනාක්වත් හදන්න හිතා අර්චනා කුස්සියට ගියාය.

www.sl-unlimited.com
Sumee
E-BOOK
The Spirit of Sri Lankan e-community



Scanned by CamScanner

ඈ අල ටික තම්බා පොඩි කරන්න ගත්තේ කට්ලට් වලටය. ඒ අතරේ ඇගේ පිටුපසින් උරහිසේ යමක් වැදිණ. ගැස්සී ගිය ඈ හැරී බැලුවාය. කිසිවෙක් නැත. බිම වැටුණු කොළ ගුලිය එහාට මෙහාට පැද්දෙයි... අර්චනාගේ හිතට බියක් දැනිණ. කෝකටත් කියා ඈ කුළුබඩු දමූ ලොකු අල්මාරිය අස්සට එබිණ.

"බයවුණාද...?"

ඒ අස්සේ හැංගී උන් රවිශ්ක අර්චනා වැළඳගත්තේය.

"මං මේ බලා ඉන්නේ ඉක්මණට රෑ වෙන් නැත්තේ ඇයි කියලා..."

රවිශ්ක කීවේය. පුරුදු දඟකාරයා ඔහු වෙතින් ආයිමත් මතුව තිබේ.

"අනේ යන්න... දැන් ළඟදිම අප්පච්චියෙකුත් වෙන්න යනවා..."

අර්චනා බොරුවට නොක්කඩු පෑවාය.

"ඉතිං මොකද... අප්පච්චිගෙ හිතේ අම්මට තියෙන ආදරේ පැටවු හිටියට අඩුවෙනවද?..."

රවිශ්ක කීවේ අර්චනාගේ හිස සිපගනිමිනි. අර්චනාට ඒ ආදරය දැනිණ. අර්චනාට විතරක් නොවේ මේ කේසර වලව්වේ උස් බිත්තිවලටත් ඒ ආදරය දැනිණ. රවිශ්කගේ මේ ආදරය දෙවනි වෙන්නේ එකම එක ආදරයකට පමණි.... ඒ සිරිපාලගේ ආදර කතාවට පමණකි. සියල්ල නිහඬව දැක - අසා - විඳ උන් කේසර වලව්වෙ බිත්ති, වඩිම්බු මල්ලියකම් කළ ජනෙල් පට්ටම් පවා වූ හැම අංගුවක්ම සිරිපාලගේ ආදර කතාව මහා භක්තියකින් සදාතනිකව හංගා රැකගෙන උන්නේය.

---- අවසානයි -----



Scanned by CamScanner




Scanned by CamScanner